212 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 212 - இல. 5
Volume 212 - No. 5

2012 නොවැම්බර් 14 වන බදාදා
2012 நவம்பர் 14, புதன்கிழமை
Wednesday, 14th November, 2012

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) ශිරානි ඒ. බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව පිළිබඳ විශේෂ කාරක සභාව

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ රජයේ ස්ථාවරය

**විසර්ජන පනත් කෙටුම්පත, 2013** – [හතරවන වෙන් කළ දිනය]:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**2013 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව**

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புகள்:**
இலங்கைச் சனநாயகச் சோசலிசக் குடியரசின் உயர்நீதிமன்ற பிரதன நீதியரசர் பதவியிலிருந்து கௌரவ (கலாநிதி) (திருமதி) ஷிராணி ஏ.பண்டாரநாயக்கவை அகற்றுவதற்காக அதிமேதகு சனாதிபதி அவர்களுக்குப் பாராளுமன்றத்தின் பிரேரணையொன்றைச் சமர்ப்பிக்கும்பொருட்டு அரசியலமைப்பின் 107(2)ஆம் உறுப்புரையின் தீர்மானம் பற்றிய தெரிகுழு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
பதின்மூன்றாவது அரசியலமைப்புத் திருத்தம் தொடர்பிலான அரசின் நிலைப்பாடு

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013 : [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு**

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT
Public Security Proclamation

ANNOUNCEMENTS:
Select Committee on Resolution as per Article 107(2) of the Constitution for a Motion of Parliament to be presented to His Excellency the President for the Removal of the Hon. (Dr.) (Mrs.) Shirani A. Bandaranayake from the Office of the Chief Justice of the Supreme Court of the Democratic Socialist Republic of Sri Lanka

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Government Stance on Thirteenth Amendment to the Constitution

APPROPRIATION BILL, 2013 – [Fourth Allotted Day]
Second Reading – Debate Adjourned

SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2013

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012* නොවැම්බර් *14* වන බදාදා**
*2012 நவம்பர் 14, புதன்கிழமை*
*Wednesday, 14th November, 2012*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
( சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

" **ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

ජීජේඑල්/308

2012 නොවැම්බර් මස 03 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති"

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධූරයෙන් ගරු (ආචාර්ය) ශිරානි ඒ. බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව පිළිබඳ විශේෂ කාරක සභාව

### இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் உயர் நீதிமன்ற பிரதம நீதியரசர் பதவியிலிருந்து கௌரவ (கலாநிதி) (திருமதி) ஷிராணி ஏ. பண்டாரநாயக்கவை அகற்றுவதற்காக அதிமேதகு சனாதிபதி அவர்களுக்குப் பாராளுமன்றத்தின் பிரேரணையொன்றைச் சமர்ப்பிக்கும்பொருட்டு அரசியலமைப்பின் 107(2)ஆம் உறுப்புரையின் தீர்மானம் பற்றிய தெரிகுழு

SELECT COMMITTEE ON RESOLUTION AS PER ARTICLE 107(2) OF THE CONSTITUTION FOR A MOTION OF PARLIAMENT TO BE PRESENTED TO HIS EXCELLENCY THE PRESIDENT FOR THE REMOVAL OF THE HON. (DR.) (MRS.) SHIRANI A. BANDARANAYAKE FROM THE OFFICE OF THE CHIEF JUSTICE OF THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු (ආචාර්ය) ශිරානි ඒ. බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධූරයෙන් ඉවත් කරන ලෙස ඉල්ලමින් අතිගරු ජනාධිපතිතුමා වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා 2012 නොවැම්බර් 06වැනි දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ ඇතුළත් කරන ලද යෝජනා සම්මතයේ සඳහන් චෝදනා විභාග කොට පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා ස්ථාවර නියෝග අංක 78අ(2) යටතේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතිත්වයෙන් යුතු මතු සඳහන් මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

[ගරු කථානායකතුමා ]

ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු නියෝමාල් පෙරේරා මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා

மாண்புமிகு நிமல் சிறிபால த சில்வா
மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த
மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன
மாண்புமிகு டிலான் பெரேரா
மாண்புமிகு விமல் வீரவங்ச
மாண்புமிகு நியோமால் பெரேரா
மாண்புமிகு ஜோன் அமரதுங்க
மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு ஆர். சம்பந்தன்

The Hon. Nimal Siripala de Silva
The Hon. A.D. Susil Premajayantha
The Hon. (Dr.) Rajitha Senaratne
The Hon. Dilan Perera
The Hon. Wimal Weerawansa
The Hon. Neomal Perera
The Hon. John Amaratunga
The Hon. Lakshman Kiriella
The Hon. Vijitha Herath
The Hon. R. Sampanthan

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු දයාශ්‍රිත තිසේරා මහතා විසින් පිළිගැන්වීම - එතුමා හෝ එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් කිසිවකු නැත.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගාල්ල මහමෝදර රෝහල යළි ගොඩනැඟීම : විදේශ ආධාර
### காலி மகமோதரை மருத்துவமனை மீள்நிர்மாணம்: வெளிநாட்டு உதவி
### RECONSTRUCTION OF GALLE MAHAMODARA HOSPITAL: FOREIGN GRANT

1636/'11

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) (i) සුනාමියෙන් විනාශ වූ ගාල්ල මහමෝදර රෝහල යළි ගොඩනැඟීම සඳහා රුපියල් මිලියන 3000ක විදේශ ආධාර මුදලක් ලැබී වර්ෂ පහකට වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(ii) මේ දක්වා එහි ඉදි කිරීම් කටයුතු අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම රෝහල ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රජයේ බදු සහන ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රෝහල ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 3000ක මුදල ලබා දුන් රට කුමක්ද;

(ii) කොන්ත්‍රාත්කරු විසින් එම මුදල් ලබා ගෙන රෝහල් ගොඩනැඟිල්ල ඉදි නොකිරීම පිළිබඳව සොයා බැලීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එහි ප්‍රතිඵලය කවරේද;

(iv) පරීක්ෂණයක් සිදු නොකළේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) නැවතත් විදේශීය ණය මුදලක් ලබා ගෙන මෙහි ඉදිකිරීම් කටයුතුකිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල ලබා ගන්නා ආයතනය සහ රට කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுனாமியால் அழிவடைந்த காலி மகமோதரை மருத்துவமனையை மீளக் கட்டியெழுப்புவதற்காக ரூபா 3000 மில்லியன் வெளிநாட்டு உதவித் தொகை ஒன்று கிடைத்து ஐந்து ஆண்டுகளுக்கும் மேல் கடந்துள்ளதென்பதையும்;

(ii) இதுவரை அதன் நிர்மாணப் பணிகள் அத்திவாரத்துக்கு மாத்திரம் மட்டுப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) இந்த மருத்துவமனையை நிர்மாணிப்பதற்காக ஒப்பந்தகாரருக்கு அரசினால் வரிச்சலுகை வழங்கப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மருத்துவமனையை நிர்மாணிப்பதற்காக ரூபா 3000 மில்லியன் தொகையை வழங்கிய நாடு யாதென்பதையும்;

(ii) ஒப்பந்தகாரர் மேற்படி தொகையைப் பெற்றுக்கொண்டு மருத்துவமனைக் கட்டிடத்தை நிர்மாணிக்காமை தொடர்பாக ஆராயும் பொருட்டு சுகாதார அமைச்சினால் ஏதேனும் விசாரணை மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(iii) ஆமெனில், அதன் பெறுபேறு யாதென்பதையும்;

(iv) விசாரணை மேற்கொள்ளப்படவில்லையெனின், அதற்கான காரணம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஈ) (i) மீண்டும் வெளிநாட்டுக் கடனைப் பெற்று இதன் நிர்மாணப் பணிகளை மேற்கொள்வதற்கான ஏதேனும் திட்டம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அக் கடன்தொகை எவ்வளவென்பதையும்;

(iii) அக்கடன் தொகையைப் பெற்றுக்கொள்ளும் நிறுவனம் மற்றும் நாடு யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) more than five years have lapsed since the receipt of a foreign grant of Rs. 3,000 million for the reconstruction of the Mahamodara Hospital in Galle which was destroyed by the tsunami; and

(ii) the construction activities of the aforesaid hospital have been limited to the foundation up to now?

(b) Will he inform this House whether tax concessions of the Government have been granted to the contractor for the construction of this hospital?

(c) Will he state -

(i) the country which granted Rs. 3,000 million for the construction of the hospital;

(ii) whether the Ministry of Health has conducted an inquiry to look into the non-construction of the hospital building by the contractor after having taken the aforesaid amount;

(iii) if so, the outcome of that inquiry; and

(iv) if an inquiry was not conducted, the reasons for the same?

(d) Will he also inform this House -

(i) whether there is a plan to seek a foreign loan again and resume this construction;

(ii) if so, the amount of that foreign loan; and

(iii) the name of the agency and the country from which the loan is obtained?

(e) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා රජයට විදේශ ආධාර මුදලක් ලැබී නැත. එහෙත් සුනාමියෙන් විනාශ වූ ගාල්ල මහමෝදර රෝහල සංවර්ධනය සඳහා ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනම - Maternity Hospital Foundation - විසින් යුරෝ මිලියන 5.9ක මුදලක් ජර්මන් තානාපති කාර්යාලය හරහා Senok Trade Combine Limited ආයතනය වෙත සෘජුවම ලබා දී ඇත.

කෙළින්ම එම ආයතනයට ලබා දී තිබෙනවා.

(ii) ඔව්.

(ආ) ඔව්.

(ඇ) (i) ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනම.

(ii) ජර්මන් තානාපති කාර්යාලය ඇතුළු ආයතන රාශියකින් කරුණු සොයා බැලීම සිදු කර ඇත.

(iii) ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනම විසින් සෘජුවම මුදල් ලබා දී ඇති අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා මුදල් ලබා දීමක් සිදු වී නැත. මෙහි ඉදි කිරීම් දැනට අත්තිවාරමට පමණක් සීමා වී ඇති අතර, තවදුරටත් මුදල් නොලැබීමේ හේතුව නිසා මෙම ගොඩනැඟිලි ඉදි කිරීම් කටයුතු නැවති ඇත.

(iv) මේ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මඟින් මේ වන විටත් පරීක්ෂණයක් පවත්මින් තිබේ.

(ඈ) (i) ඔව්.

(ii) යූරෝ මිලියන 28.

(iii) ජර්මනියේ පුනර්නිර්මාණ බැංකුව.

එම කටයුතු අඩාළ වීම නිසා අතිගරු ජනාධිපතිතුමා විශේෂයෙන් කළ ඉල්ලීමක් අනුව තමයි යූරෝ මිලියන 28ක් ජර්මනියේ පුනර්නිර්මාණ බැංකුව මඟින් ලබා ගෙන නැවත මේ රෝහල ඉදි කරන්නට කටයුතු කරලා තිබෙන්නේ.

(ඉ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ඒ යූරෝවලින් සඳහන් කළ මුදල ලංකාවේ මුදල්වලට ගැළපුවොත් රුපියල් කෝටි 300ක් -රුපියල් මිලියන 3,000ක්- වාගේ විශාල මුදලක්. අපි දන්නවා සුනාමියට ලැබුණු මුදල් අවසාන විග්‍රහයේදී රාජ්‍ය මුදල් බවට තමයි ඒ වකවානුවේ දිගින් දිගටම සඳහන් වුණේ කියලා. එතකොට දැන් මෙහෙම ආපු මුදල වෙනත් සංවිධානයක් හරහා අපහරණයට ලක් වීම සිදු වුණත්, නව රෝහල ඉදි කරන්න ඒ ඉඩම් ලබා දීම කරලා තිබෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නොවෙයිද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සුනාමි කාලය තුළ යම් යම් ආයතන මේ රටට උදවු කළා. එතැනදී මේ රෝහල ඉදි කරන්නත් මේ මුදල කෙළින්ම ඒ අදාළ ආයතනයට දීලා තිබෙන්නේ අපේ පාලනයකින් තොරවයි. මොකද, එහෙම ඉදි කිරීම් කරලා තිබෙනවා. ඉඩම් ලබා දීම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කළා. ඒ ගැන විමර්ශනත් කළා. නමුත් කෙළින්ම මුදල් ලබා දීම, ඒ කටයුතු කාරණා සියල්ල කර තිබෙන්නේ ඒ ආයතන දෙක හරහායි. අපේ රජයට කිසිම මුදලක් ලබා දීලා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. රුපියල් කෝටි 300ක් අරගෙන රෝහලක් හදන්න යනවාය කියන පදනම මත රජයෙන් නව රෝහල ඉදි කිරීමට ඉඩම් ලබා දීමක් සිද්ධ කරලා තිබෙනවා. එතකොට ඉඩමක් දෙන කොට ඒ මුදල සැබැවින්ම තිබෙනවාද, ඒ සඳහා සැලසුම් තිබෙනවාද, ඒ මුදලින් රෝහල ඉදි කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා බලන්නේ නැතුව ඒ ඉඩම ලබා දීමට කටයුතු කරපු පුද්ගලයන් සහ නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

එදා ඉඩම දුන්නේ නැත්නම් ඔය ප්‍රශ්නයම තමුන්නාන්සේ වෙන විධියකින් අහයි. යූරෝ මිලියන 5.9ක් මේ රෝහල ඉදි කරන්න දෙන්න ලැහැස්ති වුණා, තමුන්නාන්සේලා ඒ ඉඩම දුන්නේ නැත්තේ ඇයි කියලා අහයි.

[ගරු ලලිත් දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, මේක සද්කාර්යයක් නිසා අපි ඉඩම දුන්නා. ජර්මන් තානාපති කාර්යාලය හරහා Senok Trade Combine Limited කියන ආයතනයටයි ඒ මුදල ලබා දීලා තිබෙන්නේ. දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා එම කොමිසම මඟින් ඒ පිළිබඳ කටයුතු කර ගෙන යනවා. මොකද, foundation එක විතරයි දමා තිබෙන්නේ. අතිගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න යුරෝ මිලියන 28ක් බැංකුවක් හරහා ලබා ගන්නට අවශ්‍ය කටයුතුත් මේ වන විට කරලා තිබෙනවා. මේ කටයුත්ත ඉදිරියට ගෙන යන්නයි අතිගරු ජනාධිපතිතුමා උත්සාහ කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමාට උදව්වක් වශයෙන් මා ඒ කාරණය ටිකක් පැහැදිලි කරන්න කැමැතියි. මොකද, ඒ කාලයේ මම තමයි මුදල් ඇමතිවරයා හැටියට හිටියේ. ඇත්ත වශයෙන් වුණ සිද්ධිය මේකයි. ජර්මනියේ හිටපු හෙල්මුට් කෝල් කියන චාන්සලර්තුමා විශ්‍රාම ගිහිල්ලා, ලංකාවේ නිවාඩුවක් ගත කරමින් හික්කඩුවේ ඉන්න වෙලාවේ තමයි සුනාමිය ආවේ. ඒ වෙලාවේ රජයත් කලබල වුණා එතුමා කොළඹට ගෙන්වා ගන්න ඕනෑ කියලා. අපි කලබල වෙලා එතුමාගෙන් ඒ ගැන අහනකොට එතුමා කිව්වා, "මාත් එක්ක මේ හෝටලයේ ඉන්න සාමාන්‍ය මිනිස්සු මාව හොඳට බලා ගන්නවා. ඒ අය, ඒ අයගේ ගෙදරකට මාව එක්කර ගෙන ගිහිල්ලා, මට අඳින්න සරමක් දීලා, කන්න බොන්න දීලා මාව බලා ගත්තා" කියලා. එහෙම කියපු එක අපේ රටට විශාල ගෞරවයක්. මට මතක හැටියට, සුනාමිය ඉවර වෙලා සති දෙකකට විතර පස්සේ තමයි එතුමා කොළඹට ඇවිල්ලා හිටපු ජනාධිපතිනිය හමු වුණේ. එතුමා හොඳින් බලා ගත්ත එක වෙනුවෙන් කරන ප්‍රති උපකාරයක් හැටියට, ගෞරවයක් හැටියට තමයි හෙල්මුට් කෝල් මැතිතුමාගේ යාළුවෝ ටික එක්කාසු වෙලා හෙල්මුට් කෝල් පදනම -ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු ඒ පදනම- හරහා ලංකාවට පරිත්‍යාගයක් කළේ. ඒක පරිත්‍යාගයක් - grant - එකක්. ඒක සුවිශේෂ අවස්ථාවක්. මට පුදුමයි, ඒ ගැන තීන්දු ගත්තු නිලධාරින්ට මේ විධියේ චෝදනා කිරීම ගැන. ඒක grant එකක්. ඒක ලංකාවට කරපු ගෞරවයක්. ඒ අවස්ථාවේ තමයි එතුමන්ලාගේත් අපේත් එකඟත්වයෙන්, තිබෙන ඉස්පිරිතාල භූමියේම ඒ ගොඩනැඟිල්ල ඉදි කරන්න කියලා තීරණය කළේ ගරු කථානායකතුමනි.

ඒක ලංකාවට ගෞරවයක්, එතුමන්ලාටත් ගෞරවයක්. අපි ඒක ගැන ආඩම්බර වෙනවා මිසක්, මේ විධියට ප්‍රශ්න අහලා අපි ඒ කරපු හොඳ වැඩේ සවුත්තු කර ගන්න හොඳ නැහැ කියා මම කියන්න ඕනෑ. පක්ෂ භේදයෙන් තොරවයි මම ඒක කියන්නේ. මොකද, මේවා පිළිබඳව ප්‍රශ්න අහලා මෙහෙම චෝදනා කරන එක පිට රටවල ප්‍රචාරය වුණාම ඒක ලංකාවේ ප්‍රතිරූපයට ඉතාම නරක විධියට බලපානවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

සුනාමි ඛේදවාචකය සිදු වෙලා අවුරුදු 8ක් ගත වෙලා තිබෙනවා. රුපියල් කෝටි 300ක මුදලක්,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ පුන පුනා අහන්නේ ඒකමනේ. කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය පැහැදිලිව අහන්නම්. රුපියල් කෝටි 300ක මුදලක්,- [බාධා කිරීමක්] මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නකෝ ගරු ඇමතිතුමා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන ගන්න ඕනෑ මොකක්ද? කෙටියෙන් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ සඳහා රුපියල් කෝටි 300ක මුදලක් ලැබුණාය කියනවා. ඒ එක්කම දැන් කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කර තිබෙනවා කියලා. එහෙම නම්, අපි මෙතැනදී ප්‍රශ්න ඇසීම නිසා නොවෙයි රටට අපකීර්තියක් ඇති වෙලා තිබෙන්නේ. යකඩ මල්ලට ගුල්ලෝ ගැහුවා වාගේ රුපියල් කෝටි 300 නැති වීම පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. අපි ඒ ගැන ප්‍රශ්න ඇසීම නොවෙයි ප්‍රශ්නය. ජාත්‍යන්තරය හමුවේ ලංකාව අපකීර්තියට පත් වෙන්නේ ඒ සල්ලි ටික ගුල්ලෝ කාපු එක නිසායි. ඒ නිසා ඒ ගුල්ලෝ ගැන පරීක්ෂණයක් කරන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ටිකක් හොයලා බලන්නකෝ. සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දැන් ඒ ඉදි කිරීම් කර ගෙන යනවා. කවුරු හරි මොනවා හරි කිව්වාම, ඒක මෙතැනට ඇවිල්ලා වමාරන එක හොඳ නැහැනේ. [බාධා කිරීම්]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මහමෝදර රෝහලේ අවුරුදු 100ක් විතර පැරණි දෙමහල් ගොඩනැඟිල්ල තමයි සුනාමියෙන් විනාශ වුණේ. ජර්මනියේ හෙල්මුට් කෝල් මාතෘ රෝහල් පදනමට තමයි ඒ මුදල කෙළින්ම දීලා තිබෙන්නේ. අතිගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා ඒකට නැවත මුදල් ලබා ගන්නට යම් කිසි කටයුත්තක් කරලා තිබීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. සිදු වුණු අනෙක් කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ මුදල සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලැබිලා නැහැ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලබා දීලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හම්බන්තොට දිස්ත්‍රික්කයටත් ආධාර දෙනවාය කියලා මිනිස්සු පොරොන්දු වෙලා, නොදීපු අවස්ථා තිබෙනවා. ඒ තැන්වලත් භාගයට අත්තිවාරම් දමා තිබෙනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් දන්නවා ඇති.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට මේ මුදල් දීලා, ඊට පස්සේ මොනවා හරි වෙලා තිබෙනවාද කියලා බලන්න.

ප්‍රශ්න අංක 3 -1871/'11- (3), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ කල් ඉල්ලන හතරවන වතාව.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් එකඟ වුණු කාරණයක් සම්බන්ධ ඉල්ලීමක් ඔබතුමා වෙත ඉදිරිපත් කරන්න තිබෙනවා. එම කාරණය ඔබතුමාගේත් අවධානයට යොමු කර තිබෙනවා. අමාත්‍යාංශ වැය ශීර්ෂ -පිළිබඳව කාරක සභා අවස්ථාවේ, Committee Stage එකේදී- විවාදයට ගන්නා අවස්ථාවේදී මේ සමහර ප්‍රශ්නවලට - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. ස්ථාවර නියෝග අනුව ඒක කරන්න බැහැයි කිව්වාට, අපි ස්ථාවර නියෝග අත් හිටුවලා මීට පෙර එසේ කරලා තිබෙනවා. මා හිතන හැටියට එහෙම වුණොත් එය මන්ත්‍රීවරුන්ට විශාල ජයග්‍රහණයක්. එදිනට අමාත්‍යතුමා අනිවාර්යයෙන් පාර්ලිමේන්තුවේ ඉන්නවා; අමාත්‍යාංශයේ නිලධාරින් ඉන්නවා. උත්තර දිය හැකි ප්‍රශ්නවලට එදාට උත්තර දීලා ඉවර කරන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කාරක සභා අවස්ථාවේ. ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවත් ඔබතුමාට උත්තරය ලැබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
උත්තරය ලැබිලා මදි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I am referring to the Committee Stage.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
There is some confusion.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
In Parliament?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes. මා ආණ්ඩුව වෙනුවෙන් ඒ අදහස ඉදිරිපත් කළේ. හුඟක් ඒවා clearකර ගන්න පුළුවන්. ඔබතුමන්ලා අකමැති නම් ඒක ඔබතුමන්ලාගේ වැඩක්. එතුමා නේ නායකයා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නායකකමක් ගැන නොවෙයි මා කථා කළේ. මේක ප්‍රායෝගිකව අප විසඳා ගන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඇවිත් කථා කරන්න. මේක විසඳා ගන්න වෙයි.

## රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්: විස්තර
## அரச சேவைக்கு ஆட்சேர்க்கப்பட்ட பட்டதாரிகள்: விபரம்
## GRADUATES RECRUITED TO PUBLIC SERVICE : DETAILS

2097/'11

**4. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 1999 වර්ෂයේ රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ 2005 වර්ෂයේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වැඩසටහන යටතේ රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ බඳවා ගැනීම් උසස්වීම් ක්‍රමයක් සහිත නිශ්චිත බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියක් යටතේ සිදු කරනු ලැබුවේද;

(iii) ඉහත පරිදි බඳවා ගත් උපාධිධාරීන් සියලු දෙනා අතරින් විධිමත් ක්‍රියා පටිපාටියකට අනුව උසස්වීම් ලබා ගැනීමට හැකිවූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රාජ්‍ය සේවයට පිවිසෙන කාර්යාල කාර්ය සහායකවරයෙකුටද මාණ්ඩලික ශ්‍රේණියකට පත්වී විශ්‍රාම යාමට හැකි උසස්වීම් ක්‍රියා පටිපාටියක් පවතින රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට ද නිශ්චිත පටිපාටියක් අනුව උසස්වීම් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1999ஆம் ஆண்டில் அரசின் முன்னுரிமையான விடயங்களை நடைமுறைப்படுத்துதல் மற்றும் 2005ஆம் ஆண்டின் வேலையில்லா பட்டதாரிகளுக்கு வேலைவாய்ப்பு வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின் கீழ் அரச சேவைக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்ட பட்டதாரிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்களின் ஆட்சேர்ப்பு, பதவி உயர்வுடன் கூடிய திட்டவட்டமான ஆட்சேர்ப்பு நடைமுறையின் கீழ் மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(iii) மேற்கூறியவாறு ஆட்சேர்ப்பு செய்யப்பட்ட மொத்த பட்டதாரிகளில், முறைசார்ந்த நடைமுறைக்கேற்ப பதவியுயர்வு பெற்றுக்கொள்வதற்கு இயலுமாயிருந்த பட்டதாரிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அரச சேவைக்கு பிரவேசிக்கின்ற அலுவலக பணியாளர் ஒருவருக்குக் கூட பதவிநிலைத் தரத்திற்கு பதவியுயர்வு பெற்று ஓய்வு பெறக்கூடியவாறான செயல் நடைமுறையொன்றைக் கொண்ட அரச சேவைக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்ட பட்டதாரிகளுக்கும் திட்டவட்டமான நடைமுறையொன்றுடன் கூடிய பதவியுயர்வு வழங்கும் வேலைத்திட்டமொன்றைத் தயாரிப்பாரா என்பதையும்;

(v) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning :

(a) Will he inform this House -

(i) of the number of graduates recruited to the Public Service under the implementation of priority matters of the Government in the year 1999 and the programme implemented in the year 2005 to provide employment for unemployed graduates;

(ii) whether their recruitment was done under a specific recruitment procedure with a promotion scheme;

(iii) of the number of graduates who were able to get promotions on a proper procedure, out of the total number of graduates recruited in the aforesaid manner;

(iv) whether arrangements will be made to grant promotions according to a specific procedure to the graduates who were recruited to the Public Service where a promotion procedure that enables even a *Karyala Karya Sahayaka* who joins Public Service to retire as a staff grade officer, exists; and

(v) if so, the time frame required for that?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

| වර්ෂය | රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 1999 | 10,250 |
| 2005 | 43,633 |

(ii) ඔව්.

1999 වර්ෂයේදී උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් එකවර බඳවා ගත් බැවින්, බඳවා ගැනීමෙන් අනතුරුව සේවා අවශ්‍යතා මත පදනම්ව බඳවා ගැනීමේ පටිපාටි ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා ප්‍රධානීන් විසින් සකස් කොට අනුමත කර ගෙන ඇත.

2005 වර්ෂයේ සිදු කරන ලද බඳවා ගැනීම් අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සිදු කර ඇත.

(iii) 2012.02.14 දින අංක 1745/11 දරන වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගන්නා ලද සියලුම උපාධිධාරීන්ට විධිමත් ක්‍රියා පටිපාටියකට උසස්වීම් ලබා ගැනීමට හැකියාව ඇත.

(iv) මෙම උපාධිධාරීන් වෙනුවෙන් විධිමත් උසස්වීම් පටිපාටියක් ඇතුළත් වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව සකසා ඇති අතර, එය අංක 1745/11 හා 2012.02.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා උසස්වීමේ පටිපාටියක් තිබුණාය කියලා කිව්වත් අද උපාධිධාරීන් ඒ සේවා ව්‍යවස්ථාව තුළ MN 4 කියන කාණ්ඩයටයි ඇතුළත් කරලා තිබෙන්නේ. මේ MN 4 කියන කාණ්ඩයේ වැටුප් පියවරයන් තිබෙනවා, 3:2:1 කියලා. නමුත් වැටුප් පියවරයන් තිබුණාට ශ්‍රේණි ක්‍රමයක් නැහැ. පැහැදිලි උසස්වීමේ ක්‍රමවේදයක් නැහැ. උදාහරණයක් වශයෙන් SL 1 දක්වා බඳවා ගත්ත උපාධිධාරීන්ට ඉදිරියට යන්නට කිසිම ක්‍රමවේදයක් නැහැ. ඔබතුමාත් උපාධිධාරියෙක් හැටියට, රාජ්‍ය සේවයට ප්‍රවීණ සේවාවක් කරපු පුද්ගලයෙකු හැටියට, උපාධිධාරීන්ට SL 1 දක්වා යන්නට සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකරන්නේ ඇයි කියලා ඔබතුමාගෙන් මා අහන්න කැමැතියි. ඒ අයට කුඩම්මාගේ සැලකිල්ලක් දක්වන්නේ ඇයි කියන එකයි මා අහන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැදගත් ප්‍රශ්නයක් නඟලා තිබෙනවා. ඔබතුමා අහලා තිබෙන්නේ 1999 සිට 2005 දක්වා. ඊට පස්සේ ළඟදීත් batch එකක් ගත්තා. ඒ batch එක ගැන නොවෙයි මා දැන් කථා කරන්නේ. ඇත්ත වශයෙන් හදිසි අවශ්‍යතාවක් අනුව මේ උපාධිධාරීන් බඳවා ගත්තා. මුල් අදහස තිබුණේ ඒ අයට අවම වැටුපක් පුහුණු වීමේ ක්‍රමය යටතේ ගෙවලා ඒ ඇති වන ඇබෑර්තු විවිධ ව්‍යවස්ථාවන් යටතේ තිබෙන සේවාවන්ට යොමු කරන්න. ගුරු සේවයේම තිබෙනවා, අභ්‍යන්තර ව්‍යවස්ථාවක්. වෙන වෙන සේවාවන්වලත් තිබෙනවා. ඒවාට යොමු කළාම ඒ ගොල්ලෝ ඒ කියූ ව්‍යවස්ථාවට යටත් වෙනවා. ඒකේ තිබෙන පඩි නඩි, උසස් වීම් සියල්ලම ඒ අදාළ ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, නමුත් මේ සංඛ්‍යාව විශාල නිසා සමහර අයට ඒ මාර්ගය තුළින්ම අනාගතය සාක්ෂාත් කර ගන්න බැරි වන තත්ත්වයක් අපට පෙනුණා.

සමහර විට වයස් සීමාව වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ තරග විභාගය අසමත් වීම නිසා වෙන්න පුළුවන්. ඒ අදාළ ව්‍යවස්ථාව යටතේ ඉහළට යන්න බැරි අය ඉල්ලීමක් කළා, "එහෙනම් අපට මොකක්ද කරන්නේ? අපව ඒකට බඳවා ගත්තා. අපෙන් එක කොටසක් ව්‍යවස්ථා තිබෙන එක එක සේවාවන්වලට ඒ කොන්දේසිවලට යටත්ව ගියා. ඉතුරු අයටත් සහනයක් දෙන්න." කියලා. ඒක ගැන දීර්ඝ කාලයක් සාකච්ඡා කරලායි මේ ක්‍රමය හදලා තිබුණේ. මේක ආදර්ශවත් තත්ත්වයක් නොවෙයි.

ඇත්ත වශයෙන් දැනටමත් ඒගොල්ලන් යන්න ඕනෑ, රාජ්‍ය සේවයේ නිශ්චිත තනතුරුවලටයි. ඒ නිසා ඔබතුමා කියපු කරුණුත් අපට සලකා බලන්න පුළුවන්. දැනට අපි මොකක් හරි ඉදිරි පියවරක් අරගෙන තිබෙනවා. ඒක තවත් දුරට හදන්න කියලා තමුන්නාන්සේලා යෝජනා කරනවා නම්, අපි ඒක සලකා බලන්නම්. නමුත් අපේ අදහස නම් මේගොල්ලන් අඩු විය යුතු කණ්ඩායමක් කියන එකයි. ඒගොල්ලන් විශේෂිත සේවාවන්වලට ගිහිල්ලා ඒ ව්‍යවස්ථාවන්වලට යටත් වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු උගත් ඇමතිතුමාට මම කියන්න කැමැතියි, ඔබතුමා දුන් පිළිතුරෙන් මගේ ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ කියලා. කමක් නැහැ, මම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට යන්නම්.

ගරු කථානායකතුමනි, ඕනෑම සේවාවක් තුළ අඛණ්ඩ වැටුප් වර්ධක දහයක් උපයා ගත්තාට පස්සේ දෙවැනි ශ්‍රේණියට උසස්වීම සඳහා කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණයක් තිබෙනවා. නමුත් මේ සමස්ත උපාධිධාරි බඳවා ගැනීම්වලට ඒ විභාගය තබන්නේ නැතිව, උසස්වීම්වලට සුදුසු නැති පිරිසක් හැටියට මේ අයව හංවඩු ගහලා වාර්ෂික වැටුප් වර්ධක 13න් පස්සේ වැටුප් වර්ධක අත් හිටවලා තිබෙනවා. මම අහන්න කැමැතියි, මේ වැරැද්ද නිවැරැදි කරන්නේ කවදාද කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේ කියපු කරුණු අනුව ඒ සඳහා සාමාන්‍ය සම්මත ක්‍රමය පිළිපැදලා නැත්නම් අපි ඒ ගැන සොයා බලා ඒක සකස් කර දෙන්නම්. ඒක මම පිළිගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම ඉදිරිපත් කරපු අඩු පාඩුව ඔබතුමා පිළිගන්නවා?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔව්, ඔව්. මම පිළිගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමනි, වසරක කාලයක් තුළ පුහුණු කාලයේ වැටුප් වර්ධකයක් ලබා දෙනවා. හැබැයි, මේ පුහුණු කාලයේ ලබා දෙන වැටුප් වර්ධකය සේවා කාලයට ඇතුළත් කරන්නේ නැහැ. පළාත් සභා ක්ෂේත්‍රය තුළ වාගේම අර්ධ රාජ්‍ය ආයතන තුළ මේ උපාධිධාරීන් බඳවා ගෙන තිබෙනවා. දැනට ඉදිරිපත් කර තිබෙන සේවා ව්‍යවස්ථාව තුළින් ඒ අයට සහනයක් ලැබෙන්නේ නැහැ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අර පුහුණු කාලය තුළ ලබා දුන් වැටුප් වර්ධකය සේවා කාලයට ඇතුළත් කිරීමටත්, ඒ වාගේම පළාත් සභා සහ අනෙක් ක්ෂේත්‍රවල සේවය කරන උපාධිධාරීන්ට මේ වාගේ ව්‍යවස්ථාවක් හදලා ඒ අයට ඉහළම තලයට යන්නට ඉණිමඟ සකස් කරලා දෙන්නේ කවදාද කියලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, මගේ පිළිතුරෙන් ඔබතුමාට පෙනෙනවා ඇති, 1999 සහ 2005 - අවසාන එක 2005- බඳවා ගත් අයත් ගැන තමයි මේ 2012.02.14 වෙනි දින මේ ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළේ කියා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ඒක සමස්ත උපාධිධාරින්ට-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. මේ බඳවා ගැනීම් කළ වර්ෂ දෙකක් තිබෙනවා නේ. අපි ඒ ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළා. සෑම ව්‍යවස්ථාවකම මේක වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. යම් යම් කොටස් ඇවිල්ලා කියනවා, මේක මදි, එහෙම නැත්නම් සමස්ත සංඛ්‍යාවෙන් එක්තරා කොටසකට අඩුවක් වෙනවා කියලා. සමහර අය අහනවා අපේ පුහුණු කාලය එකතු කළ යුතුද නැද්ද කියලා. මොකද, පුහුණු කාලය සේවා කාලය හැටියට සැලකිය යුතු ද නැද්ද කියන එක සමස්ත රාජ්‍ය සේවයේම තිබෙන ප්‍රශ්නයක්.

ඉතින් අපට පුළුවන් මේ කියන කරුණු ඒ අයත් එක්ක සාකච්ඡා කර යම් කිසි සාධාරණ ඉල්ලීමක් තිබෙනවා නම් මේ ව්‍යවස්ථාව සකස් කරන්න. මොකද, හුඟාක් ව්‍යවස්ථාවල මේ තත්ත්වය තිබෙනවා. මහන්සි වෙලා සාකච්ඡා කරලා ව්‍යවස්ථාව හදනවා. එතකොට විවිධ කොටස් ඇවිල්ලා කියනවා මේකෙන් අපට අසාධාරණයක් වුණා; මේක මීට වඩා හොඳට හදන්න තිබුණා කියලා. එතකොට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මුදල් අමාත්‍යාංශය හෝ ඒ ගොල්ලනුත් එක්ක සංවාදයක යෙදිලා ඒවා සාධාරණ ඉල්ලීම් නම් අපට ඒ ව්‍යවස්ථාව නැවත වරක් සකස් කරන්න පුළුවන් ඒ ඒ ක්ෂේත්‍රවලට. සෑම රජයක්ම මේක කර තිබෙනවා.

## ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය : පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලා
## சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சு : பாலர் பாடசாலை ஆசிரியர் பயிற்சிநெறிகள்
## MINISTRY OF CHILD DEVELOPMENT AND WOMEN'S AFFAIRS : PRE-SCHOOL TEACHER TRAINING COURSES

2350/'12

**5. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2011 වර්ෂය වන විට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය ලබා ඇති පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවන් කවරේද;

(ii) එම පාඨමාලාවන් පවත්වනු ලබන ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාවක් හදාරා ඇති පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව එක් එක් පළාත හෝ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011 ஆம் ஆண்டாகும்போது சிறுவர் அபிவிருத்தி மகளிர் அலுவல்கள் அமைச்சின் கீழ் பதிவுசெய்யப் பெற்றுள்ள பாலர் பாடசாலை ஆசிரியர் பயிற்சிப் பாடநெறிகள் யாவை என்பதையும்;

(ii) அந்தப் பாடநெறிகளை நடத்தும் நிறுவனங் களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சின் கீழ் பதிவுசெய்யப்பட்டுள்ள பாலர் பாடசாலை ஆசிரியர் பயிற்சிப் பாடநெறியை பின்பற்றியுள்ள பாலர் பாடசாலை ஆசிரியர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாகாணம் அல்லது மாவட்டத்திற்கேற்ப வெவ்வேறாக எவ்வளவு என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he state -

(i) the pre-school teacher training courses registered under the Ministry of Child Development and Women's Affairs as at 2011; and

(ii) the names and addresses of the institutions that conduct those courses?

(b) Will he also state the number of pre-school teachers who have followed a pre-school teacher training course registered under the Ministry of Child Development and Women's Affairs, separately in terms of each province or district?

(c) If not, why?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම් 01හි දැක්වේ.

(ii) ඇමුණුම් 01 හි දැක්වේ.

(ආ) මුළු සංඛ්‍යාව 6002යි. විස්තර ඇමුණුම් 02 හි දැක්වේ.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම 01

## ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලා

| ඩිප්ලෝමා පාඨමාලාවේ නම | ආයතනයේ නම හා ලිපිනය |
|---|---|
| පෙර පාසල් ගුරු පුහුණු එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව | බෙන්තොට බෞද්ධ සමාජ සේවා ආයතනය, ශ්‍රී ධර්ම විජයාරාමය, පිටාරඹ බෙන්තොට |
| මුල් ළමාවිය සංවර්ධනඅධ්‍යනය ඉංග්‍රීසි මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | ලයිසියම් ගුරු අධ්‍යාපන ආයතනය, ද ක්ලියෝන් බිල්ඩිංග්, 1/3, රේමන්ඩ් පාර, නුගේගොඩ |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සිඟිති සේවා පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, රාවතාවත්ත, මොරටුව |
| එක් අවුරුදු ළදරු පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික ළමා අධ්‍යාපන පදනම, මුල්ලේරියාව නව නගරය |
| එක් අවුරුදු ළමා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා නෙසෙක් පදනම (ජාතික ළමා සංවර්ධන ආයතනය) තැ.පෙ.11, කඩවත |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික පෙර පාසල් සංවර්ධන පදනම, 19 ඒ, සමරනායක පෙදෙස, කළුතර දකුණ |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව | වැව්ලි මානව සංවර්ධන භාරය, 427/14, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල |
| මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ප්‍රබෝධ පුහුණු හා සම්පත් මධ්‍යස්ථානය, 27/4, දේවාල වත්ත පාර, අරුප්පල |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය, බාහිර උපාධි පාඨමාලා සහ ව්‍යප්ති සේව ඒකක, බෙලිහුල්ඔය |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | සුරංගනී ස්වෙච්ඡා සේවා ආයතනය, නො 172/14 ඒ, විජය කුමාරතුංග මාවත, කොළඹ 05 |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | වයඹ පෙර පාසල් ගුරු පුහුණු විදුහල, වෙලගෙදර උයන, කුරුණෑගල |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | දකුණු පළාත් සභාව, ඉහළ ඩික්සන් පාර, ගාල්ල |
| පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා කළමනාකරණ ආයතනය, සක්සීඩ් ජාත්‍යන්තර පාසල, පස්යාල පාර, මීරිගම |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | අනුලා පෙර පාසල් ගුරු පුහුණු මධ්‍යස්ථානය, 310, හයිලෙවල් පාර, කොළඹ 6 |
| AMI ADVANCED DIPLOMA IN MONTESSORI | Cambrige collage of higher education (pvt) ltd, No 10, Aureliya Gardens, Hospital Squre, Colombo 10 |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, දුම්රියපොළ පාර, රත්මලාන, ශ්‍රී ලංකාව. |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | සී/ස තරුණ සේවා සමාගම, 65, හයිලෙවල් පාර, මහරගම |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | පෙර පාසල් හා ප්‍රාථමික ගුරු පුහුණු මධ්‍යස්ථානය, නො 25, ජයන්ත පාර, ගම්පහ |
| Diploma in pre school education | Aaruthal, 164 A, Lower Road, Orr's Hill, Trincomalee. |
| EARLY CHILDHOOD EDUCATION COURSE | Nature's classroom teacher training centre, No 25, Rajawatta teras, seebale avenue, kirulapone. |
| පෙර පාසල් ගුරු පුහුණු (එක් අවුරුදු) ඩිප්ලෝමා පාඨමාලාව | සතර වෘත්තීය කාර්මික විදුහල, 175/27, අඟුරුවාතොට පාර, හොරණ |
| එක් අවුරුදු පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුර, උතුරු මැද පළාත |
| Diploma in pre school education | Faculty of Asian Vocational Education, 215, High level Rd, Nugegoda. |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | උසස් අධ්‍යාපන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 236/10-02, මහියංගණ පාර, බදුල්ල |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ලිට්ල් බඩ්ස් ගුරු පුහුණු ආයතනය, 12, රත්මල් මාවත, සිරිමල් උයන, රත්මලාන |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ළමා නිකේතන පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයතනය, 108, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ |
| මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය, හොරණ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ආග්‍රා ආයතනය, අංක 66/20 සී, අලි පින්නා මාවත, වරපලාන පාර, තිහාරිය |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | සිසුමග විද්‍යා අධ්‍යයන කේන්ද්‍රය, අංක 94, බදුල්ල පාර, හාලිඇල |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | දකුණු ආසියා අන්තර්ජාතික උසස් අධ්‍යාපන ආයතනය (පුද්) සමාගම, අංක 705, හයිලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | ගාමිණී දිසානායක තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනය, ශ්‍රී සුමංගල මාවත, හාවා එළිය, නුවර එළිය |

ඇමුණුම 02

## ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලා

| ඩිප්ලෝමා පාඨමාලාවේ නම | ආයතනයේ නම හා ලිපිනය | 2011 ඩිප්ලෝමා ලබාගත් සංඛ්‍යාව | 2012 ඩිප්ලෝමා ලබාගත් ප්‍රමාණය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | බෙන්තොට බෞද්ධ සමාජ සේවා ආයතනය, ශ්‍රී ධර්ම විජයාශ්‍රමය, පිටාරඹ, බෙන්තොට | 41 | 42 | ගාල්ල |
| මුල් ළමාවිය සංවර්ධන අධ්‍යයනය ඉංග්‍රීසි මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව | ලයිසියම් ගුරු අධ්‍යාපන ආයතනය, ද ක්ලියෝන බිල්ඩින්, 1/3, රේමන්ඩ් පාර, නුගේගොඩ | | | කොළඹ |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සිඟිති සේවා පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, රාවතාවත්ත, මොරටුව | | | කොළඹ |
| එක් අවුරුදු ළදරු පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික ළමා අධ්‍යාපන පදනම, මුල්ලේරියාව නව නගරය | 62 | 71 | කොළඹ |
| එක් අවුරුදු ළමා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා නෙසෙක් පදනම (ජාතික ළමා සංවර්ධන ආයතනය) තැ.පෙ. 11, කඩවත | | | ගම්පහ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික පෙර පාසල් සංවර්ධන පදනම, 19 ඒ, සමරනායක පෙදෙස කළුතර දකුණ | | | කළුතර |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව | වැවැලි මානව සංවර්ධන භාරය, 427/14, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල | | | කොළඹ |
| මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ප්‍රබෝධ පුහුණු හා සම්පත් මධ්‍යස්ථානය, 27/4, දේවාල වත් පාර, අරුප්පල | 25 | | මහනුවර |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා සබරගමු විශ්ව විද්‍යාලය, බාහිර උපාදි පාඨමාලා සහ ව්‍යාප්ති සේවා ඒකක, බෙලිහුල්ඔය | 68 | | රත්නපුර |

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

| | | | | |
|---|---|---|---|---|
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | සුරංගනී ස්වේච්ඡා සේවා ආයතනය, අංක 172/14ඒ, විජය කුමාරතුංග මාවත, කොළඹ 05 | 60 | 40 | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | වයඹ පෙර පාසල් ගුරු පුහුණු විදුහල, වෙලගෙදර උයන, කුරුණෑගල | 181 | 260 | කුරුණෑගල |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | දකුණු පළාත් සභාව, ඉහල ඩික්සන් පාර, ගාල්ල | 66 | | ගාල්ල |
| පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාව | වෘත්තිය සංවර්ධන හා කළමණාකරණ ආයතනය, සක්සිඩ් ජාත්‍යන්තර පාසල, පස්යාල පාර, මීරිගම | | | ගම්පහ |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | අනුලා පෙර පාසල් ගුරු පුහුණු මධ්‍යස්ථානය, 310, හයිලෙවල් පාර, කොළඹ 06 | | | කොළඹ |
| AMI ADVANCED DIPLOMA IN MONTESSORI | Cambrige gollage of higher education (pvt), no 10, Aureliya Gardens, Hospital Squre, Colombo 10 | | | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | ලලිත් ඇතුලත්මුදලි වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, දුම්රියපොළ පාර, රත්මලාන | 53 | 75 | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | සි/ස තරුණ සේවා සමාගම, 65, හයිලෙවල් පාර, මහරගම | | | කොළඹ |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | පෙර පාසල් හා ප්‍රාථමික ගුරු පුහුණු මධ්‍යස්ථානය, අංක 25, ජයන්ත පාර, ගම්පහ | 125 | 166 | ගම්පහ |
| Diploma in Pre School Education | Aaruthal, 164 A, Lower Road, Orr's Hill, Trincomalee | | | ත්‍රිකුණාමලය |
| Early Childhood Education Course | Nature's classroom teacher training centre, No 25, Rajawatta teras, seebale avenue, Kirulapone | 15 | 10 | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු (එක් අවුරුදු) ඩිප්ලෝමා පාඨමාලාව | සතර වෘත්තිය කාර්මික විදුහල, 175/27, අඹුරුවාතොට පාර, හොරණ | | | කළුතර |
| එක් අවුරුදු පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුර, උතුරු මැද පළාත | | | අනුරාධපුරය |
| Diploma in Pre School Education | Faculty of Asian Vocational Education, 215, High level Rd, Nugegoda | 75 | 93 | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | උසස් අධ්‍යාපන පර්යේශන හා පුහුණු කිරීමේ ආයතනය, 236/10-2, මහියංගන පාර, බදුල්ල | 187 | 180 | බදුල්ල |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ලිට්ල් බඩ්ස් ගුරු පුහුණු ආයතනය, 12, රත්මල් මාවත, සිරිමල් උයන, රත්මලාන | | | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ළමා නිකේතන පර්යේෂණ හා සංවර්ධන පුහුණු ආයතනය, 108, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ | | | කොළඹ |
| මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය, හොරණ | | | කළුතර |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | අග්‍රා ආයතනය, අංක 66/20 සි,අලි ජින්නා මාවත,වරපලාන පාර,තිහාරිය | 21 | 20 | ගම්පහ |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | සිසුමග විද්‍යා අධ්‍යයන කේන්ද්‍රය,අංක 94,බදුල්ල පාර,හාලිඇල | 65 | 70 | බදුල්ල |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | දකුණු ආසියා අන්තර්ජාතික උසස් අධ්‍යාපන (පුද්) සමාගම,අංක 705,හයිලෙවල් පාර,ගංගොඩවිල, නුගේගොඩ | | | කොළඹ |
| පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව | ගාමිණී දිසානායක තාක්ෂණික හා වෘත්තිය පුහුණු ආයතනය,ශ්‍රී සුමංගල මාවත,හාවා එළිය,නුවර එළිය | 300 | | නුවර එළිය |
| එකතුව | | 2371 | | |
| 2009/2010 සංඛ්‍යාව | | 3631 | | |
| මුළු එකතුව | | 6002 | | |

<u>2009/2010 ඩිප්ලෝමා ලබාගත් සංඛ්‍යාව.</u>

| දිස්ත්‍රික්කය | ඩිප්ලෝමා පාඨමාලාව | ඩිප්ලෝමා ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| කළුතර | කළුතර ජාතික පෙරපාසල් පදනම | 2273 |
| කොළඹ | මුල්ලේරියාව ජාතික ළමා අධ්‍යාපන පදනම | 381 |
| කුරුණෑගල | වයඹ පෙරපාසල් ගුරුපුහුණු විද්‍යාලය | 977 |
| එකතුව | | 3631 |

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු ඇමතිතුමනි, පිළිතුර සහාගත කිරීම සෑහෙනවා. නමුත් එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. එය ගරු අමාත්‍යතුමාගෙන් වෙනම ඇසිය යුතු නැහැ කියා මා විශ්වාස කරනවා.

මීට පෙර අය වැයකදී ඉදිරිපත් කර තිබෙනවා, අඩු ආදායම්ලාභී ගැබිනි මවුවරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දෙනවා කියා. ඔබතුමා මීට ඉස්සෙල්ලාත් මේ සම්බන්ධයෙන් උත්තර දීලා තිබෙනවා. මා ඊයේ පෙරේදා දිනක නිකවැරටිය ප්‍රදේශයට ගිය අවස්ථාවේ, සර්පයකු දෂ්ට කිරීම නිසා මිය ගිය පුද්ගලයකුගේ බිරිඳ අපට පැවසුවා, මේ සහනාධාරය ඒ අයට ලැබෙන්නේ නැහැ කියා. ඇය ගැබිනි මවක්. ඉතාම දුප්පත් තත්ත්වයක සිටින්නේ. ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහත්මයාත් එතැනට ඇවිත් හිටියා. මා ඇහුවාම එතුමා කිව්වා, මේ ප්‍රදේශවලට නම් ලබා දෙන්නේ නැහැ කියලා. ඉතින් මම තවදුරටත් මේ පිළිබඳව හොයා බැලුවා. තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කය තුළත් සමහර තැන්වල ඒ අඩු ආදායම්ලාභී ගැබිනි මවුවරුන්ට ඒ පෝෂණ මල්ල ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා අය වැයේදී කියන දේවල් හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේ අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු මන්ත්‍රීතුමනි, අඩු පාඩු තිබෙන තැන් තිබෙනවා. මේ ගැන සාකච්ඡා කරලා මා ඔබතුමාට දැනුම් දීමක් කරන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මම හිතන හැටියට ඔබතුමා මීට ඉස්සෙල්ලත් මේ සම්බන්ධයෙන් මේ සභාවේදීම උත්තර දීලා තිබෙනවා. නමුත් මීට පෙරත් මේ වාගේම පිළිතුරක් තමයි ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වැඩිය සොයා බලා කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

මම මේ ගැන හොඳින් සොයා බලා ඔබතුමා දැනුවත් කරන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
බොහොම ස්තුතියි.

## මනම්පිටිය-වැලිකන්ද දුම්රිය මාර්ගය : රක්ෂිත ඉඩම්

மன்னம்பிட்டி - வெலிக்கந்த புகையிரதப் பாதை :

ஒதுக்கீட்டுக் காணிகள்

MANAMPITIYA-WELIKANDA RAILWAY TRACK : RESERVED LANDS

1892/'11

**9. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මනම්පිටියේ සිට වැලිකන්ද දක්වා ඇති දුම්රිය මාර්ග රක්ෂිත ඉඩම් කට්ටි කර විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මක වන බවත්;

(ii) මෙලෙස අනවසර ලෙස ඉඩම් ලබා දී, ඉදි කිරීම් කිරීමට ඉඩ හැරීම මඟින් දුම්රිය අනතුරු වැඩි වීමේ ප්‍රවණතාවයක් ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එම තත්ත්වය වැළැක්වීමට කටයුතු කරන්නේද;

(ii) එලෙස කටයුතු කරන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னம்பிட்டியிலிருந்து வெலிக்கந்த வரையிலான புகையிரதப் பாதைக்குரிய ஒதுக்கக் காணிகளை துண்டுகளாகப் பிரித்து விற்பனை செய்யும் மோசடி வியாபாரமொன்று இடம்பெறுகின்றதென்பதையும்;

(ii) இவ்வாறு சட்டவிரோதமான முறையில் காணிகளைப் பெற்றுக்கொடுத்து நிர்மாணிப்புகளை மேற்கொள்வதற்கு இடமளிப்பதன்மூலம் புகையிரத விபத்துக்கள் அதிகரிப்பதற்கான வாய்ப்புகள் உள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இது சம்பந்தமாக முறையான விசாரணையொன்றை நடத்தி இந்நிலைமையைத் தடுத்து நிறுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அவ்வாறு நடவடிக்கை எடுக்கப்படுமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that -

(i) a racket of blocking out and selling of lands in the reservations of the railway track from Manampitiya to Welikanda is underway; and

(ii) there is a tendency for railway accidents to increase as a result of providing lands in the aforesaid unauthorized manner and allowing constructions to be carried out on them?

(b) Will he inform this House -

(i) whether he will take action to prevent this situation after holding a formal inquiry into this matter; and

(ii) if he takes action, the period of time taken for it?

(c) If not, why?

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. එම පිළිතුර දීර්ඝ එකක්.

(අ) (i) අප දන්නා තරමින් දුම්රිය රක්ෂිත ඉඩම් කට්ටි කර විකිණීමේ ජාවාරමක් පිළිබඳ වාර්තා වී නැත.

එවැනි ජාවාරමක් සිදු වන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. ඒක පැහැදිලිවම කියන්නට ඕනෑ.

(ii) දුම්රිය මාර්ගය දෙපස අනවසර ගොඩනැඟිලි ඉදි කළහොත් එම ප්‍රදේශයේදී දුම්රිය දර්ශනය වීම අවහිර වීම හේතුවෙන් බොහෝදුරට අනතුරු සිදු වීමට ඉඩ ඇතත් එවැනි අනතුරක් මෑත කාලයේ සිදු වී ඇති බවට වාර්තාවක් ලැබී නොමැත.

කොහොමත් දුම්රියක් සාමාන්‍යයෙන් අඩි 132ක් පමණ වෙනවා. දෙපැත්තේ රක්ෂිතය තහනම් ප්‍රදේශයක්. ඒ වාගේ අනවසර ගොඩනැඟිලි තිබුණු තැන්වල එවැනි accidents වෙලා තිබෙනවා. නමුත් මේ ප්‍රදේශයේ එවැනි සිදු වීමක් වෙලා තිබෙනවා කියලා වාර්තා වෙලා නැහැ.

(ආ) කොටසට අදාළ පිළිතුර දීර්ඝ එකක්. කියවන්නද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සභාගත කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ප්‍රශ්නයේ (ආ) කොටසට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු රෝහණ දිසානායක මහතා]

**** සභාමේසය මත තබන ලද (ආ) (i) පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட (ஆ) (i) விடை :*

** Answer (b)(i) tabled:*

(ආ) (i) මඩකලපුව දුම්රිය මාර්ගයේ වැලිකන්ද හා මනම්පිටිය අතර ප්‍රදේශය කිලෝමීටර් 16ක් පමණ වේ. (කි.මී. 270 සිට 286 අතර) මෙම ප්‍රදේශයේ දුම්රිය මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට අඩි 132ක් පමණ ප්‍රමාණයක් දුම්රිය රක්ෂිත සීමාවට අයත් වේ. මෙම දුම්රිය රක්ෂිත සීමාවේ පදිංචි අනවසරකරුවන් 44 දෙනෙකු පිළිබඳ තොරතුරු මේ වන විට වාර්තා වී ඇත. එමෙන්ම දුම්රිය රක්ෂිත ඉඩම් අනවසර පරිහරණයට ලක් වීම, දුම්රිය ඉඩම් අනවසරයෙන් අල්ලා කට්ටි කිරීම ඒ තුළ පදිංචි වීම් වැළැක්වීම පිණිස දුම්රිය ආරක්ෂක සේවය, දුම්රිය ස්ථිර පරීක්ෂකවරුන් හා දුම්රිය ස්ථානාධිපතිවරුන් දැනුවත් කර කඩිනම් පියවර ගැනීමට උපදෙස් දී ඇත.

අනවසරකරුවන් පිළිබඳ වාර්තා වූ වහාම ඔවුන්ට දින 14ක් තුළ ඉන් ඉවත් වන ලෙස දන්වනු ලබන අතර එසේ ඉවත් නොවන්නේ නම් අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඉවත් කළ යුතු වේ. ඒ සඳහා 1979 අංක 7 රජයේ ඉඩම් (සන්තකය ආපසු පවරා ගැනීමේ) පනත යටතේ ක්‍රියා කළ යුතු වේ. මෙම පනතින් නඩු පැවරීමට අනවසරකරුවෙකු පරිහරණය කරනු ලබන රජයේ භූමි ප්‍රමාණය, එම ඉඩමට මායිම් වන සතර දිශාවේ පිහිටීම් දැක්වෙන සැලසුමක් ඉදිරිපත් කළ යුතු වේ. නෙරපීමේ නියෝගයක් ලබා ගැනීමකින් තොරව පදිංචි නිවසින් ඉවත් කිරීමට බලයක් නොමැත.

මනම්පිටිය හා වැලිකන්ද අතර වාර්තා වී ඇති අනවසරකරුවන් 44 දෙනා සඳහා ඉවත් වීමේ නිවේදන නිකුත් කර අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය පිඹුරුපත් සකසා ලබා දෙන ලෙස දුම්රිය මිනින්දෝරු වෙතින් ඉල්ලා ඇත. එහෙත් දුම්රිය මිනින්දෝරු නිලධාරින්ගේ හිඟය හේතුවෙන් එම සැලසුම සකස් කිරීම ප්‍රමාද වී ඇත. එම සැලසුම් ලබා දීමට ප්‍රමුඛතාව ලබා දෙන ලෙස දැනටමත් දන්වා ඇති අතර එම සැලසුම් ලැබීමෙන් අධිකරණ ක්‍රියා මාර්ග ගෙන ඉවත් කිරීම හෝ දුම්රිය රක්ෂිත ඉඩම් අනවසර පරිහරණකරුවන් පිළිබඳ තීරණ ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කර ඇති බැවින් එකී තීරණය ලද පසු ඒ පිළිබඳ විධිමත් ක්‍රියා මාර්ගයක් ගැනීම කළ හැකි බව පෙන්වා දෙමි.

(ii) සන්තකය පවරා ගැනීමේ පනතට අනුව සැලසුම් සකසා ලිත් මාසයක කාලයක් ලබා දී අධිකරණයට යොමු කර නෙරපීමේ නියෝග ලබා ගෙන ඉවත් කිරීමට මාස 06ක පමණ කාලයක් ගත විය හැකි බව දන්වා සිටිමි.

(ඇ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමා මෙතැන 44 දෙනෙකුගේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපට තිබෙන ගැටලුව මේකයි. දුම්රිය දෙපාර්තමේන්තුවට මිනින්දෝරු මහත්වරුන්ගේ - surveyorsලාගේ- අඩුවක් තිබෙනවා. අපට cadre එකේ ප්‍රමාණයට වඩා බොහොම අඩුවෙන් ඉන්නේ. දෙදෙනෙක් පමණයි ඉන්නේ. දැනට බොහොම වැඩ කටයුතු තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. කොහොමටත් උසාවියේ නඩුවක් ඉදිරිපත් කරනකොට survey plan එකක් අපි උසාවියට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ කියන්නේ අදාළ ස්ථානයට දකුණින් ඉන්නේ කවුද, බටහිරින් ඉන්නේ කවුද, උතුරින් ඉන්නේ කවුද කියා survey plan එකක්. ඒ සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමා පිළිගන්නට යෙදුණා, 44 දෙනෙකුගේ ප්‍රශ්නයක් තිබෙනවාය, නමුත් මිනින්දෝරුවන්ගේ -surveyorsලාගේ- අඩුවක් තිබෙනවාය කියා. ඇයි, එහෙම අඩුවක් තියා ගෙන ඉන්නේ? ඒක ඉක්මනට පුරවන්නේ නැත්තේ ඇයි?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

දැනට රටේම මිනින්දෝරුවන්ගේ විශාල හිඟයක් පවතිනවා. අපේ ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමාත් මෙතැන ඉන්නවා. මා හිතන විධියට මේක එතුමාට අයිති විෂයයක්. මම හිතන හැටියට මිනින්දෝරු මහත්වරුන්ගේ හිඟයක් රටේම ඇති වෙලා තිබෙනවා. මිනින්දෝරු දෙපාර්තමේන්තුව අපට ප්‍රකාශ කර තිබෙනවා, එම අමාත්‍යාංශයෙන් අලුතෙන් එළියට එන batch එකෙන් හය දෙනෙකු ලබා දෙන්නම් කියා. ඒ හය දෙනා ලැබීමත් සමඟ අපට මේවා ඉක්මන් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් යෙදෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම අනවසරයෙන් දුම්රිය ඉඩම්වල පදිංචි වීම සෑම ස්ථානයකම තිබෙන බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන්ම කැලණිවැලි මාර්ගය ගත්තොත් අවිස්සාවේල්ල ඉඳලා ඕපනායක දක්වා දුම්රිය ගමනා ගමනයක් නැහැ. ඒ දුම්රිය පාර මත ස්ථිර ගොඩනැවිලි පවා ඉදි වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් මොකක්ද ගන්නා වූ ක්‍රියා මාර්ගය? කෝටි ගණන් වටිනා දුම්රිය ඉඩම් විධිමත්ව රජය සතු කර ගැනීම සඳහා මොකක්ද ගන්නා වූ ක්‍රියා මාර්ගය?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු කථානායකතුමනි, මම හිතන්නේ මෙය ඉතිහාසය පුරාම සිදු වෙලා තිබෙනවාය කියලායි. විශේෂයෙන්ම එතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන කාලයේත්, පසු ගිය ආණ්ඩු කාලයේත් මේ අනවසර ඉදි කිරීම් විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. ඒක සාක්ෂි සහිතව ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් මම උත්තරයක් වශයෙන් කියන්න කැමැතියි, අවිස්සාවේල්ල ඉඳලා ඕපනායක දක්වා දුම්රිය මාර්ගය - පුංචි කෝච්චි පාර - දැනට අත හැර තිබෙන කොටසක් වශයෙන් තිබෙන බව. ඒ අත් හැර තිබෙන කොටසේ 6,000ක් වාගේ ප්‍රමාණයක් පදිංචි වෙලා ඉන්නවා. ඒ අය නීත්‍යානුකූලව අයින් කරන්නත් නොයෙකුත් බලපෑම් තිබෙනවා.

සමහර තැන්වල තට්ටු තුනේ නිවාස පවා ඉදි වෙලා තිබෙනවා. පසු ගිය දවසක අතිගරු ජනාධිපතිතුමා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වුණා. මම ඒකට සහභාගි වුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාට ලොකු වුවමනාවක් තිබෙනවා, දුම්රිය මාර්ගය හම්බන්තොට දක්වා දික් කරන්න. එතුමා දිස්ත්‍රික් කමිටු රැස්වීමේදී අහලා තිබෙනවා, දුම්රිය හම්බන්තොට දක්වා ගෙනෙනවාට කැමැති නැද්ද කියලා. එතුමාට ලොකු වුවමනාවක් තිබෙනවා, හම්බන්තොට දක්වා train එක අරගෙන යන්න. ඉංගිරිය, ඇඹිලිපිටිය, සූරියවැව හරහා හම්බන්තොට දක්වා දුම්රිය මාර්ගයක් සකස් කිරීමේ ඒ වැඩ පිළිවෙළ සඳහා මොරටුව විශ්වවිද්‍යාලය මඟින් ශක්‍යතා වාර්තා - feasibility report - සකස් කර අවශ්‍ය කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, දැනට අවිස්සාවේල්ල ඉඳලා ඕපනායක දක්වා දුම්රිය මාර්ගයේ අත් හරින කොටසකුත් තිබෙනවා. අන්න ඒ වාගේ තැන්වල ඉදි කරන අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් තීරණයක් ගන්න නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ නායකත්වයෙන් දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා,

සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා, ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා සහ කුමාර වෙල්ගම ඇමතිතුමා යන අයගෙන් යුත් අමාත්‍ය අනුකමිටුවක් පිහිටුවලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා වැදගත් තීන්දුවක් අරගෙන තිබෙනවා, මෙතෙක් යම් ආකාරයක වැඩ කටයුත්තක් කොයි පැත්තකින් හෝ සිද්ධ වුණා නම්, ඒක දැනට නවත්වා අමාත්‍යාංශ අනු කමිටුවක් මඟින් යම්කිසි තීන්දුවක් අරගෙන ඉතා පැහැදිලි ලෙස මේ සඳහා නීත්‍යානුකූලව කටයුතු කරන්න. ඒක තමයි විය යුතු දෙය. අතිගරු ජනාධිපතිතුමා ඒ ක්‍රියා මාර්ගය අර ගෙන තිබෙනවා. එතකොට සියලු දෙනාටම හැම පැත්තෙන්ම පැහැදිලි සාධාරණයක් ඉෂ්ට වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයට දුන් පිළිතුරෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කරන්නට යෙදුණා, අවිස්සාවේල්ලේ සිට ඕපනායක දක්වා අනවසර පදිංචිකරුවන් 6000ක් පමණ ඉන්නවාය, තට්ටු තුනේ ගොඩනැඟිලි පවා හදා තිබෙනවාය කියා. ඒ අතර ඇඹිලිපිටිය හරහා කතරගම දක්වා දුම්රිය මාර්ගය ගෙන යන්නත් බලාපොරොත්තු වෙනවා. එතකොට මේ ගොඩනැඟිලි ඉවත් කරනවා ද? ඒ එක්කම මේ නිසා මාතර සිට කතරගම දක්වා යන කෝච්චි පාර නතර වෙනවා ද?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

නැහැ. කිසිම ආකාරයකින් නවතින්නේ නැහැ. එම නිසා තමයි ප්‍රවාහන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මොරටුව විශ්වවිද්‍යාලය මඟින් ශක්‍යතා වාර්තා ලබා ගැනීමට කටයුතු කර ගෙන යන්නේ. යම් ආකාරයක උපකල්පනයක් තිබෙනවා මේ සම්පූර්ණ දුම්රිය මාර්ගය අවශ්‍ය වෙන්නේ නැහැ කියා. එයින් යම් කිසි කොටසක් අර ගෙන ඉංගිරිය හරහා යන්න පුළුවන්. භූගෝලීය සැලැස්ම මම දන්නේ නැහැ. නමුත් ඉංගිරිය හරහා ඇඹිලිපිටියට ගහින්, සූරිය වැව හරහා හම්බන්තොටට යන්න පුළුවන්. එතකොට ඒකේ ගැටලුවක් වන්නේ නැහැ. ඒ කටයුත්ත ක්‍රියාත්මක කර ගෙන යනවා. එතැනදී යම් කිසි අත හැරෙන කොටසක් තිබෙනවා නම් ඒ කොටස බදු දෙන්න හෝ ඒ නිවාස නීත්‍යානුකූල කරනවා නම් නීත්‍යානුකූල කරන්න හෝ කැබිනට් අනුකමිටුව හරහා තීරණයක් ගන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි. ඔක්කොම අවසන් වෙන්නේ හම්බන්තොටින්.

ප්‍රශ්න අංක. 10- 2155/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා මේ ටික කියන්න කැමැතියි. මේ ප්‍රශ්නයේ කොටස් දෙකක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයේ (අ)(i) කොටසින් අහනවා, 2011 වර්ෂය තුළදී දේශීය හා විදේශීය ආයෝජකයන්ට ලබා දීමට තීරණය කළ හෝ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද කියා.

සමහර ඒවා තීන්දු කරලා තිබෙනවා. හැබැයි ඒ තීන්දු කරපු ඒවාට අපි තවම ගිවිසුම් අත්සන් කර නැහැ. ඒ නිසා ඒවායේ මුදල් ප්‍රමාණයන් පිළිබඳ විස්තර මට සභාගත කරන්නට විධියක් නැහැ. මට සතියක කාලයක් ලබා දෙනවා නම් සාර්ථක පිළිතුරක් ලබා දෙන්නට පුළුවන්. ඒ සියල්ලම සතියක් ඇතුළත අවසන් කරනවා. එතකොට අපිට ඒ දුන් මුදල් ප්‍රමාණයන් සහ සියලු විස්තර ඉදිරිපත් කරන්නට පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඇත්තටම මෙයට පිළිතුර බලාපොරොත්තු වුණේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙනුයි. කමක් නැහැ, ඔබතුමා ඒකත් එක්ක එකතු කර පිළිතුර දෙන්න. මොකද, ඉඩම් අක්කර 2054ක් දේශීය හා විදේශීය ආයෝජකයන්ට ලබා දුන්නා කියලා එතුමා කළ ප්‍රකාශයක් අනුවයි මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒක ඔබතුමාට සම්බන්ධ වන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා වගා කරන ඉඩම් හෝ මොනවා හරි ඉඩම් දීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ප්‍රශ්නය ඇමතිතුමාගෙන් වෙනම අහන්නට ඕනෑ. ආයෝජකයන් සඳහා දීපු ඉඩම් සම්බන්ධයෙන් මට උත්තර දෙන්නට පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ආයෝජකයන් සඳහා දුන් ඉඩම් තමයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඉඩම් අමාත්‍යාංශයෙන් වගා කිරීම සඳහා බදු දුන් ඉඩම් ගැන වෙනම අහන්න. මම මේ ප්‍රශ්නය වෙන් කර ඒ සඳහා සතියක් ඇතුළත පිළිතුරු දෙන්නම්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව : ලාභය/ අලාභය

## இலங்கை ஏற்றுமதிக் கடன் காப்புறுதிக் கூட்டுத்தாபனம் : இலாப நட்டம்

## SRI LANKA EXPORT CREDIT INSURANCE CORPORATION: PROFIT/ LOSS

2204/'11

**11. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට අදාළව,

[ගරු රවි කරුණානායක මහතා]

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) සේවයේ යෙදවූ මුළු සංඛ්‍යාව, එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය කොපමණද;

(iv) රජය වෙත ගෙවන ලද අඩු කිරීම් හෝ බදු ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාවේ කවර හෝ මුදලක් කපාහැර තිබේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා වැඩියෙන් ඵලදායී ලෙස ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාවට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கடந்த ஐந்து ஆண்டுகளில் இலங்கை ஏற்றுமதிக் கடன் காப்புறுதிக் கூட்டுத்தாபனம் தொடர்பாக,

(i) பயன்படுத்தப்பட்ட மொத்த மூலதனம் மற்றும் ஒதுக்குகள் என்பன யாவையென்பதையும்;

(ii) இலாபம் அல்லது நட்டம் எவ்வளவு என்பதையும்;

(iii) மொத்த பணியாட்டொகுதியினர் எண்ணிக்கை, கிரயம் மற்றும் ஒரு பணியாளருக்கான இலாபம் போன்றன யாதென்பதையும்;

(iv) கழிப்பனவுகள் அல்லது அரசாங்கத்திற்கு செலுத்திய அறவீடுகள் யாதென்பதையும்

வருடாந்த அடிப்படையில் கூறுவாரா?

(ஆ) (i) இலங்கை ஏற்றுமதி கடன் காப்புறுதிக் கூட்டுத்தாபத்தின் ஏதாவது பணம் கடந்த 5 ஆண்டு காலப்பகுதியில் பதிவழிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், பதிவழிக்கப்பட்ட தொகை யாதென்பதையும்;

(iii) என்ன காரணத்திற்காக அவ்வாறு செய்யப்பட்டது என்பதனையும்;

(iv) அவ்வாறு எப்போது நடைபெற்றது என்பதையும்

அவர் கூறுவாரா?

(இ) (i) இலங்கை ஏற்றுமதி கடன் காப்புறுதிக் கூட்டுத்தாபனம் கடந்த 5 ஆண்டு காலப்பகுதியில் பணம் பயன்படுத்திய விதத்தைவிட சிறந்த முறையில் வினைத்திறனாக பயன்படுத்தியிருக்க முடியுமா என்பதையும்;

(ii) அவ்வாறாயின், அது எவ்வாறு செய்யப்படுகின்றது என்பதையும்;

(iii) இன்றேல், ஏன் அவ்வாறு செய்யப்படவில்லை என்பதையும்

அவர் சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state in relation to the Sri Lanka Export Credit Insurance Corporation for the last five years on per year basis -

(i) the total capital and reserves employed;

(ii) the profit or loss;

(iii) the total staff, cost and profit per employee; and

(iv) the deduction or levies paid to the Government?

(b) Will he also state -

(i) whether any money of the Sri Lanka Export Credit Insurance Corporation has been written off for the last five years;

(ii) if so, the amount written off;

(iii) for what reason it was done; and

(iv) as to when it was occurred?

(c) Will he inform this House -

(i) whether the Sri Lanka Export Credit Insurance Corporation could have efficiently used the money better than the way they were used for the last five years;

(ii) if so, as to how it is done; and

(iii) if not, as to why it is not so?

(d) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය (රු. මිලියන) | 30 | 30 | 30 | 30 | 30 |
| සංචිත (රු. මිලියන) | 827 | 901 | 1,041 | 1,098 | 1,190 |
| මුළු ප්‍රාග්ධනය සහ සංචිත | 857 | 931 | 1,071 | 1,128 | 1,220 |

(ii)

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| බදු හා විසරණයන්ට පෙර ලාභය (රු. මිලියන) | 84 | 116 | 131 | 108 | 113 |
| බදු හා විසරණයන්ට පසු ලාභය (රු. මිලියන) | 57 | 65 | 79 | 54 | 89 |

(iii)

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| සේවක සංඛ්‍යාව (වසර අවසාන) | 54 | 48 | 48 | 39 | 38 |
| සේවකයෙකු සඳහා පිරිවැය (රු.මිලියන) | 0.66 | 0.74 | 0.78 | 0.83 | 0.81 |
| සේවකයෙකු සඳහා බදු හා විසරණයන්ට පෙර ලාභය (රු.මිලියන) | 1.56 | 2.42 | 2.73 | 2.77 | 2.97 |
| සේවකයෙකු සඳහා බදු හා විසරණයන්ට පසු ලාභය (රු.මිලියන) | 1.06 | 1.35 | 1.65 | 1.38 | 2.97 |

ඊළඟට අහලා තිබෙනවා, ටිකක් තේරුම් ගන්න අමාරු ප්‍රශ්නයක්. එක් සේවකයකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයකුගෙන් ලැබූ ලාභය යනාදී විස්තර අහලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විස්තර වගයක් තිබෙනවා. මම එය **සභාගත*** කරන්නම්. [බාධා කිරීමක්] එහි හුඟාක් විස්තර තිබෙනවා. ඒකයි.

(iv)

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ගෙවන ලද බදු (රුපියල් මිලියන) | 29.79 | 68.55 | 75.23 | 67.58 | 39.07 |

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ඇ) (i) පසු ගිය වසර 05ක කාලය තුළ උපරිම ඵලදායී ලෙස එම මුදල් පරිහරණය කර ඇත.

(ii) පැන නොනඟී.

(iii) සංස්ථාවේ විධිවිධානය වනුයේ අපනයනකරුවන්ට අපනයන ණය රක්ෂණ පහසුකම් හා බැංකු වෙත ඇප සහතික නිකුත් කිරීම මඟින් අපනයන ප්‍රවර්ධනය කිරීමය. එම ක්‍රියාවලියේදී, රක්ෂණය සහ ඇප සහතික ක්‍රමයන්ගේ කාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් අවසානයේදී අපනයනකරුවන්ට හිමි අරමුදලක් එක්රැස් වී ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී අපනයනකරුවන්ට උපකාර වීම පිණිස මෙම අරමුදල භාවිත කරන බැවින් මෙම අරමුදලෙහි භාරකරුවෙකු ලෙස සංස්ථාව ක්‍රියා කරයි. එබැවින්, පළමුවෙන්ම එම අරමුදල් සුරැකි වන ලෙසද, දෙවනුව අවශ්‍ය ද්‍රවශීලතාවය පවත්වා ගෙන යන අයුරින්ද, තෙවනුව ප්‍රතිලාභ ලබා ගත හැකි ආකාරයෙන්ද තහවුරු වන ලෙස රජයේ සුරැකුම් සහ රාජ්‍ය බැංකුවල තැන්පතු වැනි වඩාත් සුරක්ෂිත මෙවලම් ආකාරයෙන් මෙම අරමුදල් ආයෝජනය කිරීම සැමවිටම සංස්ථාවේ ප්‍රතිපත්තියක් යන ක්‍රියා පටිපාටියෙනි.

කෙසේ වුවද, රුපියල් මිලියන 30ක් පමණ වූ දායක ප්‍රාග්ධනය, ව්‍යාපාරයෙන් පැන නඟින ඉතිරිව ඇති වගකීම් පියවීම සඳහා වූ හිතකර අරමුදල් තත්ත්වයන් වන රුපියල් බිලියන එකකටත් වඩා ළඟාවීම යන කරුණු, සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය එහි අරමුදල් පදනම ස්ථිර වර්ධනයක් පවත්වා ගෙන යෑම සඳහා ඉවහල් වන බවට සාක්ෂියකි.

අරමුදලක් ගොඩනැඟීම පනතින් නියම කර ඇති අවශ්‍යතාවක් වන අතර, අවදානම ප්‍රාරක්ෂණයට උපකාරී වීම සඳහා ප්‍රමාණවත් සංචිත පැවැතීම තහවුරු කරනු වස් සංස්ථාව එසේ ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

(ඈ) පැන නොනඟී.

I hope you could understand all that jargon.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

What makes you think that I do not understand it? Do you understand what you told Parliament?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

No, no. I am just telling you that some of these translations are -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Your sarcasm is good for your party, not for the Opposition.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

No, no. Some of those translations have to be explained.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Just because your professor does not understand, do you think that we also do not understand it? Do not think of us at that level.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I am only talking about the jargon. You cannot understand a joke also.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I have a sense of humour that you do not seem to have. Just because you are mature in age and profession, it does not mean that you need to be sarcastic.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගැටුම් නැතිව හරස් ප්‍රශ්න අහන්න. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am not a

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

Hon. Minister, my first Supplementary Question is this. The SLECIC was incorporated then by the Hon. Lalith Athulath Mudali to ensure that exports to countries to which normal exporting terms do not apply are given a comfort factor. But now, the SLECIC does not seem to be giving a comfort factor to certain areas to which Sri Lankan exporters can export without fear. For exports to countries like Iran, Iraq and Russia, the SLECIC does not offer any insurance covers. So, would this Ministry help the exporters - there are quite a lot of exporters - who want to export to those countries? But, owing to the fact that a conducive climate for exports is non-prevalent in those countries, that is not offered. Therefore, could you please ensure that the very motive for bringing SLECIC into existence is brought into play at this moment? Did you understand what I said?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
I agree with what you say because there are so many obstacles to local exporters, particularly in the legal field. Only yesterday, with His Excellency the President of Uganda, we discussed the necessity of -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Ugandan President?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes, he is here. You may not know but he happens to be here. - [*Interruption.*] I will explain to you. I am, with some degree of responsibility, trying to tell you that what you said is correct because there are so many exporters and so many investors, particularly in the mini-hydro field, who cannot get there because of the absence of an import-export bank in Sri Lanka. They cannot get that type of credit easily, which many other investors in other countries can do. For example, in India. As you know, most of these countries are going towards setting up import-export banks. So, I am only confirming what you said, that we have to look at those instruments and create new instruments which would help exporters as well as investors because our policy is to allow our blue-chip companies and our good investors to go and invest in other countries as well. So, there is no contradiction.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
My question is not about an import-export bank or helping blue-chip companies. The concept of the Hon. Lalith Athulath Mudali then was to help the small and medium enterprises to go into countries to which hitherto we have never exported. It is not an import-export bank.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
So, that is exactly what I said.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, that is not what my question is about. You have to answer my question, not say what you feel should be said. My question was about ensuring that you help the small and medium exporters to take our exports to countries that they never think they could go. To countries such as Iran and Iraq, people do not want to export these days because there is no L/C that performs.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
So, what is your question?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
My point is that insurance premium should be to that type of countries. Why has SLECIC not allowed that and is not doing so? When the Hon. Ranil Wickremasinghe's Government was there, when this was in our charge, we ensured that we went into these types of things. The then Chairman, Mr. Hemaka de Alwis, ensured that we went into it but since 2005, they have stopped it.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
All this lecturing is of absolutely no use. Can you give me some examples where a particular -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Iran, Iraq, Yemen, Oman - [*Interruption.*]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

If you can give me some specific examples, I can answer. Otherwise, how can I answer? Hon. Speaker, how on earth can I answer these highly generalized and, in my opinion, fictitious statements in this House?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I told you just now. Iran -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

If you give me specific cases that Mr. "X" or so-and-so wanted to export to such and such a country and was deprived of that by the SLECIC, then I can give you an answer. But, how can I give answers to this sort of fishing expeditions? - [*Interruption.*] So, give an example.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්න තුනක් අහන්න. හැබැයි විස්තර -[බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Almost Rs. 10 billion accrued in Russia was lost to Ukraine. So, where is SLECIC? Is it helping?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

So, ask that as a question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

If you want a specific case, the Standard Trading -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, විස්තර කියන්නේ නැතුව තුන්වන අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

අදාළ ප්‍රශ්නයක් අහන්න. එතකොට පිළිතුරු දෙන්න පුළුවන්. අපට හංගන්න වුවමනාවක් නැහැ.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් ගරු සභාවේදී ඒ කාරණය කියලා, ඒ ගැන අතුරු ප්‍රශ්නයක් ඇහුවාම මට උත්තරයක් දෙන්න විධියක් නැහැ නේ. ප්‍රශ්නයක් තිබෙනවා නම් වෙනම අහන්න අපි දන්නේ නැහැ ඒ තිබෙන පසුබිම මොකක්ද කියලා. ඒකට හේතු සාධක ඔක්කෝම අපි ඉදිරිපත් කරන්නම්. නමුත් මෙතැනදී ඔබතුමා නැඟිටලා, - [*Interruption.*] If you ask a specific Question, then I can answer on a subsequent occasion.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ වාගේ ප්‍රශ්නවලට උත්තර ලබා ගන්න ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කළ යෝජනාව වඩා ඵලදායකයි. වැය ශීර්ෂ යටතේ මේ වාගේ දීර්ඝව සාකච්ඡා කරන්න පුළුවන්. දැන් තිබෙන්නේ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න තුනක් කෙටියෙන් අහන එකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කථා පැවැත්වූවාම අතුරු ප්‍රශ්න කීයක්ද කියලා මට ගණන් කර ගන්න බැහැ නේ. දැන් කරන්න දෙයක් නැහැ. කථා පවත්වන්නේ නැතුව ඇහුවා නම් අවස්ථාව දෙන්න තිබුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් තිබෙනවා අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තවත් කථාවක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ, නැහැ. කථාවක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම නම් කෙටියෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මා ගෞරවයෙන් මේ අතුරු ප්‍රශ්නය අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ටිකත් වැඩක් නැහැ. අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. ඔබතුමාටත් ගෞරව කරලා, එතුමාටත් ගෞරව කරලා මේ ප්‍රශ්නය අහන්නේ බැංකු සහකාර සේවය සම්බන්ධවයි. ලංකා බැංකුවේ බඳවා ගැනීම්,- [බාධා කිරීමක්] නැහැ ඔබතුමා මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා විධියට,- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒකයි මා මේ අහන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයට අදාළ නැති අතුරු ප්‍රශ්න අහන්න බැහැ. අවුරුදු කීයක් වෙනවාද ඔබතුමා පාර්ලිමේන්තුවට ඇවිත්?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක්.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, they are abusing-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 - 2260/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 - 2324/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1-1407/'11-(2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා දෙවැනි වතාවටයි ප්‍රශ්නය අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-2539/'12-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් දෙන්න තිබෙනවා. එම නිසා මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-2557/'12-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-2855/'12-(1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-2540/'12-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, ඒ සඳහා දීර්ඝ පිළිතුරක් දෙන්න තිබෙනවා. එබැවින් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දීර්ඝ පිළිතුරක් නම්, පිළිතුර සභාගත කළාම හරි නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
දීර්ඝ පිළිතුරක් ලබා ගන්න තිබෙනවා, ගරු කථානායකතුමනි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## භූමිතෙල් සහ ඩීසල් සහනාධාරය : වෙන් කළ මුදල
### டீசல் மற்றும் மண்ணெண்ணெய் மானியங்கள் : ஒதுக்கிய பணம்
### GRANT OF KEROSENE AND DIESEL SUBSIDIES : MONEY ALLOCATED

2624/'12

**14. (ගරු ජෝන් අමරතුංග මහතා - ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sunil Handunnetti)
ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2007 වර්ෂයේදී ඉන්ධන මිල ඉහළ ගිය අවස්ථාවේදී,

(i) ජනතාවට භූමිතෙල් සහ ඩීසල් සහනාධාර ලබා දුන්නේද;

(ii) එසේ නම්, එක් පවුලක් සඳහා ලබා දුන් භූමිතෙල් සහනාධාරයේ වටිනාකම කොපමණද;

(iii) භූමිතෙල් සහනාධාර ලබා දීමට ප්‍රතිලාභීන් තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(iv) එම භූමිතෙල් සහනාධාරය ලබා දීමට 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඩීසල් සහනාධාරය ලබා දුන්නේ කා සඳහාද;

(vi) ධීවර ජනතාවටද ඩීසල් සහනාධාර ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී තිබුණේද;

(vii) එසේ නම්, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී ධීවර ජනතාවට ඩීසල් සහනාධාරය ලබා දීමට වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිදි ඩීසල් හා භූමිතෙල් සහනාධාර ලබා දී නොමැති නම්, 2007 සිට මේ දක්වා ජනතාව රවටා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නො එසේ නම්,ඒ මන්ද?

பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2007 இல் எரிபொருள் விலை அதிகரித்த போது,

(i) மக்களுக்கு டீசல் மற்றும் மண்ணெண்ணெய் மானியங்கள் வழங்கப்பட்டனவா என்பதையும்;

[ගරු ජෝන් අමරතුංග මහතා]

( ii ) அவ்வாறெனின், குடும்பமொன்றுக்கு வழங்கப்பட்ட மண்ணெண்ணெய் மானியத்தின் பெறுமதி எவ்வளவு என்பதையும்;

( iii ) மண்ணெண்ணெய் மானியத்தை வழங்குவதற்காக பயனாளிகள் தெரிவுசெய்யப்பட்ட முறைமை யாதென்பதையும்;

( iv ) அந்த மண்ணெண்ணெய் மானியத்தை வழங்க 2008, 2009, 2010 மற்றும் 2011ஆம் ஆண்டுகளில் ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

( v ) டீசல் மானியம் வழங்கப்பட்டவர்கள் யாவர் என்பதையும்;

( vi ) மீனவர்களுக்கு டீசல் மானியம் வழங்கப்படுமென வாக்குறுதி வழங்கப்பட்டிருந்ததா என்பதையும்;

( vii ) அவ்வாறெனின், 2008, 2009, 2010 மற்றும் 2011 ஆம் ஆண்டுகளில் மீனவர்களுக்கு டீசல் மானியம் வழங்க ஒதுக்கப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) மேற்கூறியவாறு டீசல் மற்றும் மண்ணெண்ணெய் மானியங்கள் வழங்கப்படவில்லையெனில், 2007 தொடக்கம் இதுவரை மக்கள் ஏமாற்றப்பட்டுள்ளார்கள் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Industries:

(a) Will he state -

(i) whether kerosene and diesel subsidies were granted to people when fuel prices went up in 2007;

(ii) if so, the value of the kerosene subsidy granted to one family;

(iii) the methodology adopted for selecting the recipients of kerosene subsidy;

(iv) separately, the amounts of money allocated in the years 2008, 2009, 2010 and 2011 in order to grant the aforesaid kerosene subsidy;

(v) the persons to whom the diesel subsidy was granted;

(vi) whether a pledge had been made to grant a diesel subsidy to the fishing community too; and

(vii) if so, the amounts of money allocated in the years 2008, 2009, 2010 and 2011 separately, in order to grant the diesel subsidy to the fishing community?

(b) If diesel and kerosene subsidies have not been granted as mentioned above, will he admit that the people have been deceived since 2007 up to now?

(c) If not, why?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(vi) නොදනී.

(vii) ඩීසල් සහනාධාරය මෙම අමාත්‍යාංශයෙන් ලබා නොදෙයි.

(ආ) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

## 2012.11.09 දින වැලිකඩ බන්ධනාගාරයේ ඇති වූ සිද්ධිය: පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 2012.11.09ஆம் திகதி வெலிக்கடைச் சிறையில் நடந்த சம்பவம்: புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரின் கூற்று
## INCIDENT AT WELIKADA PRISON ON 09.11.2012 : STATEMENT BY MINISTER OF REHABILITATION AND PRISON REFORMS

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් 2012.11.12 වන දින අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු කථානායකතුමනි, එතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරමින් තුවාල වූ සංඛ්‍යාව පිළිබඳ ඉදිරිපත් කළ කරුණු ගැන මගේ විවාදයක් නැහැ. නමුත් ඊට පසුව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ආචෝප වශයෙන් ඉදිරිපත් කළ කරුණු පිළිබඳ මගේ එකඟත්වයකුත් නැහැ. එතුමා එහිදී වෙන් වෙන් වශයෙන් ප්‍රශ්න අටක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒ ප්‍රශ්න අටට පිළිතුරු මෙසේ ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවැනි ප්‍රශ්නය වුණේ, වැලිකඩ බන්ධනාගාරය වෙත පොලිස් විශේෂ කාර්ය බලකාය හා

ආරක්ෂක හමුදාවන් මැදිහත් කිරීම සඳහා නියෝග ලබා දෙන ලද්දේ කවුරුන්ද යන්නයි.

එයට පිළිතුර මෙකයි.

බන්ධනාගාර බුද්ධි අංශය මෙහෙය වන සෝදිසිය සඳහා පොලිස් විශේෂ කාර්ය බළකායේ සහය ලබා දෙන මෙන් බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයාගේ ඉල්ලීමට අනුව පොලිස් විශේෂ කාර්ය බළකායේ සහාය බුද්ධි අංශය වෙත ලැබුණි යන්නයි.

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සභාවට ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙන නිසා ප්‍රශ්න නැවත කියවන්න ඕනෑ නැහැ කියා මම හිතනවා.

දෙවැනි ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

වැලිකඩ බන්ධනාගාරය තුළ පිහිටි එල් සහ වැපල් වාට්ටු වසර ගණනාවක සිට පරීක්ෂාවට ලක් කර නැත, එයට හේතු වූයේ එම පරීක්ෂාව සඳහා රැඳවියන් විසින් අවස්ථාව ලබා නොදෙමින් පළ කරන ලද විරෝධතාවයි. තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් පිරිස් ඒ සඳහා ලබා දෙන ලෙස බන්ධනාගාර නිලධාරින් විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම අංශ පරීක්ෂාව සඳහා පොලිස් විශේෂ කාර්ය බළකායේ සහය ලබා ගැනීමට තීරණය කරන ලදී.

මෙම වාට්ටු දෙකෙහිම සිටින්නේ බරපතළ වැරැදි කරන ලද විශේෂ ගණයේ සිරකුරුවන් සහ සැකකරුවන්. බන්ධනාගාරය තුළ සිට රට තුළ අපරාධ මෙහෙය වන බවට සහ මත් ද්‍රව්‍ය ජාවාරම මෙහෙය වන බවට ආරක්ෂක අංශ විසින් වරින් වර අප වෙත කරන ලද දැනුම් දීම අනුව මෙම වාට්ටු දෙක සෝදිසි කිරීම අපේ අරමුණ විය. එසේම, මීට ඉහතදී කොළඹ රක්ෂිත බන්ධනාගාරය, බන්ධනාගාර බුද්ධි අංශය විසින් පොලිස් විශේෂ කාර්ය බළකායේ සහායෙන් කරන ලද වැටලීමෙන් ජංගම දුරකථන 127ක් සහ විෂ මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සොයා ගත හැකි වූ අතර, එම ජංගම දුරකථන මඟින් රට පුරා අපරාධ මෙහෙය වීම සම්බන්ධ තොරතුරුද, වෙනත් රටවල් සමඟ පැවැත්වූ සම්බන්ධතා ද අනාවරණ කර ගත හැකි වූ බව ත්‍රස්ත විමර්ශන අංශය විසින් අපට දැනුවත් කර ඇත. එමෙන්ම, එදා සිදු කරන ලද සෝදිසියේ මෙවැනි සිදු වීමක් සිදු නොවූ බව ද දන්වා සිටිමි. මම මේ කියන්නේ කොළඹ රක්ෂිත බන්ධනාගාරයේ කලින් කරන ලද සෝදිසි මෙහෙයුම ගැන. ඒ අනුව මෙම අවස්ථාවේදී ද සෝදිසිය සඳහා අවශ්‍ය අධිතාක්ෂණික උපකරණ සහ ඒවා භාවිතාවට පුහුණුව ලත් විශේෂ පොලිස් කාර්ය බළකායේ සහයෝගය බන්ධනාගාර බුද්ධ අංශයට ලබා ගැනීම අපේක්ෂාව විය.

තුන්වැනි ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

එම සෝදිසි මෙහෙයුම සිදු වන අවස්ථාවේ ගැටුමක් හෝ නොසන්සුන්තාවක් නොපැවතිය ද, සෝදිසියෙන් පසු නීති විරෝධී ලෙස ළඟ තබා ගත් විෂ මත් ද්‍රව්‍ය ග්රෑම් 18ක් සහ මිලිග්රෑම් 790ක් ද, -ග්රෑම් 2ක් තිබුණත් මරණීය දණ්ඩනය හිමි වෙනවා- ජංගම දුරකථන 41ක් ද, ඊට අමතර සිම් කාඩ් 22ක් ද, මුදල් වශයෙන් රුපියල් 2,140ක් ද බන්ධනාගාර බුද්ධි අංශය විසින් තම භාරයට ගැනීමෙන් පසුව නොසන්සුන් වූ රැඳවියන් සෝදිසිය අවසන් කොට පිට වන බන්ධනාගාර බුද්ධි අංශ නිලධාරින් සහ පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරින් වෙත ගල් මුල් ප්‍රහාරයක් එල්ල කළ බව වාර්තා වේ. එහිදී එක් බන්ධනාගාර නිලධාරියෙකුට තුවාල සිදු විය. ඒ අවස්ථාව වන විට බන්ධනාගාර බුද්ධි අංශයේ සහ පොලිස් විශේෂ කාර්ය බළ කායේ නිලධාරින් බන්ධනාගාරයෙන් පිටතට පැමිණ සිටි අතර, ඔවුන් වෙතද ගල් මුල් ප්‍රහාර එල්ල කරමින් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙමින් දේපොළවලට අලාභ හානි කොට, අවි ගබඩා දෙකෙන් එකක් බිඳ අවි පැහැර ගෙන, බන්ධනාගාර භූමියේ එළියේ සිටි නිලධාරින්ට මෙන්ම සිවිල් වැසියන්ට ද වෙඩි ප්‍රහාර එල්ල කරමින් බන්ධනාගාර භූමියෙන් පැන යෑම ආරම්භ කර ඇත. එම ප්‍රහාරයේදී පොලිස් විශේෂ කාර්ය බළ කායේ අණ දෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති රණවන මහතා ඇතුළු තවත් නිලධාරින් පිරිසකට බරපතල තුවාල සිදු වී ඇත. එම ක්‍රියාවට සමගාමීව අවි රැගෙන වහල මත නැග ගත් රැඳවියන් බන්ධනාගාරය ඇතුළතට සහ පිටතට වෙඩි ප්‍රහාර එල්ල කරමින් හැසිරුණු ආකාරය විද්‍යුත් මාධ්‍ය මඟින්ද දැක ගත හැකි විය.

හතර වන ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

ගැටුමෙන් මිය ගිය සංඛ්‍යාව 27කි. (සිරකරුවන් 14ක්ද, රක්ෂිත බන්ධනාගාරගත වූ අය 13ක්ද වේ.) ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් අහලා තිබුණේ සිරකරුවන් කොපමණද, රැඳවියන් කොපමණද කියලායි. මා හිතන හැටියට රක්ෂිත අය පිළිබඳව ඒ අදහස වෙන්න ඇති ගන්න ඇත්තේ.

ගැටුමෙන් තුවාල ලැබූ සිරකරුවන් සංඛ්‍යාව 19ක්ද, රක්ෂිත බන්ධනාගාරගත වූ සංඛ්‍යාව 7ක්ද වශයෙන් 26කි. එම අය අතර එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ අය හෝ -මේක වැදගත්- විදේශීය රැඳවියන් හෝ කිසිවකු නොමැති බව මෙම සභාවට අවධාරණය කරමි. වැරැදි තොරතුරු ලෝකයට යනවා, එල්ටීටීඊ රැඳවියන්ට හා විදේශීය රැඳවියන්ට තුවාල වුණාය කියලා. එවැනි කිසිවක් සිදු වෙලා නැහැ.

පස්වන ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

මිය ගිය රැඳවියන්ගේ මෘත ශරීර ළඟම ඥාතීන් හට භාර දීමත්, තුවාල ලැබූ රැඳවියන් හට අත්‍යවශ්‍ය ප්‍රතිකාර ලබා දීමත් ආණ්ඩුව විසින් සිදු කරනු ලැබේ. මේ වන තෙක් මෘත ශරීර 5ක් භාර ගන්න කිසිවකු පැමිණ නැති බව අද උදේ වන කොට වාර්තා වුණා.

හයවන ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

(i.) එවැනි ගැටුමක් ඇති කිරීමට තුඩු දුන් තීන්දු හා තීරණ ගත් කිසිදු නිලධාරියෙක් පිළිබඳ මේ වන තෙක් වාර්තා වී නොමැත.

(ii.) මේ සම්බන්ධයෙන් අපක්ෂපාතී පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයකුගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරනු ලැබ ඇත.

හත්වන ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

(i.) හයවන ප්‍රශ්නයට දැක්වූ පිළිතුර පරිදිම එවැනි ගැටුමකට මැදිහත් වීම කරනු ලැබූ තීන්දු හෝ තීරණ ගත් නිලධාරියෙක් මේ වන තෙක් වාර්තා වී නැත.

(ii.) එවැනි තත්ත්වයක් පරීක්ෂණයෙන් අනතුරුව අනාවරණය වුවහොත් බන්ධනාගාර ආඥාපනතේ නීතිරීතිවලට අනුකූලව කටයුතු කරනු ලැබේ.

අටවන ප්‍රශ්නයට පිළිතුර මෙකයි.

බන්ධනාගාර ආඥාපනතේ 77වන වගන්තිය සහ ඊට අදාළ නීති රෙගුලාසි යටතේ -20වන රෙගුලාසිය යටතේ- මේ සඳහා නෛතික ප්‍රතිපාදන සලසා ඇත. තවද, ජීවිත හා දේපළ ආරක්ෂාව සඳහාත්, සාමයට බාධා වන කැරලිකාරිත්වය මැඩලීම, නීතිය හා සාමය සුරැකීම උදෙසාත් ආරක්ෂක අංශවලට මැදිහත් වීමට නීතිමය ප්‍රතිපාදන ඇති බව සඳහන් කරමි. ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ගැන විශේෂ කාරක සභාවක් පත් කරන්නය කියලා විපක්ෂයෙන් ඉල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමා දීපු උත්තරය අපට පිළිගන්න අමාරුයි. ප්‍රවෘත්තිවල තිබෙන්නේ මීට හාත්පසින්ම වෙනස් දේවල්. ඒක නිසා විශේෂ කාරක සභාවක් ඉක්මනින්ම පත් කරලා මෙහි ඇත්ත තත්ත්වය රටට එළි කරන්න අපට අවස්ථාව දෙන්නය කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
පත් කර තිබෙන විනිශ්චයකාරවරු කවුද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒක වෙනම අහන්න. මේ ප්‍රශ්නයට අදාළ -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පත් කරලා නම් ඒ අයගේ නම් කියන්න.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අවශ්‍ය නම් මම ඒ අයගේ නම් කියන්නම්, කාගේ කාගේ ප්‍රධානත්වයෙන්ද කියලා.

මෙන්න මේ අයගෙන් තමයි කමිටුව පත් කර තිබෙන්නේ. විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා, විශ්‍රාම ලත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගුණසේන තේනබදු මැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එතුමා විනිශ්චයකාරයෙක් නොවෙයි නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
නැහැ නැහැ. විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් තමයි මේ කමිටුව පත් කළේ. [බාධා කිරීමක්] ඔව්. එක්කෙනායි. එතුමාගේ සභාපතිත්වයෙන් තමයි කමිටුව පත් කළේ. එක එක අංශවලින් සම්බන්ධ කළේ. පොලිස් දෙපාර්තමේන්තුව, ජ්‍යෙෂ්ඨ නීති උපදේශක ලලිත් අන්ද්‍රාහැන්නදි මහතා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඒක අපිට පිළිගන්න බැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
තමුන්නාන්සේලාට මොකක් කළත් පිළිගන්න බැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, අපට කිව්වේ විනිශ්චයකාරවරු තුන් දෙනෙක් පත් කරනවා කියලායි. අප බලාපොරොත්තු වුණේ අඩු ගණනේ විශ්‍රාම ගිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකුයි, මහාධිකරණයේ කෙනෙකුයි, අභියාචනාධිකරණයේ කෙනෙකුයි පත් කරාවි කියලා. 27 දෙනෙක් මැරුණ සිද්ධිය ගැන පරීක්ෂා කරන්න ආණ්ඩුවේ නීති උපදේශකයෙකුයි, විශ්‍රාම ගිය පොලිස් නිලධාරියෙකුයි, මහාධිකරණයේ කෙනෙකුයි තමයි පත් කර තිබෙන්නේ. If 27 people died, there should be, at least, a trial-at-bar.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් තමයි මේ කමිටුව පත් කර තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාපති එතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
විශ්‍රාම ගිය කෙනෙක් මේ පත් කර තිබෙන්නේ. මොකක්ද මෙකේ වටිනාකම? What is the cover-up that is being done?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු රනිල් වික්‍රමසිංහ මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ රජයේ ස්ථාවරත්වය
### 13ஆவது அரசியலமைப்புத் திருத்தம் தொடர்பிலான அரசின் நிலைப்பாடு
### GOVERNMENT STANCE ON THIRTEENTH AMENDMENT TO THE CONSTITUTION

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, 2009 වසරේ මැයි 26වැනි දා එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා සහ ශ්‍රී ලංකා ආණ්ඩුව ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කළා. එම ප්‍රකාශයේ මෙසේ සඳහන් වෙනවා:

"ශ්‍රී ලංකාවට තිරසාර සාමය හා සංවර්ධනය ලබා දීමේ ක්‍රියාවලිය සහතික කරලීම උදෙසා, දෙමළ පක්ෂ ඇතුළු අනෙකුත් දේශපාලන පක්ෂ සමඟ පුළුල් ලෙස සාකච්ඡා පැවැත්වීමටත්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරලීමටත් තමා තුළ ඇති දෘඪ අභිලාෂය ජනාධිපති රාජපක්ෂ මහතා පළ කර සිටියේය".

ඇත්ත වශයෙන්ම ඒ අවුරුද්දේ මැයි 29 වැනිදා එක්සත් ජාතීන්ගේ ජිනීවා මානව හිමිකම් මණ්ඩලයට ශ්‍රී ලංකා ආණ්ඩුව ඉදිරිපත් කරපු යෝජනාවේත් අපි මේ ගැන සඳහන් කළා. ඒ මෙසේයි.

" Further welcomes the visit to Sri Lanka of the Secretary-General at the invitation of the President of Sri Lanka, and endorses the joint communiqué issued at the conclusion of the visit and the understandings contained therein; "

මේ ආකාරයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව අවස්ථා ගණනාවකදීම ලිඛිතවත්, වාචිකවත් පවසා ඇත්තේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සිදු කෙරුණු බලය බෙදා හැරීම තවතවත් ක්‍රමවත් හා ශක්තිමත් කරන බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ පමණක් නොව වෙනත් පාර්ශ්වයන් සමඟද නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශයන්හි මේ බව සඳහන් කර තිබෙනවා. අපේ අසල්වැසි රාජ්‍යය වන ඉන්දියාව සමඟ එක්ව 2011 මැයි 17 වැනිදා නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශයේ සඳහන් වන්නේ මෙහෙමයි:

" දෙමළ පක්ෂ නියෝජිතයන් සහ ආණ්ඩුව අතර දැනට පවත්වන සාකච්ඡාවන්වලින් කඩිනම් හා තිරසාර වර්ධනයක් ලබා ගැනීම සහතික කිරීම ආණ්ඩුවේ අභිලාෂය බව ශ්‍රී ලංකා විදේශ අමාත්‍යවරයා අවධාරණය කළේය. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කර ගත් බලය බෙදා හැරීමේ යෝජනාවලියක් එවැනි ප්‍රතිසන්ධානයක් සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාලනු ඇත".

ආණ්ඩුව විටින් විට එවැනි ප්‍රකාශ සිදු කළත්, දැන් දැන් අපට ඇසෙන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් භූමිකාවක්; වෙනස් හඬක්. රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන නිලධාරියෙකු වූ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළ යුතු බව ප්‍රකාශ කරනවා. ආණ්ඩුවේ දේශපාලන සගයන් නඟන්නේද ඊටම සමාන්තර හඬවල්. ජාතික හෙළ උරුමය නිවේදනයක් නිකුත් කරමින් මේ අදහසම ප්‍රකාශ කරනවා. අමාත්‍ය විමල් වීරවංශ මහතා ජනාධිපතිවරයාට ලිපියක් යවමින් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම සඳහා ජන මත විමසුමක් පවත්වන්නැයි ඉල්ලනවා. අපි එක්කත් ඇමතිතුමා ඒ ගැන සඳහන් කළා. ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායක දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත්, එතුමාගේ මහජන එක්සත් පෙරමුණත් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න යැයි ඉල්ලා සිටිනවා. ආණ්ඩුවේ ජනමාධ්‍ය ඔස්සේත් නැඟෙන්නේ මේ හඬමයි. ඒ නිසා මෙය සංවිධානාත්මක ලෙස සිදු කෙරෙන ක්‍රියාවලියක් බව ඉතාම පැහැදිලියි. මෙයින් හැඟී යන්නේ ආණ්ඩුව තමන් කලින් දැරූ ස්ථාවරය වෙනස් කර ඇති බවක්ද, එසේත් නැතිනම් ආණ්ඩුවේ නිලධාරින්, සගයින් හා ජනමාධ්‍ය ආණ්ඩුවට එරෙහි මතයක් දරනවාද යන්නයි.

මෙවැනි ප්‍රතිවිරුද්ධ මතවාදයන් ආණ්ඩුවේ විවිධ පාර්ශ්වයන්ගෙන් එළි දැකීම දේශීය වශයෙන් පමණක් නොව, ජාත්‍යන්තර වශයෙන්ද අපේ රට අපකීර්තියට හා අපහසුතාවට පත් කෙරෙන්නක්.

අපි එක ස්ථාවරයක ඉන්න ඕනෑ. කොයි දේ වුණත් ආණ්ඩුව එක ස්ථාවරයක ඉන්න ඕනෑ.

ඒ නිසා මේ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය පැහැදිලි කරමින් මතු දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන ලෙස මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

01. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා සමඟ එක්ව නිකුත් කළ 2009 මැයි 26 වන දිනැති ඒකාබද්ධ නිවේදනය හා ඉන්දීය රජය සමඟ එක්ව නිකුත් කළ 2011 මැයි 17 දිනැති ඒකාබද්ධ නිවේදනය දැන් ආණ්ඩුව ප්‍රතික්ෂේප කරනවාද?

02. එසේ ප්‍රතික්ෂේප කරනවා නම්, ආණ්ඩුවේ වර්තමාන ස්ථාවරය කුමක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ අද නඟන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් නඟන ලද ප්‍රශ්නයේ ප්‍රධාන හරය වනුයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළ යුතු යැයි රටේ විවිධ දේශපාලන පක්ෂ හා පුද්ගලයින් විසින් කර ඇතැයි කියනු ලබන ප්‍රකාශයන් පිළිබඳව රජයේ ස්ථාවරය කුමක්ද යන්නත්, ශ්‍රී ලංකාවට තිරසාර සාමයක් හා සංවර්ධනයක් ලබා දීමේ ක්‍රියාවලිය සහතික කිරීම උදෙසා මීට පෙර කරන ලද්දේ යැයි කියන ප්‍රකාශයන් පිළිබඳව ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය ඉදිරිපත් කරන ලෙසත්ය.

මේ වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 18 වතාවක් සංශෝධනයට භාජනය කර ඇත. එක්සත් ජාතික පක්ෂ රජය විසින් 16 වතාවක් ද, අප රජය මඟින් දෙවතාවක් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර ඇති බව මෙම ගරු සභාවේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු හැම විටම සංශෝධනයන්ගෙන් තොරව තිබිය යුතු ලේඛනයක් නොවන අතර, සමාජයේ කාලීන අවශ්‍යතා අනුවත්, ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේදී ලබා ගනු ලබන අත් දැකීම් පදනම් කර ගනිමින් පුළුල් ජනතා මතයක් අනුව කාලීනව වෙනස් විය යුතු ලේඛනයක් බවත් අප රජය විශ්වාස කරයි.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" යටතේ මේ පිළිබඳ ඉතා පැහැදිලි විග්‍රහයක් එහි 50 වන පිටුවේ දක්වා ඇති අතර, එය මෙම ගරු සභාවට නැවත වරක් මා මතක් කර දීමට අවස්ථාවක් කර ගනිමි.

I quote:

"පළාත් සභාව.

දශක දෙකක් තුළ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් අපට අත් දැකීම් රැසක් ලැබී තිබේ. ගැළපෙන නොගැළපෙන, අලුතින් එක් කළ යුතු, ඉවත්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

කළ යුතු ආදී ලෙස විවිධ අදහස් ඒ හා සමඟම මතු වී තිබේ. පළාත් සභා ක්‍රමයට කැමති, අකැමැති පිරිස් ද අප අතර සිටිති.

කෙසේ වෙතත් එය අපේ ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය ලෙස රටේ මූලික නීතියට ද එකතු වී ක්‍රියාත්මක වෙමින් පවතී. දහතුන්වැනි සංශෝධනය හා පළාත් සභා ක්‍රමය පිළිබඳ විවෘත සාකච්ඡාවකට මම එළඹෙමි.

අප විසින් සියලු පක්ෂ හා සංවිධාන සමඟ කර ගන්නා සාකච්ඡාවේ පදනමක් වන්නේ එකී විවෘත සාකච්ඡාවයි.

අතීතයේ විවිධ අවස්ථාවල දී රට සභා, දිස්ත්‍රික් සංවර්ධන සභා, ප්‍රාන්ත සභා ආදී ලෙස සිදු කළ යෝජනා පිළිබඳවද එහිදී සාකච්ඡා කළ හැක. අපට අවශ්‍ය බෙදී වෙන් වන දෙසට නොව, රටේ ඒකීය භාවය තහවුරු වන ලෙස ගොඩ නැඟෙන ප්‍රාදේශීය පාලනයක් බව සිත්හි තබා ගෙන විවෘත සාකච්ඡාවක් මාර්ගයෙන් සම්මුතියක් ඇති කර ගැනීමට කටයුතු කරමි."

මේ තමයි "මහින්ද චින්තන ඉදිරි දැක්මේ" මේ පිළිබඳව තිබෙන දර්ශනය. මෙම කාලීන අවශ්‍යතාව සපුරාලීම සඳහා පුළුල් ජාතික සංවාදයක් මෙන්ම මෙම පාර්ලිමේන්තුව තුළ නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ පාර්ලිමේන්තු කාරක සභාවක් තුළින් මේ සඳහා දේශීය විසඳුමක් ලබා ගැනීම උචිත බව අප රජයේ නොවෙනස් ස්ථාවරය බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. ඒ නිසාම රජය මඟින් අනෙකුත් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කොට ඔවුන්ට ද එකඟ විය හැකි කොන්දේසි මාලාවක් ඔස්සේ දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පියවර නිර්දේශ කොට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට පියවර ගන්නා ලදී.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පළාත් සභා බලතලයන්ට අදාළ සියලු කරුණු පුළුල් ලෙස මෙම විශේෂ කාරක සභාව තුළ සාකච්ඡා කොට පුළුල් එකඟතාවකට පැමිණීම මෙම කාරක සභාව ස්ථාපිත කිරීමේ අභිප්‍රාය විය. ඒ සඳහා රජය සිය නියෝජිතයන් පත් කර වසරකට ආසන්න කාලයක් ගත වුවද, විපක්ෂය විසින් නියෝජිතයින් නම් නොකිරීම නිසා මෙම කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීම ගැන රජය කනගාටු වේ.

ද්‍රවිඩ පක්ෂ ඇතුළු අනෙකුත් දේශපාලන පක්ෂ සමඟ පුළුල් ලෙස සාකච්ඡා පැවැත්වීමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තුළ වූ දැඩි අභිලාෂය මුදුන්පත් කරවා ගැනීමට නොහැකි වී ඇත්තේ එම ක්‍රියාවලිය සඳහා යහපත් ප්‍රතිචාරයක් විපක්ෂයෙන් නොලැබීම නිසා බව අවධාරණය කරනු කැමැත්තෙමි. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා නියෝජනය කරනු ලබන එක්සත් ජාතික පක්ෂයද, ජාතික නිදහස් පෙරමුණ සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව සාකච්ඡා කළ බව මෑතදී පුවත් පත්වල පළ වුණු ප්‍රවෘත්ති තුළින් ගම්‍ය වේ.

අද දින "ද අයිලන්ඩ්" පුවත්පතේ පළමුවැනි පිටුවේ සඳහන් කර ඇති "13A : UNP agreeable to 'practical' amendments" යන සිරස්තලය යටතේ එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තිස්ස අත්තනායක මහතා විසින්ද කර ඇති ප්‍රකාශයේ මෙසේ සඳහන් වේ.

එය මෙසේයි:

"As the 13th Amendment was rushed through parliament, following the 1987 Indo-Lanka Accord, certain shortcomings had crept in and they needed to be rectified."

මෙම ප්‍රකාශයෙන් පැහැදිලිව පෙනී යන්නේ එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය වන්නේද ඉතා ඉක්මන් ක්‍රියාවලියක් තුළින් කරන ලද දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩු පාඩුකම් ඇති බවත්, එහෙයින් එය සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බවත්ය.

මා පළමුව කී පරිදි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීම, පුළුල් කිරීම, නිවැරදි කිරීම යන කරුණු පිළිබඳව දැන් අප රටේ දේශපාලන පක්ෂ හා විවිධ සංවිධාන හා පුද්ගලයින් අතර යම් ආකාරයක සංවාදයක් පැන නැඟී තිබේ. එකී සංවාදයේදී විවිධ දේශපාලන පක්ෂ හා පුද්ගලයින් ප්‍රකාශ කරන කරුණු රජයේ ස්ථාවරය ලෙස හුවා දැක්වීම සාධාරණ නොවේ. රජයේ ස්ථාවරය පදනම් වනුයේ මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි දක්වා ඇති ක්‍රියාවලිය තුළින් මතු කරනු ලබන පුළුල් එකඟතාවක් තුළිනි. මෙම මූලධර්මය උපයෝගී කර ගනිමින් මේ පිළිබඳව රජයේ ස්ථාවරය වන්නේ, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව තුළ මේ පිළිබඳව පවත්වනු ලබන පුළුල් සාකච්ඡා තුළින් එළැඹෙන එකඟතාව අනුව කටයුතු කිරීමට රජය සූදානම් බවයි.

ජාත්‍යන්තර වශයෙන් අප රට අපකීර්තියට හා අපහසුතාවට පත් විය හැකි බව ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් කර ඇති ප්‍රකාශය පිළිබඳව රජයේ ස්ථාවරය වනුයේ, රජය සෑම විටම ජාත්‍යන්තරයට පෙන්වා දී ඇත්තේ මෙම ප්‍රශ්නය සඳහා දේශීය විසඳුමක් ලබා ගැනීම රජයේ ස්ථාවරය බවත්, මෙම ප්‍රශ්නය ජාත්‍යන්තරකරණය කිරීමට අප රජය සම්පූර්ණයෙන් විරුද්ධ වන බවත්ය. එහෙයින් මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන් නොපමාව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව සඳහා නියෝජිතයින් නම් කොට එකී ක්‍රියාවලිය ආරම්භ කිරීමට සහයෝගය ලබා දී මෙම ප්‍රශ්නය විසඳීම සඳහා සිය පූර්ණ සහයෝගය ලබා දෙනු ඇතැයි රජය බලාපොරොත්තු වෙමි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය ඇත්ත වශයෙන්ම 2009 මැයි 27 වැනිදාත්, 2011 මැයි 17 වැනිදාත් ඒකාබද්ධ නිවේදන අනුව දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑ නම් සංශෝධනය කරන්න කියලායි. මගේ ප්‍රශ්නය වශයෙන් ඇහුවේ ඇත්ත වශයෙන්ම ආණ්ඩුව මේ ප්‍රකාශන දෙක තවම පිළිගන්නවාද කියන එකයි. මොකද, දැන් ආණ්ඩුව පිළිගන්නා දේ අනුව ක්‍රියා කරන එකේ විරුද්ධත්වයක් නැහැ. නැත්නම් ආණ්ඩුව මේ නිවේදන දෙක ප්‍රතික්ෂේප කරනවාද කියන එකයි අපි අහන්නේ. එච්චරයි අපට දැන ගන්න ඕනෑ. ඔබතුමන්ලා ප්‍රතික්ෂේප කරනවා නම්, අපි ඒ දිහා බලලා අපේ අලුත් ස්ථාවරය කියන්නම්. නැත්නම් අපි ඔක්කෝම එකතු වෙලා මේ ප්‍රකාශන අනුව අපට පුළුවන් මේ සභාවෙයි පිටතයි සාකච්ඡා කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, එහෙම සරල උත්තරයක් නොවෙයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව රජයේ ස්ථාවරය මොකක්ද කියලා මගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, ඔබතුමා මගේ ප්‍රකාශය කියෙව්වා නම් තේරෙයි. මේ පිළිබඳව පුළුල් වූ සංවාදයක් තියලා එකඟ වෙන කරුණු තිබෙනවා නම් ඒක තමයි රජයේ ස්ථාවරය. මේ රජය ඒක පාර්ශ්විකව තීන්දුවක් ගන්නා රජයක් නොවෙයි. රට

තුළ සියලු දේශපාලන පක්ෂ එකතු කර ගෙන පුළුල් සංවාදයක් තුළින් මේ කාර්ය කළ යුතුයි. ඒ සඳහා තමයි අපි මේ විශේෂ කාරක සභාව පත් කළේ. ඒ කාරක සභාව තුළින් එකඟ වෙන සුවිශේෂී එකඟතාව අනුව තමයි රජය කටයුතු කරන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මම ප්‍රකාශයක් කළා. එතුමා පිළිතුරු දුන්නා. ඒක අපි අතර තිබෙන්නේ. ඔබතුමන්ලාගේ පක්ෂයේ ස්ථාවරය අපි දන්නවා. ඒක පාර්ශ්විකව නවදිල්ලියේදී ප්‍රකාශයක් කළා. ප්‍රකාශයක් කර අපෙන් ඇහුවා එකඟ වෙනවාද කියලා. එහිදී කිව්වේ ඇත්ත වශයෙන්ම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කර ගෙන බලය බෙදා හැරීමේ යෝජනාවලිය එවැනි ප්‍රතිසංවිධානයක් යටතේ කරනවා කියලා. දැන් ආපසු කියන්න ඕනෑ නැහැ, පක්ෂ ගැන කථා කරලා. ඔබතුමන්ලා පිළිගන්නේ මේක නම් අපි ඒ අනුව ක්‍රියා කරන්නම්. අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඒක පිළිගන්නම්. දැන් අපි දන්නේ නැහැ ඔබතුමන්ලා ප්‍රතික්ෂේප කළාද කියලා. ප්‍රතික්ෂේප කළේ නැත්නම්, නැහැ කියන්න. එච්චරයි අපට දැන ගන්න ඕනෑ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, මට අදහසක් පළ කරන්නට තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ අදහස් ප්‍රකාශ කරන්නට බැහැ. ඒකට වෙනම අවස්ථාවක් තිබෙනවා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්තුතියි.

අද දින න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතු විෂය අංක 1 - විසර්ජන පනත් කෙටුම් පත - 2013, දෙවන වර කියවීම. හතරවන වෙන් කළ දිනය. ගරු ජොන් අමරතුංග මහතා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2013
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013
### APPROPRIATION BILL, 2013

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී*
*ඊට අදාළ ප්‍රශ්නය [ නොවැම්බර් 8 ]*
*'පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 8 ]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [மேதகு மஹிந்த ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Order read for resuming Adjourned Debate on Question - [8th November]*
*That the Bill be now read a Second time"- [His Excellency Mahinda Rajapaksa]*
*Question again proposed.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කළ ලේඛනය-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අය වැය.

[පූ.භා. 10.40]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

හොඳයි, අය වැය. මේක තමයි මේ අවුරුද්දට කෙරුණ වැදගත්ම ප්‍රකාශය. මේකේ ඔක්කොම පටලවලා තමයි දාලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් අය වැය ලේඛනයක අවසානයේ, අය වැය ලේඛනයේ සාරාංශයක් තිබෙනවා. ඒ කියන්නේ පුනරාවර්තන වියදම් කොපමණද, ඒ වාගේම ප්‍රාග්ධන වියදම් කොපමණද, ආදායම කොපමණද, ප්‍රදානයන් කොපමණද සහ පරතරය පියවන්නේ කොහොමද කියලා එක වගන්තියකින් පෙන්නුම් කරන්න ඕනෑ.

අපි අය වැය ලේඛන රාශියකට ඇහුම් කන් දීලා තිබෙනවා. මේ අය වැය ලේඛනයේ අන්තිම පිටුවේ හොඳ කවරයක් ගහලා දමා තිබෙන ඒ විස්තර ටික හොයන්න කැල්කියුලේටරයක් අරගෙන පැය භාගයක් විතර මහන්සි වෙන්න ඕනෑ. ඇයි, මේ ලේඛනය සරල ලෙස ඉදිරිපත් කරන්න බැරි? දෙන එක අපට බලා කියවා ගන්න පුළුවන් ආකාරයට දෙන්න ඕනෑ. මෙතැන පොඩි රහසක් තිබෙනවා. මට පෙනෙන හැටියට මේ රහස තමයි ණය ගත්ත ඒවා වහලා දැමීම. ණය අරගෙන අරගෙන දැන් ණය ක්ෂේත්‍රය වැඩි වෙලා තිබෙනවා. ඒක වහ ගන්නට තමයි ඔය වැඩේ කරලා තිබෙන්නේ. අපි කනගාටු වෙනවා. අපි බලාපොරොත්තු වුණා බොහොම සරල ලෙස මේ ප්‍රශ්නය ඉදිරිපත් කරයි කියා. මේ අය වැය ලේඛනය පිළිබඳව අපිට මුලින්ම කරන්න තිබෙන චෝදනාව ඒකයි.

මහින්ද චින්තන පොත ජනාධිපතිතුමාගේ පින්තූරයක් දමලා බොහොම ලස්සනට මුද්‍රණය කර තිබෙනවා. නමුත් ඒකේ සඳහන් වෙන සුන්දර යෝජනා අද ක්‍රියාත්මක වෙලා නැහැ. අපට ඒවා

[ගරු ජෝන් අමරතුංග මහතා]

දකින්නත් නැහැ. අපේ මහින්ද චින්තන පොත කාටවෝ කාලාද කියන්න මම දන්නේ නැහැ. තිබුණු හොඳ ඒවා, යහපත් ඒවා, සුළු ජාතීන්ට ඒ වාගේම අඩු ආදායම් ලබන ජනතාවට දෙන්න පොරොන්දු වුණු දේවල් අඩංගු යෝජනා අද ගිලිහී ගිහින් තිබෙන බවයි පෙනෙන්නේ. ඒ වෙනුවට ධනපති පන්තිය ශක්තිමත් කිරීමට උත්සාහයක් කරන බවයි පෙනෙන්නේ. අඩු ආදායම් ලබන සාමාන්‍ය පුරවැසියන්ට ප්‍රතිලාභයක් ලැබෙනවාද කියා අපි දකින්නේ නැහැ. ඒක කනගාටුවට කාරණයක්. වාසුදේව නානායක්කාර මැතිතුමා එදා කිය කියා හිටියේ එක්සත් ජාතික පක්ෂය ධනපති පන්තියට කත් අදිනවාය කියලායි. නමුත් අද සන්ධානය මුළුමනින්ම ඒ ධනපති පන්තිය කර උඩ තියා ගෙන යන්න හදන බව අපට පෙනෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ලැම්බෝගිනි පන්තිය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ලැම්බෝගිනි පන්තිය කියලාත් කියනවා. මම නම් දන්නේ නැහැ. පත්තරවල සඳහන් කර තිබෙනවා. මම දැන් යෝජනා ඔක්කොම කියන්න යන්නේ නැහැ. යෝජනා කිහිපයක් ගැන උදාහරණ පෙන්වන්න කැමැතියි. දැන් බලන්න කළු සල්ලි ශුද්ධ කරන්න ක්‍රමවේදයක් හදලා විවිධාකාරයෙන් දූෂණයෙන් එකතු කර ගත්ත සල්ලි ලංකාවට ගෙනෙන්න මාර්ගයක් සකස් කර දීම තමයි තමුන්නාන්සේලාගේ ප්‍රධාන යෝජනාව හැටියට අපි දකින්නේ. මේවා ඔක්කොම ධනපති පන්තියට තුඩු දෙන කරුණු. මේවා නැහැ කියන්න බැහැ. ඒක බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ යෝජනාවට අමුණුගම මැතිතුමා කැමැති වෙන එකකුත් නැහැ. නමුත් කරන්න දෙයක් නැහැ.

මොකද, එහෙම සල්ලි හම්බ කර ගත්තු හුඟක් දෙනෙක් ඉන්නවා. කවුද, කොහොමද කියන එක අපි කියන්න යන්නේ නැහැ. දැන් ඒවා මෙහාට ගෙනෙන්න මාර්ගයක් තමයි ඒ හදා ගෙන තිබෙන්නේ. ඒකෙන් කාටද ප්‍රයෝජනයක් ඇති වෙන්නේ? සුළු ජාතීන්ට, අඩු ආදායම් ලබන අයට ඒකෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. පොහොසත් මිනිහා තවත් පොහොසත් කිරීමක් තමයි ඒකෙන් වෙන්නේ.

Racing cars ගැන සඳහන් කර තිබෙනවා. මේක සඳහන් කළේ ඇයි කියා මම දන්නේ නැහැ. Racing cars පාවිච්චි කරන්නේ කී දෙනාද? අතළොස්සක් නේ. එක පවුලක කිහිප දෙනෙක් විතරයි නේ ඒවා ගෙන්වන්නේ. ඒකත් අය වැය ලේඛනයට දමලා. ඒකට අය කරන බදු සම්පූර්ණයෙන්ම නැති කරලා. සද්ද නැතිව හිටියා නම් කමක් නැහැ. ඕක ඉතින් අය වැය ලේඛනයේ සඳහන් කරන්න ඕනෑ නැහැ නේ, යටින් ගහන්න තිබුණා නේ. [බාධා කිරීමක්] වාඩි වෙන්න, වාඩි වෙන්න. තමුන්නාන්සේත් ඒ පැත්තට පන්දම අල්ලනවා නේ. ඒකත් එක කාරණයක්.

මම මේ එකක් දෙකක් පමණයි කිව්වේ. ඊළඟට රා මදින මිනිස්සුන්ට නිදහසක් දී තිබෙනවා. ලයිසන් එකකට සල්ලි දෙන්නේ නැතිව කිතුල් ගස්, පොල් ගස් මදින්න නිදහස දීලා තිබෙනවා. මේවා තමයි අඩු ආදායම් ලබන පොදු ජනතාවට දීලා තිබෙන සහන. මම ඔක්කොම කියන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේවා කියද්දී තමුන්නාන්සේටත් හිනා යනවා. නමුත් කරන්න දෙයක් නැහැ. අපි මේවා සඳහන් කරන්න ඕනෑ. බීලා, මත් වෙලා, මකබෑ වෙයන් කියලා තමයි පොඩි මිනිස්සුන්ට මේ සහන දීලා තිබෙන්නේ. ලොකු මිනිස්සුන්ට විස්කි, බ්‍රැන්ඩි තිබෙනවා ඇති වෙන්න. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. Racing cars ප්‍රශ්නය, බලපත්‍ර ප්‍රශ්නය, ඕවා ගැන තමයි ඉතින් කියන්න තිබෙන්නේ.

ඊළඟට බලන්න ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා, ඒ වාගේම මහින්ද චින්තනයේත් සඳහන් කරලා තිබෙනවා, පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙනවාය කියා. පුරවැසියන්ගේ ආරක්ෂාව කියන්නේ බියෙන්, සැකෙන් තොරව නිදහස් වීමේ අයිතියයි. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර තිබෙනවා. මහින්ද චින්තන පොතේත් සඳහන් කර තිබෙනවා. නමුත් මම අහන්නේ අද මේ රටේ ඒවා ආරක්ෂා වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නයයි. මානව හිමිකම්, කීමේ ලිවීමේ නිදහස, තොරතුරු දැන ගැනීමේ අයිතිය ආදී ඒ හැම එකක්ම ලබා දෙනවාය කියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විතරක් නොවෙයි මහින්ද චින්තනයේත් සඳහන් වෙලා තිබෙනවා. අද ඒ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සියල්ලම ගිලිහී ගිහින්. අද අපේ රට ඒකාධිපති පාලනයකට පා තබන මාර්ගයක් බවට පත් වෙලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මම කනගාටුවෙන් වුණත් ඒක කියනවා. මේක අපි විතරක් කියන දෙයක් නොවෙයි, විදේශිකයන් පවා සඳහන් කරන දෙයක්. මේක තමයි අපි දකින දෙය.

ඊළඟට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් - [බාධා කිරීම්] ඉතින් පොඩ්ඩක් ඉන්න කෝ. ඕවා කියන කොට තමුන්නාන්සේලාට කිති කැවෙනවා නේ. මේවා අහගන්න. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආරක්ෂා වුණු අධිකරණයේ ස්වාධීනත්වය අද නැති වෙලා තිබෙනවා. මම ඒක ගැන කථා කරන්න යන්නේ නැහැ. ඒක නැති වෙලා තිබෙනවා කියන එක මුළු රටම සමස්තයක් හැටියට අද පිළිගෙන තිබෙනවා. මම ඒ ගැන විස්තර කියන්න යන්නේ නැහැ. තමුන්නාන්සේලා කියයි මාව කොමිටියට පත් කරලා තිබෙන නිසා ඕවා කථා කරන්න අයිතියක් නැහැ කියලා. ඒ නිසා ඒ ගැන කියන්න යන්නේ නැහැ.

ඊළඟට රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අද තිබෙනවාද? අද ඒක දකින්නත් නැහැ. අපට පෙනෙනවා අද රජයේ ඉන්න සේවකයෝ ඔවුන්ගේ අයිතිවාසිකම් නැති වීම පිළිබඳව මොන විධියේ මැසිවිලි නඟනවාද කියලා. පොලිස් සේවයේ ස්වාධීනත්වය තිබෙනවාද? බැරි වෙලාවත් ආණ්ඩුවේ කාට හරි මොනවා හරි කිව්වොත් ඒ පොලිස් නිලධාරියාව මාරු කරලා දමනවා. එහෙම නැත්නම් අස් කරලා දමනවා. අද එහි ස්වාධීනත්වයක් නැහැ. අද පොලිස් නිලධාරින් බොහොම කනගාටුදායක තත්ත්වයකයි ජීවත් වෙන්නේ.

ඊළඟට මැතිවරණ කොමිසමේ ස්වාධීනත්වය. මැතිවරණ කොමසාරිස්තුමාත් පරාණ භයේ ඉන්නේ මොනවා වෙයිද කියලා. දැන් අපි මේවා ගැන-

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වාඩි වෙන්න කෝ. තමුන්නාන්සේ රට ඉන්න ළමයි ගැන බලා ගන්න කෝ.

දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් තමන්ගේ අවශ්‍යතාවන්, ඒ කියන්නේ රජයේ මැති ඇමතිවරුන්ගේ, රජයට පන්දම් අල්ලන අයගේ, රජයේ හෙංචයියලාගේ අවශ්‍යතාවන් තමයි අද ආරක්ෂා වෙන්නේ. ඒ අනුව කටයුතු කෙරෙන මාර්ගයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. ඒක ඇත්ත. නැහැ කියලා කියන්න බැහැ. ඕනෑම කෙනෙකුගෙන් ඇහුවොත් කියයි මැති, ඇමතිවරුන්ට හරස් වෙන්න යන්න බැහැ කියලා.

ඊළඟට අපරාධ සංඛ්‍යා ලේඛන දිහා බැලුවොත් පසු ගිය කාලයේ මිනී මැරුම් කොපමණ වෙලා තිබුණාද? පත්තරවල සඳහන් කරලා තිබෙනවා, තුන් හාර සියයක් සිද්ධ වෙලා තිබුණා කියලා. ස්ත්‍රී ඝාතන කොපමණද? ගරු කථානායකතුමනි, කහවත්තේ තිබෙන record එක බලන්න. කෙළවරක් නැහැ. හෙට අනිද්දාටත් තව මරනවා කියලා දාලා තිබෙනවා. මනුෂ්‍ය ඝාතන, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර වැඩි වෙලා. මේ වාර්තා වෙන ඒවා ඇරෙන්න නිහඬව තව කීයක් මේ වාගේ සිද්ධි වෙලා තිබෙනවාද කියන එක අපට දැන ගන්න ඕනෑ. මේ විධියට බලන කොට මේ රටේ මිනිස් අයිතිවාසිකම් රැකෙනවාද, ජීවිත ආරක්ෂාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය අපට අහන්න සිද්ධ වෙනවා.

මේවාට තුඩු දෙන කාරණයක් තිබෙනවා. ඒක තමයි මත් කුඩු. ගරු කථානායකතුමනි, අද බොහෝම පහසුවෙන් මත් කුඩු ඕනෑ තැනකින් ගන්න පුළුවන්. ඕනෑම වෙළෙඳ පොළකට ගියොත් පොඩි, පොඩි පැකට් සාක්කුවේ දා ගෙන ඉන්න මිනිස්සු රුපියල් 100ක්, 200ක් දීපුවාම ටග් ගාලා යටින් ගහලා දෙනවා. ඒක තමයි සෙල්ලම.

අපේ කාලය තුළ -අප අවුරුදු දෙකක් පාලනය කළ කාලය තුළ - මත්කුඩු නැත්තටම නැති කර තිබුණා. මත්කුඩු ගෙනෙන මාර්ග ඔක්කොම නැති කර තිබුණා. කුඩුකාරයින්ට පිස්සු හැදුණා. අද මේ මත්කුඩු ප්‍රශ්නය තමයි මිනීමැරුම්වලටයි අපරාධවලටයි මූලික හේතුව. මේ ගැන කථා කරන්නටත් අමාරුයි. මේවා මොන විධියට ක්‍රියාත්මක වෙනවාද, මේවාට වග කිව යුත්තේ කවුද කියා මම දන්නේ නැහැ. මේ මත්කුඩු ගෙන්වන්නට මැදිහත් වෙලා තිබෙන්නේ කවුද? පසු ගිය දවස්වල නම් මේ ආණ්ඩුවේ ලොකු ලොක්කෝ ගැනත් කථා වුණා. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. ඒ මිනිස්සු ගේනවා මම දැක්කේ නැහැ. කෙසේ වෙතත් තිබෙන චෝදනාව නම් මේවා ප්‍රවාහනය කිරීම හා බෙදා හැරීම කෙරෙන්නේ ලොක්කන්ගේ අතින්ය කියායි. මොකද, ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා කියන්නේ? කථා නොකළාට තමුන්නාන්සේත් ඔය ගැන දන්නවා. තරහෙන් ඉන්නවා. කරන්න දෙයක් නැහැ. නමුත් මම කියන්නේ කවුරු හෝ චේවා මේ ප්‍රශ්නය නවත්වන්නට ඕනෑ කියලායි. අපරාධ මර්දනය කරන්නට නම්, මිනී මැරුම් නවත්වන්නට නම්, ස්ත්‍රී දූෂණ නවත්වන්නට නම්, හොරකම් නවත්වන්නට නම්, මේ මත් කුඩු ප්‍රශ්නය නවත්වන්නට ඕනෑ. මේ හැම දෙයකටම අද මත් කුඩු තමයි මුල් වෙලා තිබෙන්නේ. රා මදින්න permit එක දුන්නාට මදියි ගරු කථානායකතුමනි. රා බීලා වෙරි වෙන කොට නින්ද යනවා. නමුත් මත්කුඩු භයානක දෙයක්. ඒ නිසා එය නවත්වන්නට ඕනෑ. එය නැවැත්වුයේ නැත්නම් මුළු සමාජයම විනාශ වෙලා යනවා. එම නිසා කරුණාකර මේ මත්කුඩු නවත්වන්නය කියා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට බන්ධනාගාර ප්‍රශ්නයත් -දැන් දවස් දෙක තුනකට ඉස්සෙල්ලා ඇති වෙච්ච කැරැල්ලත්- මත්කුඩු ප්‍රශ්නයටම අදාළයි. ඒ ප්‍රශ්නයට මූලික වුණු ප්‍රධාන කාරණය තමයි මත්කුඩු ප්‍රශ්නය. මත්කුඩු ගෙනැල්ලා හංගාගෙන තිබියාය කියා දැන් අපේ ඇමතිතුමා ප්‍රකාශ කළා. ඒවා හොයන්න ගිහින් තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. එතකොට අප දකින දෙයක් තමයි එහෙම නම් බන්ධනාගාර පරිපාලනය දුර්වලයි කියන එක. බන්ධනාගාර පරිපාලනයට Commissioner General කෙනෙක් ඉන්නවා; නායකයෙක් ඉන්නවා. ඔහු හමුදාවේ හිටපු -විශ්‍රාම ගිය- නිලධාරියෙක්ලු. ඇයි බන්ධනාගාරය පාලනය කර ගන්නට බැරි? බන්ධනාගාර නියාමකයින්ට කොපමණ පඩි ගෙවනවාද? බන්ධනාගාර නියාමකයින් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මාත් බන්ධනාගාරය භාර අමාත්‍යවරයා හැටියට කාලයක් කටයුතු කළා. නමුත් මේ වාගේ සිද්ධීන් ඇති වුණේ නැහැ. අප මත් කුඩු ගෙන්වන්නට දුන්නේත් නැහැ; ගෙනියන්න දුන්නේත් නැහැ. එතකොට හිටපු බන්ධනාගාර කොමසාරිස්වරයා විශේෂ කාර්ය බල කාය ගෙන්වා ගත්තේ නැතිව, පොලීසියේ ආධාරයක් නැතිව, බන්ධනාගාර නියාමකයින් ලවාම බොහොම අපූරුවට පිළිවෙළකට බන්ධනාගාරය පාලනය කළා.

ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා බන්ධනාගාරයේ ඇති වූ ප්‍රශ්නය ගැන ප්‍රකාශයක් කළා. නමුත් ඒ කරුණු අපට පිළිගන්නට බැහැ. එම නිසා තමයි ඒ ගැන විභාග කරන්නට අපි කාරක සභාවක් පත් කරන්න කියා ඉල්ලුවේ. ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කරන්නට ඕනෑ, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගන්නවාද කියලා? මේ කාරණය ගැන මම දන්නේ නැති නිසායි අහන්නේ.

පත්තරවල හැමදාම ඒ ගැන තිබෙනවා. ඒ ගැන එතුමා කථා කරන්නේත් නැහැ, එතුමාගේ ජොබ් එක ගහලා යයි කියලා. [බාධා කිරීමක්] ඒ කාර්යයට අපි විරුද්ධයි. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගන්නවාට අපි විරුද්ධයි. ඒක සම්පූර්ණයෙන්ම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කොමසාරිස් ජනරාල්තුමා නොකරපු ප්‍රකාශයක් පළ කළායි කියලා එතුමා අපේ අමාත්‍යාංශයට ලිපියක් එවා තිබෙනවා, එය නිවැරදි කරන්න කියලා. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකක්ද ඔය වැඩේ? තමුන්නාන්සේගේ කොමසාරිස් එකක් කියනවා, තමුන්නාන්සේ තව එකක් කියනවා. රජයේ ඇමතිවරුන් තව එකක් කියනවා. මේක විහිළුවක් නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කොමසාරිස් ජනරාල්තුමා -[බාධා කිරීමක්] අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් එවලා තිබෙනවා. තමුන්නාන්සේලා වැරැදි ප්‍රචාර අරගෙන යනවා. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එය අපේ රටේ කීර්තිනාමයට කැලලක් වෙනවා. අධිකරණය භාරයේ තමයි මේ රැඳවියන් සිටින්නේ. ඒ අය -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමක්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කියන්න. හැබැයි මගේ කාලය දෙන්න බැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අර ඔබතුමාගේ කාලයේ තංගල්ල බන්ධනාගාරයේ වහළ උඩ නැඟලා ලොකු විරෝධයක් පළ කළේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්, අපි ගිහිල්ලා ඒක විසඳුවා. අපි ඔය වාගේ අව් ගබඩාව කඩන්න දුන්නේ නැහැ; වෙඩි තැබුවේ නැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අපේ අතිගරු ජනාධිපතිතුමා එදා විපක්ෂ නායකවරයා හැටියට එහි නොගියා නම් ඒ අය තවම වහළ උඩ. [බාධා කිරීම්] එදා ඒක බේරුවේ අපේ වර්තමාන ගරු ජනාධිපතිතුමායි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි වෙඩි තැබුවේ නැහැ. [බාධා කිරීම්] එදා විපක්ෂ නායකවරයා හැටියට තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමායි, මමයි එහි ගියේ. අපි දෙගොල්ලන්ම ගිහිල්ලා එය විසඳුවා. [බාධා කිරීම්]

අද ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයේ අපකීර්තියට පත් වෙලා තිබෙනවා. මේ මානව හිමිකම් ප්‍රශ්නය උඩ ජාත්‍යන්තරය ඉදිරියේ අද අපේ රට අපකීර්තියට ලක් වෙලා තිබෙනවා. ජිනීවා සමුළුවට ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධ විවාදයේදී එම ඡන්දයෙන් අපේ රට පරාජය වුණා. මීට කලින් කවදාවත් මේවා සිදු වුණේ නැහැ. රටවල් ගණනාවක් ලංකාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. ඒ ඉදිරිපත් කළ යෝජනාව සම්මත වුණා. ඒ රටවල්වලට ගිහිල්ලා, විධිවිධාන පෙන්වලා, සත්‍ය මේකයි කියලා පෙන්වා දීලා එයින් අපේ රට බේරා ගන්න තමුන්නාන්සේලාට බැරි වුණා. තවමත් ඒ විවාදය යනවා. මාර්තු මාසය වනකොට නැවත වරක් යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරගෙන අපට ලැබෙන්න තිබෙන ආධාරත් නැතිව යන්න පුළුවන් කියන එක මා මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ. මේවා තමයි පසු ගිය අවුරුද්ද තුළ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කරපු දේවල්.

ගරු කථානායකතුමනි, දැන් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරනවා. මට පෙනෙන හැටියට ජනාධිපතිතුමාත් වැඩේ කොහොමද කියලා ගස් මුට්ටිය දමලා බලනවා. විමල් වීරවංශගේ මුට්ටිය ඉස්සරහට දැම්මා. දමලා බලනවා මොකද වෙන්නේ කියලා. ඊට පස්සේ හෙළ උරුමය ඉස්සරහට දමනවා, ගිහිල්ලා කථා කරලා බලපල්ලා මිනිස්සු මොකද කියන්නේ කියලා.

මම දන්නවා, තමුන්නාන්සේලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්නයි කියලා. ඒක මහින්ද චින්තනයේ බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. මොකද, තමුන්නාන්සේලා බයයි, යාපනය පළාත් සභාවේ ඡන්දය පැවැත්වුවොත් එහෙම නැවත වරක් උතුරු නැඟෙනහිර එකට එකතු වෙලා මේ රට බෙදන්න හදයි කියලා. අපි ඒකට පක්ෂ නැහැ.

අපි කොහෙත්ම ඒකට පක්ෂ නැහැ. නමුත් වෙන්න යන දේ ඒක තමයි කියන එක කල්පනා කරලා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා දමන්න දැන් දැන්ම ලෑහැස්ති වෙනවා. මතක තියා ගන්නට ඕනෑ, මේ ජනවාර්ගික ප්‍රශ්නයට අපි විසඳුමක් සොයා දෙනවා වෙනුවට මේ ප්‍රශ්නය උග්‍ර කරන වැඩක් තමයි මේ තමුන්නාන්සේලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමෙන් පළාත් සභා ඉවත් කිරීමෙන් කරන්නේ කියන එක.

මා අහනවා, මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා, බෙදුම්වාදීන්ට නැවත වරක් මේ රටේ ඔළුව උස්සන්නට අවස්ථාව සලසා දෙනවාද කියලා. යුද්ධයක් ඉවර වෙලා යාන්තම් සහනයක් ලබා ගත් අවස්ථාවේ නැවත වරක් උතුරු නැඟෙනහිර යුද්ධයක් මේ රටේ ඇති කරන්නට හදන ප්‍රයත්නයක් හැටියටයි මම මේ ගැන කල්පනා කරන්නේ. මේක භයානක ලකුණක්.

මම දන්නවා, ඉන්දියාව සම්පූර්ණයෙන්ම මෙම කාර්යයට විරුද්ධ බව. ඉන්දියාවේ හොඳ හිතත් තියාගෙන, අපේ රටේ නැවත වරක් ඒ කාලකණ්ණි යුද්ධය ඇති නොවන ලෙස බෙදුම්වාදීන්ට ඔළුව උස්සන්න ඉඩ නොතබා කටයුතු කරන්නය කියලා ජනාධිපතිතුමාගෙනුත් මේ අවස්ථාවේ දී මා ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊළඟට, බොහොම පැහැදිලි දෙයක් තමයි, නීතියේ ආධිපත්‍ය කියන එක. නීතිය ඉදිරිපිට ලංකාවේ සියලු දෙනාම එක සමානද? මම හිතන්නේ නැහැ කියලායි. සමහරුන්ට මොන නීතියක්වත් නැහැ. උසාවියට ගියාම නඩුකාරයාත් බයයි. ඒකයි ඇත්ත. ඇයි? ස්වාධීන අධිකරණයක් නැහැ. ඒ මිනිහා බලන්නේ තමන්ගේ රක්ෂාවට කෙළවෙයි කියලා ඒක ආරක්ෂා කර ගන්නයි. ඉතින් සමහරුන්ට එක විධියකටත් තවත් සමහර අයට වෙනත් විධියකටයත් තමයි කටයුතු කරන්නේ.

මේ ඔක්කෝම පහර වදින්නේ සාමාන්‍ය ජනතාවටයි. සල්ලි තිබෙන, බලය තිබෙන අයට ඒ නීතියේ ආධිපත්‍යයක් නැහැ. එය කනගාටුවට කාරණයක්. බලයේ ඉන්න නිසා තමුන්නාන්සේලාට මේවා තේරෙන්නේ නැහැ. ඕනෑ එකක් කර ගන්න පුළුවන්. දැන් අපේ කාදර් නියෝජ්‍ය ඇමතිතුමා එහෙම බොහොම සන්තෝෂයෙන් ඉන්නවා. ඉතින් ඒකට කරන්න දෙයක් නැහැ.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)
කට හෝදලා ආලා කියන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කට නොවෙයි, හෝදන්නේ. මොකක්ද කියලා මම කියන්නේ නැහැ. කාදර් නියෝජ්‍ය අමාත්‍යතුමා වාඩි වෙන්න. කාදර් නියෝජ්‍ය අමාත්‍යතුමා වාඩි වෙන්නකෝ. මක්කම යන කොට මම එන්නම්, තමුනාන්සේ එක්ක යන්න. [බාධා කිරීමක්] ඕනෑ දිහාවක එන්නම්. වාඩි වෙන්න.

ගරු කථානායකතුමනි, අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය දෙස බැලුවොත් පසු ගිය අවුරුද්ද තුළ පුදුමාකාර ප්‍රශ්න කීපයක් මතු වෙලා තිබෙනවා. සාමාන්‍ය මිනිහෙක් යන්නේ රජයේ රෝහලකටයි. මොකද, පෞද්ගලික රෝහලකට යන්න සල්ලි නැති නිසා. තුණ්ඩුවක් ලැබෙනවා. බෙහෙත් ගන්න වෙනත් ෆාමසියකට යන්න ඕනෑ. වියදම්! ඒකයි මම කිව්වේ. සෞඛ්‍යය ක්ෂේත්‍රයේ එවැනි අංශවලට හරියට සහනයක් දීලා නැහැ.

ගරු කථානායකතුමනි, ඊයේ පෙරේදා පත්තරයක තිබෙනවා මම දැක්කා, "සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගෙන්වන්නේ බාල බෙහෙත්" කියලා. කාටද ඒවා හම්බ වෙන්නේ? සල්ලි තිබෙන මිනිහා එංගලන්තයෙන්, ඇමෙරිකාවෙන් එන බෙහෙත් ගනියි. මේ විධියට හම්බ වෙන බෙහෙත් ටිකත් බාල බෙහෙත් කියන එක තමයි අපට සඳහන් කරන්නට වෙන්නේ. මේ විධියට මේ මිනිසුන්ට සලකන්නේ ඇයි කියන එක කනගාටුවට කාරණයක්.

ගරු කථානායකතුමනි, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් දමන්න ගිහින් මොන ප්‍රශ්නයක් ඇති වුණාද? වෛද්‍යවරුන් සියලු දෙනාම විරුද්ධ වුණා. මා හිතන හැටියට වර්ජනයක් කරන්නත් සූදානම් වුණා. මොකටද, මේ වැඬේ? ඒ වැඬේ හරියට නීත්‍යනුකූලව, වුවමනා කරන කරුණු කාරණා හරියට සොයලා බලා ඉදිරිපත් කළා නම් මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. අදත් වෛද්‍යවරු බොහොම කනස්සල්ලෙන් තමයි කටයුතු කරන්නේ. මේක අපට විශාල ප්‍රශ්නයක්. මේ කරුණු නිසා අද ආරෝග්‍යශාලාවල වැඩ කටයුතු හරියට කෙරෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අද පත්තරයක සඳහන් වෙලා තිබෙනවා මම දැක්කා, that nurses are to launch an islandwide token strike on Thursday කියලා. බ්‍රහස්පතින්දාට සාත්තු සේවිකාවන් strike එකක් කරන්න යනවාලු. මුළු වෛද්‍ය ක්ෂේත්‍රයේම වැඩ කටයුතු නතර වෙනවා. [බාධා කිරීමක්] වෛද්‍ය ක්ෂේත්‍රයේ වෙදකම් කරන නිලධාරින් වැඩ වර්ජනයක් කරන්න යනවා. ඒකට මේ අයට හිනා. ඇයි, මේ අයට බලපාන්නේ නැහැ නේ. මොවුන් පෞද්ගලික ආරෝග්‍යශාලාවලට ගිහින් බෙහෙත් ගන්නවා. සාමාන්‍ය මිනිහාට තමයි මේකෙන් පහර වදින්නේ. මොකද, කීප වතාවක් සෞඛ්‍ය ඇමතිතුමාට කිව්වාලු, මේ තිබෙන වැටුප් විෂමතාවන් ඉවත් කරන්න, වැටුප් වැඩි කිරීම් ගැන කල්පනා කරන්න කියලා. නමුත් ඒ කිසි දෙයක් කෙරෙන්නේ නැහැ කියලා තමයි එහෙම කරන්නේ. මෙහෙම වුණාම අපි මේ කොහාටද යන්නේ? මොකක්ද, අපේ මහජනතාවට ලැබෙන සේවාව? මේ ගැනත් බොහොම කනගාටුවෙන් වුණත් මම මතක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා පසු ගිය කාලයේ ඉන්ධන ගෙනාවා. මොකද, වුණේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම ගෙනාවේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැත්තේ මොකද? තමුන්නාන්සේ තමයි ගෙනාවේ. මොකද වුණේ? අනේ! අර අහිංසක මිනිසුන්ගේ කාර් ඔක්කෝම කැඩුණා; විනාශ වුණා; එන්ජින් ගලවන්න වුණා. සල්ලි දෙනවායි කිව්වාට ඔක්කෝටම දුන්නේ නැහැ. කොටසකට විතරයි හම්බ වුණේ. [බාධා කිරීමක්] ඔක්කෝටම හම්බ වුණේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සියයට 10කටවත් හම්බ වෙලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම දැන් තමුන්නාන්සේගෙන් අහනවා, මේ අවුරුද්ද පුරා තෙල් ආනයනය සම්බන්ධයෙන් වුණු වැරදි වැඩ කළේ තමුන්නාන්සේ නොවෙයි නම් කාටද අච්චු කෙරුවේ කියලා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔක්කෝටම සල්ලි දීලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ බලන්න, සල්ලි දීලා නැහැ. මේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පෙන්වනවා. එතුමා ඒ ලියවිලි අතේ තියා ගෙන ඉන්නවා. ඒක නිසා එහෙම "සල්ලි දුන්නා" කියලා කියන්න එපා. කොටසකට දෙන්න හම්බ වුණේ නැහැයි කියන්න. ලජ්ජා වෙන්න එපා. කරන්න දෙයක් නැහැ නේ. ඕවා ඔහොම තමයි. තමුන්නාන්සේ දෙන්නේ වැරදි පිළිතුරු. මේක විශාල ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, ඒ මදිවාට මෙතුමන්ලා ගිහින් හෙජින් ගිවිසුමක් අත්සන් කරලා එතැනත් ලොකු ප්‍රෝඩාවක්, කොල්ලයක් වෙලා තිබෙනවා. සල්ලි කවුද ගහ ගත්තේ කියලා මම දන්නේ නැහැ. අපට විශාල මුදලක් ගෙවන්න වෙලා තිබෙනවා. මේක විශාල ප්‍රශ්නයක්. මේ මුදල් සියල්ලක්ම ගෙවන්නේ මහජනතාව. වෙන කවුරුවත් නොවෙයි. මේ බදු ගෙවන්නන්ගේ සල්ලි. ඒක නිසායි අපි කෑ ගහන්නේ. මේක ලෙහෙසි වැඩක් නෙවෙයි. තමුන්නාන්සේට double charge එකක් තමයි අපි දමන්නේ. වාහන අබලන් වුණා මදිවාට හෙජින් ගිවිසුමට ගිහිල්ලා, දූෂණ ගිවිසුමක් ගහලා අද බොහෝ දෙනෙක් අමාරුවේ දාලා ඉන්නවා. මෝටර් රථ අයිතිකාරයන්ට පමණක් නොවෙයි, සාමාන්‍ය ජනතාවටත් ඒවාට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒවා ඔක්කෝම මේ අවුරුද්දේ තමයි සිද්ධ වුණේ.

ඊළඟට වෘත්ති සමිති විරෝධතා ගැන බලන්න. අද වෘත්තීය සමිතිවලට නිදහසක් තිබෙනවාද විරෝධතාවක් කරන්න? එදා කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ කොල්ලෝ ටිකක් එළියට බැහැලා කෑ ගැහුවා කියලා වෙඩි තියලා දැම්මා. මොකක්ද මේ ප්‍රජාතන්ත්‍රවාදය? මේ මොන අපරාධයක්ද? සාධාරණ විවේචනයක් කරලා ආණ්ඩුවට විරුද්ධව විරෝධතාවක් ප්‍රකාශ කරන්න එළියට බැස්සාම, එතැනදී තුවක්කු පාවිච්චි කරලා ඔවුන්ට වෙඩි තියලා මර්දනය කරලා දැම්මා. ඒකෙන් මා පෙන්නුම් කරන්න හදන්නේ, අද වෘත්තීය සමිති නිදහසත් මේ රටේ මොට කරලා දමා තිබෙනවාය කියන එකයි.

ඊළඟට කුඩා වාහන සඳහා බදු පැනවීම. දැන් racing carsවල බදු ඉවත් කරන්න යෝජනා කර තිබෙනවා. ඒකට කමක් නැහැ ටික දෙනෙකුට තිබෙන ආශාව නේ. මොකක්ද ඒකේ නම?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ලැම්බෝගිනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ලැම්බෝගිනි. මම ඒ නම අහලාත් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපට බඩගිනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් පොඩි වාහනවල, මෝටර් සයිකල්වල, ත්‍රී විලර්වල බදු වැඩි කරලා. ඇයි එහෙම කරන්නේ? ඒ වාහන සාමාන්‍ය ජනතාව තමයි පාවිච්චි කරන්නේ. පොඩි මිනිස්සු යන වාහනයටත් පයින් ගැහුවා නේ තමුන්නාන්සේලා. මොකක්ද මේ තිබෙන වෛරය? මා ඒක නේ කිව්වේ, මහින්ද චින්තනයේ තිබෙන සුන්දර යෝජනා ටික අද කාවෝ කාලා, ඒවා ඒ පොතෙන් නැති වෙලා ගිහිල්ලා කියලා. ඒ වෙනුවට අද පොදු ජනතාවට පහර ගැසීමක් තමයි අපට දකින්න ලැබෙන්නේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම නගරබද ප්‍රදේශවල මිනිසුන්ට අද එළදෙනකු තියා ගෙන කිරි දොවා ගන්න විධියක් නැහැ. ඔවුන් ගිහිල්ලා කිරි පිටි පැකට් එකක් ගන්නවා කඩෙන්. ලේසියට ඒක තමයි කරන්නේ. බලන්න, අද ඒකේ මිලත් වැඩි කරලා. පඩි වැඩි කළා නම් කමක් නැහැ, ඒකට ඔරොත්තු දෙන්න පුළුවන්. මා දන්නේ නැහැ ඇයි මෙහෙම කරන්නේ කියලා. මේ රටේ කිරි නිෂ්පාදනය හරියට කෙරෙනවා නම්, ඒත් කමක් නැහැ. රටට ඇති වෙන්න කිරි නිෂ්පාදනය කරන්න පුළුවන් නම් ඒත් කමක් නැහැ. එහෙම බැරි නම්, ඒ තත්ත්වය ඇති වන තෙක් මේ වැඩේ කරන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට තව විනාඩි පහක් තිබෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අනේ, ගරු කථානායකතුමනි, තව පොඩ්ඩක් වෙලාව දෙන්න කෝ.

අනෙක් එක, පුරා විද්‍යාව. මෙන්න අපූරු එක! ඊයේ - පෙරේදා කටුගෙටත් හොරු පැන්නා. අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, පුරා වස්තු කොහොමද ආරක්ෂා කර ගන්නේ කියලා. කොළඹ හතේ කටුගේ තිබුණු බඩු ටික උස්සා ගෙන ගියා නම්, අනෙක් තැන්වල තිබෙන නිධන් හාරන එක නවත්වන්නේ කොහොමද? මේ අවුරුද්දේ පුදුම සෙල්ලම් වෙලා තිබෙන්නේ. කටුගේ තිබුණු කඩුව කොහේද ගියේ කියලා තවම හොයා ගන්න බැහැ. අහිංසක මිනිසුන් අල්ලා ගෙන ගිහිල්ලා ගහලා, "උඹ ගත්තා කියාපන්, උඹ ගත්තා කියාපන්" කියනවා. ඒ අය, නැහැ කියනවා. ඉතින් ඒ අය අත හරිනවා. නමුත් ඒ කඩුව ගිය තැනත් අපි දන්නවා. ඒ ගත්තු නිධන් තිබෙන තැනත් අපි දන්නවා. අපි ඒවා කියන්න යන්නේ නැහැ. [බාධා කිරීමක්] එස්.බී. දිසානායක ඇමතිතුමා නම් කඩු උස්සන්නේ නැහැ. නමුත් මේ වාගේ දේවල් නැති වීම කනගාටුදායකයි. අද හැම තැනම නිධන් හාරනවා. ඇහුවාම කියනවා, හෙලිකොප්ටර් එකක් ආවා; STF එකෙන් බැස්සා; වට කෙරුවා; හාර ගත්තා; පටවා ගෙන ගියා කියලා. මා දන්නේ නැහැ ඒවා ඇත්තද කියලා. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවාද දකුණු පළාතේ ඒ වාගේ කීයක් වුණාද කියලා. කමක් නැහැ. මට ඒක කියන්න එපා. තමුන්නාන්සේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දන්නා තොරතුරු නොදීමත් වරදක්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඊළඟට, රාජ්‍ය සේවයේ අයට දුන්නු පොරොන්දුව බලන්න. ඔවුන්ට පඩි වැඩි කරනවා කියලා හැම දාම සඳහන් කළා. මීට අවුරුදු පහකට, හයකට ඉස්සර වෙලා පොඩ්ඩක් වැඩි වුණා. ඊට පස්සේ මොනවාද හම්බ වුණේ? රුපියල් 750යි, රුපියල් 1500යි, තේ කෝප්පයයි, ඒ විධියට තමයි. දවසකට රුපියල් 50යි මේ වතාවේ වැඩි වෙලා තිබෙන්නේ. ඉතින් මේක විශාල ප්‍රශ්නයක්. රාජ්‍ය සේවකයෝ බලාගෙන ඉන්නවා, කවදාද මේ රජය වැටුප් වැඩි කිරීමේ පොරොන්දුව ඉටු කරන්නේ කියලා. තව පැත්තකින් විශ්‍රාමිකයෝ බලා ගෙන ඉන්නවා. වැටුප් විෂමතාව ගැන ඔවුන් හැම දාම කථා කරනවා. ඒකටත් උත්තරයක් නැහැ. ඒකටත් මොකද කරන්නේ කියලා අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අද තිබෙන ලොකුම අර්බුදය තමයි, අධ්‍යාපන අර්බුදය. අද අධ්‍යාපන ඇමතිතුමා මෙතැන නැහැ. විශ්වවිද්‍යාලවලට ඇතුළු වුණ ළමයින්ට උපාධිය ගන්න බැරිව දැන් අවුරුදු කීයක් ගත වුණාද? 2007 ඉඳලා ඇතුළු වුණ ළමයින්ට තවම උපාධිය ලැබුණේ නැහැ. ඒ වාගේම 2011 අවුරුද්දේ විභාගයට වාඩි වෙලා විශ්වවිද්‍යාලයට ඇතුළු වෙන්න බලා ගෙන ඉන්න ළමයින්ට ඇතුළු වෙන්න අවස්ථාවක් නැහැ. 2012 අවුරුද්දත් දැන් ඉවර වේගෙන එනවා. තවම ඒවාට විසඳුමක් නැහැ.

අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන සියයට හය දක්වා වැඩි කරන්න කියලා ඉල්ලීමක් කළා. ඒක කරලාත් නැහැ. අද මා දැක්කා පත්තරේ දාලා තිබෙනවා, ගුරුවරු සහ විදුහල්පතිවරු වැඩ වර්ජනයකට අරඅදිනවා කියලා. පත්තරේ බොහොම පැහැදිලිව තිබෙනවා, "Teachers sound alarm bells" කියලා. මීට කලින් කවදාකවත් මේවා සිද්ධ වුණේ නැහැ. ඒ කියන්නේ, a countrywide token strike will be held on the 4th of December urging that their six demands be met. අම්මෝ! මේ ලැයිස්තුව නම් කවදාකවත් දෙන්න හම්බ වෙන්නේ නැහැ. දෙන්න ලැබෙන්නේ නැහැ. මට පෙනෙන හැටියට නම් අවසානයේ තමුන්නාන්සේලාට ගෙදර යන්න වෙනවා.

මේක හරි අසාධාරණයක් වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය කරලා. ඒ නිසා අද අපට පෙනෙනවා අධ්‍යාපන ක්ෂේත්‍රය විනාශකාරී තත්ත්වයකට මුහුණ දෙන්න යනවා කියලා. ඒක එච්චර හොඳ වැඩක් නොවෙයි. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, තමුන්නාන්සේගේ කාලයේ මේවා සිද්ධ වුණේ නැහැ නේ.

කොටස් වෙළෙඳ පොළට මොකක්ද කෙරුවේ? හොඳ ලස්සණට කොටස් වෙළඳ පොළ ක්‍රියාත්මක වේගෙන ආවා. පොඩි පොඩි මිනිස්සු, කාර්යාලවල ඉන්න අය තමුන්ගේ කීය කීය හරි දාලා කීයක් හරි හම්බ කරගන්න බැලුවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා committee member කෙනෙක් නේද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකේද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා ඇහුවේ නිකමට. දන්නවාද කියලා බලන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

සල්ලි තිබෙන මිනිස්සු ටික දෙනෙක් එකතු වෙලා තැරව්කාරයන් දාලා කොටස් වෙළෙඳ පොළ සුද්ධ කර දැම්මා. ඒකෙන් වුණේ මොකද? වුණේ කොටස් වෙළෙඳ පොළ විනාශ වුණා, අර පොඩි පොඩි ආයෝජන කරපු මිනිසුන්ට යන එන මඟක් නැති වුණා. මේකට ආණ්ඩුව වග කියන්න ඕනෑ. ඒකෙන් හැංගිලා යන්න බැහැ. ඒක කනගාටුදායක තත්ත්වයක්. ඒකයි මා කිව්වේ, සාමාන්‍ය පොදු ජනතාවට මේ අවුරුද්දේ පහර වැදුණා මිසක් සහනයක් ලැබුණේ නැහැ කියලා. ඒක මා මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මට කියන්න බැරි වුණ තවත් එක කාරණයක් තිබෙනවා. ඒ තමයි අතුරුදහන්වීම් සහ පැහැර ගෙන යෑම්. යුද්ධය ඉවර වුණාම අපි හිතුවා මේවා නවතියි කියලා. නමුත් තවමත් සුදු වෑන් දුවනවා. පසු ගිය දවස්වලත් උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත් මේ කාර්යය සිද්ධ වුණා. ඒකත් කනගාටුවට කාරණයක් හැටියට අප මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මට තවත් හුඟක් දේවල් තිබෙනවා, කියන්න. එළිවෙන කල් කියන්න මට පුළුවන්. නමුත් මම ඒවා කියන්න යන්නේ නැහැ. මම මේ කථා කෙරුවේ තිබෙන ප්‍රශ්නවලින් කොටසක් පමණයි. මහ ජනයාගෙන් විමසුවොත් ඔවුන්ට ඇති වෙලා තිබෙන අමාරුකම් ගැන කෙළවරක් නැතිව කථා කරයි. ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට තව කොපමණ කාලයක් ඕනෑද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

නැහැ, මම කථාව අවසාන කරනවා. මම දන්නවා, තමුන්නාන්සේ ආසයි මේවා කියනවාට. මොනවා කරන්නද, ඉතින්? කනගාටුවෙන් වුණත් මා කියන්නේ මේකයි. ධනපති පන්තියට වරප්‍රසාද ලබා දීලා අහිංසක ජනතාවට දුක් කඳුළු හෙළන්න කටයුතු කිරීම පිළිබඳව රජයට අපේ අප්‍රසාදය පළ කරමින්, මේ අය වැයට විරුද්ධව අපි ඡන්දය දෙනවාය කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මීළඟට, ආණ්ඩු පක්ෂයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මහතා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 30ක් තිබෙනවා.

[පූ.භා. 11.10]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබෙන ජයග්‍රාහී අටවැනි අය වැය විවාදයට එකතු වීමට මේ අවස්ථාවේ අපට හැකි වන්නේ, එතුමාගේ නායකත්වය යටතේ අපේ රට ත්‍රස්තවාදයෙන් හා බෙදුම්වාදයෙන් මුදා ගෙන ලබා ගත් විජයග්‍රහණය හේතුවෙන් ඇති වූ පසු බිම නිසායි. ඒ සමඟම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධන වේගය නොනවත්වා සියයට 6.8කට ඉහළින් පවත්වාගෙන යෑමේ ක්‍රියාවලියට අපට අවතීර්ණ වන්න පුළුවන් වී තිබෙන බව පළමුවෙන් සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මට පෙර කථා කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා බොහෝ දේ පටලවාගෙන අය වැය ගැන ගැඹුරින් කිසිවක් සඳහන් නොකර කථා කිරීම ගැන මම කනගාටු වෙනවා. නමුත් මම ඒ ගැන පුදුම වන්නේ නැහැ. මොකද, අද එක්සත් ජාතික පක්ෂයේ මත දහයක් විතර ප්‍රකාශ වන නිසා. එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ කවදාවත් නොතිබුණු මහා අර්බුදයකට හා පසු බෑමකට ලක් වී තිබෙන ලක්ෂණය තමයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රකාශ කළේ.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, 1980 ජූලි වැඩ වර්ජකයන්ගේ අරගලයට සහභාගි වී සහයෝගය දුන්නු වෘත්තීය සමිති නායකයකු හැටියට අතිගරු ජනාධිපතිතුමා, රුපියල් 5,000ක මාසික දීමනාවක් වයස්ගත ජූලි වර්ජකයන් වෙනුවෙන් අය වැය ලේඛනයෙන් ලබා දීම නිසා, මෙය ඓතිහාසික අය වැයක් බවට පත් කර තිබෙන බව. එය ජූලි වර්ජකයන් කීපදෙනකුට සීමා වන්නේ නැහැ. ඒ වර්ජකයන්ගේ ඉල්ලීම්වල සාධාරණත්වය සලකා බලා සහ නොනවත්වා ඒ අය විසින් කරන ලද ඉල්ලීම්වලට කන් දී රාජ්‍ය නායකයා හැටියටත්, මුදල් අමාත්‍යවරයා හැටියටත් ඒ සහනය දීම ඉතාම වැදගත්.

දැන් අපි එහි අනෙක් පැත්ත ගෙන බලමු. ගරු ජෝන් අමරතුංග මැතිතුමා මෙහිදී ඒ අය ගැන කථා කළා. කවුද ඒ සේවකයන් දහස් ගණනක් අස් කළේ? වැඩ වර්ජකයන් 45,000ක් අස් කර ඒ අයට මිලේච්ඡ පහර දීම් කළේ ජෝන් අමරතුංග මැතිතුමන්ලාගේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නොවේද?

අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අද වැඩ කරන ජනතාව ගැන කථා කරනවා. ලජ්ජාවක් නැති මිනිසුන්ට බොහෝ දේවල් කථා කරන්න පුළුවන්. ජෝන් අමරතුංග මැතිතුමාට කියලා තිබෙන කථාව තමයි එතුමා කිව්වේ. හෘදය සාක්ෂියට එකඟව නම් එතුමා ඒක කියන්නේ නැහැ. ඒ කියන්නේ එතුමන්ලාම මේ අය විනාශ කරපු ආකාරය අපි දන්නවා. වෘත්තීය සමිති ව්‍යාපාරය විනාශ කිරීමේ, වෘත්තීය සමිති ව්‍යාපාරය තළා පොඩි පට්ටම් කර දැමීමේ අරමුණ ඇති කළේ තමුන්නාන්සේලාය කියන එක මා මේ අවස්ථාවේ ඉතාම ඕනෑකමින් සඳහන් කරන්න කැමැතියි.

අපේ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් අමුණුගම මැතිතුමා පැහැදිලි කළා වාගේ මා කාරණා කිහිපයක් පමණක් සඳහන් කරන්න කැමැතියි. 2013 සඳහා අය වැය සමස්තයක් වශයෙන් මානව කේන්ද්‍රීය හා සංවර්ධන අය වැයක් බවට පත් කරලා තිබෙනවා. ඉදිරි අවුරුදු තුන සඳහා ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් ප්‍රකාශයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අඩු ආදායම් ලාභීන්ගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා වූ ජීවන මට්ටම උසස් කිරීම ඉලක්ක කර ගෙන අය වැය යෝජනා ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් ක්‍රියා මාර්ගයක් හැටියට මා දකිනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු කථානායකතුමනි, අපේ ආහාර සුරක්ෂිතභාවය, බලශක්ති සුරක්ෂිතභාවය, දිළිඳුකම තුරන් කිරීම, පරිසරය සුරක්ෂිත කිරීම, ඒ වාගේම අපේ රටේ හැදෙන, වැඩෙන නව පරම්පරාවට රැකියා, ජීවනෝපාය අවස්ථාවන් බිහි කිරීම යන කාර්යයන් ඉදිරි අවුරුදු තුන තුළ ගමන් කරන ආකාරය පිළිබඳව අය වැය ලේඛනයෙන් ඉතා පැහැදිලිව ඉදිරිපත් කරනවා. දිළිඳුභාවය සඳහා වූ ප්‍රශ්නයේදී ජලය, සෞඛ්‍ය සම්පන්නභාවය, වහලක් නැති අයට නිවසක් ලබා දීම, අධ්‍යාපනය හා ආහාර ලබා දීම සඳහා වූ ඉලක්ක ප්‍රධාන වනවා. දිළිඳුකම තුරන් කිරීමේ ප්‍රශ්නය පිළිබඳව අපි නිදහස ලැබූ දවසේ සිට පාර්ලිමේන්තුවේ සාකච්ඡා වී තිබෙනවා. මේ සඳහා අපි අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ගන්නා ලද විවිධ මිනුම් දඬුවලින් අද ඉතාම වැදගත් අවස්ථාවකට අපේ රට ගමන් කර තිබෙනවා. According to the Department of Census and Statistics, Headcount ratio has declined from 15.2 in 2006 to 8.9 in 2010. Around 1.8 million are considered poor. The Budget 2013 has allocated Rs. 1,500 million to intensify poverty reduction initiatives targeting the remaining poor. මේ සංඛ්‍යා ලේඛන කියා පානවා, පසු ගිය කාල පරිච්ඡේදය තුළ මිලියනයකට වැඩි ප්‍රමාණයක් දිළිඳුකමින් තොරව විශ්වාසනීය ජීවිතයක් ගත කළ හැකි අය බවට පත් කර තිබෙන බව. විරුද්ධ පක්ෂය මෙය පිළිගන්නේ නැත්තේ ඇයි?

"Sri Lanka Human Development Report 2012" මේ පිළිබඳව සාක්ෂි දරනවා. මේ කථාන්දරය අපි කියනවා නම් තමුන්නාන්සේලා කියයි, අපි තමයි මේවා කියන්නේ කියලා. - [*Interruption.*] I will continue with my speech. It is the UNDP Report 2012, if you want to say UNDP is wrong, you all could say UNDP is wrong. මෙම සංඛ්‍යා ලේඛනවලටත් වඩා අපේ ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළා. UNDP වාර්තාවේ ඉතා පැහැදිලිව මේ පිළිබඳව සඳහන් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. සාර්ක් රටවල් අතර ඉතාම ඉදිරියෙන් මේ දියුණුව ලැබූ රට ශ්‍රී ලංකාව බවත් එහි සඳහන් කර තිබෙනවා.

ඉතින් මේ කුමන ප්‍රතිපත්තිවල ප්‍රගතියක්ද? මෙයයි තමුන්නාන්සේලා කල්පනාවට ගත යුත්තේ කියන එක මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. මේ වෙනස්කම් ඇති කිරීමට අවධානය යොමු කොට, ඒ සඳහා ඇති කරපු වැඩ පිළිවෙළවල්වල සාර්ථකත්වය නිසායි රජයට මේ දේවල් කරන්න හැකිවී තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙන්න මේ කාරණයට ඔබතුමාත් මා සමඟ එකඟ වෙයි. මේ රටේ ගම්බද ජනතාව ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමේ වැඩ පිළිවෙළ දැන් සාර්ථක වී තිබෙනවා. අද අප සහලින් රට ස්වයංපෝෂිත කර තිබෙනවා. කවුද මේක කළේ? මේ රටේ ගොවි ජනතාව සහ ගම්බද ජනතාවයි. ඒ අයට විශ්වාසනීය නායකත්වය ලබා දී යහපත් ආර්ථික පිළිවෙතක් අනුගමනය කළ නිසා ඒ වෙනුවෙන් පිට රටට ගලා ගිය මහා ධනස්කන්ධය අද රටේ ඉතුරු වී ඒ අයගේ ජීවන මට්ටම, ආදායම් මට්ටම වැඩි වී තිබෙනවා. බඩ ඉරිඟු වැනි අනිකුත් වගාවලින් ද රට ස්වයංපෝෂිත වී තිබෙන බව ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී සඳහන් කළා. අනිකුත් අත්‍යවශ්‍ය බෝග ගණනාවකින් රට ස්වයංපෝෂිත කිරීමේ ඉලක්කයට ගමන් කිරීමට අවශ්‍ය යෝජනා මේ අය වැය ලේඛනයෙන් අප ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ ඉලක්ක සපුරා ලීම තුළින් අපට, මේ රටට ඉතුරු කර ගත හැකි විදේශ විනිමය ප්‍රමාණය වැඩි වන අතර, එමඟින් නව ආර්ථික ආදායම් මාර්ග ජනතාව තුළ ස්ථාපිත කිරීමට ද හැකි වෙනවා.

ගරු කථානායකතුමනි, වී වල සහතික මිල වැඩි කළ යුතු යයි අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැය ලේඛනයෙන් යෝජනා කළා. වී කිලෝවක් වෙනුවෙන් දැනට දෙනු ලබන රුපියල් 28-30 සහතික මිල රුපියල් 32-35 දක්වා වැඩි කිරීමට හා කාබනික පොහොර භාවිතයෙන් නිෂ්පාදනය කරන වී කිලෝ එකකට රු. 40 බැගින් ගෙවීමට එතුමා යෝජනා කර තිබෙනවා. උතුරු ප්‍රදේශයට, දකුණට, නැගෙනහිරට, රජ රටට වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා රුපියල් බිලියන 102ක් ආයෝජනය කරනු ලබන්නේ ගොවිතැන හා ආහාර කෘෂිකර්මාන්තය වැඩිදියුණු කරන්නත්, අලුත් ඉඩම් වගා කළ හැකි ක්‍රියා මාර්ගයකට අවතීර්ණ කරවීමටත් නොවේද කියන ප්‍රශ්නය අප නඟන්න කැමැතියි. ඒ වාගේම වී ගබඩා අලුත්වැඩියා කිරීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ගම් මට්ටමේ කුඩා ගොවි ඒකක තුළ ගබඩා ඉදි කිරීමටත් අවධානය යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ සියයට 38ත්-40ත් අතර ප්‍රමාණයක් ආහාර නාස්ති වෙනවා. එසේ වන්නේ හරියාකාර ගබඩා පහසුකම් නැති නිසායි. ගොවීන්ට තම නිෂ්පාදන සඳහා හරියාකාර මිලක් ලබා ගන්නට බැරි ඒ නිසායි. අතිගරු ජනාධිපතිතුමා මේ ප්‍රශ්නය ඉතා පැහැදිලිව හඳුනා ගෙන ගබඩා පහසුකම් වැඩි කිරීම සඳහා මෙවර අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා නියෝජනය කරන ධනපති පන්තියේ දේශපාලන පක්ෂයේ අදහස් වෙනුවට මහින්ද චින්තන ඉදිරි දැක්මේ නව සංකල්ප තවත් ශක්තිමත් කරමින් එතුමා සති පොළවල් වැඩිදියුණු කිරීමේ ක්‍රියා මාර්ගයට අවතීර්ණ වෙලා තිබෙනවා. එමඟින් එතුමා ගම්බද ජනතාවගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ක්‍රියාමාර්ගයට සහයෝගය දක්වා තිබෙනවා. ඒ වාගේම බීජ, පැළ ඇතුළු ඒ වගාවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහාද අය වැය ලේඛනයෙන් ප්‍රකාශයට පත් කර තිබෙන සහන අප මේ අවස්ථාවේ අගය කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. අපේ රටට ආනයනය කරන රසායනික පොහොර වර්ග අඩු කර ගැනීම සඳහා අද මේ අය වැය ලේඛනයෙන් කාබනික පොහොර භාවිතය පිළිබඳ දැඩි අවධානයක් යොමු කර තිබීම අප ඉතාම අගය කළ යුතු කාරණයක්. ඒ වාගේම පළිබෝධ නාශක හා අනිකුත් රසායන ද්‍රව්‍ය නිසා හානියට පත් වන අපේ මහ පොළොව, ඒ තුළින් හානියට පත් වන අපේ ජල පද්ධතිය, භූගත ජලය ආරක්ෂා කර ගත හැකි නව ක්‍රමයක් යෝජනා කොට, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම තුළින් අප රටේ වෙනසක් කරන ආකාරය මනාව පැහැදිලි වෙනවා.

ජීවන තත්ත්වය යටතේ ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට නොහැකි බව හෝ පානීය ජලය ලබා ගැනීමට විනාඩි තිහකට වැඩි කාලයක් ඇවිදීමට සිදු වන බව දිළිඳුබව මැනීමේදී සැලකිල්ලට ගෙන තිබෙනවා. ලක්ෂ පහක් ඉක්මවන නිවෙස් සඳහා පානීය ජලය ලබා දීමේ වැඩසටහන සඳහා ද මෙවර අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බව උතුරු ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ පළමුවෙන්ම සඳහන් කර තිබෙනවා, අවුරුදු 75ක් තිස්සේ බලා ගෙන හිටපු පානීය ජලය සහ වාරි ජලය යන දෙකම උතුරට ගෙන යාමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ක්‍රියා මාර්ගයට අය වැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් කොට වැඩ කටයුතු ආරම්භ කිරීම සිදු වෙනවාය කියලා. ඒ වාගේම මහනුවර, දඹුල්ල, අම්පාර, හම්බන්තොට, බලංගොඩ, කොළඹ, වව්නියාව, පුත්තලම, හලාවත, මන්නාරම, කිලිනොච්චිය සහ යාපනය දිස්ත්‍රික්කයේ ඉතිරි ප්‍රදේශවලට ද පානීය ජලය ලබා දීමේ වැඩසටහනට රුපියල් බිලියන 126ක් මේ ඉදිරි අවුරුදු තුන සඳහා මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා.

2013 වසරේ ආරම්භ වන ඒ වැඩ පිළිවෙළ තුළින් ජන ජීවිතය විශාල පෙරළියකට ජන ජීවිතය පරිවර්තනය කරන්න පුළුවන්කම ලැබෙනවා. ප්‍රජා ජල භාරය සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කිරීමෙන් මිලියන 3ක් පමණ වූ ග්‍රාමීය ජනතාව විසින් ගොඩ නඟාගෙන තිබෙන ප්‍රජා ජල ව්‍යාපෘතිය ශක්තිමත් කිරීමට හැකියාව ඇති වෙනවා.

ගරු කථානායකතුමනි, තවත් කාරණාවක් දෙස හැරී බලමු. අපේ රටේ බලශක්ති අර්බුදයක් පවතිනවා. අපි විශාල මුදල් ප්‍රමාණයක් බලශක්තිය සඳහා වැය කරනවා. ජලය ගොවිතැනටත්, විදුලිබල නිෂ්පාදනයටත් පානීය ජලයටත් පාවිච්චි කරනවා. අපිට මුහුණ දෙන්නට සිදු වී තිබෙන කාලගුණික විපර්යාස නිසා සමහර විට අනාගතයේදී ජල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මීට වඩා උසස් කළමනාකරණයකට අවතීර්ණය විය යුතු වනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ඉතා හොඳින් දන්නවා, අපේ රටේ ජල ක්ෂේත්‍රය ඉතා උසස් කළමනාකරණයකට භාජනය කිරීමේ කාල පරිච්ඡේදයට දැන් අපි පැමිණ තිබෙන බව. එසේ නොකළොත් භයානක ප්‍රශ්නවලට ඉදිරි කාලයේ අපිට මුහුණ දෙන්නට සිදු වෙනවා. අපි දැක්කා, දරුණු ඉඩෝරයක් ආවාම අපට ඩීසල්වලින් විදුලිය නිෂ්පාදනය කරන්න සිදු වුණු බව. මොන තරම් වියදමක් අපිට ඒ ඉන්ධන සඳහා වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවාද? මොන තරම් මූල්‍යමය ප්‍රතිපාදනයක් වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවාද? මේ අර්බුදයට නව විසඳුම් සොයා ගැනීම සඳහා වූ ක්‍රියා මාර්ග අත්‍යවශ්‍ය වනවා. අපේ රටේ විදේශ විනිමය හරියාකාරව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය බව සඳහන් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අය වැය කථාවේ සඳහන් වෙනවා, තවදුරටත් ඩීසල් භාවිතයෙන් බලශක්තිය නිෂ්පාදනය කෙරෙහි ගමන් කළ යුතු ක්‍රියා මාර්ගය අඩු කළ යුතු බව. ඒ නිසා අපි ඇමෙරිකානු ඩොලර් (US$) මිලියන 6000ක් පමණ තෙල් හා පැට්‍රෝලියම් සඳහා වාර්ෂිකව වියදම් කරනවා. අපට මෙය දැරීමට පුළුවන් ප්‍රමාණයට අඩු කර ගැනීමට විකල්ප බලශක්තිය සඳහා ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් හඳුන්වා දීම, මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම, බදු සහන ලබා දීම පිළිබඳව අය වැය ලේඛනයේ ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. විදුලි බලය පමණක් නොව සුළං බලය, සූර්ය තාපය වැනි අපට හිමි වුණ මහා දායාදයන් එලෙසම පාවිච්චි කිරීමට අපි දක්ෂ වුණොත් මේ රටට මොන තරම් වාසනාවන්ත කාලයකට අවතීර්ණ විය හැකිද? මෙය දැක තිබෙන අතිගරු ජනාධිපතිතුමා සංවර්ධනයේ ජයග්‍රහණය සඳහා මෙවර අය වැය ලේඛනයෙන් නව මාවතක් විවෘත කර තිබෙනවා.

මම විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි, අපට තිබෙන සීමිත වූ මුදල් සම්භාරයන් දිහා බලන කොට ගරු කථානායකතුමනි, ඉගෙනගත් ළමයින්ගෙන් විවිධ මට්ටම්වලින් පාසල් හැර යන කොටස, එක්තරා විධියකට දිළිඳුභාවයට පත් වී සිටින කොටසකි. තවත් විධියකට උගත් කොටස අද විදේශ ගත වෙලා තිබෙනවා. මේ තුළින් ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් (US$) මිලියන 5000ක් පමණ ආදායමක් ලබනවා. මේවා අපි හරියාකාරව ප්‍රයෝජනයට ගත යුතුය කියන කාරණාවට අය වැය ලේඛනය මඟින් දැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය සැබෑවක්. ඒ අය යළි ලංකාවට පැමිණි විට ඒ අයට නිවසක් හදා ගත හැකි, හොඳින් තම පවුලේ දියුණුව ඇති කර ගෙන ජීවත් විය හැකි වාතාවරණයක් ඇති කළ යුතුයි. ඒ වාගේම එම මුදල් සම්භාරය හා සමාන මුදල් සම්භාරයක් අපි ඉන්ධන සඳහා වැය කරනවා. අපි තවත් එවැනි කටයුතු සඳහාත් මුදල් වැය කරනවා. අද මේ රට දැවැන්ත ආරක්ෂාවකට පරිවර්තනය කර තිබෙන්නේ මැද පෙරදිග හා දකුණු යුරෝපයේ සේවය කරන ශ්‍රී ලාංකික ජනතාව බව ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ අයගේ ජීවිතවල සුරක්ෂිතභාවය මෙන්ම අය වැය ලේඛනයෙන් ඒ ගොල්ලන්ගේ ආයෝජන මේ රට තුළ වැඩි කරලා තිබෙනවා. රටට මුදල් ගෙනෙන්න එය වැඩියෙන් ආකර්ශණය කර ගෙන තිබෙනවා. ඒ වැඩි වී තිබෙන ප්‍රවණතාව විස්තරාත්මකව තිබෙන සටහන්වල ඉතා පැහැදිලිව සඳහන් වෙනවා.

ගරු කථානායකතුමනි, මට ලැබී තිබෙන කාලය සීමිත නිසා අපි අද මුහුණ දෙන තවත් වැදගත් කාරණාවක්, දෙකක් සම්බන්ධව මා සඳහන් කරන්නට කැමැතියි. මා කලින් සඳහන් කළ පරිදි ඉතාම වැදගත් ප්‍රකාශයක් තිබෙනවා.

The Institute of Policy Studies of Sri Lanka has issued the report titled, "State of the Economy 2012". This report has just been released. It is very interesting. I would like to bring to the attention of the House the crisis that we are facing in forest cover.

Page 66 of the report states:

> "The depletion of forest resources and associated losses in biodiversity have been long discussed environmental issues in Sri Lanka. The extent of natural forest in 2010 was estimated to be 1,883,310 ha, which accounts for nearly 28.7 per cent….."

Now the Proposal in the Budget has been to increase this to over 30 per cent.

මෙය අත්‍යවශ්‍යයි. මොකද, කාලගුණ විපර්යාසයෙන් හානි විය හැකි තත්ත්වයන් අපි නිවැරදි කර ගත්තේ නැත්නම් ඒක අපේ ගොවිතැනට බලපානවා, අපේ කර්මාන්තවලට බලපානවා, අලුතින් විවෘත කර තිබෙන සහනයන් මඟින් හිස ඔසවන අපේ ස්වයං රැකියා ක්ෂේත්‍රයට බලපානවා. ඒ නිසා අය වැය ලේඛනය මඟින් ඉතා පැහැදිලිව එය පිළිගනිමින් අපේ කැළෑ අලුතින් වගා කිරීමට, ආරක්ෂා කිරීමට පෙන්වා දී තිබෙන සාධකයන් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ජල මට්ටම පිළිබඳව ද මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. මා මේ කථා කරන්නේ අය වැය ලේඛනයේ තුන් අවුරුදු ක්‍රියාමාර්ගය පිළිබඳව විශ්වාසයක් ජනිත කරලා තිබෙන එක ගැනයි. සංවර්ධන විශ්වාසය, ආයෝජක විශ්වාසය, දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ඇති කරලා තිබෙනවා. ඒ තුළින් ජල සම්පත අපට අති සුවිශේෂයි කියන එක කියන්න පුළුවන්.

Page 69 of the Policy Report very clearly states and highlights the problems we are faced with regard to water resources. I hope we will be able to follow these policies so that we will not be threatened heavily by the climate change mentioned in page 71.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසු ගිය කාල පරිච්ඡේදය තුළට වඩා අපේ රටේ ගෙවත්තේ නිෂ්පාදනය සහ ගමේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා දිවි නැගුම වැඩසටහන දියත් කරපු සාර්ථකත්වය තවත් ශක්තිමත්ව ඉදිරියේදී දියත් කරන්න ලැබෙයි කියන එක මා සඳහන් කරන්න කැමැතියි. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඒ පිළිබඳව දක්වා තිබෙන උනන්දුව නිසා ගම් මට්ටමෙන් අපේ රට පුරා ඇති සෑම ගමක්ම නව පිබිදීමකට පැමිණ තිබෙනවා. ඒ අනුවයි කිරි කර්මාන්තය දියුණු වුණේ. කිරි කර්මාන්තය ඇතුළු කුඩා කර්මාන්තවල නිෂ්පාදනයන්ට පමණයි ආහාර අතින් අප මුහුණ දෙන තත්ත්වයේ ආරක්ෂාව ලබා දීමටත්, විදේශ විනිමය ඇමෙරිකානු ඩොලර් (US$) මිලියන 350ක් ඉතිරි කර ගැනීමටත් හැකි වන්නේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන ප්‍රශ්නය පිළිබඳව මේ වාර්තාවේ කියවෙනවා. ලක්ෂයක් පමණ තරුණ තරුණියන් අද විශ්වවිද්‍යාල සුදුසුකම් ලබනවා. මගේ මිත්‍ර ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා ඒ පිළිබඳව දරන විශේෂ උත්සාහයන් මේ වෙලාවේ අපි සඳහන් කරන්නට ඕනෑ. මේ වාර්තාවෙන් කියැවෙන්නේ වඩාත් පුහුණු ශ්‍රමිකයන් බිහි කරන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයක් අවශ්‍ය වී තිබෙන කාල පරිච්ඡේදයක අප සිටින බවයි.

Page 80 of the report states:

> "Currently, Sri Lanka's Tertiary education system caters to only a very small proportion of the population. Due to the limited number of placements in the state funded universities, only 17 per cent of those who qualify for university education gain admission to State Universities. Each year, more than 100,000 qualified students are forced to abandon their ambitions to enter university. Compared to other comparable countries, the number of students enrolled in tertiary education is extremely low in Sri Lanka. For example, in 2009, only 3.6 per cent of 20 - 24 year olds were enrolled in a university while only a further 3.6 per cent of the same age group was enrolled in technical and vocational training ………"

මෙය හඳුනා ගනිමින් කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය; වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය, පර්යේෂණ සම්බන්ධයෙන් අය වැය ලේඛනයේ දක්වා තිබෙන ආයෝජනය හා වැඩ පිළිවෙළ අපි මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. අපේ රටේ නව පරම්පරාවට එවැනි ක්ෂේත්‍රවලට පිවිසෙන්න පුළුවන් වන ශක්තිය තමයි, කාර්මික හා වෘත්තීයමය දැනුම ඇති අධ්‍යාපනයකින් ඔවුන්ගේ අධ්‍යාපනය හමාර කර ගැනීමට අවස්ථාව සැලසීම. මා හිතනවා, ඒ කාරණාව ගැන අන් කිසි දවසකට වඩා අද අපි අපේ අවධානය යොමු කරන්නට ඕනෑය කියලා. සෑම නිවසකම සිටින බොහෝ දෙනා අද වඩා හොඳ රක්ෂාවක් ප්‍රාර්ථනය කරනවා. සෑම නිවසකම ඉගෙන ගත් අයට, ඒ වාගේම අධ්‍යාපනය සඳහා වූ අවස්ථා පසු කරමින් සිටින අයට ඊට වඩා අත් දැකීමක්, රැකියාවක්, ජීවනෝපාය මාර්ගයක් ලබා ගත හැකි කාරණා පිළිබඳ දක්වන ක්‍රියාමාර්ග ගැනත් මෙවර අය වැය ලේඛනය සහතික කර තිබෙනවාය කියන එක අප විශ්වාස කරනවා.

අපි ප්‍රකාශ කරලා තිබෙන මේ රාමුව ආරක්ෂා කර ගනිමින් අපේ විදේශ ණයගැතිභාවය අඩු කර ගැනීමට ආයෝජකයන් ගෙන්වා ගැනීමට අපට සිදු වනවා. ආයෝජකයන් ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නය අපි දන්නවා. දැන් ලෝකය පුරා ගෝලීයකරණය තුළ මහා ආයෝජකයන්ගේ, සමාගම් විශාල ප්‍රමාණයක් ලොව පුරා ගමන් කරනවා. ඒ ආයෝජකයන්ගේ යම් යම් කොන්දේසි තිබෙනවා. ලෝකයේ මූල්‍ය වෙළෙඳ පොළේ අද විශ්වසනීය ආයෝජකයන් සිටිනවා, එසේ නොවන ආයෝජකයන් ද සිටිනවා. මෙය තෝරා බේරා ගැනීමේ ගැටලුවකට අප වාගේ රටවල් සහ ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙනවා. තමනට ආයෝජකයන් කැඳවා ගැනීම වාගේම තමනට ආයෝජකයන් රඳවා ගැනීමේ ක්‍රියා මාර්ගයන් ඉතාම වැදගත් යැයි අපි මේ අවස්ථාවේ විශ්වාස කරන්නේ, එම ක්‍රියා මාර්ගය විසින් ජනිත කරන නව දැනුම හා නව ආයෝජනය නව රැකියා බිහි කිරීමට හැකි තවත් මාවතක් බවට පත් කරන නිසායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය වුණේ මොකක්ද? එක්සත් ජාතික පක්ෂය කරන්න හැදුවේ සියලුම රාජ්‍ය සංස්ථා විකුණා දැමීමයි; ඒවා වසා දැමීමයි. එලෙස ඒ නිෂ්පාදන අඩපණ කරන හානිදායක ආර්ථික ක්‍රියා මාර්ගයක අපේ රජය ගමන් කළේ නැහැ. මේ අය වැය ලේඛනයත් එවැනි ගමන් මඟකට පිවිසිලා නැති බව මම සඳහන් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, අද ජාත්‍යන්තර වශයෙන් තිබෙන වාතාවරණය මොකක්ද? අද ජාත්‍යන්තර පුවත මොකක්ද? ඔබාමා ජනාධිපතිතුමා හදිසියේ විශේෂඥයන් කැඳවා තිබෙනවා, ඇමෙරිකන් ආර්ථිකය සියයට 2ක වර්ධන වේගයකින් පවත්වා ගෙන යන්න පුළුවන්ද කියලා සොයන්න. ඇමෙරිකාව අය වැය ලේඛනයෙන් මුහුණ දෙන දරුණුතම අර්බුදය අය වැය හිඟය - ණය හිඟය - පියවා ගන්නේ කෙසේද කියන එකයි. ජාත්‍යන්තරව මෙවැනි වාතාවරණයක් පවතිද්දී -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඇයි, චීනය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
චීනය ලබා තිබෙන යෝධ දියුණුව ලැබුණේ චීනය සමාජවාදී ගමන් මඟින් ආරම්භ කළ ගිය නිසා මිසක් තමුන්නාන්සේලා කියන ගමන් මඟෙහි ගිය නිසා නොවෙයි. අද චීනය යෝධයෙක් වී තිබෙනවා. ඉන්දියාව යෝධයෙක් බවට පත් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මගේ කථාව අවසන් කරන්නයි යන්නේ. ගරු ජෝන් අමරතුංග මහත්තයලා ඒ කාලයේ චීනය පිළිගත්තේත් නැහැ. [බාධා කිරීමක්] 1956 මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ජනතා ජයග්‍රහණයෙන් පස්සේ තමයි මහජන චීනය රටක් හැටියට තනාපති සේවාවට ශ්‍රී ලංකාව පිළිගත්තේ. අනාගතයේ සිදු වන මේ දේශපාලන වෙනස්කම් දැකලායි එවැනි වෙනස්කම්වලට අපේ රට භාජනය කළේ.

ගරු කථානායකතුමනි, වේලාව නොමැති නිසා මම කථාව අවසන් කරන්නයි බලාපොරොත්තු වන්නේ. මම විශ්වාස කරනවා, අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙන් අපට විශාල ජයග්‍රහණ ලැබී තිබෙනවාය කියලා. අපේ විදේශ විනිමය අනුපාතය පවත්වා ගෙන යාම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය අපේ රටේ ඉදිරි ප්‍රශ්නවලට වැදගත් වනවා පමණක් නොව ශ්‍රී ලාංකිකයන් විදේශගතව අමාරුවෙන් සොයා දෙන මහා ධනස්කන්ධය ආරක්ෂා කර ගැනීමට ආයෝජනයන් වැඩි කර ගැනීමටත් ප්‍රතිපත්තියක් කර ගෙන තිබෙන බවත් මා සඳහන් කරන්න කැමැතියි.

ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා අද උදේ මා ගැන සඳහන් කරපු නිසා ඒ කාරණය ගැනත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනයෙන් කියලා තිබෙන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව නොවෙයි. එතුමා කියලා තිබෙනවා පළාත් සභාවල වියදම වැඩියි කියලා. සත්‍ය ඒක නේ. නැහැයි කියනවාද? වියදම වැඩි නම් සාකච්ඡා කරලා වියදම අඩු කර ගැනීමේ නව ක්‍රමවේදයන් අනුගමනය කරන්න සිද්ධ වෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පළාත් සභා අහෝසි කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා මේ පැත්තේ ඉන්න කොට ඔබතුමාගෙන් මම මේ වාගේ ප්‍රශ්නයක් ඇහුවා, "රනිල්- ප්‍රභා ගිවිසුම අවසන් කරනවාද?"

කියලා. එදා ඔබතුමා ඒකට උත්තර දුන්නේ නැහැ. උත්තර දෙන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනයෙන් ඉතා පැහැදිලිව කියලා තිබෙනවා පළාත් සභාවල මහා වියදමක්, නාස්තිකාර වියදමක් තිබෙනවා නම් ඒවා වෙනස් කරන්න ඕනෑ කියලා. ඒක කරන්න ඕනෑ. [බාධා කිරීම්] ඒවා පටලවා ගෙන-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

පළාත් සභාවේ වියදම් ගැන කියන්නේ, ඇයි ආණ්ඩුවේ වියදම්?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් සභා අවුරුදු 25ක් පරණයි. එදා කරපු යෝජනාවෙන් පස්සේ අද ඉන්දියාවේත් විශාල වෙනස්කම් ඇති වෙලා තිබෙනවා. ප්‍රාන්ත කුඩා කරලා තිබෙනවා. ජනතාවට සහභාගි විය හැකි පහළ මට්ටමේ ආයතන අලුතින් එකතු කරලා තිබෙනවා. මේ අය කථා කරන්නේ දේශපාලන කුමන්ත්‍රණයක් ගැනයි. ඒ කුමන්ත්‍රණකරුවන් තමුන්නාන්සේලායි. ඒ ගමන යන්න එපා. තමුන්නාන්සේලා කිව්වා රට බංකොලොත් කියලා. රට බංකොලොත් වුණේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

තව ඉස්සරහට.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

තමුන්නාන්සේලා යුරෝපයට ගිහිල්ලා කිව්වා, අපේ බඩු ගන්න එපා කියලා. [බාධා කිරීම්] ඒ කේලාම් කිව්වේ තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලා අද - [බාධා කිරීම්] මගේ කථාව අවසන් කිරීමට පෙර මේ ටිකත් කියන්න ඕනෑ. තමුන්නාන්සේලා අද ලෝකයට පැමිණිලිකරුවන් වෙන්නයි හදන්නේ. තමන්ගේ රටට එහෙම කරන්න එපා. තමන්ගේ රටේ ජනතාවට එහෙම කරන්න එපා.

අද මේ රටේ ආර්ථිකය වැඩෙනවා; තරුණයන්ට අලුත් රැකියා අවස්ථා ලැබෙනවා; ගොවි ජනතාවට සහන ලැබෙනවා; ආයෝජකයන් පැමිණෙනවා; සංචාරකයන් වැඩි වෙන්න පටන් ගෙන තිබෙනවා. ඔබතුමන්ලා ඊර්ෂ්‍යාවන්ත වෙන්න එපා. වැරදි ප්‍රතිපත්ති වෙනස් කරන්න. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති වැරදියි. ප්‍රතිපත්ති වැරදි නිසා ජනතාව එක්සත් ජාතික පක්ෂය 24වැනි වතාවටත් පරාජයට පත් කරලා තිබෙනවා. අලුත් ප්‍රතිපත්ති හදන්න. අපිත් එක්ක එකඟතාවෙන් මේ ප්‍රශ්න විසඳා ගෙන කටයුතු කරමු.

මේ යුගය රටේ සංවර්ධන යුගය බවට පත් කරන්න අතිගරු ජනාධිපතිතුමා සමඟ වැඩ කරමු. මේ ආණ්ඩුව පක්ෂ 15ක ආණ්ඩුවක්. මේ ආණ්ඩුව තුළ, මම මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරනවා. මහජන එක්සත් පෙරමුණේ මතවාදය අපි ආරක්ෂා කර තිබෙනවා. තමුන්නාන්සේලා විමල් වීරවංශ මැතිතුමාට පහර ගහනවා; එහෙම නැත්නම් ජාතික හෙළ උරුමයට පහර ගහනවා; මහජන එක්සත් පෙරමුණට පහර ගහනවා. රනිල් වික්‍රමසිංහ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා අද උදේ කලබල වුණා. මොකටද මේ කලබලය? අපත් එක්ක ඉඳ ගෙන කථා කරනවා නම් මොකටද කලබල වෙන්නේ? රනිල් වික්‍රමසිංහ මහතාට මම කියනවා දෙසැම්බර් 01වැනි දා වන තුරු ඉවසීමෙන් වැඩ කරන්නය කියලා. නැත්නම් රනිල් වික්‍රමසිංහ මහතාට පක්ෂය ඇතුළේම කැරැල්ලක් උදා වෙනවා. ඒ නිසා අය වැය සම්මත කරලා ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයේ ආශ්චර්යමත් දේශයේ ගමන් මාර්ගයකට 2013 වසරේදී අපත් එක්ක ගමන් කරමුය කියන ටික සඳහන් කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] took the Chair.*

[පූ.භා. 11.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් ධම්මපදය කේන්ද්‍ර කර ගෙන මගේ කථාව ආරම්භ කරන්න මම බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

"අසාරෙ සාරමතිනො - සාරෙ චාසාරදස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡාසඞ්කප්පගොචරා"

යනුවෙන් උන් වහන්සේ දේශනා කර තිබෙනවා.

එහි තේරුම, යමෙක් සරු දෙය නිසරු හැටියට ප්‍රකාශ කරනවා නම්, තවත් පුද්ගලයකු නිසරු දේ සරු හැටියට ප්‍රකාශ කරනවා නම්, වැරදි මත පදනම් වෙච්ච එවන් ප්‍රකාශ නිසා ඒ පුද්ගලයා පිරිහෙන්නේය කියන එකයි . ඒ වාගේම,

"සහස්සමපි චෙ වාචා - අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති"

යනුවෙන් උන් වහන්සේ දේශනා කර තිබෙනවා.

එහි තේරුම වන්නේ කෙලෙස් උපදවන වචන දහසකට වැඩිය යහපත උදා කරන එක වචනයක් වටිනවා කියන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙනම් මේ අය වැය ගැන මගේ අදහස් ඉදිරිපත් කරන කොට නිසරු දෙය නිසරු හැටියට සඳහන් කරන්නටත්, සරු දෙය සරු හැටියට සඳහන් කරන්නටත් මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන් මේ රටටත්, ජනතාවටත් යහපතක් උදා වන ආකාරයට මගේ අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ අය වැය ගැන කථා කරන කොට විශේෂයෙන්ම ආර්ථික විශේෂඥ ක්ෂේත්‍රයක් තුළින්, එවන් දෘෂ්ටි කෝණයකින් බලනවා නම් අපි දෙයාකාරයකින් බලන්න ඕනෑ. ප්‍රථමයෙන්ම අපි බලන්නට ඕනෑ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය - fiscal management- පැත්තෙන්. දෙවනුව අපි බලන්න ඕනෑ, සාර්ව ආර්ථික විචල්‍යයන් කළමනාකරණය - management of macroeconomic variables - පැත්තෙන්.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර අය වැයේ, ආදායම් වියදම් කළමනාකරණයේ - income and expenditure management - ආදායම් පැත්ත දිහා අපි ප්‍රථමයෙන්ම බලමු.

වර්තමාන ආණ්ඩුව වක්‍ර බදු උපයෝගී කර ගෙන, රාජ්‍ය ආදායම උත්පාදනය කරන්නට උත්සාහ කරනවා. විශේෂයෙන්ම අය වැය සාරාංශයේ 4වෙනි වගුවේ සඳහන් වෙලා තිබෙනවා රාජ්‍ය ආදායම උත්පාදනය කරන්නට උත්සාහ කරන්නේ වක්‍ර බදු - indirect taxes - උපයෝගී කර ගෙන කියලා. පැහැදිලිවම අපි සඳහන් කරන්නට ඕනෑ, වක්‍ර බදු කියන්නේ regressive tax එකක් බව. ඒ කියන්නේ ප්‍රතිගාමී tax එකක්. දුප්පත්, පොහොසත් ආදායම් භේදයකින් තොරව හැමෝටම එක හා සමානව දඬුවම් දෙන ක්‍රමයක් තමයි මේ වක්‍ර බද්ද; - regressive tax එක. ඒ නිසා මේ ආණ්ඩුව වක්‍ර බදු තුළින් රජයේ ආදායම් උත්පාදනය කරන්නට උත්සාහ කිරීම ඇත්ත වශයෙන්ම මම දකින්නේ ඉතාමත්ම නින්දිත, පහත් ක්‍රියාවක් හැටියටයි. ලෝකයේ රජයක් ආදායම් උත්පාදනය කරන්නට උපයෝගී කර ගන්නා සර්ව සාධාරණ ක්‍රමය වන්නේ ප්‍රගතිශීලී බදු ක්‍රමයයි; progressive tax system එකයි.

අද ප්‍රගතිශීලී බදු ක්‍රමය පැත්තකට දමලා මේ රටේ ජනතාවගේ ආදායම් මට්ටම කුමක් වුණත්, හැමෝටම එක හා සමානව සලකලා, මේ රටේ පුංචි මනුස්සයාගේ බඩට ගහන වක්‍ර බදු දියත් කරමින් මේ අය වැය පුංචි මනුස්සයාට මහා බරපතළ අසාධාරණයක් සිදු කරනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම මේ ගසා තිබෙන වක්‍ර බදු තුළින් විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ ආයෝජන ධාරිතාවට, ඉතිරි කිරීමේ ශක්තියට අහිසි බල පෑමක් සිදු කරලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැති කාරණයක් තිබෙනවා. පසු ගිය දා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවැත්වුණ මැතිවරණයේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනතාව අන්ත නින්දිත, අන්තවාදී දක්ෂිණාංශික ආර්ථික සංකල්පය පැත්තකට දමලා, පෝසතුන්ට බදු සහන ලබා දීම පැත්තකට දමලා, මධ්‍යම පන්තියට සලකන ඔබාමා රජය බිහි කළේ පුංචි මනුස්සයාට සහන ලබා දෙන යුගයක් ඇමෙරිකාවෙත් බිහි වන්නට ඕනෑ කියලා ඒ අයත් පිළිගෙන තිබෙන නිසායි. නමුත් අද අපේ රට පාලනය කරන රජය මොකක්ද කරන්නේ? මේ රජය වක්‍ර බදු හරහා මේ රටේ කුඩා, විශාල සෑම සියලු දෙනාම එකම තැනකට දමලා හැමෝම ආර්ථික වශයෙන්, සමාජීය වශයෙන් තලා පෙළන යුගයක් ක්‍රියාත්මක කර තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුව වක්‍ර බදු පනවන්න ලොකු දක්ෂතාවක් ඉස්මතු කරලා තිබෙනවා. නමුත් ආණ්ඩුව මොහොතකටවත් උත්සාහ කර නැහැ, බදු දැල පැහැර හරින, -මේ රටේ සුවහසක් ජනතාවගේ පැහැර හරින ලද බදු- අය බදු දැලට එකතු කරන්න. ඒ සඳහා කිසිම ක්‍රමයක් ඇතුළත් කරලා නැහැ; කිසිම ක්‍රමයක් ඉදිරිත් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 දෙසැම්බර් 31වෙනි දා වන විට මේ රටේ පැහැර හරින ලද බදු ප්‍රමාණය රුපියල් මිලියන 94,000යි. -රුපියල් බිලියන 94යි-. ඒවායේ දඩ මුදල රුපියල් මිලියන 45,000යි. -රුපියල් බිලියන 45යි-. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් අද මේ රජය ක්‍රියාත්මක කර තිබෙන බදු ව්‍යුහය - tax structure එක - බදු රාමුව - tax framework එක- නිර්මාණය කර තිබෙන්නේ ඇති හැකි ජනතාව අධි පෝසතුන් බවට පත් කරන්නටත්, නැති බැරි ජනතාව නැති බැරිකම කියන මහා මර උගුලේ හිර කරවන්නටත් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එක පැත්තකින් රාජ්‍ය ආදායම ගැන කථා කරනවා. අපි දැන් රාජ්‍ය වියදම පැත්තට අවධානය යොමු කරන්නට ඕනෑ. මොහොතකට හිතලා බලන්න, මේ රජය ක්‍රියාත්මක කරන ආදායම් වියදම් වැඩ සටහන ගැන. විශේෂයෙන්ම වියදම් ක්ෂේත්‍රය දිහා බැලුවාම පෙනෙනවා, එක පැත්තකින් වර්තන වියදම් තිබෙනවා. තවත් පැතතකින් ප්‍රාග්ධන වියදම් තිබෙනවා. ලෝකයේ ඕනෑම රටක්, ඕනෑම ආර්ථික විශේෂඥයෙක් පිළිගන්නා කාරණාවක් තමයි ප්‍රාග්ධන වියදම්වලට වැඩි බරක් දැම්මොත් තමයි රටක් දියුණු වෙන්නේ කියන එක. වර්තන වියදම් වර්ධනය කිරීමෙන් රටක දියුණුවක් සාක්ෂාත් කිරීම අමාරුයි.

අපේ රටේ වර්තන වියදම් ප්‍රතිශතය දිහාවට මම අවධානය යොමු කරන්නට කැමැතියි. 2011 එය සියයට 71.8යි. 2012 එක සියයට 72යි. 2013 දී එය සියයට 71ක වර්තන වියදම් ප්‍රතිශතයක් ඉලක්ක කර තිබෙනවා. නමුත් ප්‍රාග්ධන වියදම්වලට මොකක්ද වෙලා තිබෙන්නේ? එය 2011 දී සියයට 29යි; 2012 දී සියයට 28යි. 2013 දී සියයට 30ක ප්‍රාග්ධන වියදමක් ඉලක්ක කර තිබෙනවා. මේ වර්තන වියදම්වලින් මා පෙන්නුම් කරන්න කැමැතියි, පොලී ගෙවීම් ප්‍රතිශතය කොපමණද කියලා. එය 2011 දී සියයට 35.4යි; 2012 දී සියයට 35යි. ඒ වාගේම 2013 දී සියයට 35.1යි.

එපමණක් නොවෙයි. මේ රජය යටතේ අද වෙනකොට රාජ්‍ය ආයතන රැසක් පාඩු ලබනවා. SriLankan Airlines එක මිලියන 17,000ක් මිහින් ලංකා ආයතනය මිලියන 1900ක්, විදුලිබල මණ්ඩලය මිලියන 43,722ක් පාඩු ලබනවා. එපමණක් නොවෙයි. ඛනිජ තෙල් සංස්ථාව, ගමනා ගමන මණ්ඩලය ඒ වාගේම දුම්රිය දෙපාර්තමේන්තුව යනාදී ආයතන රැසක් අද පාඩු විඳිනවා. වැට් බදු වංචාව නිසා අපේ රටට රුපියල් මිලියන 39,000ක් අහිමි වෙලා තිබෙනවා. එහෙම නම් මේ රටේ පුංචි මනුෂ්‍යයාට වක්‍ර බදු පටවලා, ඒ වක්‍ර බදුවලින් ලැබෙන ආදායමෙන් මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද? කරන්නේ පාඩු ලබන ආයතන තවදුරටත් පෝෂණය කිරීමයි. ඛනිජ තෙල් සංස්ථාව තුළින් අද මේ රටේ දූෂණය වංචාව හොරකම විසි හතර පැයම, තුන්සිය හැටපස් දවසෙම ව්‍යාප්ත වී තිබෙන මොහොතක ආණ්ඩුව මොකක්ද කරන්නේ? ආදායම් මට්ටම නොසලකා මේ රටේ සමස්ත ජනතාවගේ කර පිට වක්‍ර බදු, ප්‍රතිගාමී බදු පටවලා මේ රටේ ජනතාව මිරිකලා මිරිකලා, ඒ මිරිකීම තුළින් ලබා ගන්නාවූ ආදායම තුළින් මේ රටේ එක්තරා ප්‍රභූ පැලැන්තියක් විතරක් සුඛවිහරණය ලැබීමයි අද අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. ඒක තමයි ආණ්ඩුව කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමාන රජය බොහොම ඕනෑකමින් පම්පෝරි ගහනවා අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට එන්න එන්නම අඩු කර

ගන්න කටයුතු කර තිබෙනවා කියලා. එය 2011 දී සියයට 6.9යි; 2012 දී සියයට 6.2යි. 2013 දී සියයට 5.8ක් ඉලක්ක කර තිබෙනවා. ඒක ඇත්ත. අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අඩු කර ගන්නට මේ ආණ්ඩුව බොහොම සාර්ථකව කටයුතු කර තිබෙනවා. ඒක කර තිබෙන්නේ කොහොමද? සමෘද්ධි සහනාධාරය වැඩි කර නැහැ. පොහොර සහනාධාරය වැඩි කර නැහැ. නියඟයෙන් පීඩා විඳි ජනතාවට ලබා දීලා තිබෙන්නේ සොච්චමක්. මහපොළ ශිෂ්‍යත්වය -ශිෂ්‍යාධාරය- වැඩි කර නැහැ. රාජ්‍ය සේවක වැටුප් වැඩි කර නැහැ. ඒ අයට සොච්චම් දීමනාවක් විතරක් ලබා දීලා තිබෙනවා. ගුරු වැටුප් විෂමතා විසඳා නැහැ. විශ්‍රාම වැටුප් විෂමතා විසඳා නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළින් ලබා දුන්නු නොමිලේ දිවා ආහාරය අද කප්පාදු කරලා. ගොවි විශ්‍රාම වැටුපට මුදල් වෙන් කරලා නැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැතිවරණ වේදිකාවක් වේදිකාවක් පාසා රටේ ජනතාවට දෙනවාය කියපු සුබසාධන මල්ල කප්පාදුවට ලක් කරලා, සමූල ඝාතනයට ලක් කරලා අය වැය හිඟය අඩු කර ගත්තාය කියන එක මහා ලොකු දෙයක් නොවෙයි කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව ආරම්භයේදීම මම ඔබතුමාට ප්‍රකාශ කළා, අය වැයක් ගැන කථා කරන විට එක පැත්තකින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ගැන - fiscal management - අපි බලන්න ඕනෑ කියලා. ඒ වාගේම අපි සාර්ව ආර්ථික විචල්‍යයන් කළමනාකරණය - management of macroeconomic variables - දෙසත් අපි බලන්නත් ඕනෑ. මම කැමැතියි, ඒ පිළිබඳව මගේ අදහස් මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අද වන විට ආණ්ඩුව කියනවා, උද්ධමනය අඩු කරන්න මේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා කියලා. උද්ධමනය ගැන කථා කරන විට උද්ධමන වර්ග ගණනාවක් තිබෙනවා. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය - cost-push inflation, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය - demand-pull inflation, වැටුප් උද්ධමනය - wage inflation - තිබෙනවා. දැන් ආණ්ඩුව පෙන්නුම් කරනවා, 2008 දී සියයට 22.6ක්ව තිබුණු උද්ධමනය 2009 වන විට සියයට 3.4 දක්වා අඩු කර ඇති බව. සියයට 84.9ක අඩු කිරීමක් කරන්න ආණ්ඩුව සමත් වෙලා තිබෙනවාය කියනවා. කොහොමද, මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ මේ ඓතිහාසික උද්ධමන වේගය මේ තරම් ඉක්මනට අඩු කරන්න මේ ආණ්ඩුව කටයුතු කර තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නූල් සූත්තර ගණිතමය ජිල්මාට් එකක් ක්‍රියාත්මක කර තමයි අද උද්ධමනය ගණනය කිරීම කර තිබෙන්නේ. ඒ මිසක් සැබෑ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා නොවෙයි. යථාර්ථවාදී නොවන මිථ්‍යාවාදී උද්ධමන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා පම්පෝරි ගහන්න අද ආණ්ඩුව පිඹුරු පත් සකස් කරලා තිබෙනවා. මොනවාද මේ අය කරලා තිබෙන්නේ? පහු ගිය කාලය තුළ දෙවතාවක්ම උද්ධමනය ගණනය කරන පදනම් වර්ෂය වෙනස් කරලා තිබෙනවා. 1952 පදනම් වර්ෂය 2002 බවට පරිවර්තනය කළා, 2007-2008 කාලයේදී. 2011 දී නැවත වරක් 2006-2007 වශයෙන් පදනම් වර්ෂය වෙනස් කළා.

ඒ විතරක් නොවෙයි. උද්ධමනය ගණනය කරන්නට සකස් කෙරුණු භාණ්ඩ පැස අද සහමුලින්ම වෙනස් කරලා. මද්‍යසාර, පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ඒ භාණ්ඩ පැසෙන් ඉවත් කරලායි අද උද්ධමනය ගණනය කරන්නේ. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ආණ්ඩුව කථා කරන පම්පෝරි ගහන උද්ධමන වේගයට අමතරව සැබෑ උද්ධමනයක්, සැඟවුණු උද්ධමන වේගයක් අද අපේ රටේ තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ තවත් සාර්ව ආර්ථික විචල්‍යයක් පිළිබඳව කථා කරන්න කැමැතියි. වැදගත්ම macroeconomic indicator එකක් තමයි විරැකියාව පිළිබඳ ප්‍රශ්නය. මම මගේ කථාවේ මුලදී කිව්වා අපි ඇත්ත ඇති සැටියෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. සංඛ්‍යා ලේඛනවලට අනුකූලව ඇත්ත වශයෙන්ම විරැකියාවේ අඩු වීමක් සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි රජයට ප්‍රශංසාව පළ කරනවා. 2005 වසරේ සියයට 7.2ක්ව තිබුණු විරැකියා ප්‍රතිශතය 2010 දී සියයට 4.9 දක්වා අඩු කර තිබෙනවා. හැබැයි විරැකියා ප්‍රතිශතවල සැඟවුණු භයංකාර ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි තරුණ විරැකියාව - youth unemployment. ශ්‍රම බලශක්ති සංගණනය පිළිබඳ 2011 වාර්ෂික වාර්තාවට අනුව අවුරුදු 15-24 අතර වයසැති, තරුණ විරැකියා ප්‍රතිශතය පිරිමින් අතර සියයට 12.9යි. තරුණියන් අතර සියයට 24.8යි. ඒ නිසා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අද විරැකියාව තුරන් කරන්නට, විරැකියාව අවම කරන්නට ජාතික ප්‍රතිපත්තියක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අගනුවරට පමණක් සීමා වෙලා තිබුණු ඒ සම්පත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ යුගයේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහන හරහා එදා රට වටේම ව්‍යාප්ත කරලා විරැකියාව තුරන් කරන මුළු රටම වෙළා ගත් පැහැදිලි, ඒකාබද්ධ ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළා. නමුත් ගරු ඇමතිතුමනි, අද අපේ රටේ රැකියා සංයුතිය දිහා බලන්න. ඔබතුමා මේක අවබෝධ කර ගන්න ඕනෑ. අපේ රටේ රැකියා සංයුතිය මොකක්ද? රාජ්‍ය සේවකයන් සියයට 14ක් ඉන්නවා. ස්වයං රැකියාවල නියැලෙන අය සියයට 31.4ක් ඉන්නවා. පෞද්ගලික අංශයේ සියයට 40. 4ක් ඉන්නවා. ඒ වාගේම ගෙවීම් නොකරන ගෘහිණියන් - unpaid female workers - සියයට 11ක් ඉන්නවා. එහෙම නම් ගරු ඇමතිතුමනි, අපේ රටේ රැකියා නියුක්තියන්ගෙන් සියයට 71.8ක් ඉන්නේ පෞද්ගලික අංශයේ සහ ස්වයංරැකියා ක්ෂේත්‍රයේයි. [බාධා කිරීමක්] ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න. පෞද්ගලික අංශයේ රැකියා උත්පාදනය කරන්න, මේ රටේ නව ආයෝජන දියත් කරන්න, ස්වයං රැකියා ක්ෂේත්‍රය දියුණු කරන්න මොනවාද මේ ආණ්ඩුව ලබා දී තිබෙන දිරි ගැන්වීම්, මොනවාද ලබා දී තිබෙන ශක්තිය කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ පිළිබඳ පැහැදිලි ඒකාබද්ධ වැඩසටහනක් දියත් කරලා නැහැ. මම ඒ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ආණ්ඩුව බොහොම ලස්සණට පම්පෝරි ගහනවා, මහා පරිමාණයේ ව්‍යාපෘති - mega projects - ක්‍රියාත්මක කරනවාය කියලා. ඒ හැම ව්‍යාපෘතියක්ම පිට රටින් බද්ධ ණය අරගෙනයි ක්‍රියාත්මක කරන්නේ. You are subjecting this country to tied loans. බද්ධ ණය කියන්නේ මොකක්ද? අල්පෙනෙත්තේ ඉඳලා, ඉදිකටුවේ ඉඳලා, වාහනයේ ඉඳලා, පුහුණු, නුපුහුණු කම්කරු ශ්‍රමය දක්වා හැම එකක්ම මේ රටට පිට රටින් ගෙනැල්ලයි මේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් සවන් දෙන්න. මට දීර්ඝ ඉදිරිපත් කිරීමක් කරන්න තිබෙනවා. මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. මහා පරිමාණ ව්‍යාපෘති මෙපමණ ක්‍රියාත්මක වෙනවා නම්, මෙපමණ mega projects ක්‍රියාත්මක වෙනවා නම් කෝ ගරු ඇමතිතුමනි, Local Multiplier Effect එක? කෝ Local

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

Multiplier Effect එක? හම්බන්තොට වරාය හැදුණාය කියලා හම්බන්තොට බල ප්‍රදේශයේ කම්කරුවාට, පුහුණු-නුපුහුණු ශ්‍රමිකයාට කිසිම සහනයක් ලැබුණේ නැහැ.

ගම් උදා වැඩසටහන ක්‍රියාත්මක වෙන කොට සාර විට වෙළෙන්දාගේ මුදල් පසුම්බියටත් මුදල් එකතු වුණා. මහා ලොකුවට mega projects ගැන පම්පෝරි ගැහුවාට mega projectsවලින් local economic multiplier impact එකක් - ප්‍රාදේශීය ආර්ථිකයට ධනාත්මක, ගුණාත්මක, හරාත්මක එකතුවක්- වුණේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේ බොහොම වග කීමෙන් ප්‍රකාශ කර සිටිනවා. සාර්ව ආර්ථික විචල්‍යයන් ගැන කථා කරන කොට- [බාධා කිරීම්] සාර්ව ආර්ථික විචල්‍යයන් ගැන කථා කරන කොට- [බාධා කිරීම්] මම කනගාටු වෙනවා, කුඩා කල මාව වඩා ගත්තු අස්වර් මැතිතුමාට මේ සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ මනා අවබෝධයක් නැති එක ගැන. මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පුස්තකාලයට ගිහිල්ලා හොඳට කියවලා, බලලා මාත් එක්ක වාද, විවාද කරන්න එන්නය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම නම් සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳව-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මගේ නම සඳහන් කළ නිසායි මම මේ අහන්නේ. එතුමාව උස්ස ගත්තද, බිම දැම්මාද කියලා නොවෙයි මම අහන්නේ. හම්බන්තොටට වරායක් එන එකට විරුද්ධද? අන්න ඒකයි අපි අහන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Sajith Premadasa, you carry on with your speech.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නැවත වරක් කියන කථාව මෙයයි. සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳව මනා දැනුමක් තිබෙන පුද්ගලයන්ට මම මේ කියන කථාව පැහැදිලි වෙනවා. මේ ආණ්ඩුව තව දුරටත් කියනවා, මේ රටේ ආර්ථික වර්ධන වේගය බොහොම ශීඝ්‍රයෙන් ඉහළ යනවාය කියලා.

ගරු ඇමතිතුමාගේ අවධානය මම යොමු කරවන්න කැමැතියි economic growth rate එක ගැන. ඔබතුමා inflation එක එකතු කළ -උද්ධමනයට ගණන් හදපු- නිෂ්පාදිතයේ අවධමනය කේන්ද්‍ර කරගෙනයි මේ economic growth rate එක ගැන කථා කරන්න ඕනෑ. එහෙම නම් නිෂ්පාදිතයේ අවධමනය ගැන කථා කරන කොට 2005 සියයට 9.9ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය 2012 වෙන කොට සියයට 7 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් සියයට 9ක, සියයට 8ක, සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් ක්‍රියාත්මක කරනවාය කියන එක හොඳ දෙයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආර්ථික වර්ධන වේගයෙන් මේ රටේ ජනතාවගේ සැබෑ තත්ත්වය පිළිබිඹු වන්නේ නැහැ; ඉස්මතු වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට ඕනෑ, 2009 - 2010 ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය පිළිබඳව. මේ රටේ ජාතික ආදායමෙන් සියයට 54.1ක් භුක්ති විඳින්නේ මේ රටේ පොහොසත්ම සියයට 20යි. මේ රටේ දුප්පත්ම සියයට 20 භුක්ති විඳින්නේ මේ රටේ ජාතික ආදායමෙන් සියයට 4.5ක්.

මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, ගෘහයක ආදායම්, වියදම් සමීක්ෂණය දෙසට. ඒ ගැන බලන කොට 2006 - 2007 සමීක්ෂණය තිබෙනවා. 2009 - 2010 සමීක්ෂණය තිබෙනවා. මේ සමීක්ෂණ දෙකම දිහා බැලුවාම ආහාර වියදම්, ආහාර නොවන වියදම් -මේ සියල්ලක්ම බැලුවාම- ගෘහයක වියදම 2010 වෙන කොට සියයට 36.5කින් වර්ධනය වෙලා තිබෙනවා. මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපට පැහැදිලි වෙනවා, මේ ආර්ථික වර්ධන වේගය ගැන කවුරු කවුරුත් පම්පෝරි ගැහුවාට ගෘහයක ජීවත් වෙන ජනතාව අද ආර්ථික, සමාජයීය පීඩනය නිසා තැලිලා, පොඩි වෙලා, මිරිකිලා, කොන්වෙලා පැත්තකට විසි වෙලා තිබෙන මොහොතක්ය කියා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කර සිටිනවා. අඩුම ගණනේ පරිපූරක ඇස්තමේන්තුවක් හෝ ඉදිරිපත් කර මීට වැඩිය සහන ප්‍රමාණයක්, මීට වැඩිය ශක්තියක් අපේ රටේ ලක්ෂ 200ක් වූ සුවහසක් ජනතාවට ලබා දෙන්නට තමුන්නාන්සේලා කැප වෙන්නය කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාර්ව ආර්ථික විචල්‍යයන් - macroeconomic variables - ගැන කථා කරන කොට අපට වෙළෙඳ ශේෂය අමතක කරන්නට බැහැ. ගරු ඇමතිතුමනි, අද වෙළෙඳ ශේෂය පිළිබඳව ඔබතුමා කියන්නේ මොකක්ද? 2010 සහ 2011 ගත් කල, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට 2010 වර්ෂයේ වෙළෙඳ ශේෂය සෘණ 9.7යි. 2011 වර්ෂයේ වෙළෙඳ ශේෂය සෘණ 16.4යි. සියයට 70ක වර්ධනයක්.

ගරු ඇමතිතුමනි, මොකක්ද අපනයන සංවර්ධන මණ්ඩලය කරන්නේ? වෙළෙඳ ශේෂය අඩු කර ගැනීමට Export Development Board එකෙන් -ඒ ආයතනයෙන්- ක්‍රියාත්මක කරන්නට ඕනෑ, මුඛ්‍ය ක්‍රියා දාමයක්. ඒ මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අද EDB එක කටයුතු කරනවාද?

එක්දහස් නවසිය පණස් ගණන්වල, හැට ගණන්වල ජපානයේ යොෂීඩා අගමැතිතුමා MITI කියන ආයතනය - Ministry of International Trade and Industry - බිහි කළා. ඔබතුමන්ලා පොඩ්ඩක් internet එකට ගිහින් ඕවා සොයා බලන්න. යොෂීඩා අගමැතිතුමා ඒ MITI කියන ආයතනය බිහි කළේ මොකද? Export-led economic growth එකක් - අපනයන කේන්ද්‍ර කර ගත් ආර්ථික සංවර්ධනයක්- ජපානයේ දියත් කරන්නටයි. එසේ නම්, කරුණාකර අඩු ගණනේ ජපානයේ MITI කියන ආයතනයෙන්වත් පාඩම් ඉගෙන ගෙන මේ රටේ අපනයන සංවර්ධන මණ්ඩලය මේ රටේ අපනයන ක්ෂේත්‍රය වර්ධනය කරන්නට කටයුතු කරන ප්‍රමුඛ ආයතනයක් බවට පත් කරන්නටය කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය ලේඛනයෙන් ප්‍රකාශ වුණා, අපනයන වෙළඳ පොළ විවිධාංගීකරණය -export

market diversification - ගැන. මම අහන්නට කැමතියි, අපේ unit cost එක වර්ධනය වෙනවා නම්, අපි අපනයන වෙළඳ පොළ වර්ගීකරණයකට ලක් කරන්නේ කොහොමද කියලා. ඒකක පිරිවැය වර්ධනය වෙනවා නම් අපි ලෝක වෙළෙඳ පොළේ තරග කරන්නේ කොහොමද? වෙළඳ පොළවල් ක්‍රියාත්මක කරන්නට අපේ රට දියත් කරන ක්‍රියාදාමය මොකක්ද? මොකක්ද අපේ රටේ දර්ශනය? ඒ වාගේම රුපියලේ අවප්‍රමාණය වීම නිසා මේ රටට එන අමු ද්‍රව්‍යවල මිල - raw material cost එක- අද එන්න එන්නම වර්ධනය වෙලා. අපේ අපනයනයන් වර්ධනය වෙනවා වෙනුවට අද අපේ රටේ අපනයන ක්ෂේත්‍රයට මහා තර්ජනයක් එල්ල වෙලා තිබෙනවාය කියන කාරණය ඔබතුමා හඳුනා ගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැයේ සඳහන් වෙනවා, ඇඟලුම් ක්ෂේත්‍රයේ රෙදි පිළි ක්ෂේත්‍රයේ අපනයන වර්ධනය ඉදිරි වසර තුන තුළ US Dollars මිලියන 5000ක ඉලක්කය කරා යනවාය කියා. ඒ ඉලක්කය කරා යන්නට නම්, මේ වසර තුන ඇතුළත අප රෙදිපිළි අපනයන ක්ෂේත්‍රයේ සියයට 19.3ක වර්ධනයක් ලබන්නට ඕනෑ. හැබැයි, ගරු ඇමතිතුමනි, 2000 - 2011 අතර අවුරුදු 11ක කාලය තුළ අප ලැබූ අපනයන වර්ධනය සියයට 40.5යි. එහෙම නම් මේ ඩොලර් මිලියන 5000 ඉලක්කයට යන ගමන යථාර්ථවාදී ද කියා මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, මම තවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ආනයන ක්ෂේත්‍රය ගැන. ඔබතුමා දන්නවා, ඔබතුමන්ලාගේ රජයෙන් "අපි වවමු-රට නඟමු" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව. දේශීයත්වයට මුල් තැන දීලා, ජාති හිතෛෂීත්වය, ජාති මාමකත්වය. ජාත්‍යාලය මුදුන්පත් කර ගෙන මේ රටේ ආහාරයෙන් හා ඒ සියල්ලෙන්ම ස්වංයපෝෂිත රටක් බිහි කිරීමේ ගමන ක්‍රියාත්මක කරනවාය කියා රජය ප්‍රකාශ කරනවා.

මා ඔබතුමාට කියන්නට කැමතියි, මේ රටට ආනයනය කළ පාරිභෝගික භාණ්ඩ ගැන. 2000 සහ 2001 වර්ෂ ගත්තාම, 2000 වර්ෂයේදී US Dollars මිලියන 1027ක පාරිභෝගික භාණ්ඩ මේ රටට ආනයනය කර තිබෙනවා. මේක වර්ධනය වෙලා තිබෙනවා, US Dollars මිලියන3654 දක්වා. එය සියයට 255ක වර්ධනයක්. ආහාරපාන ගැන කථා කරන කොට, වර්ෂ 2000ත් 2011ත් අතර කාලය තුළ US Dollars මිලියන 566 සිට 1567 දක්වා ආහාරපාන අපේ රටට ගෙන්වීම -ආනයනය කිරීම- සියයට 177කින් වර්ධනය වෙලා තිබෙනවා. මේ විධියට ආහාරපාන ආනයනය වර්ධනය වෙනකොට කොහේද "අපි වවමු -රට නඟමු" වැඩ පිළිවෙළ? කොහේද දේශීය ස්වයංපෝෂිත ආර්ථිකය? කොහේද ජාති මාමකත්වය? කෝ දේශ හිතෛෂීත්වය? මේවා වචනවලට පමණයි සීමා වෙලා තිබෙන්නේ. මේ ආණ්ඩුව දේශ මාමකත්වය, දේශ හිතෛෂීත්වය ගැන කොච්චර පම්පෝරි ගැහුවත්, කොච්චර පුරසාරම් දෙඩුවත්, ප්‍රයෝගික වැඩ පිළිවෙළවල් හරහා වචනවලට සීමා වුණු මේ ඉලක්කයන් ක්‍රියාවන්වලට පරිවර්තනය කර ඉලක්කගත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට දැඩි ලෙස අපොහොසත් වෙලා තිබෙනවාය කියන එක මා ප්‍රකාශ කරන්නට කැමැතියි.

මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, තවත් ආර්ථික ප්‍රශ්නයක් පිළිබඳව. ඒක තමයි තෙරපීමේ ප්‍රතිවිපාකය; crowding out effect. අද රජය වෙළඳ පොළට ගිහින් වාණිජ බැංකුවලින් වාණිජ ණය ලබා ගන්නවා. වාණිජ ණය ලබා ගන්නකොට පොලී අනුපාතය වැඩි වෙනවා; පොලී පිරිවැය වැඩි වෙනවා. එතකොට පෞද්ගලික ක්ෂේත්‍රයට සිද්ධ වෙන්නේ මොකක්ද? පෞද්ගලික අංශයට සිද්ධ වෙන්නේ මොකක්ද? රජය ගිහින් මේ මූල්‍ය ආයතනවලින් වාණිජ ණය ලබා ගන්නකොට පෞද්ගලික ක්ෂේත්‍රයට ඒ ලබා දියයුතු ප්‍රාග්ධන සම්පත; ඒ පෞද්ගලික අංශයට ලැබිය යුතු සම්පත් ටික අද අහිමි වෙලා තිබෙනවා.

2002ත්-2011ත් අතර රජය විසින් වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීමේ ප්‍රතිශතය වර්ධනය වෙලා තිබෙනවා, සියයට 262.3කින්. ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමැතියි, ඒක පුද්ගල ණය බරතාව කියන ප්‍රශ්නයට. ගරු ඇමතිතුමනි, 2006 වර්ෂයේ දී මේ රටේ හැම පුරවැසියකුම රටට ණයයි, රුපියල් 1,30,003ක්. 2006 වර්ෂයේ දී රුපියල් 1,30,003ක් ණය වුණු අපේ රටේ ජනතාවගේ ඒක පුද්ගල ණය ප්‍රමාණය ගණනය කළාම, 2011 වර්ෂය වනකොට ඒක පුද්ගල ණය 2,45,980 දක්වා සියයට 89.2කින් ඉහළ ගිහින් තිබෙනවා. එහෙනම් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය දිහා බලනකොට අපට පෙනෙනවා, අපේ රටේ පුරවැසි පරපුර, අපේ රටේ දරු පරපුර, අපේ රටේ මතු පරපුර සදාකාලික ණයකරුවන්, ණයගැත්තන් බවට පත් වන යුගයක් තමයි මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිර්මාණය කරලා තිබෙන්නේ කියන එක.

අය වැය කථාවේ තවත් සඳහනක් තිබෙනවා, ඒක පුද්ගල ආදායම ගැන. 2016 දී ඒක පුද්ගල ආදායම යූඑස් ඩොලර් මිලියන 4,000ක් කර ගන්නවායි කියලා සඳහන් වෙලා තිබෙනවා. 2011 දී යූඑස් ඩොලර් 2836ක් වුණු ඒක පුද්ගල ආදායම 2016 දී යූඑස් ඩොලර් 4,000ක් කරන්නට නම් ඒක පුද්ගල ආදායම සියයට 41කින් වැඩි වන්නට ඕනෑ. ආණ්ඩුවම කියනවා, මෙය සියයට 41කින් වැඩි කරන්නට නම් ජාතික නිෂ්පාදිතය ආයෝජන මට්ටමක් හැටියට ගත්තොත්, සියයට 35ක වේගයක් රඳවා ගන්නට ඕනෑ යි කියලා. නමුත් 2005ත්-2011ත් අතර කාලය තුළ පවත්වාගෙන ගිය ආයෝජන මට්ටම මොකක්ද? 2005 දී සියයට 26.5යි; 2006 දී සියයට 28.7යි; 2007 දී සියයට 28යි; 2008 දී සියයට 27.5යි; 2009 දී සියයට 24.4යි; 2010 දී සියයට 27.6යි; 2011 දී සියයට 29.9යි. එහෙනම් ඒ සියයට 35 මට්ටමට එන්නට අදටත් මේ වර්තමාන රජයට බැරිවෙලා තිබෙනවා.

අපේ රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, ඉතිරි කිරීම් සහ ආයෝජනයන් පිළිබඳව. ඉතිරි කිරීම් සහ ආයෝජනයන් පිළිබඳව මහා විෂමතාවක්, මහා ඌණතාවක් තිබෙනවා. 2010 දී අපේ රටේ ඉතිරි කිරීමේ ප්‍රතිශතය සියයට 19.3යි. 2011 දී ඒක අඩු වුණා, සියයට 15.4ක් දක්වා. සියයට 8ක, 9ක ආර්ථික වර්ධන වේගය පවත්වාගෙන යන්නට නම් ඒ සඳහා ඉලක්කගත වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ඉන්දියාව දිහා බලන්න, චීනය දිහා බලන්න, ඉන්දුනීසියාව දිහා බලන්න, මැලේසියාව දිහා බලන්න. චීනයේ ඉතිරි කිරීමේ ප්‍රතිශතය සියයට 52.3යි. ඉන්දියාවේ සියයට 32.3යි. ඉන්දුනීසියාවේ සියයට 36.4යි. මැලේසියාවේ සියයට 39.5යි. අපේ රටේ සියයට 15.4යි. එහෙනම් ඒක පුද්ගල ආදායම යූඑස් ඩොලර් 4,000ක් කරනවායි කියලා පම්පෝරි ගැහුවාට වැඩක් නැහැ. මේ ඉලක්කය කරා යන්නට, ඒ සඳහා ජාතික වැඩ පිළිවෙළක්, ජාතික වැඩ සටහනක්, ඉලක්කගත වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැයේ සඳහන් වුණු විහිළු සහගත යෝජනා කිහිපයක් ගැන කරුණු විදහා දක්වන්නට මේ අවස්ථාව මා උපයෝගී කර ගන්නවා. [බාධා කිරීමක්] විහිළු, විහිළු. In other words - if you want to comprehend in English - it is called “budgetary jokes”. අය වැය විහිළු.

පළමු වැනි විහිළුව, රණවිරුවන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් මිලියන 1,000ක් වෙන් කළාය කියන එක. ඇත්ත වශයෙන්ම ඒ පාර්ශ්වයේ සියලු දෙනාම රුපියල් මිලියන 1,000ක් කියනකොට ඔල්වරසන් දෙනවා; අත්පුඩි ගහනවා; ප්‍රීති ඝෝෂා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පවත්වනවා. හැබැයි, අපේ රටේ රණවිරුවෝ 3,50,000ක් ඉන්නවා. එහෙනම් එක රණවිරුවෙකුට නිවාස සඳහා වෙන් කරලා තිබෙනවා, රුපියල් 2857.14ක්. බොහොම හොඳයි!

දෙවැනි කාරණාව, අය වැයේ සඳහන් වනවා, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ සේවාව ස්ථිර කරනවාය කියලා, විශ්‍රාම වැටුපක් සමඟ. නමුත් අද වෙනකන් රාජ්‍ය නියෝගයක්, රාජ්‍ය චක්‍රලේඛයක් ක්‍රියාත්මක වෙලා නැහැ. අර පළාත් සභා මැතිවරණය පැවැත්වෙද්දී SMS පණිවුඩයක් විතරක් යැව්වා, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ රැකියා ටික ස්ථිරයි කියලා. මේ රටේ කවදාවත් SMS පණිවුඩවලින් රැකියා ස්ථිර වෙලා නැහැ යි කියන එක මා ප්‍රකාශ කරන්නට කැමැතියි. තවත් යෝජනාවක් තිබෙනවා, හුදකලා පාසල්වලට ධාන්‍ය ආහාර ලබා දෙනවා, කිරි ආහාර ලබා දෙනවා, දෙවැනි නිල ඇඳුමක් ලබා දෙනවා, පාවහන් යුගලක් ලබා දෙනවා කියලා.

මම අස්වර් මැතිතුමාට මතක් කරන්න කැමැතියි, මේ රටේ ජනතාවගේ 43,00,000 දුවා දරුවන්ට නිල ඇඳුම් ලබා දුන්නේ, දිවා ආහාර මුද්දරය ලබා දුන්නේ කිසිම වර්ගීකරණයකින් තොරව, කිසිම භේදයකින් තොරව බව. හැමෝටම එක හා සමානවයි සැලකුවේ. එහෙම නම් මම ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමාට මේ අවස්ථාවේදී යෝජනා කරනවා, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර පාවහන් යුගලයන් ලබා දෙන කොට, දෙවෙනි නිල ඇඳුම ලබා දෙන කොට, කිරි ආහාර, බිත්තර, ධාන්‍ය වර්ග ලබා දෙන කොට කරුණාකරලා මේ රටේ සමස්ත පාසල්වලම සිසු පරපුරට මෙය ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම හතරවන අය වැය විහිළුව මෙකයි. දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන පුළුල් කිරීමට රුපියල් මිලියන 1,500ක අතිරේක ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවායි කියලා කියනවා. 2012 සමෘද්ධිලාභී පවුල් ප්‍රමාණය 15,12,380යි. එක පවුලකට කීයක්ද වැඩි කරලා තිබෙන්නේ? මුළු අවුරුද්දටම රුපියල් 981යි.

පස්වන අය වැය විහිළුව මෙකයි. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් රුපියල් 2,500කින් වැඩි කරනවායි කියලා අද මේ වන තෙක් 2010 මහා ජනවරම තුළින් බිහි වුණු මේ ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? විශ්‍රාම වැටුපට බල නොපවත්වන ආකාරයට දීමනා වැඩි කිරීම විතරයි කරලා තිබෙන්නේ. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරලා නැහැ. අය වැය ප්‍රකාශයෙන් තවදුරටත් කියනවා, "ආගමික සිද්ධස්ථාන මුල් කර ගත් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරනවා"යි කියලා. අනේ! ආණ්ඩුව පැත්තෙන් ඉවක් බවක් නැතුව හොඳට අත්පුඩි ගැහුවා. නමුත් මම අත්පුඩි ගහන්නට ඉස්සර වෙලා පොඩ්ඩක් හොයලා බැලුවා, මේ රටේ ආගමික සිද්ධස්ථාන කොපමණ තිබෙනවාද කියලා. දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමා 2010 සැප්තැම්බර් 23 වන දා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන උපයෝගී කර ගෙන මම හඳුනා ගත්තා, බෞද්ධ ආගමික සිද්ධස්ථාන 9,897ක්ද, හින්දු ආගමික සිද්ධස්ථාන 5,035ක්ද, ඉස්ලාමීය ආගමික සිද්ධස්ථාන 3,992ක්ද, ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන 1,310ක්ද වන පරිදි මුළුමනින්ම ආගමික සිද්ධස්ථාන 20,234ක් තිබෙන බව. එක් ප්‍රාථමික සිද්ධස්ථානයකට මේ වැඩසටහනින් වෙන් කරලා තිබෙන්නේ රුපියල් 9,884.35යි.

හත්වන අය වැය විහිළුව මෙකයි. මම ඉදිරිපත් කරන්න කැමැතියි, හත්වන අය වැය විහිළුව. ගොවි විශ්‍රාම වැටුප් වෙනුවෙන් එක සත පහක්, එක රුපියලක් වෙන් කරලා නැහැ. පළාත් සභා මැතිවරණ කාලයේ මහ ලොකුවට පම්පෝරි ගැහුවා, "ගොවි විශ්‍රාම වැටුප අද දෙනවා, හෙට දෙනවා, අනිද්දා දෙනවා, ඊළඟ මාසයේ දෙනවා"යි කියලා. අපේ රටේ ජනතාව සම්පූර්ණයෙන්ම අනාථ කළා. අපේ රටේ දස ලක්ෂයක් ඉන්නවා, ගොවි විශ්‍රාම වැටුපට දායක වුණු ගොවීන්. මේ රටේ ගොවීන් 27,00,000ක් ඉන්නවා. රැකියා නියුක්තිකයන්ගෙන් මේ රටේ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නේ සියයට 33යි. මේ රටේ ගොවීන් සියයට 11.2ක දායකත්වයක් ලබා දෙනවා. අනේ! රුපියල් 1,000 සිට රුපියල් 4,166ක සොච්චම් විශ්‍රාම වැටුපක් මේ ඉල්ලන්නේ. රේස් කාර් බද්ද ඉවත් කරන්න හොඳයි. නමුත් ගොවි විශ්‍රාම වැටුපට සත පහක්වත්, රුපියලක්වත් වෙන් කරන්නට කොන්දක් නැති ආණ්ඩුවක් තමයි අද රට පාලනය කරන්නේ කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඊළඟ අය වැය විහිළුව මෙකයි. රේස් කාර් බදු අඩු කරන්න පුළුවන්, මේ ආණ්ඩුවට. ඇයි, මහ පොළ ශිෂ්‍යත්වය, සරසවි සිසුන්ට දෙන ශිෂ්‍යාධාරය වර්ධනය කරන්න කටයුතු කරන්නේ නැත්තේ? 2010/ 2011 මහ පොළ ශිෂ්‍යත්වය ලබපු සිසුන් 10,519ක් ඉන්නවා. ශිෂ්‍යාධාරය ලබපු සිසුන් 6,442ක් ඉන්නවා. රේස් කාර්වලට බදු ඉවත් කරන්න පුළුවන්. තාරුණ්‍යයේ හෙට දවසක් ගැන කථා කරනවා, තාරුණ්‍යයේ නවෝදය ගැන කථා කරනවා, තාරුණ්‍යයේ ශක්තිය ගැන කථා කරනවා. නමුත් මහපොළ ශිෂ්‍යත්ව මුදල වැඩි කරන්න බැහැ; ශිෂ්‍යාධාර මුදල වැඩි කරන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ලජ්ජයි කියන්න, අපේ රටට අරාබිකරයෙන් -සෞදි අරාබිය ඇතුළු තවත් රටවල් ගණනාවකින්- ලැබෙනවා, රට ඉඳි ආධාර . 2010 දී අපට ලැබුණා, කිලෝග්‍රෑම් 1,76,260ක්; 2011 දී ලැබුණා, කිලෝග්‍රෑම් 2,61,258ක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලජ්ජයි කියන්න, අපේ රටට නොමිලේ ලැබෙන රට ඉඳි ආධාරවලට රුපියල් ලක්ෂ 60ක් 2010 දී බදු ගැහුවා; රුපියල් ලක්ෂ 90ක් 2011දී බදු ගැහුවා. නොමිලේ ලැබෙන රට ඉඳි ආධාරවලට බදු ගහනවා. මේ රටේ ධන කුවේරයන් වෙනුවෙන්, මේ රටේ ධනපති පන්තිය වෙනුවෙන්, මේ රටේ පාලක පැළැන්තිය වෙනුවෙන් රේස් කාර් ගෙන්වන එකට බදු ඉවත් කරන්නට මේ මේ ආණ්ඩුවට හැකියාව ලැබිලා තිබීම නින්දිත දෙයක් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Azwer. What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I am happy that the Hon. Member admitted that - he mentioned my name - Saudi Arabia and other Muslim countries are sending dates to us. We are paying the taxes also. Are you against Saudi Arabia and other Muslim countries sending dates for the Muslims?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Azwer, please sit down. Hon. Member you may carry on.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර මා කැමැතියි වචන කීපයක් ප්‍රකාශ කරන්න ඉංග්‍රීසි භාෂාවෙන්. In conclusion, Hon. Deputy Chairman of Committees, when one examines the intricate substance of this Budget, I am led to believe that the decision-making structure suffers from major deficiencies. This Government lacks a sound fiscal policy stance. The monetary policy of this country depicts incongruence, incompetence and ignorance. I would like to coin the basis on which this Budget was formulated. I would like to call it the "Voodoo Economic Theory" that has been propagated by this Government. Actually disjointed incrementalism as expounded by Charles Lindblom has been the main methodology that this Government has adopted in terms of financial decision making.

In conclusion, let me quote from the speech made by John F. Kennedy in his inaugural address in 1961. He stated, I quote:

> Let every nation know, whether it wishes us well or ill, that we shall pay any price, bear any burden, meet any hardship, support any friend, oppose any foe, in order to assure the survival and the success of liberty."

On this occasion, we on this side of the political aisle would like to reflect on what late President John F. Kennedy stated. We on this side of the political aisle shall pay any price, bear any burden, meet any hardship, support any friend, oppose any foe to ensure that our mother Lanka is peaceful and prosperous.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර මා ධම්ම පදයෙන් උතුම් බුදු වදනක් උපයෝගි කර ගන්න බලාපොරොත්තු වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා, "අක්කොධෙන ජිනෙ කොධං - අසාධුං සාධුනා ජිනෙ, ජිනෙ කදරියං දානෙන - සච්චෙන අලිකවාදිනං" කියලා. උන්වහන්සේ එයින් පහදා දෙන්නේ "ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් දිනිය යුතු ය. අසත්පුරුෂයා සත්පුරුෂකමින් දිනිය යුතු ය. මසුරා දීමෙන් දිනිය යුතු ය. බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතු ය" කියලායි. එහෙම නම් මා ප්‍රකාශ කරන්න කැමැතියි, මගේ සත්‍යවාදි වදන් තුළින්, බොරුව - මිථ්‍යාව, මුසාව-මුලාව මත පදනම් වුණු මෙම අය වැය ලේඛනය ගැන මුළු රටටම, මුළු ලොවටම පහදා දෙන්නට හැකියාව ලැබුණාය කියන එක. එසේ ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය මහ ලේකම්**
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)

Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ.භා. 1.01]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 අය වැය යෝජනා සම්බන්ධයෙන් අය වැය දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් මේ අය වැය යෝජනා පිළිබඳව කථා කිරීමට මම අපේක්ෂා කරනවා. ඊට ප්‍රථමයෙන් කාරණයක් කිව යුතුයි. අද පෙර වරුවේ විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මෙම අය වැය විවාදය ආරම්භ කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ජෝන් අමරතුංග මැතිතුමා කරුණු කිහිපයක් ගෙනහැර දැක්වූවා. එතුමා නඟපු ලොකුම චෝදනාව තමයි මේ අය වැය කථාව සාරාංශගත කරලා අය සහ වැය සඳහන් කරලා තිබුණේ නැහැ කියන එක. එතුමා කිව්වා, ගණක යන්ත්‍රයක් අරගෙන ගණනය කරලා බලන්න ඕනෑ කියා.

මා හිතන හැටියට ඉතාම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට මේ අය වැය කථාව පරිශීලනය කළාම පුළුවන්කම තිබෙන්න ඕනෑ අය කොපමණද; වැය කොපමණද සහ ඒවා අතර තිබෙන්නා වූ පරතරය පියවා ගැනීම සඳහා මේ අය වැයෙන් යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ කුමන ආකාරයෙන්ද කියන කාරණය තේරුම් ගන්න. ඒ කාරණය මේ අය වැය කථාවේ සඳහන් වෙලා තිබෙනවා. නමුත් එතුමාට එය සොයා ගන්න නොහැකි වීම ගැන මම කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේදී වැකියකින් දෙකකින් විවිධ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළා. කොළඹ 7 පිහිටි කෞතුකාගාරයේ තිබුණු පෞරාණික වස්තු සොරා ගැනීම සම්බන්ධයෙන් එතුමා සඳහන් කළා. මා එතුමාට මතක් කර දෙන්න ඕනෑ, එක්තරා වකවානුවකදී, එනම් එතුමන්ලා රට පාලනය කරපු කාලයේ විශේෂයෙන් පෞරාණික ස්ථානවල නිදන් සොරුන් ගැන නිතර කථා බහට ලක් වෙලා තිබුණු බව. එතුමාට මතක් වුණේ මෑතක සිදු වීමක් ගැනයි. ඒ සිද්ධියට අදාළ සොරුන් දැන් අල්ලා ගෙන තිබෙනවා කියන එකයි පොලීසිය සඳහන් කරන්නේ. එතුමන්ලාගේ ආණ්ඩුව පැවැති වකවානුවේ

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

තමයි පෞරාණික ස්ථානවල නිදන් හෑරුවා කියන කථාව පැතිරිලා තිබුණේ. විවිධ ප්‍රදේශවල -හම්බන්තොට පවා- ඔය කථාව පැතිර තිබුණා. එතුමාට ඒ ගැන අමතක වෙලා තිබෙනවා. ඒ නිසා මම එතුමාට කියනවා කාලීන ප්‍රශ්නයක් අරගෙන අය වැය කථාවට සම්බන්ධ කරන්න එපා කියලා. අය වැය කථාව කියන්නේ ඉතා වැදගත් එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා 2013 මුදල් වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙහි ප්‍රතිපත්තිමය කරුණු, ප්‍රතිපත්තිමය තීන්දු, විවිධ ක්ෂේත්‍ර දිරිගැන්වීම සඳහා ඉදිරිපත් කරන යෝජනා, ඒ වාගේම විවිධ ක්ෂේත්‍ර සඳහා සහන ලබා දෙන යෝජනා ඇතුළත් වෙලා තිබෙනවා. මේ සියල්ල කැටි කරගෙන රටේ සමස්ත ආර්ථිකයම සලකා බලා තමයි, අද පවතින ලෝක තත්ත්වයන් දිහා සලකා බලා තමයි මේ අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන කාරණය මෙහිදී සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කථා කරපු ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සාර්ව ආර්ථික විචල්‍යයන් ගැන කථා කළා. අපි එක සාධකයක් ගනිමු. උද්ධමනය විතරක් ගත්තොත්, 2009 යුද්ධය අවසන් වුණායින් පස්සේ උද්ධමනය තනි ඉලක්කමකට ගෙන එන්න අපට පුළුවන්කම ලැබුණා කියන එක මා මෙහිදී සඳහන් කරන්න ඕනෑ. 2008 වර්ෂය ගත්තොත්, අපේ රටේ උද්ධමනය ඉලක්කම් දෙකකයි තිබුණේ. එය තනි ඉලක්කමක් යටතට ගෙනාවා විතරක් නොවෙයි, 2010න් මෙපිටට අද දක්වා උද්ධමනය පාලනය කරලා තනි ඉලක්කමේම රඳා පවත්වා ගන්න සන්ධාන රජයට පුළුවන්කම ලැබුණා.

ඒ, එදා සිට අද දක්වා ක්‍රියාත්මක කරපු ආර්ථික ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ නිසාය කියන එක මම මෙහිදී සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම, ගෘහයකට යන වියදම ගැන එතුමා කථා කළා. මට මතක විධියට අපේ ගරු ජෝන් අමරතුංග මැතිතුමාත් ඒ ගැන සඳහන් කළා. මහින්ද චින්තන වැඩ පිළිවෙළෙහි ප්‍රතිපත්තින් පදනම් කර ගෙන තමයි "අපි වවමු-රට නගමු" වැඩ සටහන, "දිවි නැගුම" ව්‍යාපෘතිය ආදි සියල්ල යෝජනා කරලා තිබෙන්නේ. ගෘහය පදනම් කර ගෙන ගෘහයේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළයි එයින් ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක මා කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි ආර්ථික වර්ධන වේගය ගනිමු. සමෘද්ධිය ලබන පිරිස කොච්චර හිටියාද, 1995 ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරන කොට? පවුල් ලක්ෂ 19ක් තිබුණා.

සියයට 23ට තිබුණු දරිද්‍රතාව සියයට 27ට ගිහිල්ලා, ඊට පස්සේ ක්‍රමයෙන් අඩු වෙන්න පටන් ගත්තා. මේ අවුරුද්දේ මහ බැංකු වාර්තාව අනුව දරිද්‍රතාව සියයට 8.9 දක්වා අඩු කරන්න මේ රජයට පුළුවන් වෙලා තිබෙනවා. ඒ, අපේ මේ දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ සහ ප්‍රතිපත්තිමය තීන්දු නිසා.

ඊළඟට වෙළෙඳ ශේෂය ගැන කථා කළා. ඔව්, වෙළෙඳ ශේෂය වැඩි වෙනවා. රටේ තිබුණු අවුරුදු 30ක යුද්ධය අවසන් කරලා, වේගවත් ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් ඉදිරියට යන කොට මහා මාර්ග හැදෙනවා නම්, තාර ආනයනය කරන්න ඕනෑ. එදා ගෙනාවාට වඩා කිහිප ගුණයක් වැඩිපුර ඒවා ගේන්න ඕනෑ. ගුවන් තොටක් හැදෙන කොට ගල්, වැලි දේවල් හැර ඒකට අවශ්‍ය වන්නා වූ අමු ද්‍රව්‍ය සියල්ල ආනයනය කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මම එක උදාහරණයක් පෙන්වලා දෙන්නම්. 2000 වර්ෂය ගත්තොත් අපේ රටට ඉන්ධන ආනයනය කිරීම සඳහා වැය වෙලා තිබෙන මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 902යි. 2005 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,657යි. 2012 දී ඇමෙරිකානු ඩොලර් මිලියන 6,000යි. ඒ අනුව 2005 සිට 2012 දක්වා තුන් ගුණයකින් ඉන්ධන ආනයන වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා වෙළෙඳ ශේෂය වැඩි වීම, රටේ ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යෑමේදී හා අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑමේදී රජයකට කරන්න වන දේවල් නිසා සිදු වන්නක්.

ඊළඟට, සඳහන් කළා අපනයන සංවර්ධනයත්, රුපියලේ අගය අවප්‍රමාණය වීමත් පිළිබඳව. එක පැත්තකින් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කළ කථාවේ පරස්පරයක් මතු වෙනවා. මොකද, අපනයනය සංවර්ධනය කරලා රුපියලේ අගය අවප්‍රමාණය වෙන කොට අපනයනකරුවන්ගේ ආදායම වැඩි වෙනවා. ඇමෙරිකානු ඩොලරයේ අගය රුපියල් 115 ඉඳලා 130ට යන කොට තේ, පොල්, රබර් වැනි සාම්ප්‍රදායික අපනයන භාණ්ඩ අපනයනය කිරීමේදී ඒ අපනයනකරුවාගේ අතට ලැබෙන්නා වූ රුපියල් ප්‍රමාණය වැඩි වෙනවා. ඒ වාගේම ආහාර ආනයනය ගත්තොත්, කිරි පිටි, බෙහෙත් ද්‍රව්‍ය අත්‍යවශ්‍ය දේවල්. ඒවා ආනයනය කිරීමේදී මුළු ලෝකයේම ආනයන පිරිවැය වැඩි වෙනවා. එසේ වැඩි වීම තමයි වෙළෙඳ ශේෂය පුළුල් වෙන්න හේතුවක් වෙන්නේ.

මේ අය වැයේ සමහර යෝජනා විහිළු යෝජනා කියලා එතුමා කිව්වා. ඒ මොනවාද? රණවිරු නිවාස ප්‍රතිසංස්කරණයට රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීම. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වේ, තුන්ලක්ෂයකට අධික රණ විරුවන් පිරිසක් ඉන්නවා, රුපියල් මිලියන 1,000 ඒ තුන්ලක්ෂයෙන් බෙදුවාම එක් අයෙකුට ලැබෙන්නේ මෙච්චරයි කිව්වා. නමුත් එහෙම ගණන් හදන්න බැහැ. ඒ සියල්ල එක වර, එක අවුරුද්දකදී කරනවාය කියන කාරණය නොවෙයි අය වැයෙන් කිව්වේ. රණ විරුවන් අතර තමන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කර ගන්න අවශ්‍ය පිරිස් ඉන්නවා. ඒ අයගේ අවශ්‍යතාවන් ඉටු කිරීමේ වැඩ පිළිවෙළ රුපියල් මිලියන 1,000කින් මේ අවුරුද්දේ ආරම්භ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොයි රටේද එහෙම කරලා තිබෙන්නේ? අපි දෙවැනි අභිමංසල කඹුරුපිටියේ විවෘත කළා. සදාකාලික දුබලතාවට පත් වුණ රණ විරුවන් 400කට අධික පිරිසක් ඉන්නවා. සදාකාලිකව ඒ අය බලා ගැනීම සඳහා රජය, ආරක්ෂක අමාත්‍යාංශය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. ඒ නිසා ඒ රුපියල් මිලියන 1,000 වෙන් කරලා තිබෙන්නේ රණ විරුවන් තුන්ලක්ෂයේම නිවාස ප්‍රතිසංස්කරණය කරන්න නොවෙයි කියන එක මම පැහැදිලිව සඳහන් කරනවා. අදියරෙන් අදියර අවශ්‍ය අයට ඒ මුදල් සැපයීමටයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

ඊළඟට සිවිල් ආරක්ෂක බලකායේ සෙබළුන් ස්ථිර කිරීම සම්බන්ධයෙන් කථා කළා. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ දැන් සකස් කර ගෙන යනවා. පාසල් ළමුන් ලක්ෂ 41ක් පමණ ඉන්නවා. -ලක්ෂ 43ක් නොවෙයි- දැනට ඒ ලක්ෂ 41ට වර්ෂය මුලදී නිල ඇඳුම් කට්ටලයක් ලැබෙනවා. ඒ වාගේම පෙළ පොත් ලැබෙනවා. ඒ මන්ත්‍රීතුමා තේරුම් ගත්තේ, වර්ගීකරණයකින් තොරව ඒ ලක්ෂ 41ක් වන දරුවන් සඳහා තව ඇඳුම් කට්ටලයක් සහ සපත්තු දෙන බවයි. ඒක නොවෙයි අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී සඳහන් කළේ. ඒ මන්ත්‍රීතුමා දන්නේ නැති වුණාට සතියේ දිනවල, පාසල් පවත්වන දිනවල පාසල් ළමයි අරලියගහ මන්දිරයට ආවාම අතිගරු ජනාධිපතිතුමා ඒ ළමයි එක්ක කථා කරනවා. විශේෂයෙන්ම දුර බැහැර ප්‍රදේශවලින් එන ළමයින් සමඟ. ඒ දරුවන්ගෙන් ලබා ගත් අදහස් තුළින්, ඒ කෙරෙහි ඇති වෙච්ච සංවේදීත්වය තුළින් තමයි එතුමා ඒ යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ ආධාර වැඩියෙන් ලැබිය යුතු අයට ලැබීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සකස් කරලා, ඒ අයට ඒ සහනය ලබා දෙන්නයි, මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මේක විහිළුවට ලක් කරන කාරණයක් නොවෙයි කියන එක ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඉතා පැහැදිලිව මා කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. දිළිඳුබව පිටු දැකීමට රුපියල් මිලියන 1,500ක් වෙන් කර තිබෙනවා. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12ක් ඉන්නවා නම්, මෙම රුපියල් මිලියන 1,500 ඒ ලක්ෂ 12න් බෙදා එතුමා ගණන හදනවා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. මෙය ප්‍රතිපත්තිමය තීන්දුවක්. මේ රුපියල් මිලියන 1,500 පමණක් නොවෙයි, මේ වැඩ පිළිවෙළට යන්නේ. දිවි නැගුම වැඩසටහන යටතේ ඉන් එහාට ගිය වැඩ පිළිවෙළකට මෙම මුදල යනවා. දැනට ක්‍රියාත්මක කරන වැඩසටහන් සහ දිවි නැගුම යටතේ තිබෙන වැඩසටහන්වලට අතිරේකවයි මේ රුපියල් මිලියන 1,500 වෙන් කර තිබෙන්නේ කියන එක මා සඳහන් කරනවා.

ඊළඟට රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම පිළිබඳව කථා කළා. එතුමන්ලාගේ රජය 2001 සිට 2004 දක්වා අය වැය ලේඛන තුනක් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 අය වැයෙන් රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප අයින් කළා. අපි 2004 දී බලයට ඇවිල්ලා තමයි, රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුප නැවත දුන්නේ. දැන් එතුමන්ලා රාජ්‍ය සේවකයන් ගැන කථා කරනවා. නමුත් එතුමන්ලා රාජ්‍ය සේවය හැකුළුවා. ඒ කාලයේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ චක්‍රලේඛ නිකුත් වුණා. ලක්ෂ හයහමාරකට අඩු කරන්න ගිය රාජ්‍ය සේවය තමයි අද අපි ලක්ෂ 13 දක්වා වැඩි කළේ. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවීම සඳහා මෙවර අය වැය ලේඛනයෙන් රුපියල් බිලියන 355ක් වෙන් කර තිබෙනවා. රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුපට යනවා, රුපියල් බිලියන 105ක්. මේ දෙකේ එකතුව ගත්තොත් රුපියල් බිලියන 460යි. අපේ රුපියල් බිලියන 1,785ක ආදායමෙන් රුපියල් බිලියන 460ක් වැය වන්නේ රාජ්‍ය සේවය නඩත්තු කිරීම සඳහායි කියන එක මා පැහැදිලිව සඳහන් කරනවා.

මීට අවුරුදු හතරකට කලින් රුපියල් 6,000ක අවම මට්ටමේ තිබුණු රාජ්‍ය සේවකයාගේ වැටුප රුපියල් 11,780 දක්වා වැඩි කළේ මෙම රජය කාලයේදීයි. මෙම රජය සෑම වර්ෂයකම වැටුප් වැඩි වීම් කරලා තිබෙනවා. ඒ ගැන නිකම් හිතන්න බලන්න. එක් රාජ්‍ය සේවකයකුට රුපියල් 1,000කින් වැටුප වැඩි කළොත් මිලියන 1.3ක් වන රාජ්‍ය සේවකයන්ට ගෙවිය යුතු මුදල කොපමණද? රුපියල් මිලියන 13,000ක් ඕනෑ. රුපියල් 1,000කින් වැටුප වැඩි කළොත් රුපියල් මිලියන 13,000ක් ඕනෑ. රුපියල් මිලියන 13,000ක් කියන්නේ මුළු සමෘද්ධි සහනාධාරයට වෙන් වන මුදල.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආගමික සිද්ධස්ථානවලට වෙන් කර තිබෙන මුදල රටේ තිබෙන ආගමික සිද්ධස්ථාන 20,000න් බෙදලා ගණන් හැදුවා, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. ලංකාවේ තිබෙන පන්සල් 9,000ටම එතුමා රුපියල් 50,000 ගණනේ දෙනවාද? රුපියල් 50,000 ගණනේ පන්සල් 9,000ට දෙන්න නම් කොපමණ මුදලක් යනවාද කියා ගණන් හදා බලන්න. එහෙම නම් එම මුදල උපයා ගත්තේ කොහෙන්ද? අන්තිමට වත්කම්, බැරකම් ප්‍රකාශය සොයා ගෙන යන්න වෙයි, ඒ මුදල ඉපයුවේ කොහොමද කියන එක සොයන්න. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට මේවාට හිනා යනවා. අපට විතරක් නොවෙයි. එතුමාගේ පක්ෂයේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට හිනා යනවා, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ කථාවේ කරුණුවලට මා උත්තර දෙන කොට.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, නැහැ. එතුමා -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ. පොඞ්ඩක් ඉන්නකෝ. ඒක නිසා මා පැහැදිලිව කියනවා, රජයේ දිගු කාලීන ආර්ථික දැක්මක් මත තමයි, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා සහනාධාර ගැන කථා කළා. ඒ සම්බන්ධයෙන් මා ඉතාම කෙටියෙන් සඳහන් කරනවා. මා එක ක්ෂේත්‍රයක් ගැන අවධානය යොමු කරනවා. ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ පුනර්ජනනීය බලශක්තිය යටතේ 13.1 සහ 13.2 කියන ඡේදවලට අවධානය යොමු කරනවා. මෙහි සඳහන් වන්නේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන්.

මා මෙහිදී සඳහන් කරනවා, විශේෂයෙන්ම නියඟය පැවැති නිසා ඉන්ධනවලින් සියයට 85ක් විදුලිය නිෂ්පාදනය කිරීමේදී වන පිරිවැය. රුපියල් 103ක් වියදම් වන තෙල් ලීටරයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විදුලිබල ක්ෂේත්‍රයට දෙන්නේ රුපියල් 65ට. දවසකට තෙල් ලීටර් මිලියන 2.4ක් දෙනවා. එතකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දවසකට රුපියල් මිලියන 92ක් පාඩු වනවා. එම මුදල දවස් 365න් වැඩි කළොත්, විදුලිබල ක්ෂේත්‍රයට සහනාධාර මිලට තෙල් දීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අවුරුද්දකට රුපියල් දශලක්ෂ 33,580ක් පාඩු වනවා.

ඊළඟට කෙලවරපිටිය බලාගාරයට ගෙනෙන අඩු සල්ෆර් තෙල් සඳහා අපි ගන්නේ ලීටරයකට රුපියල් 75යි. නමුත් ලීටරයකට රුපියල් 110ක් වියදම් වනවා. ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අවුරුද්දකට රුපියල් මිලියන 12,775ක් පාඩුයි. එතකොට එක අවුරුද්දකදී විදුලිබල ක්ෂේත්‍රයට දෙන සහනාධාරය එකතුව රුපියල් දශලක්ෂ 46,355ක්.

මේක නොපෙනෙන සහනාධාරයක්. මේ විධියට අඩු මිලට තෙල් දෙන නිසා තමයි රුපියල් 16ත්-22ත් අතර ඒකක පිරිවැයක් පවත්වා ගන්න විදුලිබල මණ්ඩලයට පුළුවන් වෙලා තිබෙන්නේ. අපි නියම මිලට තෙල් දුන්නා නම් මේ වාගේ දෙගුණයකින් ඒ පිරිවැය ඉහළ යනවා. එහෙම නම් අද මේ ගණනට විදුලි ඒකකයක් දෙන්න බැහැ. විදුලිය නිෂ්පාදනය කිරීමේදී, විදුලිබල ක්ෂේත්‍රයට රජය තෙල් සංස්ථාව හරහා අවස්ථා දෙකකදී සහනාධාර ලබා දෙනවා. මේ නිසා තමයි විදුලිබල මණ්ඩලය රුපියල් 16ත්-22ත් අතර විදුලි ඒකක පිරිවැයක් පවත්වාගෙන යන්නේ. එහිදී පළමුවෙනි ඒකක 30 දෙන්නේ රුපියල් 3.40 බැගින්. ඒකක 90 දක්වා ඒකකයකට අය කරන්නේ රුපියල් 7.90යි. ඒකක 90න් එහාට ගියාම තමයි වාණිජ මට්ටමේ මිලට එන්නේ. මේ රටේ සියයට 60ක් ඉන්නේ ඒකක 90 දක්වා විදුලිය පරිභෝජනය කරන පාරිභෝගිකයන්. ඒ පැත්තෙන් බැලුවාම ඒ පාඩුව ලබන්නේත් විදුලිබල මණ්ඩලයයි. මේ කලාපයේම රටවල් අතරින් ලංකාව විතරයි පැය 24ම විදුලිය ලබා දෙන්නේ.

මීට අමතරව තෙල් සංස්ථාව පාරිභෝගිකයන්ට ඉන්ධන සපයනවා. දවසකට පෙට්‍රල් ටොන් 1,800-2,000 අතර ප්‍රමාණයක්; ඩීසල් ටොන් 4,500-5,000 අතර ප්‍රමාණයක් සහ භූමිතෙල් ටොන් 300ක් පමණ. මේ ද්‍රව්‍ය තුනම ගත්තොත්, අද විකුණන මිල අනුව ලීටරයකින් වන පාඩුව රුපියල් 6ක් විතර වනවා. -හයට වැඩියි, සමහර ඒවායේ 8යි, සමහර ඒවායේ 12යි- මේ ඉන්ධන සහනාධාරය නිසා අවුරුද්දකට අපට සිදු වන පාඩුව රුපියල් දසලක්ෂ 14,600ක්. අපි විදුලිබල ක්ෂේත්‍රයට දළ වශයෙන් අවුරුද්දකට දෙන ඉන්ධන සහනාධාරය රුපියල් දසලක්ෂ 46,355ක්. පාරිභෝගිකයන්ට සහනාධාර දීමෙන් අපට සිදුවන පාඩුව දසලක්ෂ 14,600ක්. මේ දෙකේ එකතුව දසලක්ෂ 61,000ක්

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

වෙනවා. සංස්ථාවට දසලක්ෂ 61,000ක් පාඩු වෙන්නේ විදුලිබල ක්ෂේත්‍රයටත්, පාරිභෝගිකයන්ටත් පවතින මිලට හෝ පිරිවැයට වඩා අඩුවෙන් තෙල් ලබා දීම නිසායි. කොයි රටේද ඒ වාගේ දෙයක් කරන්නේ? නමුත් දීපු සහන ගැන මෙතුමන්ලා අහනවා. මීට වඩා සහනයක් කොහේද තිබෙන්නේ?

පසු ගිය පෙබරවාරි මාසයේ තෙල් ගාස්තු සංශෝධනය කරද්දීත්, ඩීසල් ලීටරයකට රුපියල් 25ක සහනාධාරයක් දීලා තිබෙනවා. භූමිතෙල් ලීටරයකට රුපියල් 30ක සහනාධාරයක් දීලා තිබෙනවා. ඒ නිසා පොහොර සහනාධාරයේ රුපියල් දසලක්ෂ 40,000 විතරක් නොවෙයි, සමෘද්ධි සහනාධාරයේ රුපියල් දසලක්ෂ 12,000 විතරක් නොවෙයි, මේ නොපෙනෙන සහනාධාරත් මේ රජය දීලා තිබෙනවාය කියන එක මම ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ වුණාට අසහනයක් දැන් තිබෙන්නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අසහනය තිබෙන්නේත් ඔබතුමන්ලාට. මේ වාගේ අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව විපක්ෂය අසහනයට පත් වෙලා තිබෙන බව අපට දැන් පැහැදිලිව පෙනී යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සඳහන් කළේ කරුණු කීපයක් පමණයි. තෙල් සඳහා වැය වන රුපියල් බිලියන 6ක මුදල අඩු කර ගැනීම සඳහා, විශේෂයෙන්ම පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා, මේ අය වැයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේ වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීන්දු ගන්න දැන් අප කටයුතු කර තිබෙනවා. පරිසරයත් සංරක්ෂණය කර ගනිමින් ඉදිරි කාලය තුළ ස්වාභාවික වායුව මේ සඳහා යොදා ගන්නට අප කටයුතු කරගෙන යනවා. මෙවැනි ක්‍රමවේදවලට අවශ්‍ය යෝජනා මේ අය වැය තුළ තිබෙනවා. ඒ නිසා මෙම අය වැය තුළින් සමස්ත ආර්ථිකයම සලකා බලා තිබෙන බව අපට පෙනෙනවා.

අද ස්පාඤ්ඤය වැනි රටවල සමස්ත විරැකියාව සියයට 26යි. අපේ රටේ එය සියයට 5යි. ස්පාඤ්ඤයේ තරුණ පරපුර අතර විරැකියාව සියයට 53ක් පමණ වෙනවා. ඊයේ යුරෝපා හවුල ග්‍රීසියට ඩොලර් බිලියන 40ක් අනුමත කර දුන්නා. ග්‍රීසියේ පාර්ලිමේන්තුවට බැහැ අය වැය සම්මත කරන්න, එහේ මිනිස්සු පාර්ලිමේන්තුව වටලලා. අද ලෝකයේ එවැනි තත්ත්වයක් තිබෙන්නේ. චීනය ඒ ගොල්ලන්ගේ ආර්ථික වර්ධන වේගය අඩු කළා. ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය හයෙන් පහළට අඩු කළා. හැබැයි, අපේ ආර්ථික වර්ධන වේගය සියයට 7-8 අතර ප්‍රමාණයක පවත්වාගෙන යන්න මේ අය වැය තුළින් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම ලෝක ආර්ථිකයේ තිබෙන අවපාතයත් එක්කයි අප මේවා කරගෙන යන්නේ.

ලෝකයේ තෙල් නිෂ්පාදනයෙන් සියයට 20ක් දරන්නේ ඉරානයයි. ඉරානයට පනවා තිබෙන තහංචියත් එක්ක අද ඒ තෙල් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපටත් ප්‍රශ්න මතු වුණා. නමුත් අප ඒවායින් ඉදිරියට ආවා. "තෙල් පිරිපහදුව වහනවා, පිරිපහදුව විකුණනවා" කියලා විපක්ෂය තාවකාලිකව -සතියකට දෙකකට අවශ්‍ය- සටන් පාඨයක් අරගෙන යනවා. දැන් තෙල් පිරිපහදුව අගේට වැඩ කර ගෙන යනවා. දැන් ඒ පිරිපහදුවේ ගිනි දැල්ල නැවත පත්තු වෙනවා. නමුත් ඒ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. අපට පාලනය කරගත නොහැකි කරුණුවලදී ලෝක ආර්ථිකයත් එක්ක එකතු වෙලා යම් තීන්දු ගත්තත්, අප ඒ තීන්දු සියල්ල ගන්නේ මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන්ය කියන එක මා ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

මහින්ද චින්තනයට අනුකූලව ඊළඟ පස් අවුරුදු සැලැස්ම, ආර්ථික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යෝජනා මෙවර අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා. සහන ලැබිය යුතු ක්ෂේත්‍රවලට සහන ලබා දීලා, සංවර්ධනය විය යුතු ක්ෂේත්‍රවලට බදු සහන ලබා දීලා, ඒ ක්ෂේත්‍ර සංවර්ධනය වීමට ඉඩ හැරීම තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට ගෙන යන දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළට සමගාමීව, රටේ ආර්ථික සංවර්ධනයත් ඉදිරියට ගෙන යන යෝජනා මාලාවකින් සමන්විත ඉතාම සාර්ථක අය වැයක් මෙවර ඉදිරිපත් කර තිබෙනවා. එයට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 1.21]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදයට සහභාගි වීමට මටත් අවස්ථාවක් දීම ගැන ප්‍රථමයෙන් සියලු දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා. ගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා ලෙස 2013 අය වැය තේමා තුනක් මුල් කොටගෙන ඉදිරිපත් කළා. වත්මන් ආණ්ඩුවේ පසු ගිය අය වැය කථා හා ඒවා ක්‍රියාත්මක කිරීම් බලන කොට, කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයි කියන තේමාව උඩ අපි මේ අය වැය දිහා බලන්න ඕනෑ.

ශ්‍රී ලංකා මහ බැංකුව කාලයක් තිස්සේ කිව්වේ, මේ රටේ බරපතළ ආර්ථික ප්‍රශ්න නැහැයි කියලා. කෘත්‍රිම ලෙස රුපියලේ අගයත්, පොලී අනුපාතයත් පවත්වාගෙන යන්න ගිහිල්ලා පස්ස බිම ඇන ගත්ත හැටි මා හිතන හැටියට මේ රටේ ජනතාවට හොඳින් මතකයි. පසු ගිය කාලයේ විශාල ලෙස ණය වෙමින් මහා පරිමාණ ව්‍යාපෘති මේ රජය ආරම්භ කළා. මේ ව්‍යාපෘතිවලින් රටට විශාල ප්‍රතිලාභ ලැබෙනවාය කියලාත් ජනතාවට සහතික වුණා. අපිට අහන්න සිද්ධ වෙලා තිබෙනවා, අද මේවාවලින් මොනවාද වෙලා තිබෙන්නේ කියලා.

අද දකුණේ වරායක් තිබෙනවාය කියනවා. ඒ වරායට නැව් කීයක් අද වන කොට ඇවිල්ලා තිබෙනවාද? ඒ වරායට නැවක් ආවොත් ඒක පත්තරේ පළ වන පුවතක්. නැත්නම් රැට රූපවාහිනියේ ඒ ප්‍රවෘත්තිය දානවා. ඒ වාගේම තමයි පුත්තලම් දිස්ත්‍රික්කයේ නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි කළා. අපේ රටට පමණක් නොවෙයි, ඉන්දියාවට පවා විදුලිය දෙනවාය කියලා පටන් ගත්ත මේ ව්‍යාපෘතිය කී පාරක් ගිනි ගෙන තිබෙනවාද? කී පාරක් බිඳ වැටිලා තිබෙනවාද?

ඒ එක්කම බලන්න, අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ අමාත්‍යාංශය දිහා. අද මොනවාද, ඒ අමාත්‍යාංශයෙන් මේ රටට

සිදුවෙලා තිබෙන්නේ? බාල පෙට්‍රල් නිසා, බාල ඩීසල් නිසා, හෙජින් ගනුදෙනුව නිසා අපේ රටට කෝටි කීයක් අහිමි වුණාද? මේවා සිද්ධ කළ එක නිලධාරියෙක්වත් නීතිය ඉදිරියට ගෙනි යන්න මේ රජයට පුළුවන් වුණාද? අපේ ජනතාව පත් කරලා මේවාවල වගකීම දුන්නු ඇමතිවරු ඒ ගොල්ලන්ගේ වගකීම හරියට ඉටු කර තිබෙනවාද කියලා අපට මේ අවස්ථාවේදී අහන්නට සිදු වෙනවා. ඉන්ධන මිල ඉහළ දාලා ඒක දරා ගන්න බැරිව ධීවරයෝ හලාවතදී උද්ඝෝෂණය කරද්දී ඒ ධීවරයින්ට වෙඩි තියලා, මරලා දැම්මා. EPF එක කොල්ල කන්න යන කොට ඒකට විරුද්ධව කටුනායක උද්ඝෝෂණය කරද්දී නිදහස් වෙළෙඳ කලාපයේ සේවය කරන ඒ අහිංසක පිරිසට වෙඩි තියලා, මරලා දැම්මා.

අද වන කොට මේ ආණ්ඩුව මේ අය වැයෙන් මොනවාද කරලා තිබෙන්නේ? ධීවරයින් දැල් ආම්පන්නවලට බදු සහනයක් ඉල්ලන විට, ධීවරයා බෝට්ටු එන්ජින්වලට බදු සහනයක් ඉල්ලන කොට, මොනවාද දීලා තිබෙන සහන? රේස් කාර්වලට බදු සහන දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දුප්පත් ජනතාව පාවිච්චි කරන motor cycle එකට, three-wheeler එකට බදු ගහලා ඒවායේ මිල වැඩි කරපු ආණ්ඩුව car race මේනියාවක්, ඒ වාගේම බෝට්ටු race මේනියාවක් අද මේ රටට හඳුන්වා දීමට යනවා. තමන්ගේ රාජ්‍ය බලය පාවිච්චි කරලා Carlton Sports Network හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක ක්‍රීඩා රාජ්‍යයක් අද මේ රටේ බිහි කරන්න මේ අය වැයෙන් යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. අද Carlton Sports Network ආයතනය ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය ද ආක්‍රමණය කරලා තිබෙනවා. දීර්ඝ කාලයක් cricket matches විකාශනය කිරීමට ජාතික රූපවාහිනියට දුන් රුපියල් කෝටි ගණනක් වටිනා විකාශන අයිතිය පවා නැති කරමින් අද ඒ විකාශන අයිතිය කුණුකොල්ලෙට විකුණා දමා තිබෙනවා. ක්‍රිකට්, රග්බි ක්‍රීඩාවලට එල්ල වන දේශපාලන බලපෑම් හා ඒවා තුළින් රුපියල් කෝටි ගණනක් හම්බ කර ගැනීමට-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා CSN රූපවාහිනී නාලිකාවට ලබා දීපු රූපවාහිනී විකාශනය සම්බන්ධ ගනුදෙනුව පිළිබඳව-

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
Sir, that is not a point of Order.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, can I explain this?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
As the Minister of Sports, he wants to explain it.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේක පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, මේක පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Minister says that you have misled the House and he wants to correct it.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුව නොමඟ යැවීමක් මේ කරන්නේ. ඒ විකාශන අයිතිය පිළිබඳව පුවත් පත් දැන්වීමක් දමා, ප්‍රසිද්ධිය දීලා, වැඩිම තක්සේරුවට දීලා තිබෙන්නේ. ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නේ නැත්නම් කරුණාකරලා මේක අහගන්න. මේක වැරැදියි. ඔබතුමා වැරැදි දේ කියන්න එපා..

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
කාල්ටන්වලින් වෙන දේවල් තමයි කියන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට උණක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මේක කාල්ටන් උණ නොවෙයි, කාල්ටන්වලින් වෙන දේවල් තමයි මේ කියන්නේ. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට අසනීපයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඔබතුමන්ලාටයි අසනීප තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මෙච්චර වෙලා නිශ්ශබ්දව සිටියා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේක මාර කථාවක් නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please continue.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ක්‍රිකට්, රගර් ක්‍රීඩාවලට එල්ල වන දේශපාලන බලපෑම් හා ඒවා තුළින් රුපියල් කෝටි ගණනක් හම්බ කර ගැනීමට එකතු වී තිබෙන පුද්ගලයන් ගැන මේ රටේ ජනතාව දැනුවත් කිරීම අපේ වග කීමක් වනවා. බදු ගසා අත්‍යවශ්‍ය ආහාර මිල, ඉන්ධන මිල, විදුලි බිල, ජල බිල වැඩි කර මේ රජය racing carවලට බදු සහනයක් දෙන එක සාධාරණීකරණය කරන්න පුළුවන්ද කියලා අපි මේ අවස්ථාවේදී අහනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පුළුවන්. ඇයි නරකද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විදේශ රටවල රැකියා කරන ශ්‍රී ලාංකිකයන් ගැන මේ අය වැය කථාවේදී මහා ලොකුවට කථා කළා. මේ රටට ඇමෙරිකානු ඩොලර් මිලියන 6,000ක විදේශ විනිමයක් මේ පුද්ගලයන් ගෙනෙන බවත් ජනාධිපතිතුමා සඳහන් කළා. මේ පුද්ගලයන්ව අර රණවිරුවා වාගේ "රට විරුවන්" කියලා නම් කර ඒ රට විරුවාට මොකද කළේ? 2012 ජනවාරි මාසයේදී මේ රට විරුවන් පිට රට ඉඳලා තමන්ගේ බිරිඳ, ඒ වාගේම දරුවන්, ඒ වාගේම දෙමව්පියන් සමඟ සම්බන්ධ වන්න තිබෙන ජාත්‍යන්තර දුරකථන ගාස්තු වැඩි කළා. ලබා ගන්නා ඇමතුම්-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, what is your point of Order?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මේ කියන්නේ අසත්‍යය. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා Skype හරහා telephone එකෙන් කථාව විතරක් නොවෙයි, ඒ ඉන්න කෙනා බලාගෙන කථා කිරීමටත් පුළුවන්. [බාධා කිරීම්] අද ලංකාව පුරාම ඒ පහසුකම ලබා දීලා තිබෙනවා. මේ පට්ටපල් අසත්‍යය කියන්නේ. කවුරු හරි මොකක් හරි ලියලා දුන්නාම එක පාරට කියවා ගෙන කියවා ගෙන යන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔව්. ඕක හවසට ගෙදර ගිහිල්ලා කියවන්න. කවුද ඕක ලියලා දුන්නේ?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, telecommunication ගැන මට කවුරුත් ලියලා දෙන්න ඕනෑ නැහැ. මම telecommunication engineer කෙනෙක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙනම් කොළය පැත්තක තියලා කථා කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මට කවුරුත් ලියලා දෙන්න ඕනෑ නැහැ. ගරු ඇමතිතුමා, ඔබතුමාට තමයි ලියලා දෙන්න ඕනෑ. අපි මෙතැන විවාදයක් කරන්නේ. ලෝකයේ ලොකුම නගරවල telecommunication network එක තමයි මම බලාගෙන හිටියේ. හරිද?

[බාධා කිරීමක්] ඔව්, ඔව්. වයර් මාරු කළා. ඔබතුමාට තමයි වයර් මාරු වෙලා තිබෙන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොළයේ වයර් ටික පොඩ්ඩක් මාරු වෙලා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මම හිතන හැටියට කාල්ටන් එකට ප්‍රහාර එල්ල කරන කොට මෙතුමාට ටිකක් අමාරු වෙනවා වාගේ. ඒකයි වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඔබතුමා ඉන්න. අපට ආරංචි වෙලා තිබෙනවා, තව ටික කලකින් ක්‍රීඩා ඇමතිකමත් නැති වෙලා යනවා කියලා. [බාධා කිරීම්] ඒ නිසා ඔබතුමන්ලා අහ ගෙන ඉන්නකෝ. [බාධා කිරීම්] ඔව්, ඔව්. අයින් වෙන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේක ක්‍රීඩාව නේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඔව්, ක්‍රීඩා, ක්‍රීඩා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔය කොළේ අයින් කරන්න. Qualified engineer, කොළේ අයින් කළා නම් හොඳයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ඔබතුමාගේ qualifications අපි හොඳට දන්නවා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවාරි මාසයේ ලබා ගන්නා ජාත්‍යන්තර ඇමතුම් බද්ද සියයට 50කින් වැඩි කළා. මේ ගැන පාර්ලිමේන්තුවේ විවාදයක් තිබුණා. ඒ වාගේම ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් බද්ද සියයට 29කින් ඉහළ දමන්න මේ රජය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම විදේශ රටවල ඉන්න පිරිස් දුක් විඳලා හම්බ කරන ධනය මේ තරම් බදු ගහලා සූරා කාලා වියදම් කරන්නේ මොනවාටද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. [බාධා කිරීමක්] ඔව්, "රට විරුවෝ" කියලා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රට ලෝකයේ සංවර්ධන වන රටක් වන්න නම් විශේෂයෙන්ම නීතිය හා සාමය අප රටේ තිබිය යුතුයි. එන්නම එන්නම භයානක සිද්ධීන් අද මේ රටේ වාර්තා වෙනවා. ඒ වාර්තා වන සිද්ධීන් පසුපස මේ රජයට විශාල ලෙස සම්බන්ධ ප්‍රාදේශීය දේශපාලනඥයින් ඉන්නවා. දකුණේ විදේශ සංචාරකයින් ඝාතනය කරනවා. ස්ත්‍රී දූෂණ කරනවා. ළමා අපචාර කරනවා. කහවත්තේ ඝාතන, කොළඹ කෞතුකාගාරයේ සොරකම්, මේ සියල්ලටම සාධාරණ විසඳුමක් දෙන්න අද මේ රජයට බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය දින වැලිකඩ බන්ධනාගාරයේ ඇති වුණු ගැටුම්වලින් 27 දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. 42ක් තුවාල ලබා තිබෙනවා. මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ සියලුම සිද්ධීන් පිටුපස ඉන්නවාය කියලා මේ රටේ ජනතාව දන්නවා. මේ මත් ද්‍රව්‍ය ජාවාරම ආරක්ෂා කරන්නේ කවුද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

පුත්තලම් පැත්තෙන් එන්නේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

පුත්තලම් පැත්තෙන් තමයි එන්නේ. ඉතින් වැඩක් නැහැ නේ, ඔයගොල්ලන්ගේ පොලීසියත් නැහැ. පොලීසිය ක්‍රියාත්මක වන්නේ නැහැ. නාවික හමුදාව ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒගොල්ලන් උඩ බලා ගෙන ඉන්නවාද? රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් කෝටි ගණනක් වියදම් කරනවා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මොකක්ද කරන්නේ කියන එක තමයි අපට අහන්න සිද්ධවෙලා තිබෙන්නේ.

බන්ධනාගාර පරිපාලනයේ දුර්වලකම නිසා අද අපරාධකරුවන් බෝ කරන මධ්‍යස්ථාන බවට බන්ධනාගාර පත් වෙලා තිබෙනවා. අද එළියටත් වඩා බන්ධනාගාර ඇතුළේ මත් කුඩු තිබෙනවා. බන්ධනාගාර ඇතුළේ ජංගම දුරකථන තිබෙනවා. බන්ධනාගාර ඇතුළේ විවිධ අවි ආයුධ සහවා ගෙන තිබෙනවාය කියන එක මේ ගැටුම්වලින් හොඳින් පෙනී ගියා. ඒ වාගේම මේ ගැටුම්වලදී පලා ගිය සිරකරුවන් එක්කෙනෙක් හැර අනෙක් කට්ටිය අත් අඩංගුවට ගන්න තවමත් මේ රජයට බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම නීතිය හා සාමය බිඳ වැටීම සිදු වන්නේ මේ රජය අපේ රටේ අධ්‍යාපනය, දහම් අධ්‍යාපනය ගැන සැලකිල්ලක් දක්වන්නේ නැතිකමේ ප්‍රතිඵලයක් ලෙසයි කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. විශේෂයෙන්ම දහම් පාසල් වෙනුවෙන් ඉරිදා දිනයකට මේ රජය වෙන් කරන්නේ රුපියල් 2.50ක් විතරයි. එච්චරයි වෙන් කරන්නේ. ඒ සඳහා මේ අය වැයෙන් යම් සහනයක් බලාපොරොත්තු වුණත්, ප්‍රතිපත්තියක් ලෙස ඒ ගැන කථා කළත්, අද ඒ සඳහා මුදල් වෙන් වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය අතිවිශාල ප්‍රමාණයක් ණය වෙලායි මේ ව්‍යාපෘති ආරම්භ කළේ. මෙම ව්‍යාපෘති තුළින් අද මේ රටට සහනයක්, මේ රටට ආදායමක් ලැබුණාද කියලා අපට අහන්න සිද්ධ වෙලා තිබෙනවා. ණය ගෙවා ගන්න තව තවත් ණය ගන්නා යුගයකටයි අපි අද ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ රටට එන්න තිබුණු කොටස් වෙළෙඳ පොළේ ආයෝජන අද මේ රජය බිඳ දමා තිබෙනවා. කොටස් වෙළෙඳ පොළ තමන්ගේ ගජ මිතුරන්ගේ සූදු පොළක් බවට පත් කර තිබෙනවා. ඒ එක්කම ශ්‍රී ලංකාව කේන්ද්‍ර කර ගත් සංවර්ධනයක් කරනවා වෙනුවට තමන්ගේ ප්‍රතිරූපය නංවන්නට ගිහිල්ලා ඒ ව්‍යාපෘති අසාර්ථක වෙලා අද ඒ බර ජනතාවට පැටවිලා තිබෙනවා. ඒ එක්කම ETF මංකොල්ලයට, සමෘද්ධි මංකොල්ලයට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මංකොල්ලයට රජය සෘජු ලෙස සම්බන්ධයිද කියලා අද මේ පාර්ලිමේන්තුවට හෙළි කළ යුතුයි.

ඒ එක්කම මෙම ආයතන ආරක්ෂා කිරීමට තිබුණු ස්වාධීන කොමිෂන් සභා, ස්වාධීන ආයතන දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විනාශ කරපු නිසා මේ රට අද ඒකාධිපතිවාදයකට ගමන් කරමින් තිබෙනවා. ඒ වාගේම අද මේ සියලු දේ තුළින් අපට පෙනී යන්නේ අය වැය ලේඛනය වචනවලට පමණක් සීමා වූ ලියැවිල්ලක් බවයි. මොකද, පාර්ලිමේන්තුව අද ගණන් ගන්නේ නැති තැනකට පත් කරලා තිබෙනවා විධායකය විසින්. අත උස්සන්න කියන කොට සියලුම දෙනා අත උස්සන ස්ථානයකට අද මේ පාර්ලිමේන්තුව ඇද වැටිලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ඒක ඕනෑ නැහැනේ දැන්. සුදු වෑන් එකක් ඒවී. අස් වීමේ ලිපියක් ඕනෑ නැහැ, සුදු වෑන් එකක් ඒවී. එතකොට ඉවරයි. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුදු වෑන් සංස්කෘතිය මේ රටේ තවමත් ක්‍රියාත්මක වෙමින් ඒ තුළින් රජයට එරෙහිව ක්‍රියා කරන සියලු දෙනාම මර්දනය කරනවා වාගේම මේ රට අද ණය උගුලක පටලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේදී අපි මොනවා කථා කළත්, ඒවාට බාධා කරන කිහිප දෙනකු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ විධියට බාධා කරලා මේ ප්‍රශ්න විසඳෙන්නේ නැති බවත් මේ අවස්ථාවේදී අප මතක් කර දෙන්න ඕනෑ. ජනතාවගේ අපේක්ෂා ඉටු නොවී මේ රට එන්න එන්නම අගාධයට යාම තුළ යම් කිසි දවසක එයට පිළිතුරු දෙන්න ජනතාව ලෑස්ති වෙලා ඉන්නවා කියලාත් මා මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට කියනවා. මේ අය වැය පොදු ජනතාවට සහන දෙන්න, ඒ වාගේම මේ රට ආර්ථික සංවර්ධනයකට ගෙන යන්න අඩිතාලම දමන අය වැයක් ලෙස සඳහන් කළත්, මේ අය වැය තමන්ගේ මිතුරන්ට, තමන්ගේ ව්‍යාපාරවලට වාසි සලසන, තමන්ගේ ප්‍රතිරූපය නංවන ව්‍යාපෘති රටේ සල්ලි නාස්ති කරලා හොරෙන්ම ගෙනෙන අය වැයක් හැටියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ධීවර කර්මාන්තය නංවන්නය කියලා කෝටි ගණනක් වියදම් කර මාළු tin කරන factory එකක් ගාල්ලේ ආරම්භ කර තිබෙනවා. ඒ මාළු tin කරන factory එක ක්‍රියාත්මක වුණේ ලංකාවේ මාළුවලින් නොවෙයි, චීනයෙන් මාළු ගෙනැල්ලායි. චීනයෙන් මාළු ගෙනැල්ලා වුණත් අද ඒ factory එක ක්‍රියාත්මක කිරීමට බැරි වෙලා තිබෙනවා. අද වාර්තා වෙලා තිබෙනවා ඒ factory එක වසා දමන්න යනවාය කියලා. මම හිතන හැටියට අද මේ රජය "කියන දේ නොවෙයි කරන්නේ, කරන දේ නොවෙයි කියන්නේ" වැනි ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් තමයි ගමන් කරන්නේ.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මුදල් අමාත්‍යාංශයේත් ශ්‍රී ලංකා මහ බැංකුවේත් තිබෙන පරස්පර ආර්ථික ප්‍රතිපත්ති නිසා අපේ රටේ රුපියලේ අගයට විශාල බලපෑමක් එල්ල වෙලා, ජනතාවගේ ජීවන තත්ත්වය පහත ගිහින්, ඒ ජනතාවගේ ජීවන මට්ටම විනාශ වන ආකාරයකට ඇද වැටිලා තිබෙනවා. මම කියන්නේ මේ-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේ මන්ත්‍රීතුමා කිව්වා ටින් මාළු කර්මාන්තශාලාව වහනවා කියලා. කවුද වහන්නේ? ඔබතුමා වහනවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

නැහැ, මම කිව්වේ වාර්තා වෙලා තිබෙනවා කියලායි. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

කිසිම වාර්තා වීමක් වෙලා නැහැ. අසත්‍යය නේ කියන්නේ. [බාධා කිරීමක්]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මේක පාර්ලිමේන්තුව. මේක දේශපාලන වේදිකාව නොවෙයි. දේශපාලන වේදිකාවේ ඕනෑ දෙයක් කියන්න පුළුවන්. පාර්ලිමේන්තුවේදී කථා කරනවා නම් වග කීමක් ඇතිව කථා කරන්න ඕනෑ. කිසිම කර්මාන්තශාලාවක් වැහෙන්නේ නැහැ. කර්මාන්තශාලා හතරක් ඇරලා තිබෙනවා. අය වැය විවේචනය කරනවා නම් ඒක හරි විධියට කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියපු කාරණා ටික-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී ඇති වෙලාව නම් අවසානයි.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මම අවසන් කරන්නම්. මට බාධා කරනවා නේ. මට කථා කරන්න දෙන්නේ නැහැ නේ.

මම කිව්වේ නැහැ වහලා තිබෙනවා කියලා. මම කිව්වේ වහන්න යනවා කියලා වාර්තා වෙලා තිබෙනවාය කියලායි. ඒකයි මම කිව්වේ. හැම වෙලාවේම එක එක්කෙනා ඇවිල්ලා අපට බාධා කරනවා. ඒක තමයි මේ පාර්ලිමේන්තුවේ වෙලා තිබෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළාට අදහසක් ප්‍රකාශ කරන්න දෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඒක තමයි භය වෙන්නේ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

අපි දන්නවා නේ කොහොමද ධීවරයින්ට වෙඩි තියලා මැරුවේ කියලා. ඒක ගැන කථා කරන්න කවුරුත් නැහැ. [බාධා කිරීම්]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒවා වුණේ තමුන්නාන්සේලා කරපු වැඩ නිසා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

අපි මොනවාද කළේ? [බාධා කිරීමක්] පුද්ගලයන් ගෙනාවේ නැහැ. කවුරුවත් පුද්ගලයින් ගෙනාවේ නැහැ. ධීවරයෝද ආවේ, අපිද ආවේ කියලා ඔබතුමා කියන්න. ඔබතුමා රූපවාහිනිය ඉස්සරහට ගිහින් කියන්න කවුද ඒක organize කළේ කියලා. ඔබතුමා තමයි කිව්වේ ධීවරයෝ ආයුධ අරන් ආවා කියලා. එදා ධීවරයින්ව ඝාතනය කළ එක ඔබතුමා සාධාරණීකරණය කළා, ආයුධ අරන් ආවා කියලා. ඔබතුමා එදා සාධාරණීකරණය කළා අපේ ධීවරයන්ට - [බාධා කිරීමක්] මොනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පැහැදිලිවම ආයුධ ගෙනාවා. නේවි බස්වලට ගැහුවේ කවුද? නේවි බස් කුඩු කළේ කවුද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

එතකොට ඔබතුමා කියන්නේ ධීවරයින්ට වෙඩි තිබ්බ එක සාධාරණයි කියලාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, මූලාසනය දිහා බලලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

බාධා කරනවා නේ. මෙහේ බලා ගෙන එහාට උත්තර දෙන්න බැහැ නේ. ඒක නේ ප්‍රශ්නය. [බාධා කිරීමක්] අවසාන වශයෙන් මම කියන්නේ, මේ අය වැය මේ රටේ ජනතාව මුළා කළ අය

වැයක් කියලායි. යම් කිසි දෙයක් කියලා මහ බැංකුව හරහා, මුදල් අමාත්‍යාංශය හරහා ඒක වෙනත් විධියකට ක්‍රියාත්මක කරන අය වැයක් මේක.

මම ඉතාමත් සතුටු වෙනවා, අද මට බාධා කරන්නට හුඟක් ඇමතිවරු පැමිණීම ගැන. මම හිතන හැටියට මම මොනවා හරි දෙයක් රජයට රිදෙන්නට කියන්න ඇති. මම ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 1.45]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න මතු වන්නේ මේ රට අඩු දියුණු, දුප්පත් රටක් වන නිසායි. කුමන පක්ෂය බලයේ හිටියත් ඒ ප්‍රශ්න විසඳීමට තිබෙන එකම මාර්ගය රට තුළ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමයි.

මේ ඉදිරිපත් කර තිබෙන අය වැයෙන් බලාපොරොත්තු වන්නේ, අග්නිදිග ආසියාවේ model එක මත ධනපති මාවතක් ඔස්සේ ගමන් කරලා අපේ රටේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති කරන්නයි. ඒ ආකාරයට තමයි ජපානය, දකුණු කොරියාව, සිංගප්පූරුව වැනි රටවල් මතු වෙලා ඇවිල්ලා තිබෙන්නේ. ඒ අග්නිදිග ආසියා රටවල් හැටියට චීනය, වියට්නාමය දැන් මේ ගමන යනවා. ඒක තුළින් ශීඝ්‍ර ආර්ථික දියුණුවක් ඇති වෙලා දැන් චීනය ලෝකයේ දෙවන ආර්ථිකය හැටියට මතු වෙලා තිබෙනවා. දුප්පත්කම, දරිද්‍රතාව වැනි එයින් මතු වන ප්‍රශ්න විසඳමින් ඉදිරියට ගමන් කරන්න චීනයට පුළුවන් වෙලා තිබෙනවා. නමුත් ඒ එක්කම ධනපති ක්‍රමයේ සෘණ තත්ත්වය තුළින් විවිධ ප්‍රශ්න - අපරාධ, දූෂණ වැනි ප්‍රශ්න - මතු වෙලා තිබෙනවා. මේවා තිබුණත් අපි බලන්න ඕනෑ, අපේ රටේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති කරන්න. අතිගරු ජනාධිපතිතුමා ඒ ගමන දැන් ආරම්භ කර තිබෙනවා. අපි සමාජවාදීන් හැටියට බලාපොරොත්තු වන්නේ වෙන ගමනක් යන්නයි. ඒ කියන්නේ අපි සහයෝගයෙන් - තරගයෙන් නොවෙයි- ආර්ථික සංවර්ධනය ඇති කිරීමටයි බලාපොරොත්තු වන්නේ. අපේ රටේ දැන් තිබෙන ආර්ථික තත්ත්වය පදනම් කර ගෙන ආණ්ඩුව ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළ ධනපති මාවතක් ඔස්සේ ඉදිරියට ගෙන ගියත් අපි සමසමාජ පක්ෂය හැටියට යම් කොන්දේසි පිට ඒකට සම්පූර්ණ සහාය දීලා කටයුතු කරනවා. අපේ ඉල්ලීම වන්නේ ඒ සංවර්ධන ගමනේ බර සාමාන්‍ය ජනතාවට නොව, ධනපති පන්තියට දමන්නය කියන එකයි. ඒ වාගේම මේ සංවර්ධන ගමනේ වාසිය, ප්‍රයෝජනය ධනපති කොටස්වලට පමණක් නොව රටේ අනෙකුත් සියලු දෙනාටමත් ලැබිය යුතුයි. ඒ වාගේම අනාගත පරම්පරාව ණයගැති නොවන විධියකට මේ සංවර්ධන ගමන ඉදිරියට ගෙන යා යුතුයි.

මේ ආකාරයෙන් ධනපති සංවර්ධන ගමනක් යනකොට අපි බලාපොරොත්තු වෙනවා, ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් සිදු නොවුණු දේවලුත් ඉටු කර ගන්න. ඉන් එකක් තමයි, විශේෂයෙන්ම ලාංකික ජාතියක් හැටියට අපේ රටේ ජාතික සමඟිය ගොඩ නැඟීම. ඒක මේ සංවර්ධන ගමනත් එක්කම එකට යා යුතු දෙයක් හැටියටයි අපි සලකන්නේ. ඒ නිසා තමයි අපි තදින්ම කියන්නේ අප රටේ තිබෙන පළාත් සභා ක්‍රමය තවත් ශක්තිමත් කළ යුතුයි කියා. බලය නිසි ලෙස බෙදා දෙන්න ඕනෑ. පළාත් සභාවලට සීමා කරන්නේ නැතුව එතැනින් එහා ගම් මට්ටමට යන්නත් ඒ බලය ලබා දිය යුතුයි. දැන් මේක කියනවාත් එක්කම අපි බලාපොරොත්තු වෙනවා, ජනතාවට ඒ සංවර්ධන ගමනේ නිසි ප්‍රයෝජනය, වාසිය අනිවාර්යයෙන්ම ලබා දෙන්නත් කටයුතු කරන්න ඕනෑය කියා. ඒ වාගේම ඒ ජනතාව මේකේ කොටස්කාරයෝ කරන්නත් ඕනෑ. ඒ ආකාරයට තමයි බලය බෙදා හැරීම ශක්තිමත් කරන්න තිබෙන්නේ. එමේ අපෙත් ජීවිත විශාල ප්‍රමාණයක් පුද කළා මේ පළාත් සභා ක්‍රමය ඇති කරන්න.

අපි විශ්වාස කරනවා, ඒක නිෂ්ඵල වුණේ නැත කියලා. දැන් ඒ පළාත් සභා බලය ප්‍රයෝජනයට ගන්නා අය ඉතිහාසය තුළ අපි කළ ඒ සටන්වලින් තමයි ඒ ප්‍රයෝජන ලබා ගෙන තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ගමන ආපස්සට නොගිහින් ඉදිරියට තවත් ශක්තිමත්ව යාවිය කියලා. ඒ එක්කම අපි ඉල්ලීමක් කරනවා, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව නිසි ලෙස ක්‍රියාත්මක කරන්නය; ඒ වාගේම පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවත් ඉක්මනින් හරියාකාරව ක්‍රියාත්මක කරන්නය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ පක්ෂය හැටියට මුලින්ම මේ අය වැය ගැන ජනාධිපතිතුමාටත් අපේ ආර්ථිකය පාලනය කරන අයටත් අපේ කෘතඥතාව පළ කරන්න ඕනෑ. ලෝකයේ ධනපති ආර්ථික අර්බුදය මැද, ආහාර අර්බුදය මැද, තෙල් අර්බුදය මැද, පරිසර හා ගෝලීය උෂ්ණත්වය පදනම් කර ගෙන ඇති වෙලා තිබෙන තත්ත්වයන් යටතේ යුද්ධයෙන් පසුව ආර්ථික ස්ථාවරභාවයක් වාගේම සංවර්ධන ගමනක් අපේ රටේ දියත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. රටේ ආර්ථික තත්ත්වය මැනීම සඳහා ආර්ථික විශේෂඥයන් භාවිතා කරන ඉලක්ක දිහා බැලුවාම අපේ ආර්ථිකය ගැන අපට සතුටට පත් වෙන්න පුළුවන්කම තිබෙනවා. දළ දේශීය ආදායමේ ඇති වුණු අවපාත තත්ත්වය පදනම් කර ගෙන වුණත් මේ වර්ෂයේ ඒ දර්ශකය සියයට 6.8ක පවතිනවාය කියන එක කවුරුත් පිළිගන්නවා. උද්ධමන වේගය සියයට 4යි; දරිද්‍රතාවයේ මට්ටම සියයට 8.9යි; විරැකියාභාවය සියයට 5යි. අය වැය පරතරය සියයට 8යි. ඒ වාගේම දළ දේශීය ආදායමේ ratio එක සියයට 80 දක්වා පහත දමා තිබෙනවා.

ඒ එක්කම ජාත්‍යන්තර වෙළෙඳ අවාසියක් තිබුණත් අපේ balance of payment එක දිහා බැලුවාම, අපේ ජාත්‍යන්තර සංචිතය දිහා බැලුවාම ඇමෙරිකන් ඩොලර් බිලියන 7ක් තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා. ඉතින් මෙයින් අපට හිතන්න පුළුවන්, ජනාධිපතිතුමා ප්‍රමුඛ ඒ ආර්ථිකය මෙහෙයවපු අය හරියාකාරව සියලු මිණුම් දඬු පාවිච්චි කරලා හොඳින් ඒක පරිහරණය කර තිබෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මගේ කථාවේ ඉතිරි කොටස ඉදිරිපත් කරන්නේ අපේ ආර්ථිකයේ ධන පැත්ත විතරක් නොව සෘණ පැත්ත ගැනත් බලා අවංකවම නිසි මැනීමක් කරන්නයි. පුළුවන් තරම් දුරට අපේ ආණ්ඩුව හරි මාවතක ඉදිරියට ගමන් කරවා, අපේ රට වෙනුවෙන් උපරිම සේවයක් ලබා දෙන ආකාරය ගැනත්, අපේ ජනතාව වෙනුවෙන් උපරිම සේවයක් ලබා දෙන්න පුළුවන් ආකාරය ගැනත් හැම විටම අපි බලන්න ඕනෑ. යහ පාලනය අවශ්‍යයි. දළ වශයෙන් අපේ දස අවුරුදු සැලැස්ම අනුව ජාතික ආර්ථිකය දියුණු කිරීමේ අවශ්‍යතාව මුල් කර ගෙන කටයුතු කර තිබෙනවාය කියන එක අපට පිළිගන්න පුළුවන්. ඒ කියන්නේ පෞද්ගලීකරණයට බහින්නේ නැතුව, යටිතල පහසුකම් දියුණු කර ගෙන, ආහාර ස්වයංපෝෂිතභාවය කරා ගමන් කරමින් සුබසාධන කටයුතු රැකගෙන කටයුතු කර තිබෙන බව අපි පිළිගන්න ඕනෑ.

නමුත් රාජ්‍ය අංශය දිහා බැලුවාම නම් අපට කනගාටු වෙන්න කරුණු කිහිපයක්ම තිබෙනවා. ඒ පාලනයේ යම් දුර්වලතා මතු වෙලා තිබෙනවා. ඒවා අපි නිවැරදි කළ යුතුයි. යම් අයගේ

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

දේශපාලන වුවමනාව මදිකම නිසා, එක්කෝ මුදල් ලබා දීමේ අඩුවක් නැත්නම් ප්‍රමාදයක් නිසා, දුර්වල පරිපාලනය නිසා, නිලධාරිවාදයේ නොසැලකිල්ල නිසා ඒ තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම දූෂණයත්, යම් අවස්ථාවල දේශපාලන ඇඟිලි ගැසීමුත් මේ තත්ත්වය ඇති වීමට හේතු වෙලා තිබෙනවා. මේ අය වැයෙන් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ මේ රජයේ යන්ත්‍රණය හරහා ඉදිරියට සාර්ථකව ගෙන යන්න නම් ඒවා වුවමනාවෙන්, තදින් ක්‍රියා කරමින් මේ තිබෙන අඩු පාඩුකම් නැති කළ යුතුයි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම පත්වීම් දෙන කොටත්, උසස් වීම් දෙන කොටත් සුදුසුකම් මතත්, ඒ වාගේම ඒ කරන සේවයේ නිසි තක්සේරුවක් කරලා ඒවා දිය යුතුයි. අනෙක් පැත්තෙන් සැලසුම් දිහා බැලුවාම මම හිතන්නේ, අප රටේ ඉතිහාසයේම නියම planning commission එකක් හරි, planning department එකක් හරි පිහිටුවලා සැලසුම්ගත ආකාරයකට මුළු රටේම ආර්ථික සංවර්ධනය සකස් කිරීමේ වැඩ පිළිවෙළක් තිබිලා නැහැය කියලායි. අපේ රටේ නියම සංවර්ධනයක් ඇති කරන්න නම් ඒ වැඩ පිළිවෙළ හරි ලෙස ඇති කිරීම අත්‍යවශ්‍යයි. මේ එක්කම සම්බන්ධීකරණයත්, පසු විපරමක් නොමැති වීමත් තවත් තිබෙන ලොකු අඩුවක්. අපි බලාපොරොත්තු වෙන්නේ, ජ්‍යෙෂ්ඨ ඇමති ධුර පත් කරන කොට අපට දීලා තිබුණු බලතල හා ඒ කටයුතු ඉෂ්ට කිරීමටයි. නමුත් පසු ගිය කාලයේදී ඒකට ටිකෙන් ටික තමයි අපට පිවිසෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපට නිසි ආධාර ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සිංගප්පූරුව වාගේ රටක් දිහා බැලුවාම ඒ රටේ සියයට 50කට වඩා ව්‍යවසායන් -ව්‍යාපාර- තිබෙන්නේ රජයේ අයිතිය යටතේයි; රජයේ පරිපාලනය යටතේයි. නමුත් ඒවා සාර්ථකව ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා, හොඳ, දක්ෂ පාලනයක් ඒ වාගේම ඵලදායීතාව උපරිම මට්ටමට නඟන පාලනයක්, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව ක්‍රියාත්මක වෙන නිසා. මම හිතන්නේ, ඒ පැත්ත ගැනත් අපේ හිත යොමු කළ යුතුය කියලායි. පසු ගිය කාලය දිහා බැලුවාම අපට පක්ෂයක් හැටියට පෙනුණු, අපේ අවධානය යොමු වුණු කරුණක් තමයි සංවර්ධනයට ප්‍රාග්ධනය ලබා ගැනීමේදී පිට රටින් ණය ලබා ගැනීමේ පැත්තට වුවමනාවට වැඩිය අපි හැරිලා තිබෙනවාය කියන එක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මූලාසනය සඳහා ගරු ගයන්ත කරුණාතිලක මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)
"මේ අවස්ථාවේ ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. GAYANTHA KARUNATILEKA *took the Chair.*

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි.

ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට ප්‍රාග්ධනය අත්‍යවශ්‍යයි. අපේ රට වැනි අඩු දියුණු රටවලට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයත් මෙකයි. අපේ ඒකපුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 2800 වනවාත් එක්කම අප වැටෙනවා, පහළ මධ්‍යම ආදායම් ලබන රටවල තත්ත්වයට. ඒ අනුව අපට කලින් ලැබුණු ආධාර සහ අඩු පොලී ණය අඩු වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය සලකලා අපට සිද්ධ වෙනවා, ප්‍රාග්ධනය ලබා ගැනීමට වෙන මාර්ගවලට හැරෙන්නට. ඒ සඳහා මේ අය වැය ලේඛනයේ අපනයන අංශය දියුණු කිරීමට වැඩ පිළිවෙළක් තිබීම ගැන අප සතුටු වෙනවා.

ඒ එක්කම, පිට රට සේවය කරන අයගෙන් අපට ලැබෙන ආදායම වැඩි කර ගැනීමේ වැඩ පිළිවෙළකුත් තිබෙනවා. සංචාරක අංශය දියුණු කිරීමේ වැඩ පිළිවෙළකුත් තිබෙනවා. ඒ වාගේම පිට රට සෘජු ආයෝජන - Foreign Direct Investment - වැඩි කිරීමේ වඩා හොඳ වාතාවරණයක් ඇති කිරීමේ වැඩ පිළිවෙළත් මේ අය වැය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබෙනවා. පිට රට රැකියාවලට යන අයට නිපුණතාවක් ලබා දීමට ඒ අය පුහුණු කිරීමේ ආයතන දියුණු කිරීමේ යෝජනා අය වැයට ඇතුළත් කර තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට ලොකු මුදලක් වෙන් කරලා, ඒ සඳහා සුදුසු වාතාවරණයක් ගොඩ නැඟීමට කටයුතු කරලා තිබෙනවා.

පිට රටින් එන ආදායම් වැඩි කිරීමේ ක්‍රියා මාර්ගයක් හැටියට උසස් තාක්ෂණයට සිත යොමු කර තිබීම ගැන අප සතුටු වෙනවා. නමුත් ඒක කර තිබෙන්නේ තොරතුරු තාක්ෂණ අංශයටයි. දැනටම තොරතුරු තාක්ෂණ අංශයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 400ක් පමණ අවුරුදු පතා අපට ලැබෙනවා. මේ අය වැය හරහා ගෙන යන වැඩ පිළිවෙළ අනුව, 2015 වර්ෂය වනකොට ඒක ඩොලර් මිලියන 1000 ට නංවන වැඩ පිළිවෙළක් දියත් කිරීම ගැනත් අපේ සතුට ප්‍රකාශ කරනවා. නමුත් ඉන් එහාට ගිහින්, අපේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් එකතු කිරීමේ පැත්තට බර දමන්න ඕනෑ. පසුව මම ඒ ගැන මම වචනයක් කියන්නම්.

මුදල් ඉපදවීමේ පැත්තෙන් බලනවිට අපට පෙනෙනවා, මේ අය වැය ලේඛනයෙන් ඒ සඳහා වැඩි බරක් දාලා තිබෙන බව. විශේෂයෙන් ප්‍රාග්ධන වෙළඳ පොළ ශක්තිමත් කිරීමෙන් රට තුළම ප්‍රාග්ධනය උපද වන්න අවශ්‍යයි. ප්‍රාග්ධන වෙළඳ පොළ ශක්තිමත් කිරීමට නම් අපේ කොටස් වෙළඳ පොළ හරියාකාරව ක්‍රියා කළ යුතුයි. ඒ කෙරෙහි ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගත යුතුයි. එසේ කිරීමට නම් හොඳ කළමනාකරණයක් අත්‍යවශ්‍යයි. හොඳ පාලනයක් අත්‍යවශ්‍යයි. මෑත අතීතයේ වුණත් මේ ක්ෂේත්‍රයේ විවිධ ජාවාරම් සිද්ධ වෙලා තිබෙනවා. මේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී එවැනි දේවලට ඉඩ නොතියයි කියලා අප බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම අප සතුටු වෙනවා, අපේ සංවර්ධන ප්‍රාග්ධන ඉපදවීමේ - Venture Capital - ක්‍රමය දියුණු කිරීමට NDB, DFCC බැංකු හරහා නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ගැන.

ඒ වාගේ ප්‍රාග් ධනය ලබා දුන්නෝතින් තමයි අපට පුළුවන් වන්නේ, නියම ව්‍යවසායකයන් මතු වෙලා ඒ හරහා අපේ රටේ සංවර්ධන ගමනක් යන්න. නමුත් අපේ මතය තමයි, උසස් තාක්ෂණය දියුණු කරපු තරමටයි රටවලට ඉදිරියට යන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියන එක. අපි අග්නිදිග ආසියාවේ රටවල් ගත්තොත්, ඒ ආකාරයට දියුණු වෙලා තිබෙන රටවල් විධියට කොරියාව, ජපානය, තායිවානය, සිංගප්පූරුව හඳුන්වන්න පුළුවන්. මෙවැනි රටවල්වලට ඒ සීඝ්‍ර දියුණුව ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ උසස් තාක්ෂණය - hi-tech - උපරිම ලෙස දියුණු කළ නිසායි.

ජාතික විද්‍යා තාක්ෂණ හා නව උත්පාදන ක්‍රියා මාර්ගයක් පිළිබඳ යෝජනාවක් මා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒක කැබිනට් මණ්ඩලය පිළිගත්තා. දැන් ඒක පදනම් කර ගෙන, නැනෝ තාක්ෂණ park එකක් දියුණු කිරීමට මේ අය වැයෙන් මුදල් වෙන් කර දීම ගැන මා සන්තෝෂ වනවා. ඒක හරහා අපේ රටේ උසස් තාක්ෂණය, විශේෂයෙන් nanoelectronics, nanobiotechnology වැනි තාක්ෂණ දියුණු කිරීමට හැකි වේවි කියලා අපි හිතනවා. ඒක පදනම් කර ගෙන අපේ අමු ද්‍රව්‍යවලට උපරිම වටිනාකමක් එකතු කරන කර්මාන්තකරණයකුත් ඉන් පසුව ඇති කරන්න පුළුවන් වේවි. දැන් අපේ අපනයන දිහා බැලුවාම, එයින් සියයට 1.5ක් පමණයි උසස් තාක්ෂණය යොදවලා, hi-tech භාණ්ඩ හැටියට පිට කරන්නේ. ඒ වුණත් ජපානයේ සියයට 85ක්, කොරියාවේ සියයට 70ක්, සිංගප්පූරුවේ හා මැලේසියාවේ සියයට 50ක් ඒ hi-tech භාණ්ඩ තමයි අපනයනය කරන්නේ. ඒ නිසා තමයි ඒ භාණ්ඩ ලෝක වෙළෙඳ පොළේ අළෙවි වෙලා, ඒ රටවල් දුප්පත් තත්ත්වයෙන් ගොඩ ඇවිල්ලා දැන් පොහොසත්, සංවර්ධිත රටවල් බවට පත් වෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. දැන් අපේ රටේ තිබෙන අධ්‍යාපන පහසුකම් උපයෝගී කරගෙන මේ සඳහා නිසි පදනමක් ඇති කර ගන්න අපටත් අමාරු නැහැ. එවැනි වැදගත් ඉදිරි ගමනක් සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලා නිසි වැඩ පිළිවෙළක් දියත් කරන්නට මේ අය වැයෙන් ආරම්භක පියවරක් ගෙන තිබෙනවාය කියලා මා හිතනවා.

ලංකාව මුහුණ දෙන තවත් ප්‍රශ්නයක් තමයි, විදේශ වෙළෙඳ පරතරය. මෙය අඩු කිරීම ක්ෂණිකව කළ යුතු දෙයක්. දැන් මේ පරතරය එන්න එන්නම වැඩි වීම හේතුකොටගෙන තමයි රුපියල බාල්දු කිරීමට තීන්දු කළේත්. ඒ අනුව තමයි පිටරටින් ගෙන්වන බඩුවල මිල දැන් වැඩි වෙලා තිබෙන්නේ. ඉතින් මේ තත්ත්වයත් එක්ක විදේශ පෞද්ගලික ණය පවා ලබා ගන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ තුළින් අපේ විදේශ ණය බර වැඩි වීමක් සිද්ධ වෙලා තිබෙනවා. මේ අය වැයේ සඳහන් කරලා තිබෙනවා, මින් ඉදිරියේ දී ඒ විදේශ පෞද්ගලික ණය ලබා ගැනීම නතර කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඒක හොඳ ඉදිරි පියවරක්. අපි බලන්නට ඕනෑ, නියම ලෙස අපේ විදේශ වෙළෙඳ පරතරය පියවීමටත්, අපේ ආනයනවලට වැය වන වියදමත් අඩු කරන්නත්.

අපි සන්තෝෂ වනවා, වාහන සඳහා අය කරන බදු වැඩි කිරීම ගැන. නමුත් අපේ මතය නම්, අනෙකුත් සුඛෝපභෝගී භාණ්ඩවලටත් ඒ ආකාරයටම බදු වැඩි කළ යුතුයි, ඒවා ගෙන්වීම සීමා කිරීම සඳහා.

ඒ එක්කම මට කියන්න තිබෙනවා, අපේ රටේ තිබෙන බල ශක්ති ප්‍රශ්නය ගැන.

තෙල් ගෙන්වීම සඳහා විශාල මුදලක් පිට රටට යැවිය යුතුව තිබෙනවා. දැන් අපේ රටේ විකල්ප බල ශක්ති දියුණු කිරීමට මුදල් වෙන් කරලා තිබෙනවා. මම සතුටු වනවා, ග්ලිරිසීඩියා වගාව වෙනුවෙනුත් එම මුදල් යෙදවීම ගැන.

බදු ප්‍රතිපත්තිය දිහා බැලුවාම අපි තදින්ම ඉල්ලීමක් කරලා තිබෙනවා, මේ ආණ්ඩුව බදු අය කරන්න ඕනෑ, බදු ගෙවන්න පුළුවන් පොහොසත් අයගෙන් කියලා. ඒ අයගෙන් බදු අය කර ගන්නා සියයට 24ක උපරිමය සියයට 45කට නග්ගන්න කියන එකයි අපේ යෝජනාව. ඒක කරන ගමන් දුප්පත් ජනතාවගෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවලට අය කරන වක්‍ර බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න කියන ඉල්ලීම අපි ඉදිරිපත් කරනවා.

රේගු, දේශීය ආදායම්, සුරාබදු වැනි දෙපාර්තමේන්තුවල තිබෙන අඩු පාඩු හේතුකොට ගෙන රජයට ලැබෙන ආදායම අඩු වෙලා තිබෙනවායි කියලා අපි දන්නවා. මේ ගැනත් වහාම කටයුතු කළ යුතුයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා මට තව විනාඩි දෙකක් දෙන්න.

වැටුප් වැඩි කිරීම ගැන අපි සන්තෝෂ වනවා. රුපියල් 1,500ක දීමනාවක් දීලා තිබුණාට අපේ පක්ෂයේ මතය වන්නේ සියලු රජයේ සේවකයන්ට රුපියල් 2,500කින් වැටුප වැඩි කළ යුතු බවයි. ඒක කරනවාත් එක්කම පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප රුපියල් 12,500ක් විය යුතුයි කියන එක අපේ අදහසයි. ඒ එක්කම අපි සන්තෝෂ වනවා, 1980 ජූලි වැඩ වර්ජකයින් වෙනුවෙන් රුපියල් 5,000ක මාසික දීමනාවක් දීම ගැන. නමුත් එය සීමා කරලා තිබෙනවා, වයස අවුරුදු 65 ඉක්මවූ අයට දීමට. අපි යෝජනා කරනවා, වයස අවුරුදු 60 ඉක්මවූ අයට මේ දීමනාව දෙන්න කියලා. එතකොට ඒ අයටත් අසාධාරණයක් වන්නේ නැහැ. යම් විධියකින් ඒ අය මැරිලා නම් ඒ අයගේ බිරිඳට හෝ ස්වාමි පුරුෂයාට ඒ දීමනාව ලබා දෙන්න කියලා අප යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශුභසාධන වැඩ පිළිවෙළ දියුණු කිරීමට මේ අය වැයෙන් ලොකු බරක් දාලා තිබෙනවා. ඒ ගැන අපි ජනාධිපතිතුමාට ප්‍රශංසා කරනවා. ඒ වාගේම අපේ රටේ සංවර්ධන ගමනටත් දිරි ගැන්වීමක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් අපි යෝජනා කරනවා, විද්‍යාත මධ්‍යස්ථාන සම්බන්ධ කරලා ඒ හරහා තාක්ෂණය ලබා දීමෙන් ඒ අංශය දියුණු කිරීමටත් කටයුතු කරන්න කියලා. මේ අය වැයට අපේ උපරිම සහාය ලබා දෙනවා. නමුත් අපි ඉල්ලීමක් කරනවා, ජනතාවගේ පැත්ත දිහා බලලා ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න කියලා. බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 2.14]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වනවා, මගේම පාසලේ ආදි ශිෂ්‍යයකු වන ඔබතුමා මූලාසනයේ ඉන්න වේලාවක මේ අය වැය විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය දිහා අපි බලන්න ඕනෑ, මේ අය වැය ගෙනා සන්දර්භය මොකක්ද කියලාත් බලමින්. එතකොට තමයි මේ අය වැය දෙස අපට නිවැරදි කෝණයකින් බලන්න පුළුවන් වන්නේ.

මේ අය වැය සාරාංශ කරලා බැලුවොත්, 2013 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැයේ ආදායම අපි ඇස්තමේන්තු කරනවා, රුපියල් බිලියන 1,277කට. ඒ ආදායමෙන් රුපියල් බිලියන 400කට වැඩි මුදලක් අපට වියදම් වන්නේ රාජ්‍ය සේවකයන්ගේ පඩි ගෙවන්නයි. තවත් රුපියල් බිලියන එකසිය ගණනක් වියදම් වනවා, විශ්‍රාම වැටුප් ගෙවන්න. එතකොට ආදායමෙන් සියයට 50ක විතර ප්‍රමාණයක් අනිවාර්යයෙන්ම වියදම් කළ යුතුයි. මොකද, රාජ්‍ය සේවකයාට පඩි නොගෙවා ඉන්න බැහැ නේ. ඒක ගෙවන්නම ඕනෑ. තවත් රුපියල් බිලියන 100කට වැඩි මුදලක් වැය වෙනවා, විශ්‍රාම වැටුප් ගෙවන්න. ඒකත් ගෙවන්නම ඕනෑ.

තවත් රුපියල් බිලියන 500ක් විතර යනවා සහනාධාරවලටයි, අවුරුදු ගණනක් තිස්සේ ගත්ත ණයවල -අපේ ආණ්ඩුව විතරක් නොවෙයි, විවිධ ආණ්ඩු ගත්ත ණය- පොලී ගෙවන්නයි. ඒ ණය පොලී ක්‍රමක්‍රමයෙන් ගෙවී ගෙන, ගෙවී ගෙන යනවා. එතකොට ලැබෙන ආදායම මේ කාරණා හතරට වියදම් කළාම ඉවරයි. විශ්‍රාම වැටුප් ගෙවන්න, රාජ්‍ය සේවකයන්ගේ පඩි ගෙවන්න, සහනාධාර දෙන්න සහ රටක් හැටියට ගත්ත -ආණ්ඩුව නොවෙයි. රටක් හැටියට ගත්ත- ණයවලට පොලී ගෙවන්න. ආණ්ඩුවට ඕනෑ නම් අය වැය හිඟයක් තියා ගන්නේ නැතුව, ආදායම මෙච්චරයි; මේ ටික ගෙව්වා කියලා ඉන්න පුළුවන්. එතකොට ඒක ආණ්ඩුවක් නොවෙයි. ඒකට ආණ්ඩුවක් ඕනෑ නැහැ.

ලංකාවේ මට මතක හැටියට, -මා වැරදි නම් නිවැරදි කරයි මෙතැන ඉන්නා ආර්ථික විද්‍යා පණ්ඩිතයෝ- 1954 සහ 1956 කියන අවුරුදු දෙකේ විතරයි අය වැයේ අතිරික්තයක් තිබුණේ. අනික් හැම අවුරුද්දකම, අවුරුදු 60 ගණනක් තිස්සේ මොන ආණ්ඩුවක් තිබුණත් අය වැය හිඟයක් තිබුණා. ඒ නිසා ආණ්ඩුවක් තිබෙන්නේ, රටේ ආදායම හා වියදම අතර හිඟයක් තිබෙනවා නම් ඒ හිඟය පියවා ගනිමින්, ඊළඟ වතාවේ ඒ හිඟය අඩු කර ගනිමින්, සහනාධාර දෙන්නා වූ, පඩි දෙන්නා වූ, විශ්‍රාම වැටුප් ඒ සියල්ල දෙමින් කටයුතු කරන්නයි. ආණ්ඩුවක් තිබෙන්නේ ඒකටයි. හැබැයි සමහර ආණ්ඩු මේක දිහා බලන විධිය වෙනස්. උදාහරණයක් විධියට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ බොහෝ විට ඒ ගොල්ලන්ගේ දර්ශනය වුණේ, නව ලිබරල්වාදී දර්ශනය.

අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා නම් කථා කළේ නව ලිබරල්වාදී දර්ශනයට පටහැනි විධියට. ඒක එක්සත් ජාතික පක්ෂයේ දර්ශන දෙක අතර තිබෙන්නා වූ ඝට්ටනයක්. කෙසේ වෙතත් ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ කථාව ඇහුවාම, රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාව ඇහුවාම, අපේ හර්ෂ ද සිල්වා පණ්ඩිත මහත්මයාගේ කථාව ඇහුවාම නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය තමයි අපට ගම්‍යමාන වෙන්නේ. එතකොට නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය යටතේ මේ අය වැය හිඟය අඩු කර ගැනීම සඳහා ඒගොල්ලෝ විවිධ කාරණා සිද්ධ කළා. උදාහරණයක් හැටියට ඒගොල්ලෝ රාජ්‍ය සේවයට බඳවා ගැනීම නතර කළා.

එදා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ 2001, 2002 හා 2003 කියන අවුරුදු තුනේ රාජ්‍ය සේවකයන් ලක්ෂ 6ට සීමා කළා. සීමා කරලා විශ්‍රාම වැටුප් නවත්වන්න පනතක් ගෙනවා. අලුතින් රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා විශ්‍රාම වැටුප් නවත්වනවා. එතකොට ඒ නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය යටතේ රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගන්නේ නැහැ. අලුතින් විශ්‍රාම වැටුප් දෙන්නේ නැහැ. ඒ තමයි ඔවුන්ගේ ආර්ථික දර්ශනය. ඒ ආර්ථික දර්ශනය තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා අවසාන වරට අගමැති හැටියට සිටිය වෙලාවේ ක්‍රියාත්මක කළේ. අවසානයේ අපේ ආණ්ඩුව ඇවිල්ලා තමයි නැවත විශ්‍රාම වැටුප් ගෙවීමේ පනත ගෙනාවේ.

එදා ඒ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය යටතේ, අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියපු එකේ අනෙක් පැත්ත බොහෝ විට කළේ. ඒ කියන්නේ කළු සල්ලි සහ විවිධ විධියට එන සල්ලි බදු හැටියට අය කර ගැනීමට වෙනුවට ඒවා කපා හරිනවා. ඒක හන්දා තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ වෙනම පනතක් ගෙනාවේ, කෝටි ගණනක් බදු දෙන අයගේ බදු එහෙම පිටින්ම කපා හරින්න. අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා, ඇයි මේ ආණ්ඩුව බදු අය කර ගන්න ඕනෑ අයගෙන් බදු අය කර ගන්නේ නැත්තේ කියලා. හැබැයි එතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති විධියට හිටපු ආණ්ඩුව කළේ ඒකේ අනෙක් පැත්ත. සුදු කෙළලා ගෙනාපු කළු සල්ලි, ඒ අයගේ බදු සල්ලි කෝටි ගණනක් අහෝසි කිරීමේ පනතක් ගෙනැල්ලා අහෝසි කර දැමීමයි කළේ. එතකොට එතුමා නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමා. ඒක තමයි කියන්නේ, "බලේ තිබෙන කොට මොළේ නැහැ. මොළේ තිබෙන කොට බලේ නැහැ" කියලා.

අපේ ආණ්ඩුවේ, අපේ රජයේ ප්‍රතිපත්තිය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය නොවෙයි. අපේ රජයේ ප්‍රතිපත්තිය රාජ්‍ය සේවය ප්‍රසාරණය කරන එක. ඒක සංකෝචනය කරන එක නොවෙයි. ඒ නිසා අපේ රජය යටතේ දැන් රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය ලක්ෂ 13 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2003 දී රාජ්‍ය සේවකයන්ට ගෙවපු වැටුප්වලට වඩා 2012 වන කොට සියයට 343ක් වැඩියෙන් වැටුප් ගෙවනවා. 2003 දී විශ්‍රාම වැටුප් ගෙවපු ගණනට වඩා සියයට 340කින් වැඩියෙන් මේ ආණ්ඩුව විශ්‍රාම වැටුප් ගෙවනවා. ඇයි ඒ? ඒක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වරදක් නොවෙයි. මේ ආණ්ඩු දෙක අනුගමනය කරන්නා වූ ආර්ථික දර්ශන දෙකේ තිබෙන වෙනස. ඒ ආණ්ඩුවේ දර්ශනය රාජ්‍ය සේවය සංකෝචනය කිරීම; බඳවා ගැනීම් නැවැත්වීම.

තමුන්නාන්සේලා දන්නවා නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා අග්‍රාමාත්‍ය ධුරය දරපු කාලයේ කොන්ත්‍රාත් ක්‍රමයට පවා කෙනකු බඳවා ගන්න එක නැවැත්වූ බව. එතකොට විශ්‍රාම වැටුප් දුන්නේ නැහැ. විශ්‍රාම වැටුප් ගෙවන එක නවත්වන්න කියලා පනතක් ගෙනාවා. ඒකයි මේ ආණ්ඩු දෙකේ වෙනස. අපේ ආණ්ඩුව කාලය, විශේෂයෙන් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාලය ගෙන බලන කොට වැඩියෙන් රාජ්‍ය සේවකයන් බඳවාගෙන තිබෙනවා විතරක් නොවෙයි, රාජ්‍ය සේවකයන්ගේ පඩිත් වැඩි වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මේ රට භාරගන්න කොට රාජ්‍ය සේවකයාගේ අවම වැටුප තිබුණේ ඉලක්කම් හතරේයි. මේ රටේ රාජ්‍ය සේවකයාගේ අවම වැටුප ඉලක්කම් පහට ආවේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ. ඉලක්කම් පහට ඇවිත් තිබෙනවා විතරක් නොවෙයි, රුපියල් 10,000 සීමාව ඉක්මවා ගිහින් දැන් රුපියල් 20,000 සීමාවට ළං වෙමින් පවතිනවා අවම වැටුප. ඉතින් වැටුප් වැඩි වෙලා තිබෙනවා. සජිත් ප්‍රේමදාස මහත්මයා උදේ මෙතැන බෙරිහන් දුන්නා ගොවියාට කිසිම දෙයක් දුන්නේ නැහැ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මම එහෙම කිව්වේ නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
තමුන්නාන්සේ කිව්වා, ගොවියාට සහනාධාර දුන්නේ නැහැ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කිව්වේ ගොවි විශ්‍රාම වැටුප ගැන.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
නැහැ, නැහැ. ඒ, කථාවේ අන්තිම කෑල්ල. මුල කෑල්ල ආයෙත් අහලා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එහෙම කිව්වා. [බාධා කිරීමක්] පිළිගන්නවා නම් බොහොම හොඳයි. [බාධා කිරීමක්] මම කෝල් එකක් දෙනවා රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට. තලතා අතුකෝරල මැතිනිය "රංජන් රාමනායක" කියන නම කියූ විගස නිශ්ශබ්ද වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ගොවියාට පොහොර සහනාධාරය දෙනවා. අතිගරු ජනාධිපතිතුමා රුපියල් 350ට වී ගොවියාට පොහොර දෙන්න පටන් ගත්තේ 2005 දී. තවම ඒක දෙනවා. එහෙම නම් මේ අවුරුද්දේ ආයෙත් ඒක දෙනවා කියලා කියන්න ඕනෑ නැහැ. මේ අවුරුද්දේ ඒක දෙනවා. රුපියල් 350ට පොහොර දෙනවා කියන එකෙන් මොකක්ද හැඟෙන්නේ? පොහොර මිටිය කාලයක් රුපියල් 5,000ට තිබුණා. රුපියල් 5,000ට තිබෙන පොහොර මිටිය රුපියල් 350ට දෙනවා කියන්නේ මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක හොඳ වැඩක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔව්, ඒක හොඳ වැඩක්. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඔබතුමා පොඩ්ඩක් ඉන්න. ඔබතුමා අද බණක් කිව්ව එකේ පොඩ්ඩක් ඕහොම අහගෙන ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 5,000 පොහොර මිටිය රුපියල් 350ට දෙනවා කියන්නේ රුපියල් 4,650ක් ගොවියාගේ අතට දෙනවා වාගේ තමයි. පොහොර මිටිය අද රුපියල් 3,000 නම් එය රුපියල් 350ට දෙනවා කියන්නේ, සෑම වී ගොවියකුටම රුපියල් 2,650ක් අතට දෙනවා වාගේ තමයි. ඒක සහනාධාරයක්. තවම ඒක දෙනවා. එතැනින් නැවතුණේ නැහැ. තේ ගොවියාටත් සහනාධාර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔතැන ඉන්න ඔබතුමා, ඒ වාගේම අපේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ මිතුරිය වන අපේ තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය ඇතුළු තේ කර්මාන්තයට සම්බන්ධ උදවිය සියලු දෙනා දන්නවා 2007 දී තේවලට සුනාමියක් ආ බව. තේවලට සුනාමියක් ආවා. රුපියල් 16ට, 17ට ගියා තේ කිලෝ එකක මිල. ඌව පළාතේ තේ ගොවීන් කැඳවා ගෙන මම මහා භාණ්ඩාගාරයට ගියා. ගිහින් අපි සාකච්ඡා කළා මහා භාණ්ඩාගාරයත් එක්ක. සාකච්ඡා කළා මුදල් ඇමතිතුමා හැටියට ඉන්න අතිගරු ජනාධිපතිතුමාත් එක්ක, තේ මිල ප්‍රශ්නයට උදවු දෙන්න කියලා. එතුමා තේ මිල ප්‍රශ්නයට උදවු දුන්නා විතරක් නොවෙයි, වී ගොවියාට වාගේම පොහොර සහනාධාරයක් දෙන්න කියලා කාලයක් තේ ගොවීන් ඉල්ලා සිටි පොහොර සහනාධාරයත් දුන්නා. තේ ගොවියාට තවම රුපියල් 1,000ට පොහොර මිටිය හම්බ වෙනවා. ඒ සහනාධාරය අතිගරු ජනාධිපතිතුමා දුන්නා 2008 දී. තවම ඒක දෙනවා. තේ ගොවියාට දැන් පොහොර සහනාධාරය දෙනවා, මෙවර අලුතෙන් තේ වගා කරන්නන්හට දෙන්නා වූ ඒ සියලු සහනාධාරත් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණ රැස්වීමට නුවරඑළියේ ගියාම නුවරඑළියේ ජනතාව කිව්වා, බදුල්ල පැත්තේ, වැලිමඩ පැත්තේ ජනතාව කිව්වා -එතැන ගරු සී.බී. රත්නායක ඇමතිතුමාත් හිටියා.- වී ගොවියාට පොහොර සහනාධාරය දෙනවා, තේ ගොවියාට දෙනවා, එළවලු ගොවියාටත් සහනාධාර දෙන්න කියලා. එළවලු ගොවියාටත් සහනාධාර දුන්නා. තවම ඒක දෙනවා. දුන්නු ඒවා නවත්තලා නැහැ. ඒවා දිගටම දෙනවා. "දෙනවා, දෙනවා" කියලා ආයේ කියන්න අවශ්‍ය නැහැ. මේවා කියන කොට සජිත් ප්‍රේමදාස මහත්මයා චුත වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ගිහින් එනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
හරි නම් ඔබතුමා එන්න ඕනෑ. දේශපාලනඥයන් කියන්නේ එහෙම අයයි. ඔබතුමා එන්න ඕනෑ.

මේ වියදම් දරමින්, ඒ සහනාධාරත් එහෙමම තියා ගෙනයි මේ අය වැයෙන් සහන දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, ජාත්‍යන්තර වශයෙන් තිබෙන සන්දර්භය අරගෙන බලමු. අපේ රටේ අපනයනවලට තිබෙන ආදායම අඩු වුණා. ඇයි ඒ? ලංකාවේ අපනයන වැඩියෙන්ම මිලදී ගන්නේ කවුද? ඇමෙරිකාව සහ යුරෝපයයි. ඕකයි ඇත්ත. ලංකාවට වැඩියෙන්ම මානව හිමිකම් සම්බන්ධයෙන් චෝදනා එල්ල කරමින් අමාරුවේ දාන්න හදන්නේත් ඒ ගොල්ලෝයි. හැබැයි, අපේ රටේ අපනයන වැඩියෙන් මිලදී ගන්නේ ඇමෙරිකාව සහ යුරෝපයයි. දැන් ඇමෙරිකාවේ, යුරෝපයේ ආර්ථික කඩා ගෙන වැටිලා. ඒ ගොල්ලන්ගේ ආර්ථික වර්ධන වේගයත් අපේ රටටත් වඩා අඩුයි. ඒ නිසා ඒ ගොල්ලන්ට මිල දී ගැනීමේ හැකියාව අඩුයි. ඒ නිසාම ඒ අය අපේ අපනයන මිලදී ගන්නවා අඩුයි. ඒ හින්දා අපේ අපනයන ආදායම අඩු වුණා. ඒ එක්කම මොකද වුණේ? ඉන්දියාවේ සහ චීනයේ ඇති වන්නා වූ මහා සංවර්ධනය නිසා දැන් ඉන්දියාව හා චීනය තෙල්වලට විශාල වශයෙන් ඉල්ලුම් කරනවා.

දැන් ලෝකයේ වැඩියෙන්ම තෙල් මිලදී ගන්න පොර කන්නේ ඉන්දියාව හා චීනයයි. ඒ නිසා තෙල්වලට තිබෙන ඉල්ලුමත් එක්ක තෙල්වල මිල ඉහළ යනවා. එතකොට අපේ ප්‍රධානතම ආනයන භාණ්ඩයක් වෙච්ච තෙල්වල මිල ඉහළ ගියාම ඒක අපේ ආර්ථිකයට බලපානවා. එසේ තෙල් මිල ඉහළ ගියත්, අපට යම් ප්‍රමාණයකට සහනදායී ලෙස ලබා ගන්න තිබුණු රට තමයි ඉරානය. ඇමෙරිකාව ඉරානයට ආර්ථික තහංචි දැම්මා. එතකොට ඒ සහනයත් අපට නැතිව ගියා. ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන්නා වූ ඒ තත්ත්වයත් සමනය කරමින්, යම් ප්‍රමාණයකට තුලනය කර ගනිමින් තමයි මේ අය වැය ගෙන එන්නේ. ඒ නිසා මෙන්න මේ සන්දර්භය තුළ ඉඳ ගෙන තමයි මේක දිහා බලන්න ඕනෑ.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා මෙතැනදී කිව්වා, සාර්ව ආර්ථික විද්‍යාව ගැන. නමුත්, සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳව ටිකක් දන්න කියන උදවිය -එතුමා කථා කරපු විධියට මට වඩා දන්න කියන කෙනෙක්.- මේ අය වැය ගැන කියන්නේ මොකක්ද? සාර්ව ආර්ථික විද්‍යාවේ මූල ධර්ම දිහා බැලුවාම අපනයනවලට දැන් වෙලා තිබෙන තත්ත්වයත්, ආනයන දිහා බැලුවාමත් මේ රටේ ලබා දෙන්නා වූ සහනාධාර මල්ල එහෙම පිටින්ම තියා ගෙන, අලුතිනුත් සහනාධාර එකතු කරමින් මෙවැනි සෑම ක්ෂේත්‍රයකටම සහනයක් දුන් අය වැයක් ගෙනාවේ කොහොමද කියන ප්‍රශ්නය තමයි සාර්ව ආර්ථික විද්‍යාවේ මූලධර්ම පිළිබඳව කථා කරන බොහෝ අය අහන්නේ. සාමාන්‍යයෙන් මෙහෙමනේ. ආර්ථික විද්‍යාඥයෝ ගොඩක් ඉන්නවා.

ආර්ථික විද්‍යාව හදාරපු සමහර උදවිය GCE (Ordinary Level) pass වෙලා, GCE (Advanced Level) pass වෙලා, විශ්වවිද්‍යාලයට ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, GCE (Ordinary Level) pass වෙලා, GCE (Advanced Level) pass වෙලා බොහොම ලොකු තරගයකින් පස්සේ තමයි මම විශ්වවිද්‍යාලයට ගියේ. බොහොම අමාරුවෙන් ගියේ. අනිත් අයට වගේ නොවෙයි, කැලණිය විශ්වවිද්‍යාලයේ විශේෂවේදී උපාධිය නිසා ආර්ථික විද්‍යාව ගැන මට සීමිත දැනුමක් තිබෙනවා. හැබැයි සමහර අය ඉන්නවා, ඒ අය අපේ විශ්වවිද්‍යාලයට නොගියත්, GCE (Advanced Level), GCE (Ordinary Level) pass නොවුණත්, ආර්ථික විද්‍යාව ඉගෙන ගෙන අපටත් වඩා හොඳින් ආර්ථික විද්‍යාව ගැන කථා කරනවා. මම ඒ අයට දොස් කියනවා නොවෙයි. නමුත් කවුරු ආර්ථික විද්‍යාව ගැන කථා කළත්, ඒ ගැන කථා කරන්න ඕනෑ සැබෑ ලෙසම ආර්ථික විද්‍යාවේ මූල ධර්ම මත පිහිටලායි. එහෙම නැතුව ඒවා තමන්ට ඕනෑ ඕනෑ විධියට විකෘති කරමින් නොවෙයි.

අද උදේ ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා කළේ ඒ විකෘති කිරීම කරපු එකයි. එතුමා කියනවා, මේ ආණ්ඩුව බදු අය කර ගන්න පුළුවන් කට්ටියගෙන් බදු අය කර ගන්නේ නැහැ කියලා. හැබැයි, එතුමාම නියෝජ්‍ය ඇමති කාලයේ තිබුණු ආණ්ඩුව බදු සමා පනතක් ගෙනැල්ලා කෝටි ගණනක් හොරකම් කළ බදු හොරුන්ට සමාව දුන්නා. ඒක තමයි ඇත්ත. එතුමා කථාව අවසාන කළා, මිත්‍යාව පැත්තකට දාලා සත්‍ය ජය ගන්න ඕනෑ කියලා සඳහන් කරමින්. එතුමා ඒවා කිව්වේ කාටද කියලා මම දන්නවා. එතුමා රනිල් වික්‍රමසිංහ මහත්මයාට කියන්න ඕනෑ දේ මේ අය වැය විවාදය අවස්ථාවේදී කිව්වා. ඒක එතුමාගේ අයිතිය.

අද උදේ වරුවේ ගරු ජෝන් අමරතුංග මහත්මයාත් එහෙම වැඩක් කළානේ. ජෝන් අමරතුංග මහත්මයා නටබුන් කඩපු ඒවා ගැන, නිධන් ගැන, කඩු ගැන කියන කොට සජිත් ප්‍රේමදාස මහත්මයා දිහා බලාගෙනයි කිව්වේ. එතුමාටත් කියන්න ඕනෑ දේ එතුමාත් ඒ විධියට කියලා දැම්මා. මේ අය වැය විවාදය තුළ විරුද්ධ පක්ෂයේ ඒ ඒ මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුවේ අය වැය පාවිච්චි කරමින් තම තමන්ට ඕනෑ කරන දේ කියා ගන්නවා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඒක ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නයක්. අපේ ප්‍රශ්නක් නොවෙයි. [බාධා කිරීමක්] අපට තොප්පිය හරියන්නේ නැහැ. ඒ නිසා අපි ඒක දා ගන්නේ නැහැ.

ඊළඟට ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කථා කළා. මම හරි සතුටුයි. මම අද වන තෙක් හිතා ගෙන හිටියේ එතුමා ගොළුවෙක් කියලා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද හොඳ කථාවක් කළා විතරක් නොවෙයි, අපි බාධා කරන කොටත් ඔබතුමා ඒවාට මුහුණ දෙමින් කථා කළා. [බාධා කිරීමක්] එහෙම තමයි මන්ත්‍රීතුමා හැදෙන්නේ. මීට ඉස්සෙල්ලා මූලාසනයේ හිටපු ගරු අස්වර් මන්ත්‍රීතුමා හිටියා නම් කියයි, අපි 1994 පාර්ලිමේන්තුවට ආවාම අපට කථා කරන්න ඔය පැත්තෙන් ඉඩ දුන්නේම නැහැ කියන එක.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
1994?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අපි 1994 මේ ආණ්ඩු පක්ෂයේ පැත්තට ආවාම ගරු අස්වර් මන්ත්‍රීතුමන්ලා අපට කථා කරන්න ඉඩ දුන්නේම නැහැ. අපි හැදුණේ එහෙමයි. අපි, මහින්දානන්ද ඇමතිතුමන්ලා කරන්නේ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හදන එක, ඔබතුමා කථා කරනවන එක. ඒ නිසා ඒ ගැන කලබල වෙන්න එපා.

ඊළඟට එතුමා කිව්වා, අපි බාධා කරලා එතුමාගේ කථා කිරීමේ අයිතිය පවා නැති කළා කියලා. ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා, මම 1994 පාර්ලිමේන්තුවට ආවාම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මට වාහනයක් දුන්නා. ඒකේ අංකය 1492. මම එක නිවාඩුවකට ඒ වාහනයේ වෙන්නප්පුව ප්‍රදේශයට ගියා. එහෙම යන කොට මගේ වාහනය දැකලා මිනිස්සු පාරවල් කඩා ගෙන දුවනවා. ඒ ඇයි? ඒක නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාගේ පියා ඒ දවස්වල පාවිච්චි කරපු වාහනය. ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා අද මෙතැනට ඇවිල්ලා කියනවා, අපි එතුමාගේ කථා කිරීමේ අයිතිය නැති කළා කියලා. අංක 1492 වාහනය එතුමා දන්නවා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 1492 වාහනයේ මම අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට යන කොට වෙන්නප්පුව පැත්තේ මිනිස්සු ඒ වාහනය දැකලා පාරවල් කඩාගෙන දුවනවා. මොකද, ඒ වාහනයට ඒ තරම් භයයි. 1994 කාලය තුළ ඒ වාහනය තමයි මිනිසුන් භය කරපු වාහනය.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඔබතුමාගේ මුහුණ දැක්කාම සමහර අය දුවනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මොකක්ද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඔබතුමාගේ මුහුණ දැක්කාම සමහර අය දුවනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මගේ මුහුණ දැක්කාමද? මගේ මුහුණ දැක්කාම සමහර අය දුවනවා. වෙන එකක් තියා මගේ මුහුණ දැක්කාම - [බාධා කිරීමක්] නැහැ. මගේ මුහුණ දැකලා මා සමඟ විවාහ වුණු දෙදෙනෙකුත් මාව දමලා ගියා. එක් කෙනෙක් දැන් බදුල්ලේ හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ හොඳම මිතුරියක්. එතුමාගේ පෙළපාළියේ ඉස්සරහින්ම යන්නේ මගේ පළමුවන කසාදයේ

නෝනා. ඒක තමයි ඇත්ත. සමහර කට්ටිය බුලත් කනවා. සමහර කට්ටිය බුලත් විට කනවා. ඉතින් මොනවා කරන්නද? සමහර කට්ටිය හපලා-හපලා ඉතුරු වුණු හපයත් කනවා. මොනවා කරන්නද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සමහර අය කන්නෙම නැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
සමහර අය කන්නෙම නැහැ. දැන් බලන්න. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියනවා, සමහරු කන්නෙම නැහැයි කියලා. විපක්ෂ නායකතුමාට එහෙම ගහන්න එපා. එහෙම ගහන එක වැරදියි. මා අහන්නේ, එක් එක් කෙනාට පහර දෙන්න මෙම අය වැය විවාදය පාවිච්චි කරන්නේ ඇයි කියලායි. එහෙම ගහන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අවසානද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නියමිත වේලාව අවසානයි. විනාඩි 5කින් අවසන් කරන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා -

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔබතුමාට කථාවක් නැද්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මුල් හරියේදී කිව්ව ඒවා තේරුණේ නැද්ද? මා හිතුවේ, මුල් හරියේදී මා කියපු ඒවා තේරුණේ නැත්තේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට විතරයි කියලායි. ඔබතුමිය මා ගරු කරන කෙනෙක්; ඒ කාලයේ ඉඳලාම නීති විද්‍යාලයේ මගේ ආදරණීය මිතුරියක්. ඔබතුමිය රන්ජන් රාමනායක වෙන්න එපා. ඔබතුමියට ඊට වඩා තේරෙනවා නේ. ඔබතුමියට මොළයක් තිබෙනවා නේ. ඔබතුමිය ඒ ගණයට වැටෙන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා - [බාධා කිරීමක්] ඉතින් උත්තර දෙන්න එපායැ. එතුමා කිව්වා අධ්‍යාපනය ගැන, සහනාධාර ගැන අපි කොච්චර කථා කළත්, එතුමාගේ පියාගේ කාලයේ ආරම්භ කරපු පාසල් දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේල දෙන එක මෙවර අය වැයෙන් කප්පාදු කළාය කියලා. ඒක පට්ටපල් අසත්‍යක් නේ. ඒ කියන්නේ එතුමා අය වැය ලේඛනය කියවලා නැහැ. මෙවර ඒ පෝෂ්‍යදායී ආහාර වේල දෙන ගමන්ම තවත් සහනයන් දෙනවා.

මීට ඉස්සෙල්ලා දුන්නේ එක uniform රෙද්දයි. දැන් තව එකකුත් දෙනවා. ඒ uniform රෙද්ද දෙන්න තමුන්නාන්සේගේ තාත්තාගේ රජය කාලයේ පටන් ගත්තාට රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය කාලයේ මොකද වුණේ? ආණ්ඩුවෙන් නොමිලයේ දෙන uniform රෙද්ද බෙදා ගන්න බැරි වුණා නේ. සමුපකාරයෙන් ගන්න කිව්වා. සමුපකාරයට පස් වතාවක්, දහ වතාවක් ගිහින් ගන්න බැරුව ආපසු හැරිලා ආවා.

ඔබතුමා දැන් මෙම ගරු සභාවට ඇවිල්ලා කෙප්ප ගැහුවාට ඔබතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති වශයෙන් සිටි කාලයේ නොමිලයේ දෙන uniform රෙද්ද බෙදා ගන්න බැරි වුණු ආණ්ඩුවක් නේ තිබුණේ. එක uniform රෙද්ද වෙනුවට දැන් අවුරුද්ද මැදදී තව රෙද්දක් දෙනවා. ඒ එක්කම දුෂ්කර පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නොමිලයේ පාවහන් දෙනවා. ඒක තමයි ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනින් නවතින්නේ නැහැ. දැන් අපේ නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා බොහොම සමච්චලයට කිව්වා, "රට විරුවන්" කියලා. දෙවියනේ! මේ රටට වැඩියෙන්ම විදේශ විනිමය ගෙනෙන අයට "රට විරුවන්" කියලා කියන්න ඕනෑ. ජනාධිපතිතුමා මේ රට විරුවන්ට දෙන සහන පිළිබඳව කියා තිබියදීත් සමහර මාධ්‍යවලටත් රට විරුවන්ය කියලා කියා ගන්න බැරි වුණා. අපි ඒ ගොල්ලන් ගැන කථා කරනවා; කෑ ගහනවා. ඔවුන් ලංකාවට විදේශ විනිමය ගෙනෙනවා. විදේශ විනිමය ගෙනෙන්නේ ආණ්ඩුවට නොවෙයි ලංකාවටයි. හැබැයි ඒ අයට "රට විරුවන්" කියා කියන එකත් මෙතුමන්ලාට සමච්චලයක්. එහෙම සමච්චල් කරන්න එපා. ලංකාවට වැඩියෙන් විදේශ විනිමය ගෙනෙන්නේ ඒ අයයි. එම විදේශ විනිමය ගෙනෙන්නේ ලංකාවටයි; ආණ්ඩුවට නොවෙයි. ඔබතුමන්ලා ආණ්ඩු කරන කොටත් එහෙම තමයි. ඒ අය විදේශ විනිමය ගෙනෙන්නේ ලංකාවටයි. එම නිසා ඒ අයට සමච්චල් කරන එක වැරදියි.

ඒ අයට දුන්නු සහන ගැන මගේ අය වැය කථාවේදී කියන්නම්. මේ අය වැයෙන් අපට ලොකු අවස්ථාවකට මඟ පෑදුණා. ඒ අය බොහෝ දෙනෙක් පිට රට යන්නේ ගෙයක් හදා ගන්නයි. ඒ අයට ගෙයක් හදා ගැනීමේ ක්‍රමවේදයන් කොපමණ දුන්නත් ඒවා හරි ගියේ නැහැ. සමෘද්ධි බැංකුව මඟින් ඒ අයට ණය මුදලක් ලබා දීලා, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිලධාරින් අර දිරිය නිවාස හදන ක්‍රමයටම සැලසුමක් සහිතව ගෙවල් හදා දෙන්න පුළුවන්කම මෙවර මෙම අය වැය යෝජනාවෙන් ලැබුණා. ඒක නරකද? ඒක නරකද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කෑ ගහනවා, ගෘහ සේවිකාවන් පිට රට යවන්න එපාය කියලා. ගෘහ සේවිකාවන් පිට රට යවන්න එපා නම් කළ යුත්තේ මොකක්ද?

ගරු රෝසි සේනානායක මන්ත්‍රීතුමියනි, කළ යුත්තේ ගෘහ සේවිකාවක් පිට රට ගිහිල්ලා අවුරුදු දෙකක්-තුනක් වැඩ කර එකතු කර ගෙන එන ආදායම -ඒ මුදල- ඇයගේ බලාපොරොත්තු ඉෂ්ට කර ගැනීම සඳහා යොදවන්න අවශ්‍ය කරන පහසුකම් සලසන එකයි. එතකොට ඇය ආපහු රට යන්නේ නැහැ. එවැනි ක්‍රියා මාර්ගයකටයි අප යන්න ඕනෑ. එවැනි දෙයක් කළාම මෙතුමන්ලා සමච්චල් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ දිනවල සමාජයේ කථා බහට ලක් වෙලා තිබෙන දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අද උදේ වරුවේ අපේ ගරු සභානායකතුමා ඉතා හොඳ ප්‍රතිචාරයක් දැක්වූවා. ඊයේ තමයි ජනතා විමුක්ති පෙරමුණ රෝහණ විජේවීර මහත්තයාව දෙකට කපා ගෙන තැන් දෙකකදී සැමරුවේ. බන්ධනාගාරයේ වෙච්ච සිද්ධියෙන් මිය ගිය මිනීමරු චෝදනාවට ලක් වෙච්ච, බරපතළ මත් ද්‍රව්‍ය චෝදනාවලට ලක් වෙච්ච අය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලන අනුර දිසානායක මන්ත්‍රීතුමාට, මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයක් නැතිව කොළඹ කනත්තේදී පණ පිටින් ගිනි තිබ්බ රෝහණ විජේවීර නායකතුමා ගැන පරීක්ෂණයක් ඉල්ලන්න තවම කට ඇරුණේ නැහැ. ඇයි ඒ? අප දන්නේ නැහැ. හැම එකකටම පරීක්ෂණයක් ඉල්ලන, ආණ්ඩුවේ ඉන්න ඇමතිවරයෙකුට වාතයක් ගියාමත් පරීක්ෂණයක් ඉල්ලන ජනතා විමුක්ති පෙරමුණට තමන්ගේ නායකයාගේ මරණය ගැන පරීක්ෂණයක් ඉල්ලන්න බැරි වුණා. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා පුච්චන කොට මැරිලා හිටියේ නැහැ. ඔහු කනත්තේ ආදාහනය කරන්න මහේස්ත්‍රාත් නියෝගයක් තිබුණේ නැහැ. පණ පිටින් රෝහණ විජේවීරව පුච්චපු ආකාරය පිළිබඳව පරීක්ෂණයක් ඉල්ලන්න ජනතා විමුක්ති පෙරමුණට තවම බැරි වුණා. ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්තුමාගේ -ගාමිණී අතුකෝරල මැතිතුමාගේ- මරණය සම්බන්ධයෙන් නිවැරැදි ආකාරයේ පරීක්ෂණයක් පවත්වන්නත් තවම බැරි වුණා. මේවා ප්‍රශ්න!

මේ ප්‍රශ්න ඇතුළේ තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මම කියන්න එන්නේ. අද අපේ සභානායකතුමා ඒ ගැන නිසි පිළිතුරක් දුන්නා. හැබැයි දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමන්ලාට මම කියන්න ඕනෑ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු ක්‍රමයේ වැරැදි තිබෙන බව. එය ගෙනාවේ මන්ත්‍රීවරුන්ට හරියට කියලා නොවෙයි. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩු පාඩුකම් තිබෙනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ පළාත් සභා ගැන විතරක් නොවෙයි. මේ පළාත් සභා ක්‍රමයට ඉස්සර වෙලායි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දෙමළ භාෂාව රාජ්‍ය භාෂාව වන්නේ. ඉංග්‍රීසි භාෂාව link language එක වන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩු පාඩුකම් අයින් කරන්න ඕනෑ.

හැබැයි දෙමළ භාෂාව, රාජ්‍ය භාෂාව කියන එක තිබෙන්න ඕනෑ. දෙමළ භාෂාව, රාජ්‍ය භාෂාව හැටියට තිබෙන දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයම කුණු බක්කියට විසි කරන්න කියලා TNA එකේ තමුන්නාන්සේලාත් මීට අවුරුදු තුනකට ඉස්සර වෙලා කිව්වා. මා ළඟ තිබෙනවා ඒ පත්තර. එතුමන්ලා කිව්වා, "Throw the Thirteenth Amendment into the dustbin" කියලා. එදා TNA එක කිව්වා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය dustbin එකට විසි කරන්නය කියලා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය dustbin එකට විසි කරන්න කියලා අද තව කට්ටියක් කියනවා. විමල් වීරවංශ මහත්තයාගේ පක්ෂයත් ඒක කියනවා. ඒ ගොල්ලෝ සාකච්ඡාවකුත් කළා තමුන්නාන්සේලාගේ නායකතුමාත් එක්ක. තමුන්නාන්සේලාගේ නායකතුමා ඒක තමුන්නාන්සේලාට කියන්නේ නැහැ නේ. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. නායකතුමා අර ප්‍රභාකරන් එක්ක අත්සන් කළ ගිවිසුම පාර්ලිමේන්තුවට වහලා කළා වාගේම, දැන් තමුන්නාන්සේලාට නොකියා විමල් වීරවංශ මහත්තයා එක්ක සාකච්ඡා කරනවා නම් ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ සාකච්ඡාවෙන් පස්සේ අද තිස්ස අත්තනායක මහත්මයා පුවත් පතට කියා තිබෙනවා, එක්සත් ජාතික පක්ෂයත් සූදානම් කියලා ඒ කළ යුතු සංශෝධන ගැන, වෙනස්කම් ගැන බලන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අලුත් ව්‍යවස්ථාවක් ඕනෑ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම මේ කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්ගේ ප්‍රකාශය. එක්සත් ජාතික පක්ෂයේ මහ කේලාම්ගේ ප්‍රකාශය නොවෙයි. කේලාම් කියලා අර ඉන්න හොඳ, දක්ෂ මන්ත්‍රීවරු කපා ගෙන කපා ගෙන ගිහින් තනතුරු ගත්ත එක්කෙනාගේ ප්‍රකාශයක් ගැන නොවෙයි මා කියන්නේ. මා මේ කියන්නේ මහ ලේකම්ගේ ප්‍රකාශය ගැන. මහ කේලාම්ගේ එක නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස්කම්වලට භාජනය කළ යුතුයි. හැබැයි ඒ වෙනස්කම්වලට භාජනය කරන කොට, පාර්ලිමේන්තුව හැටියට ඔබට අපට ව්‍යවස්ථාදායකයේ තිබෙන බල ක්ෂේත්‍රයට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළු වෙනවා නම් අන්න ඒ පිළිබඳව අවශ්‍ය කරන පිළියම් යොදමින්, එහෙත් දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් හැටියට තබා ගනිමින්, ඉංග්‍රීසි භාෂාව සම්බන්ධීකරණ භාෂාව හැටියට තබා ගනිමින් තමයි ඒ සංශෝධනවලට යා යුත්තේ කියන එකයි මා විශ්වාස කරන්නේ. Thirteen Plus කියන අයට Thirteen Plus කියන්නත් පුළුවන්. Thirteen minus කියන අයට thirteen minus කියන්නත් පුළුවන්. ඩිව් ගුණසේකර ඇමතිතුමා කියා තිබුණා එතුමා thirteenවත් thirteen plusවත් නොවෙයි, thirteen minus කියලා. මා නම් කියන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දෙස අප බැලිය යුත්තේ "13 - 1 + 2" කියන සූත්‍රය ඔස්සේ කියලායි.

13 -1 + 2 කියන සූත්‍රය ඔස්සේ තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන බලන්න ඕනෑ. අඩු කරන ඒවා අඩු කරලා, වැඩි කරන ඒවා වැඩි කරලා, ජනතාවට වඩාත් බලය බෙදෙන ආකාරයටත්, දෙමළ භාෂාව කථා කරන ජනතාවට බලය බෙදෙන ආකාරයටත් තමයි ඒ සංශෝධනය ගැන බලන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකරලා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අද උදේ ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සහ ගරු සභානායකතුමා අතර මේ සභා ගර්භයේ ඇති වුණු සංවාදය වැදගත් වනවා වාගේම, ඒ සඳහා හොඳ ආරාධනයක් ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට අය වැය කථාව අවසානයේ විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ

නායකතුමාටත්, ද්‍රවිඩ සන්ධානයේ නායකතුමාටත් කළා. එතුමන්ලා දෙදෙනාගේ දේශපාලන අත් දැකීමුත්, ජනාධිපතිතුමාගේ දේශපාලන අත් දැකීමුත් කියන මේ අත් දැකීම් සියල්ල සැලකිල්ලට අරගෙන සැබෑ ලෙස ජනතාවට බලය බෙදීමේ වැඩ පිළිවෙළකට යන්න ක්‍රියාත්මක වෙන්න කියන ආරාධනය කළා. ඒ ආරාධනය පිළි අරගෙන සියලුම පක්ෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ ඉඳ ගන්න කොට දෙමළ ජනතාවට තවදුරටත් අසත්‍යය කියන්න බැරි වන අන්දමට ද්‍රවිඩ සන්ධානයටත් ඒ තේරීම් කාරක සභාවට එන්නය කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.42]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය ගාම්භීර පුටුවේ ඉඳ ගෙන ඉන්න අවස්ථාවක කථාවක් කිරීමට ලැබීම ගැන මම ඉතාමත්ම ආඩම්බර වෙනවා. මොකද ඔබතුමාට ඔය පුටුව ගොඩක් දුරට ගැළපෙනවා. ඒ නිසා අපේ ආණ්ඩුවකදී ඔය පුටුව ඔබතුමාට ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයෙන් සාමාන්‍යයෙන් දකින්නට ලැබෙන ස්තෝත්‍ර ගායනා කරනවාට වඩා ඉතාමත්ම තාර්කික ලෙස පාර්ලිමේන්තුවට ඔබින හොඳ කථාවක් කිරීම සම්බන්ධයෙන් මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන, මගේ අසල්වැසි ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මොකද පාර්ලිමේන්තුවේ තිබෙන අර්ථය වඩාත් අර්ථවත් වෙන්නේ එවැනි ආණ්ඩුවේ මත ප්‍රකාශ කිරීමත්, ඒ මතත් එක්ක විපක්ෂය ගැටීමත් එක්ක මිසක ආණ්ඩුව කරන්නා වූ හැම දේම, "හොඳයි හොඳයි" කියමින් ජනාධිපතිතුමා ඇතුළු එම පවුලට ස්තෝත්‍ර ගායනා කිරීමෙන් නොවෙයි. තමන්ගේ තනතුරු ලබා ගැනීමට බලාපොරොත්තු වනවාට වඩා තාර්කික ලෙස දේශපාලනය කිරීම වඩාත් යහපත් යැයි මා පෞද්ගලිකව සිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය 8වැනි දා ජනාධිපතිතුමා පැය දෙක හමාරක් තිස්සේ අය වැය කථාව කළා. මේ රටේ දෙකෝටියකට කිට්ටු වන අතිවිශාල ජන කොට්ඨාසයක් බලාපොරොත්තු රාශියක් දල්වා ගෙන හිටියා. අපිත් මේ පුටුවල හිටියා. පුළුවන් තරම් අහගෙන ඉන්න බැලුවා. මට නම් ටිකක් නින්දත් ගියා. නින්ද ගියාට පස්සේ නැඟිටලා බැලුවා, මේ අය වැයේ මොකක් හරි හොඳ දෙයක් හොයා ගන්න තිබෙනවාද කියලා. "මේ ආණ්ඩුව ඉදිරිපත් කරපු අය වැයේ යම් කිසි සාධාරණත්වයක් තිබෙනවා, මෙවර අය වැය හොඳයි" කියලා හෝ ජනතාවට හරි, මාධ්‍යයට හරි ගිහිල්ලා කියන්න අපට හැකියාවක් ලැබෙයි කියලා අපි විශ්වාස කළා. නමුත් එහෙම දෙයක් පෙනෙන්නට තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවසක ප්‍රවෘත්ති පත්තරයක් අරගෙන බලන කොට ඒකේ කාටූනයක් ඇඳලා තිබුණා. ඒ කාටූනයේ තිබුණේ මහා ලොකු කෑම වට්ටෝරුවක් තිබෙන මේසයක අතිවිශාල බඩ තඩි මිනිහෙක් ඉඳ ගෙන ආහාර බුක්ති විඳිනවා. සාටකයක් දා ගත්ත waiter මහත්තයෙක් ඇවිල්ලා තවත් tray එකක තිබෙන කෑම වට්ටෝරුවක් ඒ පිඟානට බෙදනවා. ඒ බෙදන අවස්ථාවේදී අහිංසක මහල්ලෙක් පාන් මල්ලක් අතේ තියා ගෙන මේසය යටට වෙලා ඉන්නවා, "අනේ මගේ පිඟානටත් මොකක් හරි වට්ටපන් කෝ" කියලා. මේක මේ අය වැය ඉදිරිපත් කළ දවසට පස්සේ දවසේ මේ රටේ ප්‍රධාන ප්‍රවෘත්ති පත්‍රයක තිබුණු කාටූනයක්. මොකක්ද මේකෙන් කියන්නේ? මේ රටේ ඉන්න දුක් විඳින ජනතාව වෙනුවෙන් මේ අය වැය තුළින් කිසිම දෙයක් සිදු වුණේ නැහැ, අපි තවමත් බඩගින්නේ, තියෙන එකාට, තියෙන පැළැන්තියට තවත් සලකලා තිබෙනවාය කියන එක තමයි එයින් පෙනෙන්නට තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසු ගිය කාලයේදී අය වැය කථා කීපයක් ඇහුවා. බලාපොරොත්තු පිට, බලාපොරොත්තු පිට, පොරොන්දු පිට, පොරොන්දු පිට, පොරොන්දු ලබා දුන්නා. නමුත් මේක හැම දාම අර එකම කැසට් පටය එහා පැත්ත මෙහා පැත්ත දානවා වාගේ වැඩක්. අය වැය දවසට එනවා. ගිය අවුරුද්දේ කිව්ව කථාව පොඩ්ඩක් වෙනස් කරනවා. ඒ විධියටම කථා කරනවා. ඒ විධියටම රඟපානවා. ඒ විධියටම අඬනවා. ඒ විධියටම පපුවට ගහ ගන්නවා. ඒ විධියටම හිනාවෙලා අන්තිමට තට්ටුවක් දාලා යනවා. නමුත් ජනතාවට වුණ සේවාවක් නැහැ. "ඒබ්‍රහම් ලින්කන්" මැතිතුමා මෙහෙම කියමනක් කියලා තිබෙනවා, I quote:

> "You can fool some of the people all of the time, and all of the people some of the time, but you can not fool all of the people all of the time."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටික දෙනෙක් සදාකාලික බොරුවෙන් රවටන්නට පුළුවන්; විශාල පිරිසක් ටික කාලයකට බොරුවෙන් රවටන්නට පුළුවන්; නමුත් රටක් සමස්ත කාලයටම බොරුවෙන් රවටන්නට බැහැ; බොරුව දවසකදී එළි වනවා කියන අදහස තමයි එහි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප කිව්ව ලෙසම අද මේ රටේ ණය බර තව තවත්, තව තවත් වැඩි කරලා තිබෙනවා. ණය බර කොයි තරම් වැඩි කළාද කිව්වොත් එහෙම මේ ආණ්ඩුවේ තිබෙන සුන්දරත්වය ඒ තරමම සුන්දරයි. මේ ආණ්ඩුව IMF එකේ අධ්‍යක්ෂකව පවා තමන්ගේ දැලට දමා ගෙන ඉවරයි. එතුමාගේ භාර්යාවත් ලංකාවේ කෙනෙක් ලු. එතුමාට මෙහේ පුරවැසිභාවයත් දෙනවාද දන්නේ නැහැ. කොහොම හරි IMF එකේ අධ්‍යක්ෂකටත් ලංකාවට වුවමනා විධියට පොලිය -[බාධා කිරීමක්] ඒක තමයි, ඒක දක්ෂකම. හොඳයි. එහෙම අල්ලා ගන්න පුළුවන් වීම දක්ෂකමයි. නමුත් ඒ ගන්නා වූ ණයවලින් මේ රටට ප්‍රයෝජනයක් වනවා නම් ඒක තමයි අපත් බලාපොරොත්තු වන්නේ කියන එක කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ ඇමතිවරු නම් මේක මහා දැවැන්ත, මේ ලෝක ඉතිහාසයේ තිබුණු මහා සංවර්ධනතම අය වැය කියලා කියනවා. සමහර කට්ටිය ඇවිල්ලා මාධ්‍යයට කියනවා, මේක ජනතාව වෙනුවෙන් සැකසුණු, ගමේ සිටින අහිංසක දුප්පතා වෙනුවෙන් සැකසුණු අය වැයක් කියලා. සමහර කට්ටිය කියනවා, මේ අය වැය අනාගතය බලාගෙන, මේ රට අනාගතයේ බටහිර රටවල් එක්ක තරග කරන්න පුළුවන් රටක් හැටියට සංවර්ධනය කරන අය වැයක්ය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ මිනිස්සු සියයට 99ක් අමතක කරලා, සියයට එකක් ගැන කල්පනා කරලා හදපු අය වැයක් හැටියටයි අපි මේ අය වැය දකින්නේ. මේ අය වැයෙන් රාජ්‍ය සේවකයාට රුපියල් 1,500ක කැරට් අලයක් දැම්මා. රුපියල් 1,500ක පඩි වැඩිවීමක් තිබෙනවා කියලා පෙන්වන්න කැරට් අලයක් දැම්මා. රුපියල් 1,500 පඩි වැඩිවීම දෙන්නේ ලංකාවේ ශ්‍රම බලකායෙන් ලක්ෂ 13කට විතරයි. ඒ රුපියල් 1,500 පඩි වැඩිවීමේ කැරට් අලයයි. පෞද්ගලික අංශයේ ඉන්න ලක්ෂ 67ක ජනතාවට අඩුම ගණනේ කැරට් අලයේ පළුවක්වත් ලැබිලා නැති එක මහා ශෝචනීය තත්ත්වයක්. ලංකාවේ ආර්ථිකයට පණ පොවන්නේ සම්පූර්ණ වශයෙන් පෞද්ගලික අංශයයි. පෞද්ගලික අංශය ගැන කිසිම ප්‍රකාශයක්වත්, සඳහනක්වත් මේ අය වැයේ නැති එක ගැන අපි කනගාටු වනවා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයෙන් එන මමත්, අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාත්, ඩිලාන් පෙරේරා මැතිතුමාත් වතු කම්කරු ජනතාවත් එක්ක ජීවත් වන කණ්ඩායමක්. අපි අහන්නට කැමැතියි, අද වතු කම්කරු ජනතාවගේ පඩිය ගැන මේ අය වැය තුළ කිසිම තැනක සඳහනක් වෙලා තිබෙනවාද කියලා. වතු කම්කරුවෝ ගැන, වතු කම්කරුවෝ මේ දවස්වල විඳින දුක ගැන කිසිම ප්‍රකාශයක් මේ අය වැය තුළ සඳහන් වෙලා නැහැ. මහා ලොකු වෘත්තීය සමිති නායකයෝ කියලා කියා ගන්නා උදවිය ඔය පැත්තට වෙලා, ස්විට්සර්ලන්තයේ ගිහිල්ලා, බීලා, පඩි පෙළෙන් වැටිලා කකුල් කඩා ගෙන එහේ නාඩගම් නටනවා. මේ රටේ සිටින අහිංසක වතු කම්කරුවන්ගේ පඩියෙන් ජීවත් වන, එක්සත් ජාතික පක්ෂයෙනුත් දිනලා එහා පැත්තට පැනපු එහෙම නාඩගම් නටන වෘත්තීය සමිති නායකයෝ කියන උන්දැලා ඉන්නවා. මේ අය වැය හදන කොට මේ දෙමළ ජනතාව, වතු කම්කරු ජනතාව ගැන අඩුම ගණනේ වචනයක් කථා කරන්නට ඒ එක්කෙනකුටවත් අමතක වුණාද කියන එක ගැන අපේ දුක, කනගාටුව අපට ප්‍රකාශ කරන්න සිදු වනවා. "ඇටි කෙහෙල් කාපු උගුඩුවෝ වාගේ" දැන් ඒ පැත්තට වෙලා ඉන්නවා. කට ඇරලා වචනයක්වත් කියන්නේ නැහැ. ජනාධිපතිතුමා කිව්වා, සියලු වෘත්තීය සමිති එකතු කර ගෙන, හැම කණ්ඩායමකගෙන්ම සියලු දේ අහලා ඉදිරිපත් කරපු අය වැය කථාවක් තමයි එතුමා ප්‍රකාශ කළේ කියලා. එහෙම නම් මේ ආණ්ඩුවට පැනලා සිටින වෘත්තීය සමිති නායකයෝ බුදියගෙනද සිටියේ කියන එක අපට මේ අවස්ථාවේදී අහන්න සිදු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැයෙන් ගොවියෝ ගැන විශාල වශයෙන් කථා වුණා. අඩුම ගණනේ මේ ආණ්ඩුව ගොවීන්ට යමක් කරන්නට උත්සාහයක් දරලා තිබෙනවා කියලා අපි හිතනවා. නමුත් කාලයක් තිස්සේ ගොවීන් අවශ්‍ය කළේ ජලය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නයි. පොළොන්නරුව වැනි ප්‍රදේශවල ගමන් කරන කොට අපි දැක්කේ ජලය පිළිබඳ ප්‍රශ්නය එම ගොවීන්ට වැඩිපුර තිබුණු බවයි. ඔවුන්ට වෙළඳ පොළ පිළිබඳවත් ප්‍රශ්න තිබුණා. අපේ පැතිවල නම් අස්වැන්න නෙළා ගන්නා කාලයට පිට රටින් බඩු ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නය ගොවීන්ට තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වගා පාළුව ගැන වන්දි ගෙවන එක හොඳයි. නමුත් අය වැය කථාවේ කිසිම තැනක එහෙම සඳහනක් වෙලා නැහැ. ණය වාරිකය "තාවකාලිකව කපා හරිනවා" කියලා තිබෙනවා. ඒකේ භයානකත්වයක් තිබෙනවා. ණය වාරිකය කපා හරින්නේ "තාවකාලිකවයි". සදාකාලික නැහැ. තව දවසක අය කරන්න ඉඩ තිබෙනවා.[බාධා කිරීමක්] අනිවාර්යයෙන්ම අය කරනවා. ඒ සඳහා දැන් ලියුම්ද ඇවිල්ලා තිබෙනවා. මේ ණය කපා හැරලා තිබෙන්නේ තාවකාලිකවයි. සදාකාලික නැහැ. ඒ නිසා "හිටපන්, මේ ටික කාලයෙන් පස්සේ උඹලාට ආයෙත් ටොක්ක අනිනවා" කියලා ජනතාවට සීනි බෝලයක් කවමින් ඇත්ත සඟවන්න උත්සාහ කරලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ ගොවි විශ්‍රාම වැටුප ගැන කථාවක්වත් නැහැ. ගොවීන්ට නොමිලයේ බිත්තර වී ලබා දුන්නා. ඒවායේ ගුල්ලෝ ගහලා තිබුණා. ඒක ලංකාවේ සිටින ගොවියෝ හැමෝම දන්නවා. නමුත් ඇමතිවරයා විතරක් ඒක පිළිගන්නේ නැහැ. බිත්තර වීවල ගුල්ලෝ හිටියේ නැහැ කියලායි එතුමා ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආර්ථික විද්‍යාඥයෝ නොවෙයි. නමුත් අපේ ආර්ථිකය ගොඩ නඟා ගන්න නම්, සිල්ලර කඩයක් අයිතිකාරයෙක් වුණත් දැන ගන්න ඕනෑ රටේ තිබෙන වියදම අඩු කර ගන්න ඕනෑ, ආදායම වැඩි කර ගන්න ඕනෑ, වියදම අඩු කර ගත්තේ නැත්නම්, ආදායම වැඩි කර ගත්තේ නැත්නම් සිල්ලර කඬේ නොවෙයි බුලත්විට කඬේ හරි පාඩු වෙනවා කියලා. නමුත් මේ අවස්ථාවේ වෙලා තිබෙන්නේ වෙන මොකුත් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අනවශ්‍ය වියදම් වැඩිවීමයි. ඒ තුළ තමයි මේ ආර්ථිකය බිඳ වැටිලා තිබෙන්නේ. අනවශ්‍ය වියදම් අතිවිශාල වශයෙන් වැඩි වෙලා. තමන්ගේ දේශපාලන ප්‍රතිමූර්තිය ගොඩනඟා ගන්න විශාල මුදල් කන්දරාවක් නාස්ති කිරීම නිසා තමයි අද මේ ආර්ථිකයට හෙනහුරා වැටිලා තිබෙන්නේ.

පසු ගිය දවසක අපි පාර්ලිමේන්තුවේ ඉන්නකොට දැක්කා, බස්වලින් ඇවිල්ලා "දිවි නැඟුම"ට පක්ෂව පෙළපාළි යනවා. කවුද ඒ බස්වලට තෙල් ගැහුවේ? බාප්පොච්චිද? අප්පොච්චිද? නැහැ, ඒවාට තෙල් ගැහුවේත් අපිමයි. මේ සීටීබී බස්වලින් ඒ අය ගෙනාවාට -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
අපි ශත පහක්වත් ගෙව්වේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔන්න ගහපු එක්කෙනා! පුහුල් හොරා කරෙන් දැනේ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒ කිව්ව එක ඉල්ලා අස් කර ගන්න. ඒ සියලුම අය තමන්ගේ වෘත්තීය සමිති මාර්ගයෙන් ආපු අය.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
හරි, මම එතුමාගේ ඒ වචනයට ගරු කරමින් ඒක ඉල්ලා අස් කර ගන්න කැමැතියි. නමුත් මම එකක් කියන්න ඕනෑ. ඒ ආවේ වෘත්තීය සමිතිවල අය කියලා කිව්වා. නමුත් රක්ෂාව කරන තැන අත්සන් කරලා, වැඩ කරන තැන වැඩ කරන්නේ නැතිව, මෙතැනට ජොලි දමන්න ආපු එකෙන් රටට වන අවාසියත්, අසාධාරණයත් ඔබතුමා තේරුම් ගන්න. වෘත්තීය සමිති වෙන්න පුළුවන්, වෘත්තීය සමිතිවල සල්ලිවලින් ඒ අය ආවා වෙන්න පුළුවන්. නමුත් වැඩ කරන අවස්ථාවේ ඒ වැඩ පාළු කර ගනිමින් දිවි නැඟුමට "චූන්" දෙන්න එන එක මේ රටට වෙන ලොකු පාඩුවක් කියන එකත් මතක තියා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පුහුල් හොරා කරෙන් දැනේ" කියලා කථාවකුත් තිබෙනවා. ඒ වාගේ දෙයකුත් මෙතැනදී මතක් වුණ බව මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විශේෂ දෙයක් තිබෙනවා. අපේ ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේ 66 වැනි පිටුවේ මෙහෙම සඳහනක් කරනවා:

"ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවකයන්ට සාධාරණ වැටුප් තීරණය කිරීම සේවකයන්ගේ අවශ්‍යතාවත් රජයට දරා ගත

හැකි මට්ටම් තුළිනුත් නිගමනය විය යුතුයි. අවසාන වශයෙන් රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවන්නේ මහජනතාව විසින් ගෙවනු ලබන බදුවලින්. එම නිසා වැටුප් වැඩි කිරීමක් සාධාරණීකරණය කළ හැක්කේ එය ජනතාවට දැරිය හැකි නම් පමණයි. දිළිඳුකමින් තොර මැදි ආදායම් රටක් වශයෙන් නැඟී එන අපේ රටේ සංවර්ධන හා පරිපාලන කටයුතුවල අභියෝග කළමනාකරණයේදී රාජ්‍ය සේවකයන්ට ඇත්තේ ඉතා බරපතළ වග කීමක්."

මෙහෙම කියන්නේ ජනාධිපතිතුමා. එතකොට මේ ආණ්ඩුවෙන් වැටුප් වැඩි වීමක් ඉල්ලා සේවකයා හඬ නඟන කොට, රජයට හැකි මට්ටමින්, ජනතාවට දරා ගත හැකි ප්‍රමාණයෙන් පමණයි මේ රුපියල් 1500 දෙන්න හදන්නේ. ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් කියන්නේ, "ජනතාවට දැරිය හැකි නම් පමණයි" මේ දේ කරන්න ඕනෑ කියලා. එහෙම නම්, ඔබතුමන්ලාගේ cutout ගහන, මහා ලොකු ප්‍රචාරක වැඩ සටහන් කරන, පුවත් පත්වල පිටු ගණන් ප්‍රචාරක දැන්වීම් දමන ඒ අනවශ්‍ය වියදම්වලට ඔබතුමන්ලාට අනුබල දුන්නේ මොන ජනතාවද, මොන බදු ගෙවන්නාද කියන එක මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමැතියි. මේ රටේ ඉන්න මොන මනුස්සයාද මේවාට කැමැති වෙලා තිබෙන්නේ? "මේ cutouts ගහන්න අපේ බදු මුදල් ගනින්" කියලා තිබෙන්නේ මොන පුද්ගලයාද? මේ අනවශ්‍ය වියදම් සඳහා අපි කවුරුවත් අනුමැතිය දීලා නැහැ. මේ රටේ ජනතාව ඔබතුමන්ලාට ඒ සඳහා අනුමැතිය දීලා නැහැ.

ගුවන් යානා අර ගෙන, ගෙදර වැඩ කරන එකා හැර, අතිවිශාල කණ්ඩායම් -ගෙදර ටොමියා හැර- දැන් පිට රට සවාරි ගිහිල්ලා තිබෙනවා. ගෙදර ටොමියා හැර අනෙක් ඔක්කොම මේ සවාරි ගිහිල්ලා, ලෝකයේ රටවලට ගිහිල්ලා ලබා ගත්ත දෙයක් තිබෙනවාද කියලා අපි මේ අවස්ථාවේදී අහනවා. ප්ලේන් පුරවාගෙන අර ගෙන ගිහිල්ලා රුපියල් කෝටි ගණන් මුදල් නාස්ති කළේ මේ රටේ ජනතාව ඒ මුදල් අනුමත කරපු නිසා ද, රටේ ජනතාව ඒවාට අනුමැතිය දුන්න නිසා ද කියන එක මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළාත් සභාවල වියදම් ගැන කථා කළා. මට මේක නොකියාම බැහැ. පසු ගිය දවසක මගේ පළාතේ - ඌව පළාතේ- මොණරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් ඔප්පු බෙදීමේ උත්සවයක් තිබුණා. ජනාධිපතිතුමා ඔප්පු බෙදා දුන් උත්සවයේ වියදම රුපියල් ලක්ෂ 50යි. ඒ රුපියල් ලක්ෂ 50 පළාත් සභාවෙන් ගෙවන්න අනුමැතිය දීලා තිබෙනවා. කවුද ඒ අනුමැතිය දුන්නේ? අපිද දුන්නේ? අනවශ්‍ය වියදම් කපා හරින්න කියලා ආණ්ඩුවෙන්ම කියනවා; ජනාධිපතිතුමාම කියනවා. නමුත් ජනාධිපතිතුමාගේ මේ උත්සවයේ විතරක් වියදම වෙච්ච රුපියල් ලක්ෂ 50 ගෙවන්න අනුමැතිය දීලා තිබෙනවා. ඉතින් කොහොමද පළාත් සභාවල වියදම අඩු කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 7,500ක, 10,000ක පඩි වැඩි කිරීමක් ඉල්ලද්දී රජයට ආර්ථික ශක්තියක් නොමැති බව ප්‍රකාශ කරමින්, රාජ්‍ය සේවකයන්ට විතරක් රුපියල් 1500ක් ලබා දීලා තිබෙනවා. ඒකත් දෙන්නේ දෙවරකට.

ජනවාරි මාසයේ ඉඳන් පළමුවැනි මාස හය තුළ රුපියල් 750ක් දෙනවා. ඉතිරි රුපියල් 750 දෙන්නේ ජුනි මාසයේ ඉඳලා. දැන් ආණ්ඩුවට හිතවත් තවත් පිරිසක් සැරසෙනවා, මේ රුපියල් 1,500ක දීමනාව වැඩි වීම ගැන කියලා cutouts ගහලා, posters ගහන්න. මාසයකට රුපියල් 750ක් කියන්නේ දවසකට රුපියල් 25යි හම්බ වෙන්නේ. ඔබතුමන්ලා හදවතට තට්ටු කරලා බලන්න. කල්පනා කරලා බලන්න. රුපියල් 25කින් මෙන්න මේ වාගේ පාන් භාගයක් විතරයි ගන්න පුළුවන්. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, 2013 අය වැය සංවර්ධන අය වැයක් නොවෙයි, පාන් භාගයේ අය වැයක් ලෙස නම් කරන්න කියලා. මොකද, රුපියල් 25ක සොච්චම් මුදලක් ලබා දීපු අය වැයක් හැටියටයි අපි මේ අය වැය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 70 දශකයේ මහගම සේකරයන් ලියපු සිංදුවක් තිබෙනවා. එතුමා 70 දශකයේ කියලා තිබෙනවා, මේ ගීතය දවසක ලංකාවේ ජාතික ගීතය බවට පත් වෙන්නත් පුළුවන් කියලා. මොකක්ද එතුමා කියලා තිබෙන්නේ? "බල්ලො මරල හරි සල්ලි හොයාලා - ඉන්න ටිකේ ඉමු ජොලිය දමාලා" මහගම සේකරයන් එදා කිව්වේ එහෙමයි. නමුත් අද ඉන්න ඇමතිවරුත් එහෙමයි. මොන දේ වුණත් කමක් නැහැ, "එහෙයි, සර්, එහෙයි සර්, එහෙයි" කියනවා.

බලන්න, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඛනිජ තෙල් සංස්ථාවෙන් පාඩු වෙන කොට ඇමතිවරයා තවම රෙදි ඇඳ ගෙන ඉන්නවා. Mihin Lanka එකේ පාඩුව තිබියදී ඇමතිවරයා තවම බයිලා ගහනවා. ගොවීන්ගේ නිෂ්පාදන මහ පාරට හලලා යද්දී, වෙළෙඳ ඇමති බලාගෙන ඉන්නවා. රෝහල්වල බෙහෙත් නැති වෙන කොට සෞඛ්‍ය ඇමති

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගහනවා. විශ්වවිද්‍යාල වැහෙන කොට උසස් අධ්‍යාපන ඇමති බලා ගෙන ඉන්නවා. කිරි පාරේ හලන කොට පශු සම්පත් ඇමති නිදා වැටෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මහගම සේකර වගේ තමයි අගමැතිතුමා. අද අගමැතිතුමා මේ සභාවේ නැහැ. නමුත් ගිය අය වැයේදී එතුමා කිව්වා, "අද මැරුණත් හිතට සැපයි, හෙට මැරුණත් හිතට සැපයි, අද ජොලි කරපල්ලා" කියලා. බලන්න, එතුමාත් කිව්වේ ඒ කථාව. හරියට හරිනේ? මහගම සේකර ඒක 70 දශකයේ කිව්වා; දි.මු. ජයරත්න 2011 දී කිව්වා. ඉතින් ඔබතුමන්ලා කරන්නේ මැරෙනකම් ජොලියේ ඉඳපල්ලා කියන න්‍යාය පත්‍රය අනුව කටයුතු කරන එක. අන්න ඒ නිසා තමයි අද රටට මේ ඉරණම අත් වෙලා තිබෙන්නේ.

2010 අය වැයේදී රුපියල් 2,500ක පඩි වැඩිවීමක් දෙනවා කිව්වා. 2011 දී arrears එකත් එක්ක දෙනවා කිව්වා. මා ඉල්ලා සිටිනවා තුන්වැනි වතාවටත් මේ සීනි බෝලය කවන්න එපා කියලා. දෙනවා කියාපු දේ මේ ජනතාවට, මේ රාජ්‍ය සේවකයාට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ලංකාවේ මෙච්චර ප්‍රශ්න තිබෙනවා. නමුත් ඊයේ රජය උගන්ඩාවට ඩොලර් මිලියනයක් දීලා තිබෙනවා, වෘත්තීය සමිති වෙනුවෙන්! උගන්ඩාවට ඩොලර් මිලියනයක් දෙනවා ලංකාවේ එකාට මොකුත් නැති කොට. මේකට තමයි කියන්නේ, "ලෝකෙට පරකාසෙ, ගෙදරට මරගාතේ" කියලා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය කථාවේ තවත් සුවිශේෂී සිදු වීමක් තිබෙනවා. අය වැය පොතේ 12 වැනි පිටුවේ 8.1 යටතේ ජනාධිපතිතුමා පිළිඅරගෙන තිබෙනවා, අඩු ආදායම්ලාභී පවුල්වලට ජලය, නිවාස, මාතෘ සායන, ළමා සායන, සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කළ යුතුයි කියලා. ඒ වාගේම දරුවන්ගේ පාසල් යෑමේ උනන්දුව අඩුයි කියනවා. දුෂ්කර ප්‍රදේශවලට වෙළෙඳ පොළ සම්බන්ධ වීම අඩුයි කියනවා. අඩුආදායම්ලාභී පවුල්වලට මත්ද්‍රව්‍ය, කසිප්පු, අපරාධ නිසා අතිවිශාල ප්‍රශ්න සිදු වෙලා තිබෙනවා කියනවා. අපි නොවෙයි මේවා කියන්නේ. මේවා කියන්නේ ජනාධිපතිතුමා. එහෙනම් අපි අහනවා කෝ, ආසියාවේ ආශ්චර්යය? කෝ, මතට තිත? කෝ, මේ කියන සෞඛ්‍ය හා පෝෂණය? ඒ වාගේම මහින්ද චින්තනයේ ගැබිණි මවුවරුන්ගේ පෝෂණ මල්ල ගැන කථා කරනවා. කෝ, දෙයියනේ! හම්බ වෙච්ච කෙනෙක්? අඩුම ගණනේ පාන් භාගයක්වත් දීලා තිබෙනවාද? [බාධා කිරීමක්]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)
හැම තැනටම ලැබිලා තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඔබතුමිය වග කීමෙන් කියනවාද, හැම තැනටම ලැබිලා තිබෙනවා කියලා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මොණරාගල දිස්ත්‍රික්කයේ දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අනෙක් දිස්ත්‍රික්කවලත්- [බාධා කිරීමක්] අසත්‍ය කියන්න එපා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මොණරාගල දිස්ත්‍රික්කයේ දුන්නාට බදුල්ල දිස්ත්‍රික්කයේ දීලා නැහැ. තවත් තැන්වලට දීලා නැහැ. දීලා තිබෙනවා නම් කවුරු හෝ කථා කර කියයි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අය වැය කථාවේ 13 වැනි පිටුවේ 8.3 යටතේ තිබෙන විධියට, ජනාධිපතිතුමා පිළිඅරගෙන තිබෙනවා, මාතෘ ළමා මරණ අනුපාතය දියුණු රටවල මට්ටමට ගත යුතුයි කියලා. ග්‍රාමීය රෝහල්, බෙහෙත් ශාලා, මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන ඉලක්කගත ප්‍රදේශවල සංවර්ධනය කරනවා කියලා. මේවා හොඳ දේවල්. හැබැයි, අපි අහනවා අවුරුදු අටක් මේ රට පාලනය කළේ යූඑන්පිය ද? 1994 ඉඳලා අද වන තුරු මේ රටේ ජනාධිපති ධුරය ඉසුලුවේ එක්සත් ජාතික පක්ෂයද? එහෙම නම් මේ අඩු පාඩුවලට වග කියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂයද, එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද, එහෙම නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානය ද කියන එක මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මෙවරත් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙන්නේ සියයට 1.8යි. නමුත් මේ ඉන්න ඇමතිවරු කියනවා, දෙමාපියන් පෞද්ගලිකව වියදම් කරලා තමන්ගේ දරුවන් පිට රට යවලා උගන්වන ඒවාත් එක්ක එකතු කරලා බලපුවාම සියයට 4.1ක් අධ්‍යාපනයට වියදම් වෙනවා කියලා. දෙයියනේ! මේ කියන්නේ ඔළමොට්ටළ කථාවක්නේ. දැන් මේ ඇමතිවරයෙක් තමන්ගේ දරුවා එංගලන්තයට යවන්න වියදම් කරන එක කොහොමද නිදහස් අධ්‍යාපනයට එකතු වෙන්නේ? මොන ලෝකෙද එහෙම වෙන්නේ? මේ රටේ උත්තරීතරම තැනක ඉන්න පුද්ගලයකුට එහෙම කථාවක් කියන්න තරම් නූගත් වෙන්න පුළුවන්ද? මේක සම්පූර්ණ වශයෙන් තේරුම් ගන්න.

මෙවර කලින් ගෙන ගිය අධ්‍යාපන ක්‍රියාදාමයත් සම්පූර්ණයෙන් කඩාකප්පල් කරලා -IMF එකේ අධ්‍යක්ෂව අල්ලා ගත්ත වාගේ- අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් පෙළගස්වපු කෙනාත් -අපේ මේ පරම්පරාවේ ඉන්න නායකයෝ අල්ලා ගෙන- කොහොම හරි ඒ වැඩ සටහනත් කඩාකප්පල් කරලා, අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන මුදල රුපියල් බිලියන 1.8ම තිබ්බා. මේ රටේ ඉන්න ජනතාව වෙනුවෙන් කිසිම වැඩදායී දෙයක් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආරක්ෂාව සඳහා සහ නාගරික සංවර්ධනය සඳහා රුපියල් බිලියන 289ක් වෙන් කරලා තිබෙනවා. නමුත් රටේ සෞඛ්‍ය සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 93යි. මම හිතනවා, ආණ්ඩුව කල්පනා කරනවා වෙන්න පුළුවන් වට රවුම් ටික ශුද්ධ කරලා, tile ටික අල්ලලා, පාරේ මල් පැළ ටික වවපුවාම මිනිසුන්ගේ ප්‍රශ්න ටික විසඳෙයි කියලා. පාර්ලිමේන්තු වට රවුමේ ලයිට් දාලා, මිනිසුන්ට ඇවිදින්න හදපුවාම, -ඉහළ පැළැන්තියේ සියයට එක වෙනුවෙන් හදපුවාම- ගමේ ඉන්න දුප්පතාගේ සෞඛ්‍ය ප්‍රශ්නයට විසඳුම් ලැබෙයි කියලා මේ ආණ්ඩුව හිතනවා වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හේනේ, කුඹුරේ, ගොවි බිමේ, කම්හලේ, මහ පොළොව සමඟ පොර බදන අයට මොකුත් වාසියක් වෙලා නැහැ. දැන් සිදු වන්නේ කුඹුර කොටන්නත් Formula One cars ගේන්න. Formula One, Lamborghini දාලා තමයි දැන් කුඹුර හාන්න වෙන්නේ. එදා කරපු සම්ප්‍රදායට අඩුම තරමින් මීහරකාට තට්ටුවක්වත් ලැබෙන්නේ නැති කාලයේ, මේ කාලේ කුඹුර හාන්න ගෙනත් තිබෙන්නේ Formula car. මේ අය වැය Formula carවලින් කුඹුරු හාන්න පටන් ගෙන තිබෙන අය වැයක්. අඩුම ගණනේ සුනාමි මැස්සන්ට හෝ එහෙම නැත්නම් අත් ට්‍රැක්ටරයකට හෝ එහෙමත් නැත්නම් කුඹුරු කොටන ට්‍රැක්ටරයකට හෝ මේ අය වැයෙන් සහනයක්, පහසුකමක් දීලා නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මතක් කරන්නට කැමැතියි, මේ වර්ෂය මේ රටට දැවැන්ත අභියෝගයක් තිබෙන වර්ෂයක් කියලා. 2013 වර්ෂය, රටක් හැටියට -පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව- අභියෝගාත්මක වර්ෂයක්.

With the Universal Periodic Review and the CHOGM due next year, I think there is a very critical and important year ahead for the Government.

While we welcome the allocation of Rs. 500 million to implement LLRC recommendations, we suggest that the Government acts with more credibility.

The recent outbreak in the prison will not help us and the impeachment against the CJ is also not going to be looked at favourably by the international community. Having said that, I strongly recommend to the Government to rethink of their foreign policy. We cannot challenge the West. Instead, we should use them for the betterment of our country and its future.

I would like to quote Sir Winston Churchill, who said:

> "When I am abroad, I always make it a rule never to criticize or attack the government of my own country. I make up for lost time when I come home."

This is exactly what we do. We do not condemn the President. We do not condemn the Government when we go abroad. But, here in this House, it is our duty and solemn responsibility to make constructive criticism that is needed by the Members of the Opposition. Therefore, we will support the Government and urge it to work without challenging the Western World. We need to support to uplift the nation that we love and to act with integrity and more solidarity keeping our political differences aside.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාවෙන් ජනතාවට පොරොන්දු වුණ සහන ඉතිහාසයේ මෙන් නොව අනාගතයේ හෝ යථාර්ථයක් බවට පත් වේවා කියන ප්‍රාර්ථනාව තමයි අපි තුළ තිබෙන්නේ. ආණ්ඩුවේ අනවශ්‍ය වියදම නවත්වලා, රජයේ අංශයේ ව්‍යවසායකත්වය කළමනාකරණය කරමින්, පෞද්ගලික අංශයේ ද දායකත්වය ලබා ගනිමින් කඩිනම් සංවර්ධනයක් මේ රටේ කළ යුතුව තිබෙන කාලයක් බවයි අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නේ. නමුත් ආණ්ඩුව දූෂණය, වංචාව, අල්ලස, හොරකම, මැරකම රජ කරන දේශපාලන ප්‍රතිමූර්තිය ගොඩ නඟා ගන්න උත්සාහ දරන්නේ නම්, මේ රටේ ඉන්න අහිංසක ජනතාවට ඒ බර පටවන්නේ නම් ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ වශයෙන් මේ ආණ්ඩුවට විරුද්ධ, එරෙහි ජනතාවත්, විපක්ෂයත් සියලු දෙනා ඒක රාශී කරමින් මේ ආණ්ඩුවට දැනෙන පාඩමක් උගන් වන්නටත් විපක්ෂය කිසි විටෙකත් පසු බට වෙන්නේ නැහැ කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවට සීනි බෝල දීලා, පටු සටන් පාඨ ඉදිරිපත් කරන වැඩසටහනක් ගෙනැත් ආණ්ඩුව ඇඳ සිටින සීතාම්බර සළු පට පිළිබඳව, මේ රටේ ජනතාවට මනා අවබෝධයක් තිබෙන බවත් ඔබ සියලු දෙනාම මතක තබා ගත යුතුයි කියන කාරණයත් මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ජනතාව අවබෝධ කර ගත්ත එක කවියකින් මගේ කථාව අවසන් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ඇත්ත කියන විටදී ඇතැමෙක් සීනි තිත්තයි කියනවාලු
ඇත්ත ඇති සැටියෙන් දක්නට බොහෝ අය අකමැති යාලු
ඇත්ත බොරුවෙන් වසා ගන්නට සළු පිළි ඔතනවා ලු
ඇත්ත එළිවෙන විටදී බොරුවේ සිනිඳු සළු ගැල විලා යාලු

බොහොම ස්තුතියි.

[අ.භා. 3.06]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා පොදුවේත් පෞද්ගලිකවත් සතුටු වෙනවා. විශේෂයෙන්ම අය වැය කථා දහයක් දොළහක් පමණ අහලා තිබෙනවා, දැකලා තිබෙනවා. මීට පෙර අය වැය කථාවන් ගැන මාධ්‍ය, පුවත් පත් හරහා පළ කරන ලද අදහසුත් අප දැක තිබෙනවා. මා හිතන හැටියට ඉතාමත්ම අවාසනාවන්ත සම්ප්‍රදායික ක්‍රමයෙන් මිදිලා අය වැයක් ගැන ස්වාධීනව විග්‍රහයක් කිරීමට කිසි කෙනෙක් පොහොසත් වෙලා නැහැ. ඉතාමත්ම සාරවත් අය වැයක් ඉදිරිපත් කළත්, එය මුල සිට අගට යන තුරු විවේචනය කිරීම තමයි විපක්ෂය සම්ප්‍රදායක් කර ගෙන තිබෙන්නේ. ඒ වාගේම මෙවර ඉදිරිපත් කර තිබෙන මෙම අය වැය මේ ලෝකයේ තිබෙන හොඳම අය වැයයි කියා අපේ පැත්තෙන් අපි ප්‍රකාශයක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අය වැය සම්බන්ධයෙන් කථා කරන්න කාලවේලාවල් බෙදා ගන්න අපි රණ්ඩු වෙන බව. හැබැයි, මේ ඔක්කොම පැත්තකින් තියලා කථිකයෝ දෙදෙනෙක් විතර ආලා එක් කෙනෙකුට පැය දහයක් විතර දීලා, "මේ අය වැය ඉතාමත්ම හොඳ අය වැයක්. මේ ඉදිරිපත් කර තිබෙන්නේ ලෝකයේ තිබෙන හොඳම අය වැයක්" කියලා කියවලා, "මේක අනෙක් කණ්ඩායමේත් දෙදෙනෙකුට පැය අටක් දහයක් විතර දීලා, ලෝකයේ තිබෙන ඉතාමත් අසාර්ථකම අය වැයයි" කියලා කියවලා දවස් දෙක තුනකින් මේ අය වැය විවාදය අවසන් කළොත් කාලෝචිතයි කියලා මම හිතනවා, මේ ආකාරයෙන් අය වැය විග්‍රහයක යෙදෙනවාට වඩා. ඒක තමයි ඇත්ත. ඒක තමයි අපි දකින්නේ. අද මම සන්තෝෂ වෙනවා, විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කිරීමේදී මේ රටේ ප්‍රධාන පුවත් පතක් වන අපේ මිත්‍ර ගරු රුවන් විජයවර්ධන මන්ත්‍රීතුමාගේ පුවත් පතේ මේ අය වැය ගැන විග්‍රහයක් තිබෙනවා. එම විග්‍රහය මෙසේයි. "BT-RCB poll reveals... Most people in favour of 2013 Budget Proposals"

මේක අපේ සම්ප්‍රදායට විරුද්ධයි. මේ පුවත් පත සම්ප්‍රදායානුකූලව විවේචනාත්මක පුවත් පතක් කිව්වොත් නිවැරදියි. හැබැයි, මේ පුවත් පතේ බොහොම පැහැදිලිව කියා තිබෙනවා, මේ ගරු සභාවේදී විපක්ෂය විසින් කථා කරන සියල්ල පැත්තක තියලා බොහොම පැහැදිලිව කියනවා, "Most people in favour of 2013 Budget Proposals" කියා. මේක තමයි කරන්න පුළුවන් හොඳම දේ. අපට කියන්න බැහැ, සියයට 100ක්ම සන්තෝෂ කරන අය වැයක් කොයිම ජගතෙකුටවත් කවදාවත් ඉදිරිපත් කරන්න පුළුවන් කියා. අපට ඉදිරිපත් කරන්න පුළුවන්. මා හිතනවා, ලෝකයේ තිබෙන ආර්ථික අවපාතයන්, ලෝකයේ තිබෙන ආර්ථික තත්ත්වයන්, රට තුළ තිබෙන ස්වාභාවික විනාශයන් යන මේ සියල්ල තක්සේරුවට අරගෙන, රටේ ජනතාවට සාධනීය සහ ඉදිරි දැක්මක් එක්ක හෙට දවස ගැන බලාපොරොත්තු තියන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කිරීම තමයි සාර්ථකත්වය කියන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමා මුල ඉඳන් අගට යන තුරු මහා විවේචනයක් ගෙන ගිය එක ගැන මා කනගාටු වෙනවා. එතුමාට අඩු ගණනේ උඩින් බලලා මේකේ කොයි තැනකවත් මේ කාරණය හොඳයි කියන්න පුළුවන්කමක් නොතිබ්බාද කියන එක ගැටලුවක්. එහෙම කිව්වා නම්, මේකේ අඩු පාඩුවක් තිබෙනවා නම් අපටත් කියන්න පුළුවන්, මේකේ යම්කිසි අඩු පාඩුවක් තිබෙනවා කියා. අපේ මුදල් ඇමතිතුමාට කථා කරලා මේක වෙනස් කර ගන්න බලමුයි කියලා අපට කියන්න පුළුවන්. අර constructive criticism කියන එකට යන්න පුළුවන් නම් එහෙම නම් දෙගොල්ලන්ටම පුළුවන් වඩා ඵලදායී දෙයක් ජනතාවට අවසානයේ භාර දෙන්න. ඒක වෙන්නේ නැහැ. අවාසනාව ඒකයි. එහෙම නම් පාර්ලිමේන්තුව තුළ අපි සාධාරණයක් ඉෂ්ට කරනවාද කියන ප්‍රශ්නයට ජනතාව ඉදිරියේ අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

දැන් බලන්න සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා parliamentary jokes එහෙම නැත්නම් budget jokes කියා පළමුවෙන් කිව්වේ මොකක්ද? හමුදාවේ 350,000ක් ඉන්නවා; ඒ 350,000ට රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා; ඒක බෙදුවාම එක් කෙනෙකුට 9,080ක් එනවා; 9,080න් ගෙයක් හදන්න පුළුවන්ද කියල අහනවා. ඔලමොට්ටල කථාවක්ය කියා ඔබතුමා එක් අවස්ථාවක කිව්වා. ඒක එතුමාට කියන්න ඕනෑ. මොකද, 350,000ටම ගෙවල් එක අවුරුද්දෙන් හදන්නේ නැහැ. එතුමාගේ පියා ඒ දේ නොකළයි කියා එතුමා හොඳටම දන්නවා.

යම්කිසි මුදලක් වෙන් කරන්නේ ඒ වැඩ පිළිවෙළ ආරම්භ කර යම් කොටසකට කිසියම් සහනයක් ලබා දෙන්නයි. මේ දෙය තේරුම් ගන්න බැරි නම් කමක් නැහැ. මම හිතන හැටියට තේරුම් ගන්න බැරිව නොවෙයි. "විහිළු"යි කියන කථා එක්ක ඊළඟට අහනවා, "ගොවියාට දීලා තිබෙන සහනාධාර මොනවාද?" කියා. මා පෞද්ගලිකව හිතනවා, මේ රටේ කෘෂිකර්මය ගැන මහා දැක්මක් තිබුණු මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

එකම සිහිනය වුණේ ගොවියා සැබැවින්ම රජ කරනවා දකින්නයි කියා. ඒක තමයි එතුමාගේ සිහිනය වුණේ; ඒක තමයි එතුමා දැක්ක දර්ශනය වුණේ. හැබැයි ඒක කර ගන්නට බැරිව ගියා. එදා සිට මෙදා දක්වාම ආ සියලු රජයන් ඒ උත්සාහයේ යෙදුණා. හැබැයි කවදාවත් ඒ උත්සාහය සාර්ථක කර ගන්න බැරිව ගියා. අද අපට කියන්නත් සන්තෝෂයි, පහු ගිය වසර කීපය තුළ මේ රටේ ගොවියාට ගොවිතැන ලාභදායී වැඩ පිළිවෙළක් බවට පරිවර්තනය වෙලා තිබෙන බව. පුරන් කුඹුරු වගා වෙනවා. සහල් පිට රට යවන තරමට රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. කෙතේ සිට මිල නියම කරන තැනට අද ගොවියා පත් වෙලා තිබෙනවා.

ඇයි මේ සත්‍යය පිළිගන්න බැරි? මේක අපි කාටත් පොදු දෙයක්. මේ රටේ දේශපාලනය කරන අපි නිල්, රතු, කහ සහ කොළ කියන ඔය කොයි පැත්තේ හිටියත්, රටේ ගොවියා හැදෙනවාය කියන්නේ රටේ ආර්ථිකය යම්කිසි මට්ටමකින් ගොඩ නැඟෙනවාය කියන්නේ ශක්තිමත් අත්තිවාරමක් රටට ලැබෙනවාය කියන එකයි. ඇයි මේ ගැන අගය කිරීමක් කරන්න බැරි? ඇයි මේ ගැන කථා කරන්න බැරි? වීවලට සහතික මිලක් ලබා දීම ගැන අපි ඉතිහාසයේම කථා කළා. අද වී කිලෝවක සහතික මිල රුපියල් 32 - රුපියල් 35 දක්වා වැඩි වෙනකොට, ඒක පාරිභෝගිකයාත් යම්කිසි මට්ටමකින් ආරක්ෂා කරමින් පාරිභෝගිකයාට ඔරොත්තු දෙන තැන ඉඳ ගෙන ගොවියා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක්ය කියන එක අපි කියන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ආර්. යෝගරාජන් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

"ගරු ආර්.යෝගරාජන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. GAYANTHA KARUNATILEKA *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්න උත්සාහ ගන්නේ මෙවැනි සාධනීය කරුණු ගණනාවක් මේ අය වැයේ අඩංගුය කියන එක අවිවාදයෙන් අපට පිළිගන්නට සිද්ධ වෙනවාය කියන එකයි.

මට පෙර කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු රජයේ සේවකයන් වෙනුවෙන් වැඩි කළ වැටුප් ගැන කථා කරමින් "රුපියල් 1500ක සොච්චමක්"ය කියා කිව්වා. මතක තියා ගන්න ගරු මන්ත්‍රීවරුනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ බලය ගන්නකොට රුපියල් 7500 - 8000 අතරේ තිබුණු රජයේ සේවකයන්ගේ අවම වැටුප අද රුපියල් 17,000 -18,000 දක්වා වැඩි වෙලා තිබෙනවාය කියා.

එහෙම නම් ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කළ කථාවේ යම්කිසි සත්‍යයක් තිබෙනවාද? පෞද්ගලික අංශය ක්‍රියාත්මක වෙන්නේ කොයි ආකාරයෙන්ද කියා ඇසුවා. පෞද්ගලික අංශය පදනම් වෙන්නේ ආර්ථික සංවර්ධනයත් එක්ක ඉදිරියට යන ගමන මතයි. ඒකට පඩි නියම කරන්න, නීති දමන්න හෝ අණපනත් ගෙනෙන්න කිසිම හැකියාවක් නැහැ. ලෝකයේ කොහේවත් ඒ ආකාරයට සිද්ධ වෙන්නේ නැහැ.

හැබැයි කම්කරු දෙපාර්තමේන්තුවක් තිබෙනවා, අවම වැටුප් තිබෙනවා, Shop and Office Employees Act එක තිබෙනවා. ඒ වාගේම නොයෙකුත් ප්‍රඥප්ති තිබෙනවා. ඒ අනුව ඔවුන්ගේ වැටුප් කාලයෙන් කාලයට, රටේ අවශ්‍යතාවන් අනුව වෙනස් වෙන එක ස්වභාවික දෙයක්. එය ඒ විධියට ක්‍රියාත්මක වෙනවාය කියන එක මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා මේක සමස්තයක් හැටියට අරගෙන මේක පුස්සක්ය, රු.1500ක් දෙනවාය ආදී වශයෙන් කියනවා. [බාධා කිරීමක්] ඔබතුමා කියාපු කථාව ඇත්තයි. අවසානයේ මේ සියල්ල එකතු කරලා කළමනාකරණයක් පමණයි කෙරෙන්නේ. එහෙම නැත්නම් සල්ලි අච්චු ගහන්නවත්, පෞද්ගලිකව කාගේවත් සේප්පුවකින් ගන්නවා වාගේ දෙයක් කරන්නවත් බැහැ. බොහොම පැහැදිලිවම රටේ සංසරණය වන මුදල් යම් නිෂ්පාදනයක් එක්ක, යම් පාලනයක් එක්ක, යම් සැලැස්මක් එක්ක, කළමනාකරණයක් එක්ක ජනතාව අතරට යන්නේ; එහෙම නැත්නම් වේතන සහ අනිකුත් අවශ්‍යතාවලට ගෙවන්න සිද්ධ වෙන්නේ.

මගේ මිත්‍ර ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා රාජ්‍ය ආදායම සහ වියදම සම්බන්ධයෙන් කිව්වා. රාජ්‍ය ආදායම සහ වියදම සම්බන්ධයෙන් කල්පනා කරනකොට විශේෂයෙන්ම රාජ්‍ය සේවය දහතුන් ලක්ෂයක් දක්වා ප්‍රසාරණය වීම, ඒ වාගේම විෂමතාවන් ඉවත් කිරීම හරහා විශ්‍රාමිකයන්ට දෙන ලද වැටුප් ආදී ඒ සියල්ල ගත්තාම සෞඛ්‍ය, අධ්‍යාපනය ආදී ප්‍රධාන අවශ්‍යතාවන් පිරිමසා ගන්න අවසානයේ අපට ඉතුරු වෙන්නේ ඉතාමත්ම සුළු මුදලක්.

එතුමන්ලාගේ කථාවලදී කිව්වා, මේ මුදල් නාස්ති වෙනවා කිසිම කටයුත්තක් වෙන්නේ නැහැය කියලා. අද ගම් පළාත්වලට ගිහිල්ලා බලන්න ඕනෑ. ගම් පළාත්වල වෙන සංවර්ධනය මෙතුමන්ලා ඇස් දෙකෙන් දැකලා සමහරක් විට නොදැක්කා වාගේ ඉන්නවා. එහෙම නැත්නම් පුංචි ඊර්ෂ්‍යාවක් දැනෙන නිසා කථා නොකර ඉන්නවා කියලා මා හිතනවා. මොකද අපේ සෑම ගමකටම -බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙතැන ඉන්නවා.- පළමුවන වතාවට රුපියල් ලක්ෂ 10 ගණනේ වෙන් කරලා තිබෙනවා.

මේ රටේ ගම් 14,000ක් තිබෙනවා. මේ රටේ තිබෙන සෑම ගමකටම, සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම ගමේ පුංචි වැඩක් කර ගන්නට, ගමට යම් කිසි වැඩක් කරන්නට ලක්ෂ 10ක මුදලක් ලබා දීලා තිබෙනවා. ඉතින් ඒකෙන් දැවැන්ත සංවර්ධනයක් සිද්ධ වෙනවා. මේවාට මුදල් කොහෙන්ද? ඔබතුමන්ලා කියන විධියේ මහා විනාශයක්, මහා නාස්තියක් මේ රටේ ඇති වෙනවා නම් මේ විධියට මුදල් වෙන් කරලා, එවැනි සංවර්ධන වැඩ පිළිවෙළකට මේ රට ගෙන යන්නට හැකියාවක් නැහැයි කියන එක මා සඳහන්

කරන්නට ඕනෑ. ඒ නිසා මා බොහොම ස්ථිර වශයෙන්ම, ඒ වාගේම අවධාරණයෙන්ම කියන්න කැමැතියි, මේ අය වැයෙන් යම් කිසි ශක්තිමත් අත්තිවාරමක් මේ රටේ හරයවන කෘෂිකර්මය හා වැවිලි කර්මාන්තය හරහා ලබා දීලා තිබෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු කිව්වා, ට්‍රැක්ටර්වලටවත් බද්දක් අය කරන්නේ නැහැ කියලා. ට්‍රැක්ටර්වලට බදු අය කරන්නේ නැහැ පසු ගිය අවුරුදු හතරක, පහක කාලයක සිට. මෙතුමන්ලා නොදන්නා නිසායි මම කියන්නේ. Tax එකක් ගැන හුඟ දෙනෙකු කථා කළා. Racing car එකක බද්දක් ගැන කථා කළා. මේක තමයි අද ප්‍රධානම මාතෘකාව වුණේ. එහෙම මාතෘකාවක් තිබෙන එක හොඳයි. සෑම කථිකයෙක්ම තමන්ගේ කථාව අවසාන කළේ racing car එකකට බද්දක් කියන එක ගැන කථා කරලායි. හැබැයි එක දෙයක් මතක තියා ගන්න. නිල වශයෙන් එන සියලුම ක්‍රීඩා භාණ්ඩ සඳහා බදු අය කරන්නේ නැහැ. ඒ වාගේම තමයි අද රටේ අලුත් ක්‍රීඩාවක් ඇති වෙනවා නම් ඒකට ගෙනෙන වාහනයකට බදු අඩු කිරීම අරුමයකට, පුදුමයකට කරුණක් නොවෙයි. එහෙම නැත්නම් ඒක එකම කරුණ හැටියට අරගෙන ඒ කරුණ අය වැය හරහා දුවන තත්ත්වයකට ගන්නට එපා කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද ඒක අසාධාරණයි. ඒ සියලු දේවල් සමස්තයක් හැටියට ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලු කෘෂි කාර්මික භාණ්ඩ බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. කෘෂි කර්ම වැඩ පිළිවෙළට සහනාධාර ලබා දීලා තිබෙනවා. තේ වගාවට දීලා තිබෙන මුදල් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. මට මතක විධියට තේ නැවත වගා කර වැඩි දියුණු කර ගැනීම සඳහා හෙක්ටයාර් එකකට රුපියල් 300,000 සිට 350,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ අය වැය ලේඛනය ගැන යම් කිසි විශ්ලේෂණාත්මක ඇහකින් බලන්න ඕනෑ. මොන කර්මාන්තකරණය ගැන කථා කළත්, ආයෝජනයන් ගැන කථා කළත් අවසානයේ මේ රටේ පැවැත්ම, රටේ ශක්තිමත් අත්තිවාරම, රටේ හරය තිබෙන්නේ මා විශ්වාස කරන හැටියට කෘෂිකර්මය හා වැවිලි කර්මාන්තය තුළයි. ඒ අත්තිවාරම ශක්තිමත් කරන්න මේ අය වැය ලේඛනයෙන් විශාල සහයෝගයක්, විශාල මුදල් සම්භාරයක් ලබා දීලා තිබෙනවාය කියන එක අපට අනිවාර්යයෙන් පිළිගන්නට සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්නට පෙර මේ කාරණයත් කියන්නට කැමැතියි. විශේෂයෙන්ම මම කියපු විධියට සම්ප්‍රදායෙන් මිදිලා අඩු ගණනේ මේ අය වැය ලේඛනයෙන් ගොවීන්ට ලබා දීලා තිබෙන, වැවිලි කර්මාන්තයට ලබා දීලා තිබෙන, ඒත් එක්කම මේ අමාරුකම් මැද්දේ මේ රටේ මහා දැවැන්ත සංවර්ධනයක යෙදෙමින් සිටින කාලය තුළ, ඒ ක්‍රියා දාමයන් ක්‍රියාත්මක කරමින් රටේ ජනතාවට යම් කිසි අනාගත බලාපොරොත්තුවක් ඇති වෙන ආකාරයෙන් කටයුතු කරන අවස්ථාවක මේ අය වැය ලේඛනයේ හොඳ, නරක වෙන් කරලා කථා කළොත්, ජනතාව මේ අය වැය ලේඛනය කියන දේ ගැන, පාර්ලිමේන්තුව ගැන මීට වඩා උනන්දුවෙන්, මීට වැඩිය වග කීමකින් කටයුතු කරාවිය කියන හැඟීමයි මට තිබෙන්නේ.

එසේ ප්‍රකාශ කරමින් මේ අය වැය ලේඛනය හරහා මේ රටේ වැඩ කරන ජනතාවටත්, සමස්ත මධ්‍යම පාන්තික, ඉහළ මධ්‍යම පාන්තික අයටත් -මොකද මේ සියල්ල වෙන් කරන්න බැහැ. මේ රටේ සියලුම අය පුරවැසියන්.- සෙතක් සැලසෙනවාය කියන එකත් ප්‍රකාශ කරන්න කැමැතියි. අපට කියන්න පුළුවන්, සියයට එකක් ධනවතුන් කියලා. සියයට එකක් ගැන නොවෙයි මම කථා කරන්නේ. නමුත් බහුතරයකට සෙතක් සැලසෙන අය වැයක් ඉදිරිපත් කිරීම ගැන මගේ ප්‍රශංසාව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා. ස්තුතියි.

[අ.භා. 3.20]

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

ඉතාමත්ම කෙටි කාලයක් තිබෙන බැවින් ඉතාමත් සරලව කෙටියෙන් කරුණු කිහිපයක් ගෙන හැර දක්වන්න කැමැතියි. මගේ අත් දැකීමේ හැටියට මම අය වැය 24කට, 25කට ඇහුම් කන් දීලා තිබෙන කෙනෙක්. නමුත් සමස්ත ජන කොට්ඨාසයෙන් විශාල පිරිසක් සම්බන්ධ කර ගෙන සහන සැලසූ අය වැයක් හැටියටයි මම මේ අය වැය දකින්නේ. ඒ වාගේම වර්ෂ ගණනාවක ඉදිරි ගමනක් සඳහා සැලසුම් කළ අය වැයක් හැටියටත් මම මේ අය වැය හඳුන්වනවා.

අය වැය ගැන පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ගණනාවක් දීර්ඝ වශයෙන් කථා කළ නිසා මා විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ මගේ පැරණි මිත්‍ර එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් අය වැය ගැන කළ කථාවලට උත්තර ලබා දීමටයි. විශේෂයෙන් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මම පුංචි පණිවුඩයකුත් යැවුවා, මම සවස එතුමාට උත්තර දෙනවා, පොඩ්ඩක් ඉන්න කියලා. එතුමා අය වැය ගැන විග්‍රහයක යෙදෙමින් ප්‍රධාන වශයෙන්ම පහර දුන්නේ රජයට පවරා ගත් පැල්වත්ත සහ සෙවණගල ආයතන පිළිබඳවයි. මා මේ අවස්ථාවේදී එක දෙයක් කියන්නට ඕනෑ. මේ රජය මේ මොහොතේ අවුරුද්දකට රුපියල් කෝටි 5,500 ක් -රුපියල් බිලියන 55ක්- වියදම් කරනවා සීනි ගේන්න. අප නිෂ්පාදනය කරන්නේ අපට අවශ්‍ය සීනි ප්‍රමාණයෙන් සියයට 6යි. සියයට 25ක්-30ක් නිෂ්පාදනය කළ එක සියයට 5ට වට්ටලා දැම්මා. පසු ගිය අවුරුද්දේ මේ ආයතන රජයට පවරා ගැනීමෙන් පසු අපට යාන්තම් පුළුවන් වුණා ඒ නිෂ්පාදනය සියයට එකකින් වැඩි කර ගන්න. නමුත් රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරද්දී පහර පිට පහර ගැහුවේ සෙවණගල සහ පැල්වත්ත ආයතනවලටයි. පහර ගැහුවා පමණක් නොවෙයි, පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර ගෙන රුපියල් මිලියන 1,500ක මුදලක් මේ ආයතන දෙකට ලබා දුන්නාය කිව්වා. නැහැ. ඒක එතුමාට සම්පූර්ණ වැරදීමක් වෙලා තිබෙන්නේ. අප මහා භාණ්ඩාගාරයෙන් මිලියන 870ක් ලබා ගත්තා. ඒක ඇත්තයි. ඒ මේ ආයතන දෙක පවරා ගනිද්දියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආයතන දෙක ගැන කථා කරද්දී විශේෂයෙන් මම කියන්නට ඕනෑ, ඒ ආයතන දෙක අප පවරා ගන්නා විට තිබුණු තත්ත්වය පිළිබඳව. විශේෂයෙන් මේ සෙවණගල මේ ආයතනයේ අයිතිකාර මහත්මයාගේ නෝනාත් එහි හිටපු අධ්‍යක්ෂවරියක්; අදත් ඉන්න අධ්‍යක්ෂවරියක්; අද පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරියක්. හෙක්ටෙයාර් 4,000ක් තිබුණු ආයතනයේ අවුරුදු 12කට පස්සේ හෙක්ටෙයාර් 2,000යි වගා කර තිබුණේ. මේ ආයතනය අපේ එක්සත් ජාතික පක්ෂයේ මගේ පැරණි මිත්‍රයෝ -ඒ ආණ්ඩුවෙන්- දීලා තිබුණේ රුපියල් මිලියන 570කටයි. රුපියල් මිලියන 762කට ඉල්ලුමක් තිබුණත් මේක මිලියන 570කටයි ගමගේ මහත්මයාට දුන්නේ. මිලියන 570කට විකුණද්දී ස්ථාවර තැන්පතු විතරක් මිලියන 300ක් තිබුණා. සීනි සහ ස්ප්‍රීතු stocksවල වටිනාකම මිලියන 240ක් තිබුණා. සේවක සහ ගොවි ණය මිලියන 30ක් ලැබෙන්නට තිබුණා. මිලියන 570ක් දීලා ගත්තාට පස්සේ අතට ශුද්ධ ලාභය තව මිලියන 25ක් ආවා.

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් මේ ආයතන සම්බන්ධයෙන් අහපු පළමුවන ප්‍රශ්නය තමයි, අප එක සීනි ඇටයක් වැඩිපුර නිෂ්පාදනය කළා ද කියන එක. ඔව්, මම තමුන්නාන්සේලාට සංඛ්‍යා ලේඛන පොඩ්ඩක් ගෙන හැර දක්වන්නම්. සෙවණගල ආයතනය 2000 වර්ෂයේදී සීනි ටොන් 25,000ක් හැදුවා. ඒක 2004 වර්ෂය වනකොට සීනි ටොන් 18,000ට බැස්සා. 2009 වර්ෂයේදී සීනි ටොන් 8,000 ට බැස්සා. 2011 දී සීනි ටොන් 5,000ට බැස්සා. අපි පවරා ගත්තාට පසුව මේ මොහොත වෙද්දි සීනි ටොන් 5,000 සීනි ටොන් 10,000ක් දක්වා වැඩි කරන්න අපට පුළුවන් වුණා. අප ඒක කළේ කොහොමද? මෙන්න මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආයතනයේ තිබුණු මූලික සිද්ධාන්තය සීනි නිෂ්පාදනය කිරීම නොවෙයි, මද්‍යසාර නිෂ්පාදනය කිරීමයි ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමනි. මේ උදවිය එක උක් ටොන් එකකින් spirit ලීටර් 29ක් හැදුවා. ගිය අවුරුද්දේ මේ ආයතනය රජය පවරා ගෙන මගේ අමාත්‍යාංශයට භාර දුන්නාට පස්සේ ගරු ජනාධිපතිතුමා එක දෙයයි පැහැදිලිවම කිව්වේ. ඒ මොකක්ද? "සීනි නිෂ්පාදනය කරන්න. සීනිවල අතුරු ඵලයක් මද්‍යසාර. හැබැයි මද්‍යසාරවල අතුරු පලයක් කර ගන්න එපා සීනි."

ඒක තමයි අතිගරු ජනාධිපතිතුමාත්, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් අපට දුන්නු උපදෙස. බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, එක උක් ටොන් එකකින් මද්‍යසාර ලීටර් 29ක් මෙතුමන්ලා හැමදාම හැදුවා. අපි පසු ගිය අවුරුද්දේ එම මද්‍යසාර ලීටර් 29 ප්‍රමාණය ලීටර් 14ට බැස්සුවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ඇයි ඒ?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
අපි සීනි නිෂ්පාදනය වැඩි කෙරුවා. මෙතැන රහසක් තිබෙනවා. උක් ගස කපලා ගෙනැල්ලා පැය 48ක් ඇතුළත ඇඹරුවොත් සීනි ප්‍රමාණය වැඩියි. පැය 48ට වඩා ප්‍රමාද කරලා අඹරපුවාම වැඩිපුර ලැබෙන්නේ මද්‍යසාරය. මෙන්න සෙල්ලම. සෙවනගල ආයතනයේ ගමගේ මහත්මයා ඇතුළු හැම කෙනෙක්ම එම ආයතනය රජයට පවරා ගැනීම ගැන කථා කරනවා. දැන් මම අහන්න කැමැතියි, පසු ගිය අවුරුදු 12 ඇතුළත මේ සෙවනගල ආයතනයේ ආදායම කීයද කියලා. අපි සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ, එම ආයතනය අපිට භාර දුන්නාට පසුව පසු ගිය මාස 10ට ශුද්ධ ලාභය රුපියල් මිලියන 780යි කියලා. මෙන්න වෙනස.

මේ අය වැයෙන් හෙක්ටෙයාර් 1,30,000ක් උක් වගාව වෙනුවෙන් වෙන් කර තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ඒ සඳහා දායක වුණු සියලු දෙනාටම අපි ස්තුති කරන්නට ඕනෑ. කිසිම රජයකින් කරන්න හිතපු නැති දෙයක්. අවුරුද්දකට රුපියල් කෝටි 5,500ක් වියදම් කරනවා. අපි හරි සැලැස්මක් අනුව වැඩ කළොත් කර්මාන්තශාලා 10ක් විතර ඇති කරලා අවුරුදු 06ක -07ක කාල සීමාවක් තුළ මේ සීනි නිෂ්පාදනය වැඩි කර ගන්න අපිට පුළුවන් වෙනවා. එන්න එන්න මේ මුදල වැඩි වනවා. තව අවුරුදු කිහිපයක් යද්දී ලෝකයේ සීනි නිෂ්පාදනය කරන රටවල් සීනි අපනයනය කරන්නේ නැහැ. මොකද, ඔවුන් එතනෝල් හදලා ඔවුන්ගේ වාහන සඳහා ඒවා පාවිච්චි කරනවා. දැනට මාස දෙකකට ඉස්සර වෙලා බ්‍රසීලය අලුතින් උක් වගා කිරීම සඳහා හෙක්ටෙයාර් මිලියන 4.5ක් වෙන් කළා. සීනි නිෂ්පාදනය කරලා පිට රට පටවන්නේ නැහැ. තමන්ට අවශ්‍ය සීනි ප්‍රමාණය තබා ගෙන ඉතිරි ඒවායින් එතනෝල් හදනවා. එතනෝල් තමන්ගේ වාහන සඳහා පාවිච්චි කිරීමෙන් ඔවුන් ඩොලර් මිලියන ගණනක් ඉතිරි කර ගන්නවා.

මා මේ කියන්න හදන්නේ මොකක්ද? අතිගරු ජනාධිපතිතුමා විසින් අපට සැලැස්මක් අනුව උපදෙස් දුන්නා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා එයට නායකත්වය ගත්තා. අපි එතුමන්ලාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. මහා භාණ්ඩාගාරයත් සමඟ එකතු වෙලා අපට එතුමන්ලා හැම වෙලාවේම උපදෙස් දුන්නා, මොකක්ද කරන්න ඕනෑ, කොයි විධියටද මේ ගමන යා යුත්තේ කියලා. පැල්වත්තේ සීනි කම්හලේ සේවකයෝ 5,000ක් සිටිනවා. ඒ සේවකයන් 5,000ට මාසික වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 86ක් යනවා. මාසික වැටුප වශයෙන් රුපියල් මිලියන 86ක් ගෙවලාත් මාස 10ක ශුද්ධ ලාභය රුපියල් මිලියන 400ක් දක්වා වැඩි කර ගන්න අපට පුළුවන් වුණා.

මේ අය වැය විවාදයේ කරපු කථා මා අහගෙන සිටියා. අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් කථා කළේ ද්වේශයෙන්. මා ඔවුන්ට ඒ පිළිබඳව දොස් කියන්නේ නැහැ.

විශේෂයෙන්ම මා කියන්නට ඕනෑ, ලෝකයේ ආර්ථිකය ගත්තාම අද යුරෝපය, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය වැනි රටවල් කිහිපයක් හැරෙන්ට අනෙක් හැම රටකම ආර්ථිකය කඩා වැටිලා තිබෙන බව. ඒ හුඟක් රටවල් එක්ක සංසන්දනය කරලා බලද්දී අපි ඉහළ මට්ටමක සිටිනවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරනවා මා අහගෙන සිටියා. එතුමාගේ කථාව ගැන ඩිලාන් පෙරේරා ඇමතිතුමාගේ කථාවේ සඳහන් කරපු කොටසක් ගැන තමයි මා මේ කියන්නේ. මොකක්ද?

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා රට විරුවන් කියලා අර පිට රට රැකියා සඳහා යන අපේ රටේ ශ්‍රමිකයන්ව බොහොම හැල්ලුවට ලක් කරලා කථා කළා. එතුමා ඇහුවා පිට රට යන උදවියව රට විරුවන් කියලා නම් කළේ ඇයි කියලා. එහෙනම් එතුමන්ලා ඉල්මහ විරුවන් කියලා අද සමරන්නේ කාවද? මේ රටේ කී දෙනෙක් මරපු නායකයන්වද එතුමන්ලා ඉල්මහ සමරුව කියලා සමරන්නේ. තමුන්නාන්සේලාගේ මේ කථා පිළිබඳව අපි කනගාටු වනවා, විජිත හේරත් මන්ත්‍රීතුමනි.

ඊළඟට මා විශේෂයෙන්ම කියන්නට ඕනෑ "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන ගැන. ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමනි, මෙක එක්සත් ජාතික පක්ෂයේ වැඩසටහනක්. "යළි පුබුදමු ශ්‍රී ලංකා" එදා අපේ එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරපු වැඩසටහනක්. එය එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරපු වැඩසටහනක් වුණාට "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහනේ එකම දෙයක්වත් අපට කර ගන්නට බැරි වුණු එක ගැන මම කනගාටු වනවා.

උදාහරණයකට ගනිමු, දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය. ඒ අධිවේගී මාර්ගයට මොකද වුණේ කියලා ඔබතුමාත් දන්නවා; මාත් දන්නවා. අපේ හිටපු හොඳම ඇමතිවරු දෙන්නෙක් කරපු දේ ඔබතුමා දන්නවා. දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයට මොකද වුණේ කියලා ඔබතුමා දන්නවා. 'යළි පුබුදමු ශ්‍රී ලංකා' වැඩසටහනේ තිබුණා, කොත්මලේ දෙවන පියවර ගැන. අපේ ආණ්ඩුව කාලයේ -නවීන් දිසානායක ඇමතිතුමාත් මේ

අවස්ථාවේදී සභා ගර්භයේ දැන් ඉන්නවා- අපට පුළුවන් වුණාද, උදැල්ලක් තියලා කොත්මලේ ව්‍යාපෘතිය පටන් ගන්න? බැරි වුණා. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පුළුවන් වුණා, කොත්මලේ වැඩ පටන් ගන්න. අද එහි වැඩ අවසානයි.

ඊළඟට නොරොච්චෝලේ ගන්න. අපට පුළුවන් වුණාද, නොරොච්චෝලේ වැඩ පටන් ගන්න? එදා එක්සත් ජාතික පක්ෂයේ ඉන්දැද්දී අපට සිද්ධ වුණේ මොකක්ද? නොරොච්චෝලෙට ගිහිල්ලා නොරොච්චෝලේ හදන්න එපා කියලා අපි විරෝධය පෑවා. ඒ බව ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය අමාත්‍යතුමාට හොඳට මතක ඇති. අපිට උපදෙස් දුන්නේ, නොරොච්චෝලේ හදන්න එපා කියලා විරෝධය දක්වන්න කියලායි. අපි විරෝධය දැක් වූවා. ඇත්ත. අද බලන්න, අඩු පාඩුකම් තිබුණත් අද නොරොච්චෝලේ හදලා අවසානයි.

එදා එක්සත් ජාතික පක්ෂයේ අපේ තිබුණු සිහිනයක් තමයි හම්බන්තොට වරාය හැදීම. අපි ඒවා ලැයිස්තුවලට දැම්මා. අපට පුළුවන් වුණාද, හම්බන්තොට වරාය හදන්න? එහෙම නම් අද අපට මොකක්ද ඒ ගැන කථා කරන්න තිබෙන අයිතිය? අද හම්බන්තොට වරාය හදලා ඉවරයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණු අවුරුදු තුනේ අපි වැල්ලවාය ගුවන් තොටු පොළ ගැන කථා කෙරුවා. 2004 මැතිවරණය වෙලාවේ වැල්ලවාය ගුවන් තොටු පොළට අපි ගිහින් මුල් ගල තිබ්බා. මොකද, මැතිවරණය නිසා. මට මතකයි, ඒ ප්‍රදේශයේ ගොවි ජනතාව boards ගහලා තිබුණා, "ගුවන් නැවියන් ඕනෑ කර තිබේ" කියලා. එහෙම තමයි ඒ ජනතාව අපව අපහාසයට ලක් කරලා එදා එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කළේ. අද මත්තල ගුවන් තොටු පොළ හදලා අවසානයි. තව වැඩ පොඩ්ඩක් තිබෙනවා. අපි මේවා ගැන ද්වේෂයෙන් බලා වැඩක් නැහැ. අද විශාල වැඩ කොටසක් කෙරී ගෙන යන අවස්ථාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට මම ඊයේ උත්තර දුන්නා. එතුමා බොහොම ඕනෑකමකින් කථා කෙරුවේ ජනාධිපතිතුමාගේ තුන්වන වරම ගැනයි; තුන්වන වතාවට ඉල්ලන්න හැකි වන පරිදි ජනාධිපතිතුමා ව්‍යවස්ථාව වෙනස් කළ ආකාරය පිළිබඳවයි. එසේ වෙනස් කිරීම සම්බන්ධයෙන් මම වරදක් දකින්නේ නැහැ. මොකද, ඒ පිළිබඳ ඉතිහාසය මමත් දන්න නිසා. එහි ඉතිහාසය මම දන්නවා. එතුමන්ලා කවුරුවත් නොදන්නා ඉතිහාසයක් මමත් දන්නවා.

1988 ජේ.ආර්. ජයවර්ධන මහත්තයාත් උත්සාහයක් ගත්තා, පුළුවන් නම් තුන්වන වරටත් ජනාධිපතිවරණයට ඉල්ලන්න. සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ තාත්තා එම කමිටුවේ සභාපති වෙලා හිටියේ. නමුත් "තුන්වන වතාවට ඉල්ලන්න එපා, රටේ ප්‍රශ්න රාශියක් තිබෙනවා" කියලා ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට කියන්න රන්ජන් විජයරත්න මහත්තයාට සිද්ධ වුණා. ඒකට එතුමා එකඟ වුණා. ප්‍රේමදාස මහත්තයාට තරග කරන්න අවස්ථාව දුන්නේ ඒකයි. ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට ඕනෑ වුණා, තුන්වන අවස්ථාවට තරග කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න. ලංකාව පිළිබඳව මේ උදවිය කථා කරන්නේ බොහොම ද්වේෂ සහගතවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම කෙනෙකුටම අමතකයි, ඉන්දියාවේ තත්ත්වය. ගාන්ධිගෙන් පස්සේ ගාන්ධි මහත්මියගේ පුතා ආවා. අද ඒ පුතාගේ නෝනා ඒ දේශපාලනයේ ඉන්නවා. අපේ තාත්තාගෙන් පස්සේ මම පාර්ලිමේන්තුවට ආවා. සුසන්ත පුංචිනිලමේ මහත්මයාගේ තාත්තාගෙන් පස්සේ සුසන්ත පුංචිනිලමේ මහත්මයා පාර්ලිමේන්තුවට ආවා. අපේ ගාමිණී දිසානායක මහත්මයාගේ මරණයෙන් පස්සේ එතුමාගේ පුතා නවීන් දිසානායක මහත්මයා පාර්ලිමේන්තුවට ආවා. ලෝකයේ බොහෝ රටවල මේ දේ සිද්ධ වෙලා තිබෙනවා. සිංගප්පූරුවේ ලී ක්වාන් යූ මහත්මයාගෙන් පස්සේ එතුමාගේ පුතා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. ඇමෙරිකාවේ ජෝර්ජ් බුෂ්ගෙන් පස්සේ ජෝර්ජ් බුෂ්ගේ පුතා ජනාධිපතිකම කෙරුවා. ඉතින් මේ පිළිබඳව අපි ද්වේෂ සහගතව කථා කරලා තේරුමක් නැහැ. ද්වේෂ සහගතව මේ පිළිබඳව බලන්නේ නැතිව කටයුතු කරන්න කියලා මගේ පරණ මිත්‍රයන්ගෙන් මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ජනාධිපතිතුමා වැදගත් ඉල්ලීමක් කෙරුවා. එය රටේ අවශ්‍යතාවක්. එනම් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවයි. තිස්ස අත්තනායක මහත්මයාගේ කථාවට මම ප්‍රශංසා කරනවා. මමත් ඒක කියෙව්වා. අපි ඒ ගැන කථා කෙරුවා. වෙනසක් වෙන්න ඕනෑ තැන වෙනසක් වෙන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕනෑ නම් වෙනස් කරන්න ඕනෑ. ඇත්ත. ව්‍යවස්ථාවක් තිබෙන්නේ වෙනස් කරන්නයි. එදා එක්සත් ජාතික පක්ෂයේ අපි තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 16 වතාවක් වෙනස් කෙරුවේ. ඉදිරියේදී වෙනස් කරන්න ඕනෑ නම් ව්‍යවස්ථාව ආයෙත් වෙනස් කරන්න ඕනෑ. එහි කිසි වරදක් නැහැ. නමුත් මේ අය වැය දෙස ද්වේෂ සහගතව බැලීම පිළිබඳවයි මම මේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් රටේ සමස්ත ජනතාවටම විශාල දායකත්වයක් ලබා දීලා තිබෙනවා. එහි විශේෂ වැඩසටහන තමයි දිවි නැගුම වැඩසටහන. අද අපේ ගම්වල හැම පුංචි ගෙදරකම දිවි නැගුම වැඩසටහන ඉතාමත්ම සාර්ථකව කර ගෙන යනවා. අපේ ගම්වල මිනිස්සු මේ මෑත කාලයේදී මිරිස් ගහක් වෙනුවට හිටෙව්වේ මොනවාද? මල් ගහක්. මිරිස් ටික ගන්න කඩේට ගිහින් මිරිස් ගණන් වැඩියි කියලා ආණ්ඩුවට දෙස් දෙවොල් තියනවා. නමුත් පසු ගිය මාස 12ක-14ක තිස්සේ සිට මොකක්ද වෙන්නේ? මල් ගහත් තිබෙනවා; මිරිස් ගහත් හදන්න පටන් අරන් තිබෙනවා, අද මේ ජනතාව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you have one more minute.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
එහෙම නම් මගේ කථාව කෙටි කරන්න සිද්ධ වෙනවා. කොහොම නමුත් සමස්තයක් හැටියට මුළු රටේම ජනතාවට සහන ලබා දුන්නු අය වැයක් ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට අපේ ගරුත්වය, ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා.

[3.36 p.m.]

**ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය (ජලසම්පාදන හා ජලාපවහන නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) நிரூபமா ராஜபக்ஷ - நீர் வழங்கல், வடிகாலமைப்பு பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Nirupama Rajapaksa - Deputy Minister of Water Supply and Drainage)
Hon. Presiding Member, the eighth Budget of the UPFA Government presented by His Excellency President Mahinda Rajapaksa on the 8th of November would benefit our entire population. It is driven with the objective of achieving peace and reconciliation and ushering in fast-track development programmes to the country.

[ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය]

We have entered into an era of tranquility and accelerated development. President Mahinda Rajapaksa's Budget Proposals seek to maximize this situation and aim to transform the country into a poverty-free State with a vibrant society. The eighth Budget has been conceived in furtherance of the development-based "Mahinda Chintana - Vision for the Future".

The assumption of leadership of our nation by His Excellency President Mahinda Rajapaksa proved to be a turning point in our political history and paved the path for unity and harmony amongst the diverse communities fragmented by the 30-year long war. His dynamic efforts to develop the economy through numerous projects while, at the same time, seeking peace and reconciliation of our communities have already yielded resounding success, and I must add, within a very short span of time. Today, Sri Lanka is visibly transforming into an upper middle-income country which will surely achieve a per capita income of US Dollars 4,000 by the year 2016.

The national Budget must provide not only for the present, but for the future as well. Accordingly, President Mahinda Rajapaksa has submitted to the House what one would refer to as a "forward-looking" Budget. It is a development-focused Budget, which will benefit the rural farmers and the low-income groups. It seeks to boost medium enterprise. It is bent towards protecting and fostering democracy so that all citizens enjoy equally the benefits of the post-war economic boom.

This Budget has been prepared in consultation with numerous staketholders - farmer organizations, trade unions, employer organizations and several other relevant groups. It factors in the interests of all sections of the population. The basic tenor of this Budget is the achievement of a poverty-free Sri Lanka. It is built on the premise of providing gainful employment opportunities to the under-privileged segments of the population. It leans heavily towards nursing remote villages in facilitating access to basic amenities such as water and electricity. The Government's novel programme "Divineguma" has already reached approximately 2.5 million households, which are now engaged in food production, livestock and cottage industries, poultry farming and dairy production. The programme has generated a significant number of new sources of income for rural entrepreneurs.

Sir, I am particularly happy to note that my Ministry, the Ministry of Water Supply and Drainage, has received an allocation of Rs. 2,200 million in the 2013 Budget Estimates. This provision has been made for water supply improvements in several districts, which will see that the rural communities obtain safe drinking water.

It has been the policy of the UPFA Government to encourage and support the farmer communities. The 2013 Budget Proposals contain several measures to boost production, seed supply and storage facilities. The increase of the guaranteed price for paddy from Rs. 32 to Rs. 35 per kilo from the next "Maha" season will surely assist the farmer communities immensely. His Excellency the President has also ensured that the farmers who were affected by the drought will recover fast. Accordingly, the Budget proposes to provide seed paddy for the "Maha" cultivation free of charge to all farmers in drought-stricken areas and the deferment of recovery of agricultural loans and the writing-off of interests on the loans.

The health sector has been given top priority, by the provision of Rs. 125 billion for 2013. Under the modernization programme, the number of doctors, nurses, paramedical officers, technical and support staff are to be increased. The Government is also taking the initiative to manufacture pharmaceutical products locally. With regard to support staff, the Health Ministry has taken action to recruit 5,000 persons from all over the country.

The Budget also addresses the needs of the small enterprises, by exempting them from the NBT and the VAT, which will greatly contribute towards their business growth and expansion. The needs of the smallholder plantation sector have been addressed by the increase of replanting subsidies and the introduction of new plantation subsidies.

Sir, an area of economic activity that has shown tremendous growth is tourism. We wish to thank the Minister of Economic Development, the Hon. Basil Rajapaksa, for his well-thought-out plans and strategy in developing this industry. This year alone has witnessed over one million foreign tourists and foreign earnings of billion dollars. New hotels are mushrooming in various places including Kalpitiya, Pasikuda, Yala, Kuchchaveli and Nilaveli. This will not only generate foreign exchange but also provide employment opportunities, particularly for the youth.

His Excellency the President has not forgotten our war veterans, "Ranaviru" who freed our country from terrorism, in this Budget. They have been amply rewarded for the sacrifices they made for the country by the provision of Rs. 1,000 million for development of housing schemes for them and their families.

His Excellency, through the Budget Proposals for 2013, proposes to set up a new Pay Commission to formulate a National Wage Policy to address the concerns of both the Public sector and the private sector. Public servants will also get an increase in their allowances by a minimum of Rs. 1,500 from next year. Pensioners will get an increase in the Cost of Living Allowance by Rs. 500 from January 2013.

Sir,I wish to draw your attention to the extensive work done by the Government in Colombo and Sri

Jayawardenepura. Today, the Independence Square and the board walk around the Diyawanna Oya provide safe and splendid surroundings for people to walk and exercise. The beautiful green City of Colombo, its suburbs and other cities provide the much-needed environment to develop a population of healthy body and mind. The Environment Protection Unit of the Police enforces the Environmental Law which keeps the City clean and tidy. Needless to say, beautiful and clean cities are hallmarks of economic development and progressive thinking.

Roads have been developed, small canals have been cleaned out, the rainwater draining systems have been cleared and garbage collection has been streamlined. In the last couple of weeks, Colombo did not experience flooding, although there was heavy rainfall. The credit for all these goes to Mr. Gotabaya Rajapaksa, Secretary to the Ministry of Defence and Urban Development.

Sir, we had the privilege of successfully sponsoring the 58th Commonwealth Parliamentary Conference. Democracy has been restored in Sri Lanka and resettlement of displaced and affected families in the North is nearing completion. The Government has taken action to implement the LLRC recommendations which will safeguard the minority issues.

Mega projects such as the Moragahakanda Irrigation Project which provides water to the Iranamadu Tank, the Maththala Airport Project, islandwide road construction, irrigation and water supply schemes, the beautification of cities, towns and the creation of small townships will make Sri Lanka "The Wonder of Asia" within a few years.

Sir, I respectfully request the House to unanimously endorse the eighth Budget of the UPFA. Let us support His Excellency President Mahinda Rajapaksa to lead our nation to the ideal state, where each and every Sri Lankan, regardless of religion, ethnicity, caste, creed and social or economic background, can live peacefully with dignity and contentment.

Thank you.

[பி.ப. 3.44]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அரசாங்கத்தின் எட்டாவது வரவு செலவுத் திட்டம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு முதற்கண் நன்றி தெரிவித்துக்கொள்கின்றேன். 1977களின் பிற்பகுதியிலே ஆரம்பித்த யுத்த வரவு செலவுத் திட்டம் இன்றுவரை தொடர்கிறது. இந்த நாட்டிலே யுத்தத்தை யார் யாருக்கு எதிராக நடத்தினார்கள் என்பது உலகறிந்த விடயம். யுத்தத்திலே வெற்றி பெற்றதற்காக வருடந்தோறும் மிகப் பெருந்தொகையைச் செலவழித்து வெற்றிவிழாக் களியாட்டங்களையும் 'போர் வெற்றியின் அனுபவங்களை எம்முடன் பகிர்ந்துகொள்ளுங்கள்' என்ற சாகச நிகழ்ச்சிகளையும் நடத்துகின்ற இந்த அரசாங்கம், யுத்தம் முடிவடைந்து மூன்று வருடங்கள் கழிந்த பின்னரும் பாதுகாப்புக்கென மிகப் பெருந்தொகை நிதியை ஒதுக்கியிருப்பதானது, தமிழ் மக்களுக்கு எதிரான அரசின் யுத்தம் இன்னமும் முடியவில்லை என்பதையே காட்டகின்றது.

தமிழ் மக்களின் இரண்டரை இலட்சத்துக்கும் மேற்பட்ட வீடுகளைத் தரைமட்டமாக்கி அழித்தொழித்த இராணுவத்தினருக்கு வீட்டுத் திட்டத்தையும் வீடுகளை இழந்துள்ள தமிழ் மக்களுக்குப் பொட்டல் காட்டையும் காட்டி நிற்கின்றது இந்த வரவு செலவுத் திட்டம். வீடுகளை இழந்த தமிழ் மக்கள் மரங்களுக்குக் கீழ் வாழ்ந்துகொண்டிருக்க, வேறு மாகாணங்களில் வாழ்ந்தவர்களை அங்கு சகல வசதிகளுடன்கூடிய வீட்டுத் திட்டங்களில் குடியேற்றி வருகிறது இந்த அரசு. வீடுகளை இழந்தவர்களுக்கு வீடுகளைக் கட்டிக் கொடுக்காதது மட்டுமன்றி, இந்தியாவினால் வழங்கப்படுகின்ற வீடுகளைக்கூடத் தட்டிப்பறித்துள்ள இந்த அரசாங்கம், அவர்கள் உயிர் வாழ்வதை ஆபத்துக்குள்ளாக்கியிருக்கிறது.

யுத்தத்தினால் இடம்பெயர்க்கப்பட்ட சுமார் மூன்று இலட்சம் மக்களை முள்வேலிக்குள் அடைத்துவைத்த நாள் முதல் இன்றுவரை இந்த அரசாங்கம் அம்மக்களின் மீள்குடியேற்ற நடவடிக்கைக்கோ, மறுவாழ்வுக்கோ தனது நிதியில் ஒரு சதத்தைக்கூட ஒதுக்கவில்லை. இக்காலகட்டத்தில் ஐக்கிய நாடுகள் சபை மற்றும் சர்வதேச தொண்டு நிறுவனங்களின் உதவி மட்டுமே எமது மக்களை இன்றுவரையில் உயிருடன் வைத்திருக்கின்றது. மாறாக, அக்காலகட்டத்தில் இவர்களுக்காகப் பெருந்தொகைப் பணத்தைச் செலவழித்ததாக இந்த அரசு போலிப்பிரசாரம் மேற்கொண்டது. இன்றும்கூட வன்னிப் பிரதேசமான முல்லைத்தீவு மாவட்டத்தில் கேப்பாப்பிலவு, மன்னார் மாவட்டத்தில் முள்ளிக்குளம், யாழ்ப்பாண மாவட்டத்தில் வலிகாமம் வடக்கு, கிழக்கு மாகாணத்தில் திருகோணமலையிலுள்ள சம்பூர் உள்ளடங்கலாகப் பல இடங்களிலே நிரந்தரமாக வாழ்ந்துவந்த எமது மக்களுக்கு, மீண்டும் தமது சொந்தக் காணிகளில் மீள்குடியேறுவதற்கான அனுமதி மறுக்கப்பட்டிருக்கிறது. இறுதி யுத்தத்தின்போது இடம்பெயர்க்கப்பட்ட மக்கள் தங்கியிருந்த செட்டிகுளத்தில், சுமார் 6,200 ஏக்கர் காணி உட்பட, பல ஏக்கர் கணக்கான ஏராளமான காணிகள் இன்று வடக்கு, கிழக்கில் அபகரிக்கப்படுகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வீடுகள், கால்நடைகள், தோட்டங்கள், வயல்கள், நான்கு சில்லு உழவு இயந்திரங்கள், இரண்டு சில்லு உழவு இயந்திரங்கள், பார ஊர்திகள், பேருந்துகள், உந்துருளிகள், கார்கள் எனத் தமது வாழ்வாதாரத் தேவைகளுடன் வசதியாக வாழ்ந்த எமது மக்களின் அத்தனை சொத்துக்களையும் வளங்களையும் வாழ்வாதாரங்களையும் 'பயங்கரவாதத்திற்கு எதிரான போர்' என்ற போர்வையில் அழித்தொழித்த இந்த அரசாங்கம், அந்த மக்களின் வீடுகளைக் கட்டவோ, வாழ்வாதாரங்களை மீட்டெடுக்கவோ இந்த வரவு செலவுத் திட்டத்தில் ஒரு சதமேனும் ஒதுக்கவில்லை. மாறாக, அவர்கள் வாழ்ந்து வளப்படுத்திய நிலங்களையும் வாழ்வாதாரங்களாகத் திகழ்ந்த பயன்தரு மரங்களைக்கொண்ட செழிப்பான நிலங்களையும் இராணுவப் பயன்பாட்டுக்கென அபகரித்துக்கொண்டு, பூச்சியத்திலிருந்து வாழ்க்கையைத் தொடங்குமாறு கையேந்து நிலையில், அவர்களைக் காடுகளில் குறுகிய நிலப்பரப்பில் தள்ளியிருக்கின்றது. பொருளாதாரத்தில் தன்னிறைவு பெற்று வாழ்ந்த மக்களை நாதியற்றவர்களாக்கி,

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

கையேந்த வைத்து, அவர்களை உடல் ரீதியாகவும் உள ரீதியாகவும் பலவீனப்படுத்துவதன்மூலம் அவர்களின் ஆயுட்காலத்தைக் குறைக்கும் மறைமுகத் திட்டத்துடன் இந்த அரசு செயற்படுகின்றதா என்ற சந்தேகம் எமக்கு எழுகின்றது. மிருகங்களின் உயிரின்மேல் காட்டப்படும் அக்கறைகூட எமது மக்களின்மேல் காட்டப்படுவதில்லை.

எமது மக்களின் அழிக்கப்பட்ட வாழ்வாதாரங்களை மீட்டெடுக்க எந்தவிதமான ஒதுக்கீடும் இந்த வரவு செலவுத் திட்டத்தில் இல்லை. மாறாக, அவர்களுக்குத் தமது வாழ்வாதாரத்தை மீட்டுக்கொள்ள ஏனைய நாடுகளால் வழங்கப்பட்ட உதவிகளைக்கூட இவ்வரசு தட்டிப்பறிப்பதன்மூலம் அவர்களது வாழ்விற்கான வழிகளை அடைத்து மீளமுடியாத சகதிக்குள் தள்ளுகின்றது. பாதிக்கப்பட்ட விவசாயிகளுக்காக வழங்கப்பட்ட இரு சக்கர உழவு இயந்திரங்களைப் பறித்துச் சிங்கள மக்களுக்கு வழங்கியதற்காக, அதனை வழங்கிய சர்வதேச செஞ்சிலுவைச் சங்க அதிகாரியான பெண்மணி கண்ணீர்விட்டழுத நிகழ்வானது தொலைக்காட்சியிலே காட்டப்பட்டதை இந்தச் சபையும் அரசும் மறந்திருக்காது. இதனைப் போன்றே இந்தியாவும் யுத்தத்தால் பாதிப்புற்ற வடக்கு, கிழக்கு மக்களுக்காக நல்லெண்ணத்துடன் வழங்கிய நான்கு சக்கர உழவு இயந்திரங்களும் பறித்தெடுக்கப்பட்டதை நான் இந்தச் சபையில் ஏற்கெனவே குறிப்பிட்டிருந்தேன். அவை இன்னமும் மீளளிக்கப்படவில்லை என்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

வட மத்திய மாகாணம் வரையிலான குளங்கள் புனரமைக்கப்பட்டுள்ளதாக அரசாங்கம் பிரகடனப்படுத்தியிருக்கிறது. ஆனால், வன்னிப் பகுதியில் உள்ள நூற்றுக்கணக்கான குளங்கள் புனரமைக்கப்படவேண்டும். இதனை நான் கடந்த வரவு செலவு திட்ட உரையிலும் குறிப்பிட்டிருந்தேன். ஆனால், அவை இன்னமும் புனரமைக்கப்படாமல் உள்ளன. மாறாக, மன்னார் மாவட்டத்திலுள்ள சன்னாரைப் போன்று வன்னியிலும் பல குளங்களைச் சுற்றி இராணுவம் தனது முகாமை அமைப்பதன்மூலம் அக்குளங்களின் நீரைப் பயன்படுத்த முடியாமல் மக்கள் தடுக்கப்படுகின்றனர். அதற்கும் மேலாக, பெருமளவு விவசாயிகளின் வாழ்வாதாரத்தின் அடிப்படையாக இருக்கும் இரணைமடுக் குளத்தின் நீர் மட்ட உயரத்தை அதன் அருகில் அமைக்கப்பட்டுள்ள விமானப்படைத் தளத்தின் பாதுகாப்புக் கருதி, 32 அடியிலிருந்து 27 அடியாகக் குறைத்ததன்மூலம் கடந்த போகத்தில் கிளிநொச்சியைச் சேர்ந்த பெருமளவு விவசாயிகளின் நெற்செய்கை அழிக்கப்பட்டது. அன்று விடுதலைப் புலிகள் மாவிலாறின் மடைக்கதவைப் பூட்டியதனால் சிங்கள விவசாயிகளின் நெற்செய்கை பாதிக்கப்பட்டதாகக் கூறிய இந்த அரசு, உடனடியாக அந்த மக்களுக்குப் பெருமளவு இழப்பீட்டு நிதியை வழங்கியதுடன், அதனைக் காரணம்காட்டி மிகப்பெரும் யுத்தமொன்றையும் முன்னெடுத்தது. ஆனால், இன்று குண்டுத்தாக்குதல்களால் முள்ளிவாய்க்கால்வரை விரட்டப்பட்டு, உயிரைத் தவிர ஏனைய அனைத்தையும் இழந்து, கடன்களின் மத்தியிலும் கடின உழைப்பினாலும் பயிர்ச்செய்கை மேற்கொண்ட தமிழ் மக்களின் விவசாயம் திட்டமிட்டு அழிக்கப்பட்டது. விமானப்படையின் தேவைக்காகப் பல்லாயிரக்கணக்கான ஏக்கர் நெற்பயிர்கள் அழிக்கப்பட்டதுடன், அந்நிலங்களும் எதிர்காலத்தில் விவசாயம் செய்யமுடியாத நிலைக்குத் தள்ளப்பட்டுள்ளன. மேலும், 60ஆம் ஆண்டிலிருந்தே அங்கீகரிக்கப்பட்ட தீர்வுத் திட்டங்கள் இருக்கின்றபோது, யாழ்ப்பாணத்தில் குடிநீர்ப் பிரச்சினையைத் தீர்க்கும்வகையில், இரணைமடுக் குளத்திலிருந்து அங்கு தண்ணீர் கொண்டு செல்வதானது, குடிநீருக்காகவும் விவசாயம் உள்ளிட்ட ஏனைய தேவைக்காகவும் இணைமடுக் குளத்தை மட்டுமே நம்பியிருக்கின்ற பல்லாயிரக்கணக்கான மக்களின் அடிப்படைத் தேவையை நிராகரித்து, அவர்களை அங்கு வாழமுடியாமல் செய்து விரட்டுவதை நோக்கமாகக் கொண்டதாகும்.

ஆயுதப் படையினர் எமது மக்கள் மீன்பிடிப்பதற்குத் தடைகளையும் கட்டுப்பாடுகளையும் விதிக்கும் அதேவேளை, வேற்று மாகாணங்களைச் சேர்ந்த பல நூற்றுக்கணக்கானவர்கள் எமது பகுதிகளில் குடியேறி மீன்பிடிப்பதற்குப் பாதுகாப்பளிக்கப்படுகின்றது. இதுபோன்றே தமிழ் மக்களின் விவசாயக் காணிகளில் சிங்களவர்கள் அத்துமீறிப் பயிர்ச்செய்கையில் ஈடுபடுவது வன்னியில் நாளாந்தம் அதிகரித்து வருகின்றது. இவர்களுக்கு முப்படையினரும் பாதுகாப்பளிக்கின்றனர். வடக்கு, கிழக்கில் பாதுகாப்புப் பலப்படுத்தப்படுவதன் தாற்பரியத்தை இது புலப்படுத்துகின்றது. "இடம்பெயர்க்கப்பட்ட மூன்று இலட்சம் பேரை மூன்று ஆண்டுகளுக்குள் குடியேற்றியமை ஓர் உலக சாதனை. அதனை உலகம் புரிந்துகொண்டு பாராட்ட வேண்டும்" என்று பாராட்டுப் பிச்சை கேட்கும் அரசின் மீள்குடியேற்றக் கொள்கை இதுவேயாகும். இது எப்படியிருக்கின்றதென்றால் வழிப்பறிக் கொள்ளைக்காரன் அனைத்தையும் பறித்துக்கொண்டு கொள்ளையடிக்கப்பட்டவனுக்கே பிச்சை போடுவதைப் போன்றதாகும்.

போரில் தப்பிப் பிழைத்த சிறுவர்கள் மற்றும் மாணவர்கள் உட்பட, கணிசமான மக்கள் இன்னமும் தமது உடல்களின் பல பாகங்களிலும் - தலைமுதல் கால்வரை - துப்பாக்கிச் சன்னங்களையும் மற்றும் வெடித்துச் சிதறிய குண்டுகளின் உலோகச் சிதறல்களையும் தாங்கியவண்ணம் தொடர்ந்து நோயாளிகளாக வாழ்கின்றனர். ஆனால், எவ்வளவு பேர் இத்தகைய பாதிப்பிற்குள்ளாகினர் என்ற புள்ளிவிபரம்கூட அரசிடம் கிடையாது. அதுமட்டுமல்ல, முள்வேலிக்குள் மூன்றாண்டு காலம் அடைத்து வைக்கப்பட்டிருந்த மக்களுக்கான குறைந்தபட்ச மனிதாபிமானப் பணியான உயிர்காக்கும் முயற்சியைக்கூட எடுக்கவில்லை. தலைமுதல் கால்வரை உடலின் பல்வேறு பாகங்களிலும் குண்டுகளின் சன்னங்களைத் தாங்கிய மாணவர்கள் பாடசாலைகளில் வாந்தி எடுப்பதும் மயங்கிவிழுவதும் வன்னிப் பாடசாலைகளில் அன்றாட நிகழ்வுகளாகும். தாம் உயிருடன் போராடிக் கொண்டிருக்கின்றோம் என்பதை அறியாமலே தமது எதிர்காலம் பற்றிய கனவுகளோடு வாழும் இந்தக் குழந்தைச் செல்வங்களின் பரிதாபநிலை தெரிந்தும்கூட இவ்வரசு பராமுகமாக இருக்கின்றது. அரசுக்கு எண்ணிக்கை தெரியாவிடினும் பல நூறு பேர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள் என்பது தெரியும். ஆனால், அவர்களின் உயிரைக் காப்பதற்கு அரசு ஒரு சதமேனும் ஒதுக்கவில்லை. குண்டுச் சன்னங்களை உடலில் தாங்கி நோய்க்குள்ளாகியிருக்கும் தமிழ் மக்களின் சிகிச்சைக்கென நிதி ஒதுக்குவதன் அவசியத்தை 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட குழுநிலை விவாதத்திலும் குறிப்பிட்டிருந்தேன். இருந்தபோதிலும், இந்த அரசாங்கம் அதற்கென எந்தவிதமாகவும் நிதி ஒதுக்காதது மட்டுமல்ல, எத்தனை பேர் அதில் பாதிக்கப்பட்டார்கள் என்பதை அறிந்துகொள்ளவாவது முயற்சி செய்யவில்லை. சிங்கள மக்கள் பாதிக்கப்படும்போதெல்லாம் மருத்துவச் செலவு, இழப்பீடு முதலியவற்றுக்கு நிதியொதுக்கி வரும் அரசு, தம்மால் நோய்க்குள்ளாக்கப்பட்ட அந்த மக்களுக்கு மருத்துவ சிகிச்சையைக்கூட மறுப்பதானது, 'அழிவது தமிழர்தானே' என்ற அதன் அலட்சிய மனோபாவத்தின் வெளிப்பாடன்றி வேறென்ன? அரசு இதுபற்றி விளக்க வேண்டும்.

எமது மக்களின் மீள்குடியேற்றம், வாழ்வாதாரங்களை மீட்டெடுத்தல், உடல் பாதிப்புக்குள்ளானவர்களின் நலன்பேணல் முதலிய எந்தவோர் அடிப்படை விடயத்திற்கும் நிதியொதுக்க விரும்பாத போக்கும் எங்களுடைய மக்களுக்கு நடைமுறையில் உரித்தானவற்றைக்கூடப் பறிக்கும் மனிதாபிமானமற்ற போக்கும் தமிழினம் இந்த நாட்டில் இனிமேல் தலையெடுக்கக்கூடாது என்கின்ற ஓர் உறுதியான நிலைப்பாட்டினைச் செயற்படுத்தும் வகையில் இருக்கின்றது. இத்தகைய அணுகுமுறைகளின் நோக்கம், தமிழ் மக்களை விரக்தியடைய வைத்து அவர்களை நாட்டைவிட்டு வெளியேற்றுவது அல்லது சிங்கள பௌத்த மேலாதிக்கத்தை ஏற்றுக்கொண்டு அடங்கி வாழ வைப்பது மற்றும் இவற்றை எதிர்த்து உரிமைக்காகக் குரல் கொடுப்போரை அழிப்பது என்பதாகும். இம்மூன்று விடயங்களும் இன அழிப்பின் வெவ்வேறு வடிவங்களாகும்.

பயன்படுத்தாத நிலங்கள் கையகப்படுத்தப்படும் என்று வரவு செலவுத் திட்டத்தில் குறிப்பிடப்பட்டிருப்பதானது வடக்கு, கிழக்கில் தமிழ் மக்களின் நிலங்களைப் பறிக்கும் கபட நோக்கம் கொண்டதாகும். முடிவடைந்த நீண்டகால யுத்தமானது இலட்சக்கணக்கான தமிழ் மக்களை நாட்டைவிட்டு விரட்டியது. அந்த மக்கள் மீண்டும் நாட்டிற்குள் திரும்ப வந்து தமது நிலங்களில் குடியேறி புதிய வாழ்வைத் தொடங்குவதற்கேற்ற வகையில் அரசியல் தீர்வொன்றைக் காண்பதற்குப் பதிலாக, அவர்களின் வெளியேற்றத்தை அரிய சந்தர்ப்பமாகப் பயன்படுத்தி அவர்களது நிலங்களையும் சொத்துக்களையும் கபளீகரம் செய்ய நினைப்பது, இனப்படுகொலை தொடர்பான ஐ.நா. சபையின் தீர்மானத்திற்கப்பாற்பட்டதாகும்.

எனவே, இந்த இன ஒழிப்பு வரவு செலவுத் திட்டத்தையும் அதன் நோக்கங்களையும் தமிழ்த் தேசியக் கூட்டமைப்பு வன்மையாகக் கண்டிப்பதுடன், அழிக்கப்பட்ட வீடுகளைக் கட்டுவதற்காகவும் அழிக்கப்பட்ட வாழ்வாதாரங்களை மீட்டெடுப்பதற்காகவும் 90 ஆயிரத்திற்கும் மேற்பட்ட விதவைகளுக்கான வாழ்வாதாரங்களை ஏற்படுத்துவதற்காகவும் யுத்தத்தால் அங்கவீனமுற்றோர், காயமடைந்தோருக்கான சிகிச்சை மற்றும் வாழ்வாதாரத்திற்காகவும் வன்னிப் பகுதியில் சிறுநீரக நோயாளிகளின் தேவைகளை நிறைவேற்றும் பொருட்டும் இருதய நோயாளர் பிரிவை ஏற்படுத்தும் பொருட்டும் வவுனியா பொது மருத்துவனையில் சிறுநீரக மற்றும் இருதயநோய் சிகிச்சைப் பிரிவுகளை ஏற்படுத்துவதற்காகவும் யுத்தத்தில் மரணித்தவர்களின் எண்ணிக்கையைச் சரியாகக் கணக்கிட்டு அவர்களின் சொந்தங்களுக்கு நட்டஈடு வழங்குவதற்காகவும் வன்னியிலுள்ள குளங்கள் அனைத்தையும் புனரமைப்பதற்காகவும் தேவையான நிதியினை ஒதுக்க வேண்டுமென ஒரு திருத்தத்தையும் பிரேரிக்கின்றேன்.

மேலும், தமிழ் மக்களின் வாழ்வாதாரங்களை அடாவடித்தனமாகப் பறிப்பதை அரசு நிறுத்த வேண்டும். அத்தகையோருக்குப் பாதுகாப்புக் கொடுப்பதை உடன் நிறுத்தவேண்டுமென்றும் குளங்கள் அனைத்தையும் மக்களின் முழுமையான பயன்பாட்டுக்கு அனுமதிக்க வேண்டுமென்றும் வடக்கு, கிழக்கில் வாழும் தமிழர்களுக்கான நிரந்தர அரசியல் தீர்வு எட்டப்படும்வரை, இந்தப் பிரதேசங்களில் காணிப்பதிவு விடயங்களை நிறுத்த வேண்டுமென்றும் கட்டப்படும் வீடுகளுக்கு வழங்கப்படும் வாழ்வாதார உதவிகள் யுத்தத்தில் அனைத்தையும் இழந்தவர்களைச் சென்றடைவதை வெளிப்படைத்தன்மையுடன் உத்தரவாதப்படுத்த வேண்டுமென்றும் கோருகின்றேன். இல்லாதவிடத்து, இந்த வரவு செலவுத் திட்டமும் அதன் செயற்பாடுகளும் இலங்கை அரசின் இன ஒழிப்புத் திட்டத்தை நிரூபிப்பதாகவே அமையும்.

அத்தோடு, முல்லைத்தீவு மாவட்டத்தில் மீள்குடியேற்றம் செய்யப்பட்டு ஒரு வருடம் கடந்திருக்கின்ற நிலையில் அங்கு குறிப்பாக, கரைதுறைப்பற்று பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட 342 இற்கும் மேற்பட்ட குடும்பங்களுக்குத் தற்காலிகக் கொட்டகைகளைக்கூட அமைத்துக் கொடுக்கவில்லை. தற்போதைய பருவமழை காரணமாக அத்தனை குடும்பங்களும் சிறு குடிசைகளுக்குள் சேறு சகதிக்கு மத்தியில் வாழ்ந்துகொண்டிருக்கின்றன. அவர்களுக்கு இந்த ஒரு வருட காலத்தினுள் 6 தகரங்கள் மட்டுமே வழங்கப்பட்டன. வேறு எந்தவிதமான உதவிகளும் கிடைக்கவில்லை. ஆகவே, வடக்கு, கிழக்கைப் பொறுத்தவரை அங்குள்ள தமிழ் மக்களுக்கு, வருடாந்தம் சமர்ப்பிக்கப்படும் இந்த வரவு செலவுத் திட்டங்களினூடாக எந்தவிதமான உதவிகளும் சென்றடைவதில்லை எனக் குறிப்பிட விரும்புகிறேன்.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කරුණුවලට, මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී මම උත්තර දෙනවා. ඔබතුමා කරුණාකර මට ඒ අවශ්‍ය ටික ලියා එවන්න. මම ඔබතුමාට උත්තර දෙන්නම් මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන කොට.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

நன்றி, அமைச்சர் அவர்களே. அதேபோன்று, மன்னார் மாவட்டத்தின் முசலி பிரதேசத்தைச் சேர்ந்த முள்ளிக்குளம் கிராம மக்கள் அந்தக் கிராமத்தைவிட்டு வெளியேற்றப்பட்டு 5 வருடங்கள் கடந்துவிட்டன. இதுவரை காலமும் அவர்கள் தங்களுடைய உறவினர்கள் மற்றும் நண்பர்களுடன்தான் தங்கியிருந்தார்கள். அந்த வாழ்வு சலித்துப்போன நிலையில் கடந்த 6 மாத காலமாக அந்த 230 குடும்பங்களும் முள்ளிக்குளம் கிராமத்துக்கு அருகாமையிலிருக்கின்ற காட்டுப் பகுதிக்குள் எந்தவித அடிப்படை வசதிகளுமில்லாமல் வாழ்ந்து வருகின்றார்கள். இந்தப் பருவ மழைக்கு மத்தியில் அவர்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். அவர்களுக்குப் போக்குவரத்து வசதிகளோ, ஒழுங்கான பாதை வசதிகளோ இல்லை. தற்காலிகமாகத் தங்குவதற்குக்கூட வீடுகளும் இல்லை. மாணவர்களுக்கான கல்வி வசதியில்லை; கடற்றொழில் வசதி இல்லை. அவர்கள் விவசாயம் செய்வதனைக் கடற்படையினர் தடுத்திருப்பதால் அதுவும் செய்ய முடியாத நிலைவரம்! ஆகவே, எந்தத் தொழிலும் வருமானமும் இல்லாமல் கடந்த ஆறுமாத காலமாக இந்த 230 குடும்பங்கள் அந்தக் காட்டுப் பகுதியில் மழையிலும் பாம்பு, பூச்சிகளுக்கு மத்தியிலும் மிகவும் கொடுமையான ஒரு சூழலில் வாழ்ந்துகொண்டிருக்கின்றன. எனவே, கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்தக் கிராமத்துக்குப் போகவேண்டும்; அங்குள்ள மக்கள் படுகின்ற அவஸ்தைகளை நேரில்சென்று பார்க்கவேண்டும்.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු මන්ත්‍රීතුමනි, මා පසු ගිය දවස්වලත් මුලතිව් ඇතුළු එම සියලු ප්‍රදේශවලට ගිහින්, නැවත පදිංචි කිරීම් කටයුතු ආරම්භ

[ගරු ගුණරත්න වීරකෝන් මහතා]

කළා. මහ කැලෑවල් කියා කියන එක අසත්‍යයක්. ඒවා ශුද්ධ කරලායි තිබෙන්නේ. තමුන්නාන්සේලා මමත් එක්ක එන්න, ඒවා බලන්න යන්න. එම කැලෑවල් ශුද්ධ කරලා ඒවායේ තාවකාලිකව පදිංචි කරවා, ස්ථාවර ගෙවල් හැදීමේ කටයුතු දැන් අපි ආරම්භ කර ගෙන යනවා. එම නිසා මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන අවස්ථාවේදී මා ඔබතුමාට පැහැදිලි උත්තරයක් දෙන්නම්.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் குறிப்பிடுவது முல்லைத்தீவு மாவட்டமல்ல. மன்னார் மாவட்டத்தின் முசலிப் பிரதேசத்திலிருக்கின்ற முள்ளிக்குளம் கிராம மக்கள் பற்றி. தற்பொழுது, அந்த மக்கள் அக்கிராமத்துக்கு அருகில் இருக்கின்ற காட்டில்தான் வசிக்கின்றார்கள். [இடையீடு] நான் அந்தக் கிராமத்துக்கு இரண்டு தடவைகள் சென்று, அங்குள்ள மக்கள் படுகின்ற கஷ்டங்களை நேரடியாகப் பார்த்திருக்கின்றேன். இதுவரைக்கும் அந்த மக்களுக்கு எந்தவிதமான அடிப்படை வசதிகளும் செய்துகொடுக்கப்படவில்லை. [இடையீடு]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

80,000ක්, 85,000ක් ස්ථාවර නිවාසවල පදිංචි කර වීම පහසු දෙයක් නොවෙයි. නමුත් අපි දැන් එම කටයුතු පියවරෙන් පියවර කර ගෙන යනවා. පසු ගිය සතියේ අපි මුලතිව් ප්‍රදේශයේ ගෙවල් 50කට අත්තිවාරම් දැම්මා. අපි එම කටයුතු ක්‍රමානුකූලව කර ගෙන යනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් මට ලියා දෙන්න. මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන කොට මා ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්නම්.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் என்னுடன் வந்தால் நான் உங்களை மன்னார் மாவட்டத்தின் முசலிப் பிரதேசத்திலுள்ள முள்ளிக்குளம் கிராமத்துக்குக் கூட்டிக்கொண்டுபோய் அங்கு மக்கள் படுகின்ற அவஸ்தைகளை நேரடியாகக் காட்டுகின்றேன். இல்லையென்றால், அந்தக் கிராமத்தை ஆக்கிரமித்துக்கொண்டிருக்கின்ற இராணுவத்தினர் மற்றும் கடற்படையினரைக் கேட்டால் தெரியும். அவர்கள்கூட இந்த மக்களுடைய நிலையைப் பார்த்துப் பரிதாபப்படுகின்றார்கள். "உங்களைப் பார்க்கும்போது எங்களுக்குப் பரிதாபமாக இருக்கின்றது; நாங்கள் என்ன செய்யமுடியும்? எங்களுக்கு இந்த இடத்தைவிட்டு அகலுமாறு மேலிடத்திலிருந்து உத்தரவு வருமாக இருந்தால், நாங்கள் இந்த நிமிடமே இவ்விடத்தைவிட்டு வெளியேறத் தயாராக இருக்கின்றோம்" என்று அவர்கள் கூறுகின்றார்கள். ஆகவே, நீங்கள் அங்கே நேரடியாகச் செல்லாவிட்டாலும் அங்குள்ள படையினரிடம் கேளுங்கள், அங்கு அந்த மக்கள் எந்த நிலையில், எப்படி வாழுகின்றார்கள்? என்று. தற்சமயம் அங்கு மாரிகாலம் - மழைக்காலம் - என்பதனால் அப்பிரதேசம் முழுவதும் சேறும் சகதியுமாக உள்ளது. இவ்வாறான காட்டுக்குள்ளேயே குழந்தைகள், கர்ப்பிணிகள் மற்றும் முதியவர்கள் என்று வாழவேண்டியிருக்கின்றது.

இங்கே பலரும் இந்த வரவு-செலவுத் திட்டம் பற்றிப் பலவிதமாகப் பேசினார்கள். இன்று போர் முடிந்து மூன்றரை வருடங்களாகிவிட்டன. இந்த மூன்றரை வருட காலத்திற்குள் எங்களுடைய பகுதியில் போரினால் பாதிக்கப்பட்டவர்களுக்கோ, இடம்பெயர்ந்தவர்களுக்கோ குறைந்தபட்சம் ஒரு தற்காலிக வீடேனும் வழங்கப்படாமல் இருக்கின்றது. தற்பொழுது, பெய்துவருகின்ற மழையினால் எங்களுடைய பகுதியில் நூற்றுக்கணக்கான மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள்.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු මන්ත්‍රීතුමනි, තිස් අවුරුද්දක් තිස්සේ තිබුණු ත්‍රස්තවාදයෙන් විනාශ වුණු ප්‍රදේශයි මේවා. තිස් අවුරුද්දක ප්‍රශ්නයක් මේ. මෙය අවුරුදු තුනකින් ප්‍රතිසංවර්ධනය කිරීම පහසු කටයුත්තක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් මා අවස්ථා ගණනාවකදීම මෙම පාර්ලිමේන්තුවේදී කිව්වා. අපට බරපතළ ප්‍රශ්නය වෙලා තිබුණේ, සෙට්ටිකුලම් ප්‍රදේශයේ තිබුණු කඳවුරුවල හිටපු පවුල් 85,000ක් කොහේ හෝ නැවත පදිංචි කර වීමයි. දැන් අපි ඒ කටයුතු ආරම්භ කරලා කර ගෙන යනවා. එම නිසා ඔබතුමන්ලාත් මේ ගැන කල්පනා කරන්න. තිස් අවුරුද්දක් තිස්සේ විනාශ කරපු ප්‍රදේශයක් අවුරුදු තුනකින් ප්‍රතිසංවර්ධනය කරන්න බැහැ. අපට පුළුවන් විධියට අපි ඒ කටයුතු කර ගෙන යනවා. නැහැයි කියන්න බැහැ නේ. මමත් එක්ක මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා සහභාගි වුණා. සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා මමත් එක්ක ඒ ප්‍රදේශවලට ගියා. අපි කණ්ඩායමක් හැටියට එම ප්‍රදේශවලට ගිහින් උදවු කළා. අහලා බලන්න, එතුමාගෙන්. මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමාගෙන් අහලා බලන්න. සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාගෙන් අහලා බලන්න. 2010 ගංවතුර ව්‍යසනය ඇති වුණු වෙලාවේ අපි ගිහින් පවුල් 10,000කට පුළුවන් තරම් උදවු කළා. අපි සියලු දෙනාම එකට ගියේ. මේක පහසු දෙයක් නොවෙයි. අවුරුදු 30ක් තිස්සේ සිදු වී තිබෙන විනාශයක් ලේසියෙන් හදන්න බැහැ. අපි කවුරුත් එකතු වෙලා මෙම කටයුතු කරමු.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

நன்றி. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முப்பது வருட போரினைப் பற்றிச் சொல்கின்றீர்கள். ஆனால், நான் சொன்ன விடயம், 300 வருடங்களுக்குமேல் பழைமைவாய்ந்த முள்ளிக்குளம் கிராம மக்களை இன்னமும் - யுத்தம் முடிவடைந்து மூன்றரை வருடங்களாகிவிட்ட நிலையிலும் - அவர்களது சொந்த இடங்களில் குடியேற்றவில்லை என்பதைப் பற்றித்தான். அந்த மக்கள் சொந்த இடங்களில் இன்னமும் ஏன் குடியேற்றப்படவில்லை? கடற்படையினருக்கு அல்லது இராணுவத்தினருக்கு அல்லது வேறு யாருக்காவது முகாம் அமைப்பதற்கு இடம் தேவையாக இருந்தால், அதற்கேற்றவாறு வேறிடங்களில் எத்தனையோ ஏக்கர் காணிகள் இருக்கின்றன; காடுகள் இருக்கின்றன. அங்குபோய் அவர்கள் தங்களுக்குத் தேவையான முகாமைப் பெரிய அளவில் அமைத்துக்கொள்ளலாம். இது அவர்கள் காலாகாலமாக வாழ்ந்ததும் 300 வருடங்கள் பழமைவாய்ந்ததுமான கிராமம். அந்தக் கிராமத்தை அண்டிய வயற்காணிகள், குளங்கள் என்பன அவர்களின் பூர்வீகச் சொத்துக்கள். கடற்படையினர் அந்த இடத்திற்குப் போய் அவர்களை அங்கு மீளக் குடியேறவிடாமல் தடுத்தமையாலேயே அந்த 230 குடும்பங்களும் தங்களது சொந்தக் கிராமத்திலே மீளக் குடியேறவிடுமாறு கேட்டு, அந்தக் காட்டுப் பகுதியிலே ஆறு மாத காலமாக இருக்கின்றார்கள் என்பதைத்தான் நான் இங்கு சொல்கின்றேன். அதாவது வடக்கு, கிழக்கிலே போருக்கு முதல் எங்கெங்கே எல்லாம் அந்த மக்கள் குடியிருந்தார்களோ, அந்த இடங்களிலே - அவரவர் சொந்தக் கிராமத்தில் - அவர்கள்

மீளக் குடியேற்றப்பட வேண்டும் என்பதுதான் எமது கோரிக்கை. ஆகவே, நீங்கள் தயவுசெய்து மேதகு ஜனாதிபதி அவர்களிடம் இந்த விடயத்தைச் சொல்லி அதனை நிறைவு செய்து தர வேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன். இந்த முள்ளிக்குளம் மக்களும் அதேமாதிரி கேப்பாப்பிலவு, கருநாட்டுக்கேணி, கொக்கிளாய் போன்ற இடங்களில் இறுதியாகக் குடியேறிய மக்களும் மிகுந்த சிரமங்களுக்கு மத்தியில் வாழ்ந்து வருகின்றார்கள். எனவே, இவர்களுக்கு அவசரமாகத் தேவைப்படும் மனிதாபிமான உதவிகள் செய்யப்பட வேண்டும்

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

அதேபோல முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்று மீனவர்களைப் பொறுத்தவரையில் அவர்கள் மீளக் குடியேறி ஒரு வருட காலமாகிவிட்டது. ஆனால், அவர்கள் அங்கு கடற்றொழிலுக்கும் போக முடியாது; விவசாயமும் செய்ய முடியாது. ஏனென்றால் தென்பகுதியைச் சேர்ந்த 300க்கும் மேற்பட்ட மீனவர்கள் அவர்களுக்குரிய பகுதியில் சட்டவிரோதமான முறையில் தொழில் செய்து கொண்டிருக்கின்றார்கள். இது அந்த மக்களின் முதலாவது பிரச்சினை. இரண்டாவது பிரச்சினை, கொக்கிளாய் பகுதியைச் சேர்ந்த விவசாயிகளுக்குச் சொந்தமான பல்லாயிரக்கணக்கான விவசாய நிலங்களிலும் மற்றும் மேட்டு நிலங்களிலும் தற்சமயம் வெலிஓயா பிரதேசச் செயலகத்தின் அனுமதியுடன் அவசர அவசரமாக வேறு ஆட்கள் குடியேற்றப்படுகின்றமையாகும். ஆகவே, இந்நடவடிக்கைகள் எல்லாம் தடுத்து நிறுத்தப்பட வேண்டும். அதாவது அத்துமீறிய குடியேற்றங்கள் நிறுத்தப்பட வேண்டும். ஆகவே, இடம்பெயர்ந்த அந்த மக்கள் தமது சொந்த இடங்களில் மீள்குடியேற்றப்பட வேண்டும் என்பது எனது கோரிக்கையாகும்.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

නැවත පදිංචි කිරීමේ කටයුතුවලදී කවුරුවත් බලහත්කාරයෙන් පදිංචි කරවන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, දැනට එතුමාගේ වෙලාව අවසන් වෙලා තිබෙනවා. ඔබතුමාගේ වෙලාවේදී එයට උත්තර දෙන්න. දැන් එතුමාට වෙලාවක් නැහැ, ගරු ඇමතිතුමනි.

கௌரவ உறுப்பினர் அவர்களே! இப்பொழுது உங்களுடைய பேச்சை முடித்துக் கொள்ளவும்.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ அமைச்சர் அவர்களே! உங்களுக்குரிய நேரத்திலே பதிலளிக்கும்படி நான் கேட்கின்றேன். [இடையீடு]

அடுத்ததாக,போர் முடிந்து மூன்றரை வருடங்கள் கடந்தும்கூட, இலங்கையில் இருக்கின்ற சிறைச்சாலைகளில் 700க்கும் மேற்பட்ட தமிழ் அரசியல் கைதிகள் இன்றுவரையும் எந்த வழக்கு விசாரணையும் இல்லாமல் மிகுந்த கஷ்டங்களின் மத்தியில் இருக்கின்றார்கள். ஆனால், தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தில் இருந்த முக்கியஸ்தர்கள் சிலர் இன்று அமைச்சர் மற்றும் முதலமைச்சர் போன்ற பதவிகளை வகிக்கின்றார்கள். அரசாங்கம் அவர்களுக்குத் தேவையான சகல வசதிகளையும் செய்து கொடுத்துள்ளது. ஆகவே, சந்தேகத்தின்பேரில் கைது செய்யப்பட்டவர்களின் வழக்குகளைத் துரிதப்படுத்தி, அவர்களை விடுதலை செய்வதற்கு நடவடிக்கை எடுக்கும்படி கேட்டு, என்னுடைய உரையை முடிக்கின்றேன். நன்றி. வணக்கம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. S.M. Chandrasena. Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. R. YOGARAJAN *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

[අ.භා. 4.11]

**ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට අටවන අය වැය ඉදිරිපත් කිරීම මා හිතන හැටියට එතුමා ලැබූ විශාල ජයග්‍රහණයක්. විශේෂයෙන්ම පළමුවන අය වැයේ සිට මෙම අටවන අය වැය දක්වා එතුමා දීර්ඝ සංවර්ධන ක්‍රියාවලියක් ඉදිරියට ගෙන ගිහින් තිබෙනවාය කියන එක රටේ තොටේ ඇවිදින කොට අපි ඕනෑ කෙනකුට පෙනෙන දෙයක්. ඒ වාගේම මෙම අටවන අය වැය ලේඛනය විශේෂයෙන්ම හැම ක්ෂේත්‍රයකම දැවැන්ත සංවර්ධනයක් ඇතුළත් අය වැයක් හැටියටත් අපට දකින්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට ජනතාව බඩු මිල අඩු වෙයි කියලා radio එක ළඟ, TV එක ළඟ අහගෙන ඉන්නවාය කියලා. එහෙම කාලයක් තිබුණා. සිගරැට්, අරක්කු, ඒ වාගේම සීනි, පරිප්පු, කිරි පිටි, පාන් පිටි වාගේ දේවල්වල මිල අඩු වැඩි කරන මිල දර්ශනයක් හැටියට තමයි ඒ කාලයේ අය වැය ලේඛනය දැක්කේ. මෙම අය වැය ලේඛනය කඩේ තිබෙන මිල දර්ශනයක් නොවෙයි, ඊට එහාට ගිය ඉතාම දැවැන්ත සංවර්ධනයක් ඇතුළත් අය වැය ලේඛනයක්. මෙම අය වැය ලේඛනය, අවුරුදු 30ක් යුද්ධයට හසු වෙලා තිබුණු රටක්, ත්‍රස්තවාදයට හසු වෙලා තිබුණු රටක් සංවර්ධනය කරන්න අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන, ශක්තිය ලබා දෙන අය වැය ලේඛනයක්. ඒ බව මෙම අය වැය ලේඛනය දකින කොට, පරිශීලනය කරන කොට, අධ්‍යයනය කරන කොට අප කාටත් පෙනී යනවා. මෙම අය වැය ලේඛනයේ දොස් කියන්න, අඩු පාඩු කියන්න හිතේ තබා ගෙන ඉන්නවා නම් කොපමණ හොඳ අය වැය ලේඛනයක් ඉදිරිපත් කළත් වැඩක් නැහැ, එහි නරක පැත්ත තමයි දකින්නේ.

[ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා]

අප මධ්‍යස්ථව බැලුවොත් පෙනෙනවා මේ අය වැය ඉතාම වටිනා අය වැයක් බව. මේක අපේ රට සංවර්ධනය කරන අය වැයක්. අපේ රටේ පාරවල් ටික හදන්න, අපේ රටේ විදුලිය නැති ගම්වලට විදුලිය ලබා දෙන්න, අපේ ග්‍රාමීය සංවර්ධනය ඇති කරන්න, කෘෂි කාර්මික සංවර්ධන කටයුතු කරන්න, රැකියා ලබා දෙන ව්‍යාපෘති ආරම්භ කරන්න යෝජනා කළ අය වැයක් මේක. විශේෂයෙන්ම මේ අය වැයේ ගොවි ජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඇතුළත් කර තිබෙනවා. අපේ රටේ සමහර ගොවි මහත්වරු වී මිල වැඩි කරන්න කියලා පසු ගිය කාලයේ පෙළපාළි ගියා. රුපියල් 28ක් නොවෙයි අඩු ගණනේ වී කිලෝවක් රුපියල් 32ක්වත් කරන්න කියලා ඔවුන් ඉල්ලුවා. අතිගරු ජනාධිපතිතුමාගේ අය වැයේ තිබෙනවා, "වී කිලෝවක සහතික මිල රුපියල් 32 සිට 35 දක්වා වැඩි කරනවා" කියලා. එතුමා කිව්වා අප ඉදිරි කාලයේදී වී වල සහතික මිල වැඩි කරනවා කියලා. එතුමා දුන්නු ඒ පොරොන්දුව මේ අය වැයෙන් ඉෂ්ට කර තිබෙනවා.

අද රසායනික පොහොර සහ කෘමි නාශක භාවිත කිරීම නිසා අපේ පරිසරයට හානියක් වෙලා තිබෙනවා. මේ රසායනික පොහොර පාවිච්චිය වැඩි නිසා නොයෙක් ආකාරයේ ලෙඩ දුක් හැදෙනවාය කියන කාරණය පසු ගිය කාලයේ අපේ රටේ කථා බහට ලක් වුණා. එතුමා ඒකටත් පිළියමක් හැටියට අපේ රටේ කාබනික පොහොර ව්‍යාප්තියට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ගොවි ජනතාව කාබනික පොහොර භාවිතයට හුරු පුරුදු කරන යෝජනාත් මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා.

ඉන් එක් යෝජනාවක් තමයි කාබනික පොහොර කිලෝ එකක් රුපියල් 8 ගණනේ රජය මඟින් මිල දී ගැනීම. ඒ අනුව කිලෝ පණහේ කාබනික පොහොර මිටියක් රුපියල් 400කට මිලදී ගන්න එතුමා යෝජනා කර තිබෙනවා. ඉස්සර මෙවැනි යෝජනා තිබුණේ නැහැ. මේ කාබනික පොහොර ගැන මීට පෙර අය වැය ලේඛනවල සඳහන් වෙලා තිබුණේ නැහැ. නමුත් එතුමා මේ රට ගැන ගැඹුරින් හිතලා, රටේ කෘෂිකර්මය ගැන හිතලා අද ඒ කාර්ය භාරය ඉෂ්ට කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාව කෘෂි කාර්මික රටක්. මහා වාරිමාර්ග, මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග සහ සුළු වාරිමාර්ග 30,000ක් පමණ මේ රටේ තිබෙනවා. අපේ රටේ දිස්ත්‍රික්ක 13කට පමණ දරුණු නියඟයක් බලපෑවා. විශේෂයෙන්ම රජ රට ප්‍රදේශයේ වැව් අමුණු සිඳිලා ගියා. ඒ වෙලාවේ එතුමා වැව් හැරීමේ -රොන් මඩ ඉවත් කිරීමේ- ව්‍යාපෘතිය ආරම්භ කළා. ඒ ව්‍යාපෘතිය තවත් ඉදිරියට අරගෙන යන්න මේ අය වැයෙන් විශාල මුදලක් එතුමා වෙන් කර තිබෙනවා. මා හිතන හැටියට අවුරුදු ගණනකින් අපේ වැව් හැරුවේ නැහැ. රජ කාලයෙන් පස්සේ අපේ රටේ කැඩිච්ච වැව් අප හැදුවා; වැව් බැම් හැදුවා; නමුත් රොන් මඩ ඉවත් කරලා ඒ වැව් හාරන්න එක රාජ්‍ය නායකයෙක්වත් කටයුතු කළේ නැහැ. ඒ කටයුත්ත එතුමා දැන් කරගෙන යනවා; ඒ කටයුත්ත කරන්න අවශ්‍ය පහසුකම් සලසලා තිබෙනවා.

අප දන්නවා වගාවකට නියඟයකින්, ගංවතුරකින්, සුළි සුළඟකින් හෝ සතුන්ගෙන් හානි වුණාම ගොවියා ඉතාම අපහසු තත්ත්වයට පත් වන බව; පීඩාවට පත් වන බව. ඒ ගොවියා රැක ගන්න අද රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙනවා. කිලෝ 50ක රසායනික පොහොර බෑග් එකක් ගන්න හැම කෙනෙකුගෙන්ම රුපියල් 150ක රක්ෂණ ගාස්තුවක් අය කිරීම තුළින් මේ ක්‍රියාවලිය දිරිමත් කර තිබෙනවා.

මට ඇසුණා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා, "පොහොර මිටිය රුපියල් 500 කළා"ය කියලා. රුපියල් 350 වක්‍රව රුපියල් 500ක් කිරීමක් ලු, කළේ. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. ඒ රුපියල් 150 ගොවියා වෙනුවෙන්, ගොවියාගේ රක්ෂණය වෙනුවෙන් වෙන් කරන්නේ. අප දැක්කා පසු ගිය කාලයේ විශාල වගා විනාශයක් වුණු වෙලාවේ, තමන්ගේ වගාවන් කෘෂි රක්ෂණ මණ්ඩලයේ රක්ෂණය කර තිබුණු සමහර අයට වන්දි ලැබුණු බව. අනික් අයට වන්දි දෙන්න රජයට විශාල මුදලක් දරන්න වුණා. ඒත් රජයෙන් පුළුවන් පුළුවන් සහන ලබා දුන්නා. නමුත් මීට පස්සේ ස්ථිරවම -එක්කෝ නියඟයකට වෙන්න පුළුවන්, ගං වතුරකට වෙන්න පුළුවන්, වන අලින්ගෙන් සහ සතුන්ගෙන් වෙන හානියකට වෙන්න පුළුවන්- රක්ෂණය කරන්න තමයි මේ රුපියල් 150 ගොවි මහත්තයෙකුගෙන් අය කරන්නේ. ඒක මේ රජය අය කරන මුදලක් නොවෙයි. එහි ප්‍රතිලාභය නැවත ඒ ගොවියාට ලැබෙනවා. ගොවියා ඒ අවදානමෙන් මිදෙනවා. ඒ සඳහා තමයි පොහොර මිටියකින් රුපියල් 150ක් අය කරන්න කටයුතු කළේ. ඒක රජය අය කර ගන්න බද්දක් නොවෙයි, ගොවියා වෙනුවෙන්ම වෙන් කරන රක්ෂණ ක්‍රමයකට අය කරන මුදලක්. ඉතාම ශක්තිමත් රක්ෂණ ක්‍රමයක් හදලා දෙන්න තමයි ඒ කටයුත්ත කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හිතන්නේ ඉතිහාසයේ එකම අය වැයකවත් ගොවි ජනතාව වෙනුවෙන් මෙපමණ සහන දීලා නැහැ කියායි. මොකද, වාරි මාර්ග ක්ෂේත්‍රය සඳහා -මහා වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න, සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න, ගංගා හරස් කරලා මොරගහකන්ද ව්‍යාපාරය වාගේ ඒවා ඉදිරියට අරගෙන යන්න- මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ උතුරේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, උතුරට සලකන්නේ නැහැ කියලා. සලකන හැටි අද උතුරට ගිහින් බලන්න ඕනෑ. A9 පාර අරගෙන බලන්න. මම ගිය සතියේ අනුරාධපුරයේ ඉඳලා A9 පාරේ ගියා. මා හිතන්නේ, එතුමන්ලා නම් යන්නේ නැහැ කියලායි. අපි ගොඩක් ඈත ප්‍රදේශවලට යනවා. ඒවායේ ඇවිදලා ජනතාව ගැන සොයනවා. අපේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාත් ඒ ගැන දන්නවා. එතුමාත් ඒ ප්‍රදේශයේයි. යුද්ධය ඉවර වුණ අලුත අපි A9 පාරේ යන කොට අපට පැය 7ක්, 8ක් විතර ගියා. ගිය සතියේ මම අනුරාධපුරයේ ඉඳන් A9 පාරේ ගියා. මට පැය දෙකයි කාලයි ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම උතුරේ විදුලිය සැපයුම සම්බන්ධයෙන් බලන්න. ඒ ප්‍රදේශයේ හැම ගමකටම පාහේ විදුලිය ලබා දීලා තිබෙනවා. දැන් මොරගහකන්ද ජලාශයේ සිට ඉරණමඩු දක්වා ව්‍යාපෘතියක් සැලසුම් කර තිබෙනවා. ඒ, උතුරට වතුර ගෙන යන්නයි. ළඟදී එහි වැඩ පටන් ගන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. ඒ ප්‍රදේශයේ කඩා වැටිලා තිබුණු සියල්ල අද ප්‍රතිසංස්කරණය කරනවා. වැව් අමුණු, ක්‍රීඩා පිට්ටනි, රෝහල්, කච්චේරි, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, උසාවි ආදිය හදනවා. එල්ටීටීඊ එකේ ප්‍රභාකරන්ගේ උසාවි වහලා අද කිලිනොච්චියේ රජයේ උසාවි ඇරලා තිබෙනවා. යාපනයේ පිහිනුම් තටාක හදලා තිබෙනවා. ඒ ප්‍රදේශයට දෙන්න පුළුවන් උපරිම දේ දෙනවා.

මා හිතන්නේ මේ පැත්තේ සංවර්ධනයට වඩා විශාල සංවර්ධනයක් උතුරේත් නැඟෙනහිරත් කෙරෙනවා කියායි. මේවාට ස්තුති කරන්න ඕනෑ. ස්තුති කරන්නේ නැතිව මඩ ගහනවා. උතුරේ මන්ත්‍රීවරු ජාත්‍යන්තරයට වාර්තා කරන්න මේ උත්තරීතර සභාව පාවිච්චි කරනවා. ඒ පිළිබඳව නම් ඉතාම කනගාටුයි. මොකද, අපි යන එන නිසා දන්නවා ඒ ප්‍රදේශවල සංවර්ධනය ගැන. යුද්ධයෙන් විනාශ වුණ කිසිම රටක ඒ වාගේ සංවර්ධනයක් කෙරිලා නැහැ. කෙරෙන්නේ නැහැ. අපේ මැති

ඇමතිවරු එහේ ගිහිල්ලා විශාල වැඩ කොටසක් කරනවා. දකුණේ -මේ ප්‍රදේශවල- අය කියනවා උතුරට සලකනවා වැඩියි කියලා. එහෙමයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාත් යාපනය ප්‍රදේශයේ හොඳින් වැඩ කරන බව අපි දන්නවා. ඒ ප්‍රදේශවල කෙරෙන සංවර්ධනය ගැන එතුමන්ලා හොඳට දන්නවා. අපි එහේ යන එන නිසා ඒ ගැන දන්නවා. හැබැයි එහේ යන්නේ නැති, ඒ පැත්තවත් බලන්නේ නැති සමහර අය කවුරු හරි වැරැදි යමක් කිව්වාම ඇවිත් ඒක කියනවා. වැරැදි තොරතුරක් කොළ කැල්ලක ලියලා එව්වාම මෙතැන ඇවිල්ලා ඒක කියවනවා. ඒක තමයි තත්ත්වය. එහේ යන එන අය නම් ඒ ප්‍රදේශවල දියුණුව දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඒ ප්‍රදේශවල ධීවර කර්මාන්තය ගන බලන්න. ඒ ප්‍රදේශවල ධීවර කර්මාන්තය විශාල වශයෙන් සිදු වෙනවා. අපේ මුහුදු සීමාවෙන් තුනෙන් දෙකක් තිබෙන්නේ උතුරු නැඟෙනහිරටයි. එය සම්පූර්ණයෙන් ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදයට යට වෙලායි තිබුණේ. අද එහි ධීවර කර්මාන්තය දියුණු වෙලා තිබෙනවා. අද ධීවරයන්ට විශාල ආදායමක් ලැබෙනවා. උතුරේ ජනතාවට විශාල ආදායමක් ලැබෙනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ දුම්රිය මාර්ග හදනවා. ලබන අවුරුද්ද වෙන කොට තවත් පාරවල් හදනවා. මන්නාරමට, යාපනයට පාරවල් හදනවා. අපේ පැත්තේ පාරවලට වඩා ඒ පැත්තේ පාරවල් හොඳයි. Air-conditioned buses දුවනවා. මේ විධියට බැලුවාම ඒ පැත්ත තමයි මෙහේට වඩා දියුණු කරන්නේ. ඉතින් ඒවා සම්බන්ධයෙන් ස්තුති කරන්න ඕනෑ. එහෙම කරනවා කවදාවත් අපි අහලා නැහැ. ඒවාට ස්තුතියි කියලා කියන්න හයියක් නැති එක පිළිබඳව අපි කනගාටු වෙනවා. උතුරේ මන්ත්‍රීවරුන්ට එහෙම හදවත් නැති එක පිළිබඳව අපි කනගාටු වෙනවා. තවමත් ඒ අය බලන්නේ අර පරණ විධියටමයි. නිල නොවන ත්‍රස්තවාදය පතුරුවා හරින්න තමයි ඒ අය හදන්නේ. ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදයේ හෙවණැලි බවට ඒ අය තවමත් පත් වෙලා ඉන්නවා. ඒ පිළිබඳව නම් අපි ඉතාම කනගාටු වෙනවා. උතුරේ එක මන්ත්‍රීවරයෙක් කිව්වා ඒ අයට අලින්ගෙන් ගොඩක් කරදර තිබෙනවා කියලා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොහේටද? යාපනයටද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්, මම අහගෙන හිටියා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
යාපනයටද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ ගොල්ලන්ට තිබුණු අර කොටි කරදරය දැන් මතක නැහැ. අලින්ගෙන් කරදර තිබෙනවා ලු.

ඉතින් මේ වාගේ රටේ නැති ඒවා කියනවා. නැති ප්‍රශ්න ඇති කරනවා. මෙතැනට ඇවිල්ලා නැති ප්‍රශ්න නිර්මාණය කරනවා. නැති ප්‍රශ්න නිර්මාණය කරලා, ඒවා record කරලා, පාර්ලිමේන්තුවේදී කථා කළා කියලා ජාත්‍යන්තරයට යවනවා. ඒවා තමයි එතුමන්ලාගේ වැඩ කටයුතු. නමුත් අපි දන්නවා මේ රට හදන්න පහළ වුණු එකම නායකයා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බව. ඒක අපි කවුරුත් දන්නා දෙයක්. අපි ඒක හිතට එකඟව කියන්න ඕනෑ. හැබැයි ඒක කියන්න බැහැ, ආණ්ඩු පිහිටුවන්න ඉන්න අයට; ආණ්ඩු හදන්න බලාපොරොත්තුව ඉන්න අයට; කවදාවත් ආණ්ඩු හදන්න බැරි අයට. ආණ්ඩු හැදීමක් පෙනෙන තෙක් මානයේවත් නැති අය මෙතැනට ඇවිල්ලා මොන මොනවා හරි කියනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බබා වඩාගෙන-

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේත් වැරැදියි. මම බලාගෙන හිටියා කෘෂිකර්මය පිළිබඳව වැරැදි තොරතුරු -[බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බබා වඩාගෙන ආණ්ඩුවට ආවේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමා බබා වඩාගෙන තමයි ආණ්ඩුවට එකතු වුණේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොන බබාද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පලා බබා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා නොවෙයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අස්වර් මන්ත්‍රීතුමාද? [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට විශේෂයෙන් කියන්න ඕනෑ, වී නිෂ්පාදනය ගැන. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. අපි දන්නවා, ඉස්සර සමුපකාරයෙන් හාල් ටික ගන්න පෝලිමේ බලා ගෙන

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

හිටියා; බුරුමයෙන් හාල් එන තුරු බලා ගෙන හිටියාය කියලා. [බාධා කිරීම්] ඒ වුණාට පොහොර සහනාධාරය ලබා දුන්නාට පස්සේ තමයි -

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
වැඩිය වැව් හදලා තිබෙන්නේ අපේ රජය කාලයේයි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මොරගහකන්ද, දැදුරු ඔය, යාන් ඔය වාගේ ඒවා අපත් හදනවා. තමුන්නාන්සේලාගේ කාලයේත් කොටසක් හදන්න ඇති. ඩී.එස්. සේනානායක මහත්තයාත් හැදුවා. බණ්ඩාරනායක මහත්මයා වාගේ හිටපු අගමැතිවරු යම් කිසි ප්‍රමාණයකට වැව් හැදුවා. නමුත් හාල් පිට රටින් ගෙනාවා. ඔන්න ඕකයි තත්ත්වය. නමුත් අද අපිට වැඩිපුරත් එක්ක හාල් තිබෙනවා. ගංවතුර එන කොට හුඟ දෙනෙක් ඇහුවා, "හාල් පිට රටින් ගෙනෙන්න වෙයිද?" කියලා. අපි කිව්වා, "හාල් පිට රටින් ගෙනෙන්න වෙන්නේ නැහැ"යි කියලා. විශේෂයෙන්ම වී වගා කරන දිස්ත්‍රික්ක 13ක් නියඟයට හසු වුණා. කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව, වව්නියාව, ත්‍රිකුණාමලය පැත්තේ නියඟය ඇති වෙලාත් එක හාල් ඇටයක් අපි පිට රටින් ගෙනාවේ නැහැ. ගබඩාවල තවත් වී අතිරික්තයක් තිබෙනවා. ඕකයි රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය. කෘෂිකාර්මික ප්‍රතිපත්තිය හොඳ නිසා තමයි අද අපට අවශ්‍ය සහල් ප්‍රමාණය -වී ප්‍රමාණය- නිෂ්පාදනය කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

රට සංවර්ධනය වෙලා තිබෙනවාය කියලා ප්‍රායෝගිකව අපි කවුරුත් දන්නවා. හැම පැත්තෙන්ම රට සංවර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම කෘෂිකර්මයෙන් රට සංවර්ධනය වෙලා තිබෙනවා. පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙන් පස්සේ ආහාරවලින් රට ස්වයංපෝෂිත වෙලා තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේ ඉතාම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.26]

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)
அக்கிராசனத்தில் அமர்ந்திருக்கும் கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்த வரவு செலவுத் திட்டத்தில் நாட்டின் அபிவிருத்திக்கான பல அம்சங்கள் நிறைந்துள்ளமையை நாங்கள் காணக்கூடியதாக உள்ளது. வறுமையற்ற நிலையை உருவாக்குவதற்கும் உணவு, நீர், தரமான கல்வி மற்றும் தொழில்நுட்பத்துடன் புரட்சிகரமான பாதையில் நாட்டை முன்னெடுத்துச் செல்வதற்குமான பல விடயங்கள் இதில் காணப்படுகின்றன. குறிப்பாக, கல்வித்துறையை முன்னெடுத்துச் செல்வதற்காக, நம் மத்தியில் அடிமட்டத்தில் வாழ்ந்துகொண்டிருக்கும் சிறார்களுக்குத் தேவையான பாடநூல்கள், சீருடைகள், பருவகாலச் சீட்டுக்கள், மதிய உணவு போன்றவற்றை இலவசமாக வழங்க இருப்பதன்மூலம் அவர்களது கல்வித் திறனை வளர்க்கக்கூடியதாக இருக்கும். இம்முறை கல்விக்காக ஒதுக்கப்பட்டிருப்பது தேசிய வருமானத்தில் 4.1 சதவீதமாகும். கல்வித்துறைக்கான நிதி ஒதுக்கீடு மிகவும் திருப்திகரமாக உள்ளது. அந்தத் துறையில் அக்கறையுடன் செயற்படும் எனக்கு மிகவும் சந்தோசமாக இருக்கின்றது.

இருப்பினும், எமது நாட்டுக்குப் பல தலைமுறைகளாக அந்நியச் செலாவணியைப் பெற்றுக்கொடுக்கும் பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு நேரடி நலன்சார் விடயங்கள் எதுவும் இந்த வரவு செலவுத் திட்டத்தில் குறிப்பிடப்படாமை கவலைக்குரிய ஒரு விடயமாகும். இன்று அரசாங்கத்தினால் பல அபிவிருத்தித் திட்டங்கள் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு எடுத்துச் செல்லப்படுகின்றன. யுத்தத்தினால் பாதிக்கப்பட்ட இம்மாகாணங்களுக்கு அபிவிருத்தி தேவைப்படுகின்றது என்பதில் இரண்டு கருத்துக்கு இடமில்லை என்பதை நான் ஏற்றுக்கொள்கின்றேன். இருப்பினும் யுத்த காலகட்டத்திலும் சரி, யுத்தத்துக்குப் பின்பும் சரி, எவராலும் கவனிக்கப்படாமல் 10 அடி 'லயின்' அறைகளில் வாழ்ந்துகொண்டிருக்கும் பெருந்தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைமுறை பற்றி நாங்கள் சற்று சிந்தித்துப் பார்க்கவேண்டும். ஏனென்றால், முறையான கல்வி, முறையான சுகாதார வசதி, வீடு வசதிகள் என்பன இல்லாமல் அவர்களில் பெரும்பாலானவர்கள் மதுவுக்கு அடிமையாகி வாழ்ந்துகொண்டிருக்கிறார்கள். எனவே, நாங்கள் அவர்களையிட்டுச் சற்று அவதானம் செலுத்த வேண்டுமென வேண்டிக்கொள்கின்றேன்.

பெருந்தோட்டத் தொழிலாளர்கள் மத்தியில் விழிப்புணர்வை ஏற்படுத்துவதற்கான திட்டங்களை அரசாங்கமே முன்னெடுக்குமாயின், இவர்களது ஏழ்மையை காட்டிப் பணம் சம்பாதிக்கும் அரச சார்பற்ற நிறுவனங்களைத் தடுத்து நிறுத்தக்கூடியதாக இருக்குமென நான் நினைக்கின்றேன். பெருந்தோட்டங்களில் பயன்படுத்தப்படாத நிலையிலுள்ள பல்லாயிரம் ஏக்கர் நிலங்கள் இன்று இனங்காணப்பட்டுள்ளன. இந்த நிலங்களை 12,500 இளைஞர்களுக்குப் பல வருடகால குத்தகைக்கு வழங்கப்போவதாக மேதகு ஜனாதிபதி அவர்கள் வரவு செலவுத் திட்ட உரையிலே தெளிவாகச் சொல்லியிருக்கிறார். இதற்காகத் தெரிவுசெய்யப்படும் இளைஞர்கள் வெளிமாவட்டங்களைச் சேர்ந்தவர்களாக இல்லாமல், அவர்கள் நம்நாட்டில் தேயிலை ஏற்றுமதிக்கு அர்ப்பணிப்புச் செய்த பெருந்தோட்டத் தொழிலாளர்களின் பிள்ளைகளாக இருக்கவேண்டும் என்பதே எமது அவாவாகும். வெளிமாவட்டங்களில் இருப்பவர்களை இப்பகுதியில் குடியேற்றுவதற்கான காரணியாக இவ்விடயம் இருக்குமேயாயின், அது மலையகத்திலும் இனமுறுகலைத் தோற்றுவிக்கக்கூடியதாக இருக்கும் என்பதை நான் இவ்விடத்திலே தெளிவாகக் சொல்ல விரும்புகின்றேன்.

அது மட்டுமன்றி, தோட்டத் தொழிலாளர்கள் தங்களுடைய குடியிருப்புக்களை ஓர் அடி வெளியே தள்ளிக்கட்டினால்கூட முதலாளிமார் பொலிஸாரின் உதவியுடன் அந்தக் குடியிருப்புக்களை உடைத்தகற்றி விடுகிறார்கள். இந்த நிலைமை மாற்றப்பட வேண்டும். தோட்டத் தொழிலாளர்களுக்கு வீடுகளைக் கட்டித் தருகிறோமென்று வழமைபோன்று சொல்வதை விடுத்து, அவர்களுக்கு முழுமையான அளவிலே 7 பேர்ச்சஸ் காணி வழங்கப்பட வேண்டும். ஏனென்றால், பல வருட காலமாக அது செயற்படுத்தப்படவில்லை. வீடுகளைக் கட்டிக்கொடுப்பது நடைமுறைக்குச் சாத்தியப்படும் விடயமாகத் தெரியவில்லை; தோட்டங்களிலே மக்கள் குடியிருக்கக்கூடிய வசதிவாய்ப்புக்களைக் கொண்ட நிலங்களை அடையாளம் காணக்கூடியதாக இருப்பதால் அந்தக் காணிகளை அவர்களுக்கு வழங்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அவர்களுடைய பிள்ளைகள்

நகரப்புறங்களில் வேலைசெய்கின்றார்கள். அவர்களின் வருமானத்தின் மூலமாக அல்லது வங்கிக்கடன்கள் மூலமாகத் தங்களது வீடுகளை அந்தக் காணியில் கட்டக்கூடிய நிலையில் வாழ்ந்துகொண்டிருக்கின்றவர்களுக்குத் தேவை 7 பேர்ச்சஸ் காணிதான். மாறாக, அரசாங்கத்தின் மூலமாகக் கட்டிக்கொடுக்கப்படுகின்ற வீடுகளல்ல என்பதைப் புரிந்துகொள்ள வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அரசியலமைப்புக்கான 13ஆவது திருத்தச் சட்டம் இன்று கடுமையான விமர்சனத்துக்குள்ளாகியுள்ளது. மேதகு ஜனாதிபதி அவர்கள் தனது வரவு செலவுத்திட்ட உரையிலே, அதிகாரப்பகிர்வினை அர்த்தமுள்ளதாக மாற்றுவதற்குத் தற்பொழுது காணப்படும் மாகாண சபை முறைமை மாற்றப்படவேண்டியது அவசியமாகுமென்று குறிப்பிட்டுள்ளார். அதாவது, அதிகாரப்பகிர்வை மேலும் விஸ்தரிப்பதற்காக இந்த முறைமை மாற்றப்படவேண்டுமென்று அவர் சொல்லியிருப்பாரென்று நாங்கள் நினைக்கிறோம். இந்த மாற்றமானது, 13ஆவது திருத்தத்தைவிட மேலதிகமான அதிகாரப்பகிர்வைப் பெறக்கூடியதாக அமையவேண்டும். இந்தச் சபையிலுள்ள ஒருசில அரச பங்காளிக் கட்சிகள் 13ஆவது திருத்தச் சட்டத்தை முற்றுமுழுதாக இல்லாதொழிக்கவேண்டுமென்று கோஷமிடுகின்றன. இந்த ஜனநாயக நாட்டிலே தங்களுடைய கருத்துக்களைச் சொல்வதற்கு அவர்களுக்கு பூரண உரிமையுள்ளதென்பதை நாங்கள் ஏற்றுக்கொள்கிறோம். என்றாலும்கூட, இந்தத் திருத்தச் சட்டம் அகற்றப்படுமேயானால், இந்த நாட்டிலே மீண்டும் பிரிவினைவாதம் அதிகரிப்பதற்கு அது காரணியாக அமைந்துவிடும்.

மேலும், இனப்பிரச்சினைக்குத் தீர்வாக 19ஆவது திருத்தச் சட்டம் உருவாக்கப்படுமென்றும் பேசப்படுகிறது. 19ஆவது திருத்தச் சட்டம் உருவாக்கப்பட்டால், அது 13ஆவது திருத்தச் சட்டத்துக்கு மேலதிகமாக அதிகாரப்பகிர்வினைப் பெற்றுக்கொடுக்கக்கூடியதாக இருக்கவேண்டும். சிறுபான்மையினரைப் பிரதிநிதித்துவப்படுத்தும் ஓர் உறுப்பினர் என்ற வகையிலே, அதில் அதிகாரப்பகிர்வு குறைக்கப்படுமேயானால் அப்போது எனது கடுமையான ஆட்சேபனையைத் தெரிவிக்க வேண்டிவரும் என்பதை இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதேநேரத்தில் இந்தச் சபையிலுள்ள கம்யூனிஸ்ட் கட்சி அமைச்சர்களும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியின் ஏனைய முற்போக்கு அமைச்சர்களும் அதிகாரப்பகிர்வை முழுமையாக ஆதரிப்பதையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன். மேதகு ஜனாதிபதி அவர்களின் நிலைப்பாடும் அதுவாகத்தான் இருக்குமென்பது எனது பரிபூரண நம்பிக்கையாகும்.

இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கும் பிரதம நீதியரசருக்கெதிரான குற்றவியல் பிரேரணையை ஆராயும் குழுவில் பங்குபற்ற தமிழ்த் தேசியக் கூட்டமைப்பினால் முடியுமாயின், இனப்பிரச்சினைத் தீர்வுக்கான பாராளுமன்றத் தெரிகுழுவில் ஏன் பங்குபற்ற முடியாது? என்று நான் கேட்க விரும்புகிறேன். கடந்த காலங்களில் விடுதலைப் புலிகள் பின்பற்றிய தவறான அணுகுமுறைகளையே இவர்களும் கடைப்பிடிக்கிறார்கள். விடுதலைப் புலிகள் சமஷ்டி - federal போன்ற முறைமைகளைப் ஏற்றுக்கொள்ள மறுத்ததன் விளைவாகவே இன்றைய இந்நிலைக்கு தமிழ் மக்கள் ஆளாகவேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது என்பதை அவர்கள் புரிந்துகொள்ள வேண்டும். பேச்சுவார்த்தை என்று கிடைக்கும் சந்தர்ப்பத்தைப் பற்றிப்பிடித்து, பாராளுமன்றத் தெரிகுழுவில் அங்கம் வகித்து, இந்த அரசாங்கத்தின்மூலம் இனப்பிரச்சினைக்கான தீர்வினைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் பெற்றுக்கொள்ள வேண்டும்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

கௌரவ பிரபா கணேசன் அவர்களே, இன்னும் ஒரு நிமிடத்தில் முடித்துக்கொள்ளுங்கள்.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)

சிங்கள மக்களின் 75 சதவீதமான ஆதரவினை இந்த அரசாங்கம் பெற்றிருக்கிறது. ஆகவே, தமிழ் மக்களைப் பிரதிநிதித்துவப்படுத்தும் ஒரு கட்சி என்ற ரீதியிலே கூட்டமைப்பினர் அரசாங்கத்துடன் பேசி, இந்தப் பிரச்சினையைத் தீர்த்துக்கொள்ளக்கூடிய நிலைக்கு வரவேண்டும். அதற்கான பாராளுமன்றக் தெரிகுழுவிலும் அவர்கள் அங்கம் வகிக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். அதைவிடுத்து, வாக்குகளைப் பெற்றுக்கொள்வதற்காக மட்டும் அவர்கள் செயற்படுவதென்றால் அது முறையான அரசியலாக இருக்க முடியாது.

மேலும், மீள்குடியேற்றத்தைப் பற்றி கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்கள் பேசும்பொழுது பல விடயங்களைப் பற்றிப் பேசினார். மீள்குடியேற்ற அமைச்சர் அவர்களும் அவற்றுக்குப் பதிலளித்துக்கொண்டிருந்தார். உண்மையில் கௌரவ உறுப்பினர்களான செல்வம் அடைக்கலநாதன், மாவை சேனாதிராஜா போன்றவர்கள் மீள் குடியேற்ற நடவடிக்கைகளில் தன்னுடன் முழுமையாக இணைந்து செயற்பட்டமை குறித்து அமைச்சர் அவர்கள் இங்கு தெளிவாகத் தெரிவித்தார். 30 வருட காலமாக இடம்பெற்று வந்த யுத்தத்தின் காரணமாக ஏற்பட்ட பாதிப்புக்களை மூன்று வருடங்களில் நிவர்த்தி செய்வதென்பது சாதாரண விடயமல்ல. இருந்தாலும்கூட, மீள்குடியேற்ற அமைச்சர் அவர்கள் இந்த நடவடிக்கைகளைப் பல தடைகளையும் மீறி தன்னால் முடிந்தளவு சரியாகவும் நேர்மையாகவும் முன்னெடுத்து வருகின்றார். எனவே, தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் உரிமைகளைப் பெற்றுக்கொள்வதற்காகக் குரல் கொடுப்பது ஒருபுறமிருக்க, அவர்கள் அந்த மக்களின் இன்றைய அடிப்படைத் தேவையான மீள்குடியேற்ற நடவடிக்கைகள் சரியான முறையில் இடம்பெறும் வகையில் அமைச்சர் அவர்களுடன் இணைந்து செயற்பட்டு, அதற்கு முழுமையாக ஒத்துழைப்பு வழங்க வேண்டுமென்று நான் இந்தச் சபையினூடாகத் தயவாகக் கேட்டுக்கொள்கிறேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

இப்பொழுது உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்.

**ගරු ප්‍රභා ගනේසන් මහතා**
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Praba Ganesan)

ஒரு நிமிடம்!

தமிழ்த் தேசியக் கூட்டமைப்பினராகிய நீங்கள் அமைச்சர்களுக்கு எதிராகப் பேசுவதைத் தவிர்த்து, அவர்களுடன் ஒத்துழைத்து, உங்கள் மக்களின் அடிப்படை வசதிகளைப் பெற்றுக் கொடுக்க வேண்டும். அதேநேரம், தமிழ்

[ගරු ප්‍රභා ගනේසන් මහතා]

மக்களின் உரிமை பற்றிய உங்களது குரல் தாராளமாக ஒலிக்க வேண்டும். அதற்கு எப்பொழுதும் எங்களது ஆதரவு உண்டு. அந்த மக்களின் மீள்குடியேற்றம் இப்பொழுது அவசரத் தேவையான ஒரு விடயமாக இருப்பதால், தயவுசெய்து அமைச்சர் அவர்களுடன் இணைந்து அந்த மீள்குடியேற்றத்தைச் சரியான முறையில் செய்யுங்கள்! அதன்மூலம் அந்த மக்களின் முன்னேற்றத்துக்கு நீங்கள் ஏதாவது ஒன்றைச் செய்ததாக அமையும் என்று கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 4.36]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවර අය වැය යෝජනා දෙස බැලීමේදී අපට හොඳින්ම පෙනෙන දෙයක් තමයි, මෙය සාම්ප්‍රදායානුකූල කටයුත්තක් ඉෂ්ට කරන්න ඉදිරිපත් කළ අය වැයක් මිසක්, රටේ අවශ්‍යතාවවත්, එහෙම නැත්නම් ජනතාවගේ අවශ්‍යතාවවත්, එහෙමත් නැත්නම් අද රටේ ඇති වෙලා තිබෙන දුප්පත්කමට යම් කිසි පිටිවහලක් වෙන්නවත් ඉදිරිපත් කළ අය වැයක් නොවෙයි කියලා.

විශේෂයෙන්ම 2011 නොවැම්බර් විසිඑක්වෙනිදා මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළ 2012 අය වැයත්, මේ අවුරුද්දේ නොවැම්බර් අටවෙනිදා ලබන අවුරුද්දට ඉදිරිපත් කළ අය වැයත් දිහා සන්සන්දනාත්මකව බලන කොට, ඒ දෙකේම කිසිම වෙනසක් පෙනෙන්නට නැහැ. විශේෂයෙන්ම කරුණු ගොනු කිරීමක් පමණයි තිබෙන්නේ. ඒ පිළිවෙළ විතරක් වෙනස් වෙලා තිබෙනවා.

මෙවර අය වැයේ තිබෙන දේවල් දිහා බැලුවාම පෙනෙන්නේ මහා සංවර්ධිත රටක අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා වාගේයි. විශේෂයෙන්ම රේසින් කාර් ගැනත්, රගර් ක්‍රීඩාව ගැනත්, රගර් ක්‍රීඩාව සඳහා ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ඉදි කිරීම පිළිබඳවත් මෙවර අය වැයෙන් මහත් අභිමානයකින් කියලා තිබෙනවා.

සාමානයෙන් ඉස්සර අය වැය ඉදිරිපත් කරන කාලය ළං වෙන කොට රටේ ජනතාවගේ පෙළ ගැස්මක් තිබුණා, අය වැයෙන් මොනවාද වෙන්නේ කියලා බලා ගන්න. නමුත් අද එහෙම පෙළ ගැස්මක් නොවෙයි තිබෙන්නේ. අද අය වැය ළං වෙන කොට රටේ ජනතාව දන්නවා, පුරුදු පරිදි අය වැය කෙරෙහි තිබෙන අවධානය වෙනත් පැත්තකට යොමු කරන්න මොකක් හරි විගඩමක්, නාඩගමක් නටයි කියලා. අපට මතකයි, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා බුලර්ස් ලේන් එකේ තිබෙන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්යාලය ඉස්සරහට ගිහිල්ලා මාරාන්තික උපවාසයක් කළා බෑන් කී මූන් අයින් කරන්න කියලා. ඒ වාගේම ගිය අවුරුද්දේ මානව හිමිකම් උල්ලංඝනය වුණාය කියලා රහපෑමක් ගෙනාවා.

දැන් මේ අවුරුද්දේ අමුතුම කතන්දරයක් ගෙනැල්ලා තිබෙනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කරන්න කියලා. මේ ආණ්ඩුව ඇතුළේම සිටින අය, ආණ්ඩුවේම ප්‍රධාන කොටස්කාරයෝ හැටියට ඉන්න අය මේවාගේ දේවල් කරන්නේ කාගේ හරි වුවමනාවකට රටේ ජනතාවගේ අවධානය වෙනත් පැත්තකට ගන්නද කියන එක ගැන අප කවුරුත් තුළ පුංචි සැකයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ මොකද, අය වැය ඉදිරිපත් කර ටික දවසක් ගියාම ඒ කරන දේවලුත් එහෙමම ඩෝං ගාලා යට යන නිසා.

ඒ කෙසේ වෙතත් මේ අය වැය ගම වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයක්, පුංචි මනුස්සයා වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැයක් කියලා කිව්වාට, අපට කියන්න තිබෙන්නේ සාමාන්‍යයෙන් කියන කථාවම තමයි. ඒ කියන්නේ "කොළඹට කිරි, ගමට කැකිරි" කියන එක තමයි අද මේ අය වැයෙනුත් ඔප්පු වෙලා තිබෙන්නේ. ගරු අස්වර් මන්ත්‍රීතුමා නම් මේ ගොඩක් දේවල්වලට හිත යටින් එකඟ වෙයි. මොකද එතුමා විශේෂයෙන්ම,- [බාධා කිරීම්]

අපි දැන් පුංචි උදාහරණයක් හැටියට පානීය ජලය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව අරගෙන බැලුවොත් පෙනෙනවා, 2012 අවුරුද්දේ ඉදිරිපත් කළ අය වැයෙනුත් අවුරුදු තුනක සැලැස්මක් යටතේ දිස්ත්‍රික්ක ගණනාවකට පානීය ජලය ලබා දෙන්න යෝජනා ඉදිරිපත් කර තිබෙනවාය කියලා. එම යෝජනාවම නැවත මේ අවුරුද්දේත් අවුරුදු තුනක සැලැස්මක් යටතේ යෝජනා කර තිබෙනවා. දැන් අපි බලන්නේ මේ අවුරුදු තුන පටන් ගන්නේ කොයි අවුරුද්දේ ඉඳලාද කියලායි; 2012 ඉඳලා පටන් ගත්තාද, එහෙම නැත්නම් 2013 ඉඳලා පටන් ගන්නවාද කියන එකයි. ඒ වාගේම ගිය අවුරුද්දේ තිබුණු සමහර යෝජනාත් මේ අවුරුද්ද වෙන කොට හැලිලා තිබෙනවා. ගිය අවුරුද්දේ පානීය ජලය දෙන්න යෝජනා කළ සමහර තැන්වලට පානීය ජලය නොවෙයි, වැව් ජලයවත් දෙන්න බැරි අවස්ථාවකට අද ඒ යෝජනා වෙනස් කර සම්පූර්ණයෙන්ම ඊට වෙනස් පැත්තකට පානීය ජලය ලබා දෙන්න යෝජනා කර තිබෙනවා.

ඉතින් අපට ඒ වාගේ පුංචි පුංචි උදාහරණ රාශියක් දෙන්න පුළුවන්. 2012 අය වැය කථාව ඇතුළත් පොතත්, 2013 අවුරුද්ද වෙනුවෙන් ඉදිරිපත් කළ මේ අය වැය පුස්තකයත් දිහා බැලුවාම අපට ඉතාම පැහැදිලිව පෙනෙන දේ මේකයි. යෝජනා මාලාව එකයි. ලස්සනට නම් වෙනස් කරලා තිබෙනවා. තැන් ටික වෙනස් කර තිබෙනවා. මේ විධියට වාර්ෂිකව ඉදිරිපත් කරන අය වැය තුන් අවුරුද්දකට, පස් අවුරුද්දකට, දස අවුරුද්දකට කියලා ඉදිරිපත් කරනවා.

මට මතකයි 2007 අය වැය ලේඛනය ඉදිරිපත් කළා, අවුරුදු දහයකට. එහෙම බලනවා නම් අවශ්‍ය සැලසුම් ඔක්කොම ඉදිරිපත් කර 2017 වන තෙක් කෙරෙන වැඩ තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. මුදල් වෙන් කිරීම විතරයි කරන්න වෙලා තිබෙන්නේ. හැබැයි, එහෙම කිසිම පිළිවෙළක් නැහැ. අපි බලාපොරොත්තු වුණු සහන; රටේ ජනතාව බලාපොරොත්තු වුණු සහන කිසිවක් මේ අය වැයෙන් ලැබිලා නැහැ. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, 2005 ජනාධිපතිවරණයේදීත් පොරොන්දු රාශියක් දුන්නාය කියලා. ඒ පොරොන්දු කිසිවක් ඉෂ්ට කරන්නේ නැතිව, නැවතත් 2010 මහින්ද චින්තන ඉදිරි දැක්මෙනුත් පොරොන්දු රාශියක් ලබා දුන්නා. පෝෂණ මල්ල ගැනත් එහෙමයි.

අපේ සුමේධා ජයසේන ඇමතිතුමිය මෙතැන සිට කිව්වා, මොණරාගල දිස්ත්‍රික්කයේ ඒක දෙනවා කියලා. හැබැයි, එදා 2005 මහින්ද චින්තනයෙන්වත්, 2010 මහින්ද චින්තන ඉදිරි දැක්මෙන්වත් කිව්වේ නැහැ, මොණරාගල දිස්ත්‍රික්කයට විතරයි පෝෂණ මල්ල දෙන්නේ කියලා. රටේ ජනතාව විශ්වාස කළේ මුළු රටටම ලැබෙනවා කියලායි. අපි විශ්වාස කළෙත් ඔක්කොටම ලැබෙයි කියලායි. අවුරුදු පහට අඩු දරුවන්ට කිරි වීදුරුවක් දෙනවා කිව්වා. ඉස්කෝලේ යන දරුවන්ට දිවා ආහාර වේලක් දෙනවා කිව්වා. අද ඒ කිසිම දෙයක් නැතිව අලුත්ම යෝජනාවක් කර තිබෙනවා. හුදකලා පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ට නොමිලයේ ධාන්‍ය, බිත්තර හා කිරි ආහාර ලබා දීමට යෝජනා කරන ගමන්ම, වසර මැද දී ඒ දරුවන්ට තවත් නිල ඇඳුමක් සහ සපත්තු කුට්ටමක් ලබා දෙන්නටත් යෝජනා කර තිබෙනවා. ඉතින් අපි-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒකට සන්තෝෂ නැද්ද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
සන්තෝෂ වෙනවා. හැබැයි, ඉතින් ඔබතුමාට ඒක හොඳට පෙනෙනවා ඇති. මොකද, සාමාන්‍යයෙන් ඔබතුමා පාට කණ්ණාඩියකින් තමයි ඔය හැම දෙයක් දිහාම බලන්නේ. ඔබතුමා මේ විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඉන්න කාලයේ මෙහේ දේවල් බැලුවා. ඔය පැත්තට ගියාම ඔහේ දේවල් බලනවා. දැන් ශබ්ද කරන්නේ නැතිව ඉන්න. ඔබතුමාගේ වෙලාව ආවාම කථා කරන්න.

කෙසේ වෙතත් මේ දරුවෝ වර්ගීකරණයකට ලක් කරනවාට අපි කැමැති නැහැ. එදා නොමිලයේ පෙළපොත් ලබා දුන්නේ, එහෙම නැත්නම් ජේ.ආර්. ජයවර්ධන මහත්තයලා පාසල් නිල ඇඳුම් ලබා දුන්නේ රාජකීය විද්‍යාලයේ ළමයාටයි, බිංතැන්නේ ළමයාටයි කියලා වෙන් කරලා නොවෙයි. සමස්ත රටේම හිටපු 43,00,000 වුණ සියලුම දරුවන්ට ඒ වරප්‍රසාදය ලබා දුන්නා. මේ අහිංසක දරු පැටව්. හැම දේකදීම මුලින්ම තමන්ගේ මානසිකත්වයේ හරි යපහත් පැවැත්මක් ඇති කර ගන්න. ඇයි, මේ පාසල් දරුවන් එක තැනකට කොන් කරන්න හදන්නේ?

අපි ඊයේ-පෙරේදා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඇහුවා, මේ හුදකලා පාසල්වලට තිබෙන නිර්ණායක මොනවාද කියලා. එතකොට ඒ අය කියන්නේ දරුවන් 50කට අඩුවෙන් ඉන්න පාසල් හා පාසලේ සිට කිලෝ මීටර් 4ක් ඇතුළත හෝ කිලෝ මීටර් 4ක වෙනත් ප්‍රාථමික පාසලක් පිහිටා නැත්නම් එම පාසල හුදකලා පාසලක් හැටියට සලකනවා කියලායි. මේ විධියට බලන කොට ලංකාවේ පාසල් 1,562ක් මේ ගණයට අයත් වෙනවා. සාමාන්‍යයෙන් ඒ හැම පාසලකම දරුවන් 50ක් ඉන්නවා කියලා උපකල්පනය කළොත්, මුළු රටේම බැලුවත් පාසල් 1,562ම දරුවන් 78,000යි මේකට අයත් වන්නේ. දැනට 4,000,000ක් පාසල් දරුවන් සිටින රටේ 78,000කට විතරක් මේ දීමනාව ලබා දෙන්න හදන්නේ ඇයි? සාමාන්‍යයෙන් මොකක් හරි අවශ්‍යතාවක් වුණොත්, සෙරෙප්පු එහෙම දමන්නේ නැතිව අරලියගහ මන්දිරයට ගියාම ඔක්කොටම සෙරෙප්පු දෙනවාය කියනවා. එහෙම යම්කිසි අවස්ථාවක් ලැබුණොත් බොහොම සන්තෝෂ වෙනවා. ඇත්තටම මමත්, අපේ ගරු මන්ත්‍රීතුමියන්ලාත් කල්පනා කර ගෙන ඉන්නවා කොහොම හරි අපට සාරියක් ඉල්ලා ගන්න පුළුවන් ද කියලා බලන්න ඕනෑ කියලා. [බාධා කිරීම්] මොකද, හිතෙන, හිතෙන විධියට ඒ වාගේ දේවල් දෙනවා නම් ජනාධිපතිතුමා,- [බාධා කිරීම්]මෙන්න මේ විධියට 4,000,000ක් පාසල් දරුවෝ ඉන්න රටක, 78,000කට වෙනස් විධියකට සලකන්න ගියාම අර පුංචි දරුවන්ගේ මානසිකත්වය මොන තරම් බිඳ වැටෙනවාද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. ඔවුන් සමාජයෙන් කොන් වුණ ජාතියක් කියලා; උසස් අධ්‍යාපනයක් ගැන හිතන්න බැරි කොටසක් කියලා ඒ දරුවන් කල්පනා කරයි.

අනාගතයක් ගැන හිතන්න බැරි, ගම්වල කොන් වුණ අය හැටියට ඔවුන් කල්පනා කරන්න පටන් ගන්නවා. ඒ නිසා මේ යෝජනාව ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතුමා බලන කණ්ණාඩියෙන් හොඳ ඇති. නමුත් අපට පෙනෙන විධියට නම්, මේ යෝජනාව රටේ පැවැත්මට එච්චර සුදුසු නැහැ. දැන් යුද්ධය අවසන් කර තිබෙනවා; රටේ සාමය ඇති වෙලා තිබෙනවා; අපි ඔක්කෝම එකට ඉන්න ඕනෑ; අපි එකතු වෙලා වැඩ කරන්න ඕනෑ කියලා අපට නිතරම කියනවා. ඒ ඔක්කෝම කරන්න පුළුවන්. හැබැයි ඇයි, අපි එක කොටසකට විතරක් මේ විධියට සලකන්න හදන්නේ? ඒ නිසා මේ යෝජනාව ගැන ඇත්තටම අපට එච්චර සන්තෝෂ වෙන්න බැහැ. අප කියන්නේ, මේ විධියට පාසල් දරුවන්ව වර්ගීකරණයකට ලක් කරන්නේ නැතුව, හුදකලා පාසලක් කියලා භේදයක් නැතුව, ඒ දරුවන්ට වාගේම රටේ අනෙක් සියලුම දරුවන්ටත් ඒ කියන දේවල් දෙන්න පුළුවන් නම් ඉතාම වටිනවා කියලායි.

මොකද, සමහර වෙලාවට පවුලේ උදවියට රගර් ක්‍රීඩා කරන්න ජාත්‍යන්තර තලයේ පිට්ටනි හදන කොට මේ අහිංසක දරු පැටව් රගර් බෝලයක්වත් දැකලා නැතුව ඇති. ඒ දරුවෝ සමහර විට කවදාකවත් සපත්තු කුට්ටමක් දැකලා නැතුව ඇති. ඒ නිසා අපි ඒ යෝජනාව ගැන සන්තෝෂ වෙනවා, සමස්තයක් හැටියට මුළු රටේම පාසල් දරුවන්ට ඒ දේවල් ලබා දෙන්න පුළුවන් නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය සේවාවට හැම වසරකම රුපියල් බිලියන 125ක විතර මුදලක් වෙන් කරනවා. මෙවර ඒ මුදලට වඩා බිලියන 20ක් වැඩියෙන් වෙන් කරලා තිබෙනවා. මොකද, පසු ගිය අය වැයේදී යෝජනා කළා, "ඩොලර් මිලියන 400ක් විතර ඖෂධ, සේලයින් සහ අනෙකුත් භාණ්ඩ පිට රටින් ගෙන්වීමට යොදවනවා. ඒ වෙනුවට මේ රටේ පෞද්ගලික අංශයේ ඖෂධ නිෂ්පාදනය දිරිගැන්වීමක් කරන්න ආයෝජන මණ්ඩලය විසින් වෙනම ආයෝජන කලාපයක් පිහිටුවන්නට අවශ්‍යයි." කියලා. එය පසු ගිය අවුරුද්දේ යෝජනාවක් වුණත් මේ වන තෙක් ඒ වෙන් කළ මුදල තවම කිසි දෙයකට යොදවලාත් නැහැ. ඒ ගැන කිසිම දෙයක් කියලාත් නැහැ. හැබැයි නැවත මෙවරත් ප්‍රකාශ කරලා තිබෙනවා, අඩු තරමේ මේ පාරවත් ඖෂධ නිෂ්පාදනයේ දිරිගැන්වීමක් කරන්න ඕනෑ කියලා. මේ රටේ ඖෂධ නිෂ්පාදනයේ දිරිගැන්වීමක් කරන්න ඕනෑය කියන යෝජනාව කරන අතරවාරයේ, අප සියලු දෙනාටම අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, අපේ රටේ වෙළෙඳ සැල්වල තිබෙන ඖෂධවල ගුණාත්මකභාවය සහ අනතුරුදායක තත්ත්වය පිළිබඳව. මොකද, ඔබතුමාත් දන්නවා ඇති. පසු ගිය දවස්වල "Corex-D" පානය කරලා මිය ගියාට පස්සේ තමයි ඒක අන්තරායදායකයි කියලා තහනම් කරන්න කටයුතු කළේ. ඒ වාගේ කිසිම වැඩ පිළිවෙළක් නැතුව, අඩුම ගණනේ ඒ බෙහෙත්වල කල් ඉකුත්වූ දිනය ගැනවත් හරියට සොයා බලන්නේ නැතුව වැඩ කටයුතු කරනවා.

විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල ග්‍රාමීය රෝහල්වලට, ප්‍රාදේශීය බෙහෙත්ශාලාවලට කල් ඉකුත් වෙන්න ආසන්න වුණ බෙහෙත් තමයි කොළඹින් යවන්නේ. ඒ වාගේ වාතාවරණයක් තුළ අද කථා කරනවා, මේ රටේ ඖෂධ නිෂ්පාදනය දිරිගන්වන්න ඕනෑ කියලා. ඒක පසු ගිය අවුරුද්දෙත් යෝජනා කළා. මේ අවුරුද්දෙත් යෝජනා කර තිබෙනවා. ඒ නිසා මේ අය වැය ලේඛනයේ වැඩි වෙනසක් නැහැයි කියන එක අපට කියන්න සිද්ධ වෙනවා. [බාධා කිරීමක්] කවුද ඒ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔබතුමා එන්න. මගේ යාළුවා නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙතැනට ඕනෑ නම් එන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන අංශ දෙකේම කිසිම දියුණුවක් ඇති කරන්න, සංවර්ධනයක් ඇති කරන්න, පැවැත්මක් ඇති කරන්න නොවෙයි ඒ අංශ දෙක

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

පවත්වා ගෙන යැමට අවශ්‍යා මුදල් විතරක් වාර්ෂිකව වෙන් කරනවා. ඊට අමතරව වෙන කිසි දෙයක් කරන්නේ නැහැ. අඩුම තරමේ විශ්වවිද්‍යාලවට අවශ්‍යා පර්යේෂණ කරන්න, ඒ ශිෂ්‍යයන්ට අවශ්‍යා පහසුකම් ලබා දෙන්නවත් මෙවර අය වැයෙන් කිසිම දිරිගැන්වීමක් සිද්ධ වෙලා නැහැ. අපි දන්නවා පසු ගිය දිනවල විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ මහා වැඩ වර්ජනය සිද්ධ වුණේ මොකද කියලා.

මෙවර අය වැයෙන් රුපියල් මිලියන 10ට අඩු වාර්ෂික ආදායමක් ලබන ප්‍රාදේශීය සභා 206ක් හඳුනා ගෙන රුපියල් මිලියන 10ට ළඟාවීම සඳහා අවශ්‍යා මුදල් ප්‍රදානය කිරීමට යෝජනා කර තිබෙනවා. අපි කවුරුත් දන්නවා, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන ප්‍රාදේශීය සභා ඒ පළාත් පාලන ආයතන පවත්වා ගෙන යන්නේ බොහොම අමාරුවෙන් බව. ඒ ප්‍රාදේශීය සභාවල ආදායම් අඩුයි. හැබැයි මේ වන කොට අඩුම තරමේ උසාවි දඩ මුදල් හෝ එහෙම නැත්නම් රජයෙන් අය විය යුතු මුදල් හෝ ඒ අයට කලට වේලාවට ලබා දෙන්නේ නැහැ.

ඒවා ලබා දෙනවා නම් ඒ අයට ඒ සඳහා අමුතුවෙන් වෙනත් මුදල් ප්‍රදානය කරන්න ඕනෑ නැහැයි කියන එක අපි මතක් කරන්නට ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
No, I have two minutes. I was given more time.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම 2012 අය වැය යෝජනාවලියෙන් වසර 18ක අඛණ්ඩ සේවයේ නියුතුව සිටි ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්ට මෙන්ම කලාකරුවන්ට මෝටර් රථයක් මිලදී ගැනීමට පොලී රහිතව රුපියල් ලක්ෂ 12ක ණයක් ලබා දීමට යෝජනා කළා. ඒ අනුව ජ්‍යෙෂ්ඨ කලාකරුවන් හා මාධ්‍යවේදීන් 1,100ක් අයදුම් කරලා, 980ක් සම්මුඛ පරීක්ෂණයට ගිහිල්ලා තිබෙනවා. ඒ සම්මුඛ පරීක්ෂණයෙන් 526 දෙනෙක් තෝරා ගෙන තිබෙනවා. ඒ පහසුකම ලබා දී තිබෙන්නේ, දැන් වෙන කොට බැංකුවලට දැනුවත් තිබෙන්නේ 90 දෙනෙක් වෙනුවෙන් විතරයි. එතකොට මේ සඳහා වියදම් කරන මුදල ඉතිරි කරන පොලිය, එහෙම නැත්නම් අය නොකරන පොලියට වඩා දහපහළොස් ගුණයකටත් වඩා වැඩියි. අපි ඉල්ලා සිටින්නේ ජනතාව නොමඟ අරින්න එපාය කියායි.

හැමදාම ලස්සන වචන මාලාවක් ගෙනැල්ලා, -නොයෙකුත් විධියේ වචන sets පාවිච්චි කරලා- ජනතාව නොමඟ අරින්න එපා. අග හිඟකම්වලින් පෙළෙන මාධ්‍යවේදීන් වෙනුවෙන් වෙනම අරමුදලක් ඇති කරන්න කියලා රුපියල් මිලියන 50ක් ගිය වර අය වැයෙන් වෙන් කළා. අද වන තෙක් ඒ අරමුදල ඇති කරන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලබා දුන් කාලය අවසන් කියලා ඔබතුමා කියන නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. හැබැයි, පසු ගිය අය වැයට වඩා මේ අය වැයේ වෙනසක් තිබෙනවා. බන්ධනාගාරය ගැනවත්, කෞතුකාගාරය ගැනවත් වචනයක්වත් සඳහන් කරලා නැහැ. මොකද, මම විශ්වාස කරනවා, මුදල් ඇමතිවරයා හැටියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දැන ගෙන ඉන්න ඇති පරිස්සම් කර ගන්න බැරි වෙච්ච කෞතුකාගාරයට මුදල් වෙන් කරලා වැඩක් නැහැ, ඒ වාගේම එදා රෑ වෙන කොට බන්ධනාගාරයටත් වැඩ set වෙනවා, ඒ නිසා කථා කරලා වැඩක් නැහැ; මුදල් වෙන් කරලා වැඩක් නැහැ කියලා. එහෙම හිතපු නිසා වෙන්න ඇති බන්ධනාගාරයයි, කෞතුකාගාරයයි ගැන සැලකුවේ නැත්තේ. ඒ කෙසේ වෙතත් හැමදාම බොරුවෙන්, ප්‍රෝඩාවෙන් මේ රටේ ජනතාව රවට්ටන්නේ නැතුව, මුළා කරන්නේ නැතුව, ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ දුප්පත් ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන අය වැයක් කියලා අසත්‍ය කියන්නේ නැතුව මේ අය වැය ගැන සත්‍ය ප්‍රකාශ කරන්න කියා ඉල්ලා සිටින අතර, මේ අය වැයේ කිසිම දෙයක් නැහැ, මේක racing cars පදින්නයි, රගර් ගහන්නයි තිබෙන අය වැයක් හැටියට ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 4.53]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ රජයේ 8වැනි අය වැය ඉදිරිපත් කර ඒ පිළිබඳව මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ විවාද කරන වෙලාවේ විශේෂයෙන්ම මටත් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ රටේ ඇමති මණ්ඩලය, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය ආයතනවල නිලධාරින්, ගොවීන්, කම්කරුවන්, වෛද්‍යවරුන්, නීතිඥවරුන්, ඒ වාගේම කර්මාන්තකරුවන්, වෙළෙඳ ව්‍යාපාරිකයින් ආදී රටේ ජීවත් වන හැම පුරවැසියෙක්ම එකතු කර ගෙන, අඩු ගණනේ 15,000කට වැඩි පිරිසක් එකතු කර ගෙන සාකච්ඡා කර ඒ අයගේ අදහස් උදහස් අනුව තමයි ගරු ජනාධිපතිතුමා මෙම අය වැය ලේඛනය සකස් කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා මුළු රටේම දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් ගානේ ගිහිල්ලා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට සහභාගී වෙලා, ගම් ප්‍රදේශවලට ගිහිල්ලා ඒ ගම් ප්‍රදේශවල තිබෙන ගුණ සුවඳ හඳුනා ගෙන පොළොවේ පය ගහලා ඉන්න ජනතාවත් එක්ක කථා කරලා, ඔවුන්ගේ අදහස්, උදහස් ගත්තා. ඒ අනුව තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ. මීට ඉස්සෙල්ලා හිටපු රාජ්‍ය නායකයෝ, මුදල් ඇමතිවරු මේ ආකාරයෙන් කටයුතු කළේ නැහැ. ඔවුන් කොළඹ ශීත කාමරවල ඉඳ ගෙන තමයි අය වැය ලේඛනය - Budget එක - හැදුවේ. ඒක නිසා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ අය වැයේ පොඩි වෙනසක් පෙනෙනවා ඇති.

රටේ ඉන්න බුද්ධිමතුන්, උගතුන්, කලාකරුවන් ඔක්කෝම එකතු කර ගෙන, ඒ හැමෝගේම අදහස් අරගෙන අය වැයක් හදන එක ලෙහෙසි පහසු නැහැ. ඒ ලෙහෙසි පහසු නැති ක්‍රියා දාමය ක්‍රියාත්මක කළ නායකයෙක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. මේ අය වැය විවාදයේදී අනෙකුත් දේශපාලන පක්ෂ බොහොම විවේචන ඉදිරිපත් කළා, මහින්ද චින්තනය, ඒ වාගේම මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ තිබූ පොරොන්දු කිසිවක් පසු ගිය කාලයේ සිද්ධ වුණේ නැහැ කියලා. 2001 සිට 2004 දක්වා යූඑන්පී ආණ්ඩුවක් තිබුණා. අපට මතකයි, අද ඔය කථා කරන මන්ත්‍රීතුමන්ලා එදා 16/01 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ගෙනාවා. අද ඔවුන් රුපියල් 1,500ක වැටුප් වැඩි වීම ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ දාහතරලක්ෂයකට කිට්ටු වෙන්න රාජ්‍ය සේවක පිරිසක් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ රටේ ඉන්නවා, විශ්‍රාම ලත් රාජ්‍ය සේවකයින් තවත් ලක්ෂ හයක් විතර.

මේ දෙකේම එකතුව ලක්ෂ 18ක්, ලක්ෂ 19ක් වෙනවා. රටේ ජනගහනය ලක්ෂ දෙසීයයි. හැම එකොළොස් දෙනෙකුගෙන්ම එක් කෙනෙකු මේ රටේ රාජ්‍ය සේවකයෙකු බවට පත් වෙනවා.

එදා මොනවාද කළේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? එදා මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා 16/01 දරන චක්‍රලේඛය එව්වා. 16/01 චක්‍රලේඛයෙන් මොනවාද කිව්වේ? මින් පස්සේ මේ රටේ රාජ්‍ය සේවයට කිසිම කෙනෙක් බඳවා ගන්නේ නැහැ කියලා තිබුණා. ඒක මහ නගර සභාවට යැව්වා, අනික් තැන්වලට යැව්වා, "රාජ්‍ය සේවයට කිසිම කෙනෙක් බඳවා ගන්න එපා"ය කියලා. ඒ ආණ්ඩුව තිබුණා නම් අද ලක්ෂ 5ක්, 6ක් රාජ්‍ය සේවයේ නැහැ. හැබැයි අද මේ අය වැයෙන් ලක්ෂ 13කට රුපියල් 1,500 ගණනේ වැටුප් වැඩි කරලා, විශ්‍රාමිකයන්ට රුපියල් 750 ගණනේ වැටුප් වැඩි කරලා, ජූලි වර්ජකයන්ට රුපියල් 5,000 ගණනේ දීමනාවක් ලබා දෙන්න කටයුතු කරනවා. මා හිතන්නේ ජනාධිපතිතුමා බොහොම sensitive විධියට කථා කළා කියලායි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
sensitive විධියට?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
තමුන්නාන්සේ පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේට පස්සේ කථා කරන්න පුළුවන්. ජනාධිපතිතුමා ඉතාම සංවේදී විධියට කථා කළා. තමුන්නාන්සේලාට ඉවක් නැහැ නේ. ගඳ සුවඳ දැනෙන්නේ නැහැ නේ. ගඳ සුවඳ තමුන්නාන්සේලාට දැනෙන්නේ නැහැ. ඒක නිසා ගැටලුවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ආකාරයට ජනාධිපතිතුමා කටයුතු කරනවා. රාජ්‍ය සේවකයන්ට එහෙම වැටුප් වැඩි කළා. එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික අංශය ගැන කවදාවත් හිතුවේ නැහැ. ඔවුන්ට බලය තිබෙන කොට මොළය තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද මේවා හිතේ තියාගෙන කථා කරනවා. හැබැයි එදා ඒ කටයුතු කරන්න මොළය තිබුණේ නැහැ. පාලනය කරන කොට ඒ දේවල් තිබුණේ නැහැ.

මට මතකයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ "Regaining Sri Lanka" කොළ පාට සමාජය මොනවාද කළේ කියලා. මේ රට විකුණන්න කථා කළේ. මේ රට උගස් කරන්න කථා කළේ. මම ජීවත් වන මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන සීගිරිය උගස් කරන්නයි, විකුණන්නයි කටයුතු කළේ. මේ රටේ එහෙම කටයුතු කළ යුගයක් තිබුණා. අද ඒ කට්ටිය සංවර්ධනය ගැන කථා කරනවා. එදා දවස් සියයේ වැඩසටහන ආවා මට මතකයි. වැලි කැටයක් පාරකට දාන්න බැරි වුණා. හුනු ටිකක් ගාන්න බැරි වුණා. අද එහෙම කට්ටිය සංවර්ධනය ගැන කථා කරනවා. අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ- [බාධා කිරීම්] කියන්න, කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ෂාරුක් ඛාන් වාගේයි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
බොහොම ස්තුතියි. ඔක්කොම අය ඛාන්ලා තමයි.

ගරු තලතා මන්ත්‍රීතුමියනි, ඔබතුමිය යන්න එපා. ඔබතුමිය සාරියක් ගැන කථා කළා. සාරියක් නොවෙයි, ඔබතුමිය ඕනෑම දෙයක් ඉල්ලුවොත් ජනාධිපතිතුමා දෙයි. භය වෙන්න එපා. ඉල්ලන ඕනෑම දෙයක් ජනාධිපතිතුමා දෙනවා. එහෙම ජනාධිපතිවරයෙක් අපිට ඉන්නේ. සාරියක් නොවෙයි, වෙන දෙයක් ඔබතුමිය ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්න. එතුමා නොදී ඉන්නවාද කියලා බලන්න. හැබැයි ඔබතුමියගේ නායකතුමාට ඒක කරන්න බැහැ. ඉල්ලන හැම දෙයක්ම එතුමාට දෙන්න බැහැ. ඔබතුමිය ගිහිල්ලා ඕනෑම දෙයක් ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවොත් මා දන්නවා සියයට සියයක්, ජනාධිපතිතුමා ඔබතුමියට එය දෙනවාය කියලා. ඒක සාරිය නොවෙයි.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කේන්ති ගන්න එපා. මා කිව්වේ ඔබතුමා අමීර් ඛාන් වාගෙයි කියලායි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඔතැන ශාරුක් ඛාන්, අක්ෂේ ඒ ඔක්කෝම ඉන්නවා නේ. ගම කන අයත් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කළේ මෙතෙක් පැවැති සම්ප්‍රදායෙන් ටිකක් බැහැරව ගිහිල්ලායි. ඒ නිසා එක පාරටම ගෙඩිය පිටින් දෙන දේවල්, මල්ල පුරවා දෙන දේවල් මේ අය වැයේ නැහැ. හැබැයි මුළු රටේම ගොවි ජනතාව ආවරණය වුණු, මුළු රටේම කම්කරුවන් ආවරණය වුණු, මුළු රටේම පාසල් දරුවන් ආවරණය වුණු, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ආවරණය වුණු, කෙටින් කියනවා නම් මුළු රටම ආවරණය කර ගත්ත අය වැයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. මිනිස්සුන්ගේ හදවත ගැහෙන රාවය දැන ගත්ත පොළොවේ පය ගහලා ඉන්න නායකයකු වශයෙන්, මුදල් ඇමතිවරයකු වශයෙන් තමයි එතුමා මේ අය වැය ඉදිරිපත් කළේ.

මේ අය වැයට අනුව රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,277.9කුත්, වියදම 1,785.4කුත් වනවා. ඒ වාගේම අය වැය හිඟය බිලියන 507.4ක් වනවා. දැන් මේ ප්‍රමාණයත් එන්න එන්න අඩු කර ගෙන තිබෙනවා. 2015 වන කොට අය වැය හිඟයේ පරතරය බොහොම අඩු කර ගෙන, ආදායම් වැඩි කර ගෙන, අපනයන ආදායම් වැඩි කර ගෙන, ආනයන වියදම් අඩු කර ගෙන -[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ අවස්ථාවේදී මූලාසනයට පැමිණීම ගැන මා සතුටු වනවා. විශේෂයෙන්ම මා කථා කරගෙන ආපු විධියට පසු ගිය කාලය තුළ අප රජය ලබා ගත්ත ජයග්‍රහණ ඉතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒ එකින් එක අරගෙන බැලුවොත්, අපේ ආර්ථික වර්ධනය පසු ගිය අවුරුද්ද සහ ඊට ඉස්සෙල්ලා අවුරුද්ද දිහා බලපුවාම සියයට 5 සිට සියයට 8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඒක පුද්ගල ආදායම මට මතක විධියට 2004 දී ඩොලර් 836ක්, 840ක් පමණ තිබුණේ. අද එය ඩොලර් 2,800 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. [බාධා කිරීමක්] 2004 දී ඩොලර් 836යි. අවුරුදු 50ක කාලයක් තුළ ඩොලර් 836ක් දක්වා පමණක් වැඩි වීමත්, පසු ගිය අවුරුදු 05 තුළදී එය ඩොලර් 2,000 ඉක්මවා යාමත් සංසන්දනය කර බලපුවාම ඉතාම වේගවත් සංවර්ධනයක් අතිගරු ජනාධිපතිතුමා මේ රට භාර ගත්තාට පස්සේ ඇති වෙලා තිබෙනවා කියායි මා හිතන්නේ. ඒක ඉතා පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මට මතක විධියට පසු ගිය කාලයේ උද්ධමනයේ ප්‍රතිශතය 27 ඉක්මවා ගියා. විරැකියාවේ ප්‍රතිශතය 27, 28 ඉක්මවා ගියා. අද විරැකියාවේ ප්‍රතිශතය 5යි. උද්ධමනයේ ප්‍රතිශතය 7යි. අද ඒක දවසින් දවස අඩු කරගෙන තිබෙනවා. මේ උද්ධමනය අඩු වෙන්න හේතුව මොකක්ද? රටේ ජාතික නිෂ්පාදනය වැඩි වෙමින් පවතිනවා. [බාධා කිරීමක්] ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමාගේ ගණන් නේ. ඒවා ඔබතුමාගේ ගණන්හිලවු නේ. මම කියන්නේ මහ බැංකුවේ ගණන්හිලවු, ඔබතුමාගේ ගණන්හිලවු නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අය වැය හිඟය සියයට 10 සිට සියයට 8 දක්වා අඩු කර ගෙන තිබෙනවා. ජාතික ආදායම දිහා බැලුවාම පෙනෙනවා, සියයට සියයක් ඉක්ම වූ රජයේ ණය සියයට 80 දක්වා අඩු කරගෙන තිබෙනවාය කියලා. ඒ වාගේම විදේශ සංචිතය US Dollars බිලියන 07ක පමණ තියා ගෙන යන්නට අද රජයට පුළුවන් වෙලා තිබෙනවා. මේ රටේ විදේශ සංචිතය මීට පෙර එවැනි අගයක තිබුණේ නැහැ. අද ඒක ස්ථාවර කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. එක පැත්තකින් ගෝලීය වශයෙන් නොයෙක් ප්‍රශ්න තිබුණා; දේශගුණික ගැටලු තිබුණා; කාලගුණික ගැටලු තිබුණා; මැද පෙරදිග රටවල තිබුණු ගැටලු නිසා තෙල්වල මිල උච්චාවචනය වීම් තිබුණා. මේවා ඔක්කෝමත් එක්කයි මේ රටේ ආර්ථික ස්ථාවරත්වයක් ඇති කර ගන්න රජයට හැකියාව ලැබිලා තිබෙන්නේ.

ඒ ඔක්කෝටම වඩා නීතිය හා සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් අවධානය යොමු කර තිබෙනවා. මෑත දිනකදී මාතර කඹුරුපිටියේ ඉදි කළ අභිමංසල සුවසහන මධ්‍යස්ථානය විවෘත කළා. රණ විරු ගම්මාන මේ රටේ ඇති කළා. රණ විරු බලවේගය ඇති කළා. පංචමහා බලවේගය වෙනුවට ෂඩ් මහා බලවේගයක් ඇති කර තිබෙනවා. ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කියනවා වාගේ පිට රට සේවය කරන අය අද ඒකට එකතු කර ගෙන තිබෙනවා. පෞද්ගලික අංශය ඒකට එකතු කර ගෙන තිබෙනවා. විශේෂයෙන් රණ විරු සේවා අධිකාරියට රුපියල් මිලියන 1,000ක් මේ වතාවේ ලබා දීලා, යුද්ධයේදී ආබාධිත වුණු රණ විරුවන්, යුද්ධයේදී මිය ගිය රණ විරුවන්ගේ පවුල්වල අය තනි වෙලා නැහැ කියන එක, ඔවුන් එක්ක රජය ඉන්නවා, ඔවුන් එක්ක මේ රටේ ජනතාව ඉන්නවා කියන එක පෙන්නුම් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විශ්වාසනීය බවක් ඇති කරලා තිබෙනවා. අර ගාථාවක් තිබෙනවා නේ, "ආරෝග්‍යා පරමා ලාභා - සංතුට්ඨී පරමං ධනං, විශ්වාසා පරමා ඤාතී......." කියලා. ඒ අනුව විශ්වාසවන්තම රාජ්‍ය නායකයෙක් අද අපට ඉන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එදා එහෙම හිටියේ නැහැ. විශ්වාසවන්ත නැඳෑයෙක් හිටියේ නැහැ. ඒ කාලයේ හිටපු සමහර නායකයින් සමඟ කථා කරන්න බැහැ. අදත් එහෙමයි. අපට විතරක් නොවෙයි, ඒ පක්ෂයේ අයටත් ගිහින් කථා කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශේෂයෙන් මේ සංවර්ධනය දිහා බලන්න ඕනෑ. එතුමන්ලා racing cars ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන්නේ රටකට ක්‍රීඩකයෝ -මයික් ටයිසන් වෙන්න පුළුවන්, ස්ටීව් වෝ වෙන්න පුළුවන්- මහා ධනයක්; asset එකක්, සම්පතක් කියලායි. හෙට අනිද්දා racing carsවල බදු අඩු කළාම -මේ රටේ ක්‍රීඩා භාණ්ඩවලට බදු නැහැ, අපි මීට කලින් ඒවායේ බදු අඩු කරලායි තිබෙන්නේ- කිසියම් කෙනෙක් racing car එකක් ගෙනැවිත් ඔහු ජාත්‍යන්තරයට ගියොත් ඒක අපේ රටට සම්පතක්. අනාගත සම්පත් එන විධියට තමයි මේ අය වැය හදලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ක්‍රිකට් කණ්ඩායම ගැන බලන්න. මේවා විවේචනයට ලක් කරන්න නොවෙයි ඕනෑ, මේවා පිළිබඳව පැහැදිලිව දකින්න පුළුවන් මනසක් හදා ගන්නයි ඕනෑ. ස්තුතියි.

[අ.භා. 5.05]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ 08 වැනි අය වැය ලේඛනය අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන් විසින් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා, ඒ පිළිබඳව දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයේ සිටින මේ අවස්ථාවේ සභාව අමතා වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාම සන්තෝෂයට පත් වෙනවා.

අද උදෑසන සිට මේ සභාවේ කළ කථා දිහා බලපුවාම බොහොම පැහැදිලිවම මෑත ඉතිහාසයේ ලෝකයේ ඇති වුණු අර්බුදකාරී තත්ත්වයත් එක්ක, ඇමෙරිකාවේ, යුරෝපයේ ඇති වුණු ආර්ථික අවපාතයත් එක්ක, විශේෂයෙන්ම මැද පෙරදිග, ලිබියාව, සිරියාව, ඉරාකය සහ ඉරානය ඇතුළු රටවල ඇති වුණු ගැටලුකාරී තත්ත්වයත් එක්ක අපේ ආර්ථිකයට සෘණ බල පෑමක් ඇති වෙලා, විවිධ අර්බුද මැද්දේ ඉදිරියට යන ආර්ථිකයක හොඳ, සුබදායී, ධනාත්මක චින්තනයක් මේ රටට ඉදිරිපත් කරලා, අපේ ආර්ථිකය හොඳ ශක්තිමත් පදනමක පිහිටුවලා, සියයට 7කට වඩා වැඩි ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්නට ජනතාවගේ පැත්තෙන් බලලා, ජනතාවාදීව, මානව හිතවාදීව කටයුතු කළ ආණ්ඩුවක තවත් ඉදිරි පියවරක් හැටියට අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනය පිළිබඳව අපේ ශුභාශිංසන එතුමාට පුද කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 පොදුජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වුණාට පසුව මේ රටේ දුක් විඳින ගම් මට්ටමේ ජනතාව වෙනුවෙන් ස්ථාපනය කරන්නට යෙදුණු වැඩ පිළිවෙළ තවත් ශක්තිමත්ව එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය 2004 බලයට පත් වෙලා ඉදිරියට ගෙන යන මේ මොහොතේදී

පසු ගිය කාල වකවානුව වාගේම මෑත ඉතිහාසයේදීත් පාසල් දරුවන් වෙනුවෙන් විශේෂ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නටත්, ඒ වාගේම පසු ගිය අවුරුද්දේ අය වැය ලේඛනයෙන් සමෘද්ධි සහනාධාරය ලෙස පවුලකට අවම වශයෙන් රුපියල් 1,000ක් ලබා දෙන්නටත්, මේ රටේ වයස්ගත අම්මලා තාත්තලා වෙනුවෙන් වැඩිහිටි දීමනාව රුපියල් 1,000ක අවම මුදලක් දක්වා වැඩි කරන්නටත් එතුමා කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේ මෑත ඉතිහාසයේ බොහොම කථා බහට ලක් වුණු, මෑත ඉතිහාසයේදී විශාල අසාධාරණයකට ගොදුරු වුණු 1980 ජූලි වර්ජකයින් වෙනුවෙන් රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්නත් එතුමන් කළ ඒ උත්තරීතර කාර්ය පිළිබඳව අපේ ගෞරව පූර්වක ස්තුතිය එතුමන්ට මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ලෝකයේ මෑත ඉතිහාසයේ දියුණු වුණු අපේ අවට කලාපයේ චීනය සහ ඉන්දියාව ගැන බැලුවාට පසුව ඒ රටවලට වේගවත් දියුණුවක් ලබා ගන්නට ඉවහල් වුණේ ඒ රටවල මානව සම්පතය කියන කාරණය අපි බොහොම පැහැදිලිව දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ තිබෙන ඉහළම සම්පත, උපරිමයෙන් අපි භාවිත කළ යුතු සම්පත තමයි මේ රටේ මානව සම්පත. මම හිතන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමා පුරෝකථනය කළ විධියට සියයට 7.5ක ආර්ථික වර්ධන වේගය මේ අවුරුද්දේ පවත්වා ගෙන යන්න පමණක් නොවෙයි, මේ ආර්ථික වර්ධන වේගය පසු ගිය අවුරුදු දෙකේ වාගේ සියයට 8කට, සියයට 9කට අරගෙන යන්න නම් අපි කළ යුතු වැදගත් කර්තව්‍යයක් තිබෙනවා. ඒ කර්තව්‍ය තමයි මේ රටේ මානව සම්පත සංවර්ධනය කිරීමේ කටයුත්ත. මම හිතන්නේ ඒ වෙනුවෙන් විවිධ අමාත්‍යාංශ හරහා හොඳ ප්‍රතිපාදන සැලසිලා තිබෙන මොහොතක, මේ රටේ ශ්‍රම බලකායට වාර්ෂිකව ලක්ෂ 3කට ආසන්න තරුණ පිරිසක් එකතු වන මොහොතක, ඔවුන්ගේ වෘත්තීය හැකියාව ඉහළ නංවන්නට, භාෂා දැනුම ප්‍රගුණ කරවන්නට, විශේෂයෙන්ම අපේ කර්මාන්ත අධි තාක්ෂණික කර්මාන්ත අංශයට තවම යොමු වෙලා නැති නිසා මේ රටේ, මේ ලෝකයේ ඇති රැකියා අවස්ථා සඳහා තාක්ෂණික දැනුම ඉහළ නංවලා සේවා අංශයෙන් හොඳ සේවාවක් සපයන්න අවශ්‍ය පසු තලය සකස් කර ගැනීමේ වගකීම අපට තිබෙනවා. ඒ වෙනුවෙන් විවිධ වෘත්තීය පුහුණු ආයතන මඟින් සහ විශ්වවිද්‍යාල මඟින් මෙරටට බිහි කරන උපාධිධාරීන් මේ ලෝකයේ තිබෙන වෙළෙඳ පොළ තත්ත්වයන් එක්ක ඇති රැකී රක්ෂා අවස්ථා සඳහා යොමු කර ගැනීම පිණිස අපේ පාඨමාලාවන් වෙනස් කර ගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලෝකයේ සේවා හා බැඳුණු රැකී රක්ෂා අවස්ථා සඳහා -සංචාරක කර්මාන්තය වේවා, ඉදි කිරීම් අංශය වේවා, තාක්ෂණ අංශය වේවා, විවිධ ඉදි කිරීම් හා බැඳුණු ස්වාභාවික සම්පත් කර්මාන්ත වේවා, පරිසරය සමඟ බැඳුණු අංශ වේවා, භාෂාමය හැකියාවන් ප්‍රගුණ කරන Business Process Outsourcing යටතේ විවිධ රටවලින් ලැබෙන ව්‍යාපාර මෙරට ස්ථාපනය කිරීම සඳහා වේවා- අපේ දරුවන් පුහුණු කර ගැනීම කළ යුතුයි.

ඒ වෙනුවෙන් අපි විශේෂ අවධානයක් යොමු කර කටයුතු කළ යුතුව තිබෙන යුගයක් තමයි මේ වකවානුව. ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරන අතරේ, අපේ මානව සම්පත සංවර්ධනය කරලා මේ රටේ ආර්ථික වර්ධන වේගය ඉහළට ගෙන යන්න කටයුතු කරන අතරේ අතිගරු ජනාධිපතිතුමන්ට අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් මේ රටේ ජීවනාලිය බඳු වුණු කෘෂි කර්මාන්තයේ දියුණුව වෙනුවෙනුත් විශාල සහන සලසා දෙන්න, මේ රටේ කෘෂි ආර්ථිකය ශක්තිමත් කරන්න විශාල ප්‍රතිපාදනයක් -පිරිවැයක්- වෙන් කර තිබෙනවා. මේ රට නිදහස ලැබුවාට පසු මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන්ගේ කාලයෙන් පසු කෘෂි කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් වැඩිම වැඩ කොටසක් කළේ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවයි -එක්සත් ජනතා සන්ධාන ආණ්ඩුව- කියන කාරණය අපට ඉතාම නිර්භයව ප්‍රකාශ කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඈත ගම් නියම් ගම්වල ඇළ වේලි කැපුවා, වාරි මාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළා, බිත්තර වී ටික නොමිලේ දුන්නා, කෘෂි රසායන නොමිලේ ලබා දුන්නා, වීවලට සහතික මිලක් ලබා දුන්නා, වී අළෙවි මණ්ඩලය නැවත ස්ථාපනය කළා. ඒ විතරක් නොවෙයි, නැවත වගා කිරීම සඳහා තරුණ තරුණියන් අතර ඉඩම් බෙදා දීලා කුරුඳු පැළ ටික නොමිලේ දීලා, රබර් පැළ ටික නොමිලේ දීලා, තේ පැළ ටික නොමිලේ දීලා කෘෂි කර්මාන්තය වෙනුවෙන් දැවැන්ත සේවාවක් පසු ගිය කාලයේ ඉටු කළා. ගම් මට්ටමේදී ඒ ජනතාවගේ ප්‍රතිචාරවලින් අපි ඒ බව දන්නවා. මේ රටේ අපනයන කෘෂිකර්මය වෙනුවෙන් ලැබෙන ආදායමෙන්, තේ වගාවෙන් ලැබෙන ආදායමෙන්, මේ රටට රබර් වෙනුවෙන් ලැබෙන වාර්තාගත ආදායමෙන්, පසු ගිය කාල වකවානුවේ විශාල ගැමි ජනතාවක් තමුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගෙන මධ්‍යම ආදායම් ලබන තත්ත්වයට පත් වුණා. ඒක අපිට විශාල සතුටක්.

කෘෂිකර්මාන්තය දියුණු කරන්න කටයුතු කරනවා වාගේම ඉදිරි කාල වකවානුව තුළදී මේ රටට, ජාතික ආර්ථිකයට සිවිල් යුද්ධයෙන් පසු විශාල දායකත්වයක් ලැබුණු උතුරු නැඟෙනහිර පළාත්වල කෘෂි කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් යාන්ත්‍රීකරණය වැඩි කර හොඳ ඵලදායීතාවයක් ලබා ගෙන ඉදිරියට යාම සඳහා අපි නව මුහුණුවරකින් අපේ කෘෂි කර්මාන්තය දියුණු කළ යුතුයි කියන කාරණය මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම ඵලදායිතාවය වැඩි කර ගෙන පෙර අස්වනු තාක්ෂණයෙන්, පසු අස්වනු තාක්ෂණයෙන් මේ රටේ කෘෂි කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ නංවාගෙන අපි මේ රටේ නිෂ්පාදනය කරන ගොවියාට හොඳ මුදලක් ලබා දෙනවා වාගේම පාරිභෝගිකයන් ආරක්ෂා කර ගෙන අතිරික්තය පිටරට යවන්න, සුළු අපනයන භෝග අංශයෙන් විශාල සංවර්ධනයක් ලබා ගන්න අපි සැලසුම් සහගතව කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී කථිකයන් කිහිප පොළක් අවධානය යොමු කළ මේ රටේ වෙළෙඳ ශේෂය පිළිබඳව සුළුවෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මම කෙටි කාලයක් යොමු කරනවා. පසු ගිය වර්ෂ කිහිපය පුරාවට අපේ අපනයනයන් දිරිමත් වෙලා අපනයන ආදායම වැඩි වුණත් මේ රටට පිට රටින් ගෙන්වන සමහර බඩු භාණ්ඩ නිසා මෙරට ආනයනයන් සියයට 60කින් වැඩි වෙලා වෙළඳ ශේෂය පිළිබඳ සුළු ගැටලුවක් මතු වෙලා තිබුණා. මෙරට නිෂ්පාදනය කළ හැකි, දැනට මෙරට සීමිතව නිෂ්පාදනය කෙරෙන සමහර ද්‍රව්‍ය විශේෂයෙන්ම එළවලු පලතුරු වැනි ද්‍රව්‍ය මෙරටට විශාල ලෙස ආනයනය කෙරෙනවා. කිරි පිටි විශාල ලෙස ආනයනය කෙරෙනවා. මෙරටට අත්‍යවශ්‍ය නොවන විදුලි උපකරණ ඇතුළු සමහර ද්‍රව්‍ය විශාල ලෙස ආනයනය කෙරෙනවා. මෙරටට සීනි විශාල ප්‍රමාණයක් ආනයනය කෙරෙනවා. පොහොර විශාල ප්‍රමාණයක් ආනයනය කෙරෙනවා.

මේ ගරු සභාවේදී කථික මහත්වරුන් පෙන්වා දුන් ආකාරයට මෙරටට පොහොර ගෙන්වීම සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් බිලියන 40කට ආසන්න මුදලක් වැය කරනවා. සීනි ආනයනය වෙනුවෙන් රුපියල් බිලියන 55ක් වැය

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කරනවා. කිරිපිටි ආනයනය වෙනුවෙන් ඊට වඩා වැඩි මුදලක් වැය කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මුදල එකතු කළාට පසු අපිට බොහොම පැහැදිලිව පෙනෙනවා, රුපියල් බිලියන 250කට වඩා වැඩි දැවැන්ත ධනස්කන්ධයක් මේ රටේ නිෂ්පාදනය කළ හැකි ද්‍රව්‍ය වෙනුවෙන් පිට රට යනවාය කියන එක. දේශීය කිරි නිෂ්පාදනය වැඩි කරන්නට, දේශීය සීනි නිෂ්පාදනය වැඩි කරන්නට කටයුතු කළ යුතුවා වාගේම කාබනික පොහොර නිෂ්පාදනය වැඩි දියුණු කරලා මේ රටේ පොහොර පුළුවන් තරම් නිපදවා ගැනීම සඳහා අවශ්‍ය පදනම සකසා ගත යුතුයි කියන කාරණය මා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

මෙන්න මේ කරුණු හොඳින් සංකලනය කර ගෙන මේ වෙනුවෙන් රාජ්‍ය අංශයේ වාගේම පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගෙන රාජ්‍ය අංශයේත් පෞද්ගලික අංශයේත් සහයෝගීතාවයෙන් මේ රටේ දළ ජාතික නිෂ්පාදනය වඩා ඉහළට ගෙන යන්නට කටයුතු කළ යුතුයි. ඉතාම ශීඝ්‍රයෙන් දියුණු වන චීනයේ ආර්ථිකයත් එක්ක, ඉතාම ශීඝ්‍රයෙන් දියුණු වන ඉන්දියාවේ ආර්ථිකයත් එක්ක බද්ධ වෙලා අපේ රටේ ආර්ථිකය සියයට 8කට වඩා වැඩි වර්ධන වේගයකින් පවත්වාගෙන ගිහින් තිබෙනවා.

මේ රටේ දුගී දුප්පත් ජනතාවට මෑත ඉතිහාසයේදී ලබා දුන් දැවැන්තම සංවර්ධන ප්‍රතිලාභ තුළින් සෑම නිවසකටම විදුලිය ලබා දුන්නා වාගේ, නිවාස විශාල ප්‍රමාණයකට පානීය ජල පහසුව ලබා දුන්නා වාගේ ඈත ගම් දනව්වල මංමාවත් සංවර්ධනය කරලා, දැවැන්ත අධිවේගී මාර්ග හරහා ගම් නගර යා කළා වාගේ ඉදිරි කාල වකවානුවේදීත් මේ දැවැන්ත යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රතිලාභ ගම් මට්ටමේ ජනතාවට ලබා දී අපට මේ රට ආසියාවේ ආශ්චර්යය බවට පත් කරන්න පමණක් නොවෙයි මේ රට ආසියාවේ වඩාත්ම ආකර්ෂණීය රට බවට පත් කරලා අපේ රටේ ජනතාවට ඊයේට වඩා හොඳ හෙට දවසක් ලබා දෙන්නට අපේ රජය කටයුතු කරනවා. අපි බොහොම පැහැදිලිව දන්නවා, ඒ වාගේම අපේ හදවතට තට්ටු කරලා ඇහුවොත් කියාවි, මේ රටේ ජීවත් වෙන ජනතාව වර්ෂ 2000 දී ජීවත් වුණාට වඩා අද හොඳින් ජීවත් වෙන බව; ඒ වාගේම වර්ෂ 2005 දී ජීවත් වුණාට වඩා අද හොඳින් ජීවත් වෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු ජනාධිපතිවරයකු වූ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමන්, එතුමන්ගේ ඡන්ද ව්‍යාපාරයේ කථාවකදී සඳහන් කළ කාරණයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. "මේ රටේ එක වේලක් කන දරුවන්ට වේල් දෙකක් කන්න, වේල් දෙකක් කන දරුවන්ට තුන් වේලම කන්නට, සපත්තු නැති දරුවන්ට සපත්තු දමන්නට, සෙරෙප්පු නොදමන දරුවන්ට සෙරෙප්පු දමන්නට අවශ්‍ය පදනම සකස් කරනවාය" කියන කථාව එතුමා තමන්ගේ මැතිවරණ වේදිකාවලදී කිව්වා. එක වේලක් කන දරුවන්ට වේල් දෙකක් කන්නට, සපත්තු නොදමන දරුවන්ට සපත්තු දමන්නට, සෙරෙප්පු නොදමන දරුවන්ට සෙරෙප්පු දමන්නට, බයිසිකලයක් නැති අයට බයිසිකලයක් ගන්නට, ත්‍රීවීලර් රථයක් නැති අයට ත්‍රී වීල් රථයක් ගන්නට අවශ්‍ය පදනම සකස් කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයයි කියන එක බොහොම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. ඒ වාගේම මේ ආණ්ඩුව ඉදිරි මැතිවරණ දෙක, තුනක කාලයක් නොවෙයි තව අවුරුදු 25ක් අඛණ්ඩව මේ රට පාලනය කරනවාය කියන කාරණයත් ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

[අ.භා. 5.16]

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා අඛණ්ඩව ඉදිරිපත් කළ අය වැය අතරින් 8 වන අය -2013 අය වැය- ඉතාම සාර්ථක, ඒ වාගේම ප්‍රායෝගික අය වැයක් විධියට මේ රටේ ජන සමාජයේ සියලු පැතිකඩවල් ආවරණය වෙන පරිදි ඉදිරිපත් කරන්නට ක්‍රියා කිරීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙනවා. මුදල් ඇමතිවරයා විධියට එතුමා භාර ගත් දැවැන්ත, භාරදූර තීන්දුව පිළිබඳව අපේ ගෞරවය, අපේ ස්තුතිය අපි අතිගරු ජනාධිපතිතුමාට පිරිනමනවා. මේ රටේ රාජ්‍ය නායකයෝ විශාල පිරිසක් හිටියා. ඒ සියලුම රාජ්‍ය නායකයන් පිළිබඳව අපේ මතකය අවදි කර ගෙන ඔවුන් කරපු හොඳ වැඩ, නරක වැඩ යන මේ සියල්ලම මෙනෙහි කර ගෙන යම් කිසි සම්මතයක් ප්‍රකාශ කරන්න මා කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන රාජ්‍ය නායකයෙක් බලයට පත් වුණත් ඒ බලයට පත් වුණ දවසේ ඉඳලා තමයි ඒ රජය පිරිහීමට පටන් ගන්නේ.

උදාහරණයක් වශයෙන් රජය කඳු මුදුනක් නම් විපක්ෂය තමයි ඒ කන්දේ පා මුල තිබෙන සාණුව. රජය පිහිටවපු දවසේ ඉඳලා කඳු මුදුනේ තිබෙන පස්, වැලි, පාංශු ටික ඛාදනය වෙලා ඇවිල්ලා කඳු පා මුල -විපක්ෂයට- තමයි එකතු වෙන්නේ. ඒ අවුරුදු ගණන යනකොට නිකම් හිටියත්, කිසියම්ම දෙයක් නොකර හිටියත් ස්වභාවිකව විපක්ෂය ශක්තිමත් වීමේ යම් කිසි පොදු ධර්මතාවක් තිබෙනවා. ඒ සියලුම ධර්මතාවන් යටපත් කරලා අතිගරු ජනාධිපතිතුමා අවුරුදු අටක් ගිහිල්ලා ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කළා. ඒ විතරක් නොවෙයි, දැවැන්ත පෞරුෂයකින් හෙබිව එතුමා මේ රට මනා කළමනාකාරිත්වයක් ඇතිව පාලනය කරනවා. එපමණක් නොවෙයි දවසින් දවස, මාසයෙන් මාසය, අවුරුද්දෙන් අවුරුද්ද එතුමාගේ ශක්තිය, බලය, මහජන පිළිගැනීම වැඩි වෙලා තිබෙනවාය කියන එක අපි මේ සභාවේදී ඉතාම සන්තෝෂයෙන් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ ඒ දීර්ඝ අත් දැකීම් සම්භාරය තුළ සැලසුම් සියල්ල කැටි කරලා, මේ රටේ සමස්ත ජනතාව ජීවත් වෙන විධිය, ඔවුන්ගේ සිතුම් පැතුම් සහ අවශ්‍යතාවන් පිළිබඳව ඉතා හොඳින් අධ්‍යයනය කරලා, ප්‍රායෝගිකව ඇස් පනා පිට ඒ සියල්ල දැකලා තමයි මේ සාර්ථක අය වැය මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා 2013 දී අපේ රට කරවන වැඩ පිළිවෙළ එළි දක්වන්නේ.

අපේ රට කෘෂි කාර්මික රටක්. මේ රටේ සියයට 60ක්, 70ක් ජනතාව කෘෂිකර්මාන්තයත් එක්ක පොර බදන පිරිසක්. පසු ගිය හත් අවුරුදු කාල සීමාව තුළ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් දවසින් දවස, අවුරුද්දෙන් අවුරුද්ද, කෘෂි කර්මාන්තයේ නියැලෙන ඒ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න, ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ඔවුන්ගේ වී අස්වැන්න වැඩි කරන්න විවිධ තීන්දු අරගෙන තිබෙනවා. අද වෙන කොට ඒ සියල්ලේ උපරිමයට එන්න තරම් ජනාධිපතිතුමාගේ ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ඵල දරා තිබෙනවාය කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. තවදුරටත් ඒ සියල්ල තහවුරු කරමින්, ශක්තිමත් කරමින් තිබෙනවා.

රසායනික පොහොර භාවිතයට අපේ රට නිකම්ම හුරු පුරුදු වුණා නොවෙයි. අපේ ගොවි මහත්වරු රසායනික පොහොර

දාන්න බලහත්කාරයෙන් කටයුතු කළා නොවෙයි. එවකට තිබුණු රජයන් තමයි මේ රසායනික පොහොර ආනයනය කරලා නොමිලේ දුන්නේ. මට මතකයි, අපේ දෙමව්පියන් කියනවා, එක්දහස් නවසිය තිස්හතළිස් ගණන්වලදී රසායනික පොහොර ගෙනැල්ලා, නොමිලේ ගොවීන්ට දීලා බලහත්කාරයෙන් ඒ පොහොරවලට පුරුදු කළා කියලා. එහෙම තමයි මේ රසායනික පොහොර භාවිතය අපේ රටේ ප්‍රචලිත කෙරුවේ. ඒ තුළ අද අපි බරපතළ විධියේ විවිධ අතුරු ආබාධවලට, විවිධ ප්‍රශ්නවලට ගොදුරු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඒ විතරක් නොවෙයි, පොහොර වෙනුවෙන් වැය වන විදේශ විනිමය පැත්තෙනුත් අද අපි බරපතළ විධියට හෙම්බත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සියල්ල දරා ගනිමින් තමයි අපි පොහොර සහනාධාරය වශයෙන් පොහොර මිටියක් රුපියල් 350කට දීලා, මේ රටේ කෘෂි කර්මාන්තයේ අලුත් අස්වැන්නකට -වැඩි අස්වැන්නකට- අවශ්‍ය ප්‍රවේශය නිර්මාණය කර ගන්නේ. රසායනික පොහොර භාවිතය නිසා පසු ගිය අවුරුදු 50ක, 60ක කාල සීමාවක් තුළ අපි අත් දැකපු ඒ තත්ත්වයන් සියල්ල මෙනෙහි කරලා, එයට විරාමයක් තියන්න තමයි ජනාධිපතිතුමා යෝජනා කරන්නේ, කොම්පෝස්ට් පොහොර භාවිතය මේ රටේ ප්‍රචලිත කරන්න කාලය ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ අනුව කොම්පෝස්ට් භාවිත කරන ගොවියා නිෂ්පාදනය කරන වී කිලෝවකට තව රුපියල් 5ක් වැඩි කරලා රුපියල් 40කට මිලදී ගන්න තීරණය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොම්පෝස්ට් යොදලා වගා කරන වී අස්වැන්න වැඩි මිලකට ගන්නේ, ගොවියා දිරිමත් කරලා කොම්පෝස්ට් පොහොර භාවිතය මේ රටේ ප්‍රචලිත කරන්නයි.

කිරි ගොවීන් සම්බන්ධව කථා කළත් එහෙමයි. කිරි ගොවීන් තව දුරටත් ශක්තිමත් කරන්න අය වැය ලේඛන තුළින් යම් යම් තීන්දු, තීරණ ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කාර්මාන්තය පිළිබඳව විතරක් නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත සියල්ල තවදුරටත් ශක්තිමත් කරන විවිධ සහනාධාර, විවිධ වැඩ පිළිවෙළ, මඟ පෙන්වීම් මේ අය වැය තුළ ගැබ් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්නම් බදු සහන පිළිබඳව. වාර්ෂිකව මිලියන 12ට අඩු ආදායමක් උපයා ගන්නා උදවියගෙන් අය කරන වැට් බද්ද සහ ජාතිය ගොඩ නැඟීමේ බද්ද ඉවත් කරලා විශාල බදු සහනයක් දීලා තිබෙනවා. මම දන්නවා, අපේ ගම්වල, අපේ ප්‍රදේශවල, අපේ නගරවල ප්‍රායෝගිකව මේ ව්‍යාපාරවල, කර්මාන්තවල නියැලෙන ආධුනිකයන්ට මේ බදු සහනයත් එක්ක අද විශාල ශක්තියක් ලැබෙන බව. වැට් බද්ද සහ ජාතිය ගොඩ නැඟීමේ බද්ද ඉවත් කරලා ඔවුන්ට දීපු සහනය තුළ ඔවුන්ගේ කර්මාන්ත, ව්‍යාපාර, ඒ වෙළහෙළඳාම් ඉතාම ශක්තිමත්ව පවත්වාගෙන යන්න පුළුවන්කමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම සෞඛ්‍ය සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත්තත් එහෙමයි. මේ රටේ ඉතාම සංවේදී මාතෘකා තමයි අධ්‍යාපනය සහ සෞඛ්‍ය. ඒ අංශ තවදුරටත් ශක්තිමත් කරන විධියට, ඒවායින් මහජනතාවට වඩාත් ප්‍රයෝජනයක් සැලසෙන විධියට මේ අය වැය ලේඛනය තුළින් යම් යම් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. මම එකින් එක කරුණු ප්‍රකාශ නොකළත් මේ රටේ සියලු අංශ කෙරෙහි විශාල වශයෙන් සහයෝගයක් දීමට මේ අය වැයෙන් කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ පසු ගිය කාලයේ තිබුණු බරපතළ ආන්දෝලනාත්මක මාතෘකාව තමයි දිවි නැගුම පනත. දිවි නැගුම පනත කියන්නේ මේ රටේ මෑත ඉතිහාසයේ පාර්ලිමේන්තුව හමුවට ආපු ඉතාම ප්‍රගතිශීලී පනතක්. අපේ ඉතිහාසයේ අපි කියවලා තිබෙනවා, එවැනි ප්‍රගතිශීලි පනත් පිළිබඳව. අඳ ගොවි පනත ඒ කාලයේ මේ රටේ මහජනතාව ඉතාම දැඩිව වැලඳ ගත්තු පනතක් වුණා. බස් ජන සතු කිරීමේ පනත ඒ කාලයේ තිබුණු ප්‍රගතිශීලී පනතක් වුණා. ඒ වාගේම 1972 දී ඉඩම් අත්පත් කර ගැනීම එහෙම නැත්නම් ඉඩම් අයිතිය සීමා කිරීම සඳහා ගෙනාපු පනත. ඒවා හා සමාන, ඉතාම සාර්ථක දිවි නැගුම පනත මේ පාර්ලිමේන්තුව හමුවට ගෙනැල්ලා, මේ අය වැය ලේඛනයට බද්ධ කරලා තිබෙනවා. මේ සියල්ල කරනු ලබන්නේ ගමේ, ගමේ ගෙදර ආර්ථිකය ශක්තිමත් කරන්නයි. පවුලේ සාමාජිකයන්ට ඒ මාසය තුළ ජීවත් වීම සඳහා ආර්ථික පහසුකම සපයා ගැනීමට අවශ්‍ය ප්‍රවේශයක් තමයි අපි මේ වැඩ පිළිවෙළ හරහා නිර්මාණය කර තිබෙන්නේ.

අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබෙන අය වැය පිළිබඳව අද උදේ සිට මේ මන්ත්‍රීතුමන්ලා - විශේෂයෙන්ම විපක්ෂයේ- විවිධ අර්ථකථන දුන්නා; විවිධ විවේචන ඉදිරිපත් කළා. සම්ප්‍රදායයක් විධියට විපක්ෂය අය වැය විවෙචනය කිරීම ගැන අපට ලොකු මතභේදක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න මෑත ඉතිහාසයේ ඉදිරිපත් කරපු ඉතාම සාර්ථක ප්‍රායෝගික අය වැයක් විධියට තමයි අපි මේ අය වැය දකින්නේ. ඒ තුළ අද රජය විශාල විධියට ශක්තිමත් වෙලා තිබෙනවා. අපේ රජයට අභියෝගයක් වෙච්ච සියලු දේශපාලන පක්ෂ, සියලු කණ්ඩායම් අද නන්නත්තාර වෙලා තිබෙනවා. ඒ විවිධ කණ්ඩායම් අද විශාල සෝදා පාළුවකට ලක් වෙලා තිබෙනවා. පසු ගිය මැතිවරණවලදී විශාල විධියට මේ රටේ මහජනතාවට ආමන්ත්‍රණය කරපු පිරිස් අද ජනතාව අතරින් සේදී යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මා හිතන හැටියට මේ අය වැය අවසන් වන විට, මේ ආණ්ඩුව තවත් ශක්තිමත් වන විධියට තවත් මන්ත්‍රීවරු ගණනාවක් රජයත් එක්ක අත්වැල් බැඳ ගන්නා ඉතාම ශ්‍රේෂ්ඨ වැඩ පිළිවෙළකට මේ අය වැය පත් වනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මේ අය වැය ලේඛනය පිළිබඳව රටේ සාමාන්‍ය ජනතාව ඉතාම ප්‍රශංසා මුඛයෙන් සාකච්ඡා කළා විතරක් නොවෙයි, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා මෑත ඉතිහාසයේ ඉදිරිපත් කරපු දැවැන්ත අය වැයක් විධියට ඒ ජනතාව මේ අය වැය දැඩිව ග්‍රහණය කර ගත්තාය කියන එක මතක් කරමින් මගේ අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 5.26]

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2005 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමා මේ රටේ නායකයා හැටියට පත්වෙලා, මහින්ද චින්තන දැක්ම තුළින් මේ රට ගොඩ නඟන අවස්ථාවේදී, 2005 සිට 2011 වර්ෂය දක්වා එතුමා විසින් අය වැය යෝජනා හතක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ මහින්ද චින්තන තුළින් දුන්

[ගරු ලොහාන් රත්වත්තේ මහතා]

පොරොන්දුවලින් සියයට 95ක් පමණ - ඒ පොරොන්දු සියල්ලම වාගේ- මේ වන විට ඉෂ්ට කර තිබෙනවා. මේ රටේ තිබුණු දරුණුම ප්‍රශ්නය වූ යුද්ධය අවසන් කරලා අපේ රටට නිදහස ලබා ගත්ත එක තමයි එයින් ප්‍රධාන දේ. මේක පුන පුනා කියන්න ඕනෑ නැහැ කියලා සමහරු කියනවා. හැබැයි, මා හිතන විධියට ඒක තමයි විශේෂම කාරණය. අපේ රටට නිදහස ලබා දීමෙන් පස්සේ, එතුමා ඉදිරිපත් කළ අට වන අය වැය ලේඛනය දෙවන වර කියැවීමේ විවාදයට සම්බන්ධ වෙලා තමුන්නාන්සේ ඉදිරියේ කථා කිරීමට අවසථාවක් ලැබීම ගැනත් මම සන්තෝෂ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් දන්නා පරිදි අතිගරු ජනාධිපතිතුමා මේ අය වැය සකස් කිරීමේදී ගොවි ජනතාව ගෙන්වලා, ගොවි ජනතාවගේ අදහස් උදහස් එකතු කර ගෙන, ඒ වාගේම කම්කරු පන්තියේ සියලුම ප්‍රශ්න ගැන සොයා බලා කරුණු එක් රැස් කළා. ඒ විතරක් නොවෙයි, සියලුම රාජ්‍ය සේවකයන්ගේ අදහස් උදහස් එක්කාසු කර ගත්තා. ඒ වාගේම දේශපාලන තලයේ සිටින සියලුම ප්‍රාදේශීය සභා, පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යවරුන් යන සියලු දෙනාගේම අදහස් එක්කාසු කර ගෙනයි මේ අට වන අය වැය ලේඛනය ඉදිරිපත් කළේ. ඒ අනුව සංවර්ධනය මූලික කර ගත්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම මූලික කර ගත්, ජනහිතවාදී ඉතාම ශ්‍රේෂ්ඨ අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, ඒ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරින්ටත් අපේ ස්තුතිය, ප්‍රණාමය පුද කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් අපට පෙර කථා කළා. සඳුදා දිනයේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කරමින් සිටියදී අපේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවා. එතකොට එතුමා උත්තර දුන්නේ, "මට ඒ ප්‍රශ්නය අදාළ නැහැ. මම ඒ වනකොට එක්සත් ජාතික පක්ෂයේ හිටියේ නැහැ" කියලායි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු හැටියට මා විශ්වාස කරනවා, අප සියලු දෙනා පක්ෂවලට බැඳෙන්නේ ඒ පක්ෂවල තිබෙන ප්‍රතිපත්ති සහ ඒ පක්ෂයේ සිටින නායකයන් කෙරෙහි ඇති විශ්වාසය අනුවයි කියලා. එම නිසා ඒ මන්ත්‍රීවරයාට මා කියා සිටිනවා, මීට පස්සේ තමුන්නාන්සේ යම් පක්ෂයක ඉන්නවා නම්, ඒ පක්ෂය කලින් කළ දේවල්වලටත්, දැන් කරන දේවල්වලටත්, ඉදිරියට කරන්නට යන දේවල්වලටත් -ඒ සියලු දෙයට- වගකිව යුතුයි කියලා.

බණ්ඩාරනායක මැතිතුමාගේ කාලයේ පටන් අපිත් -අපේ පවුලේ අය- ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳිලා අද වනතෙක් එම පක්ෂයේ කටයුතු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා හරි දේ කළත්, වැරදි දේ කළත් ඒ සියලු දෙයට වග කියන්න අපි නැඟී සිටිනවා.

2002 - 2004 ආණ්ඩුව කාලයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වශයෙන් සිටි ගරු මන්ත්‍රීතුමා අද උදේ අධිකරණයේ නිදහස ගැන කථා කළා. එතුමාට මා කියන්න කැමැතියි, එතුමා තමයි 2001 වර්ෂයේ පැවැති මැතිවරණයෙන් පස්සේ, හොර නඩුවක් හදලා අපේ පවුලේ සියලු දෙනාත්, යුද හමුදා නිලධාරින් 35කට අධික පිරිසකුත් අවුරුදු එකහමාරකට වැඩි කාලයක් සිරගත කළේ. අපි අවුරුදු හතරක් නඩු කියලා, ඒ සියලු චෝදනාවලින් බේරිලා එද්දී, එතුමා අපිව එල්ලන්න කඹයකුත් ගෙනත් තිබුණ බව මා එතුමාට මතක් කර දෙන්න ඕනෑ. ඉතින් දැන් එතුමා අධිකරණයේ නිදහස ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් කථා කරමින් ඇහුවා, කුඩු කොහෙන්ද ආවේ, පාතාල කල්ලි කොහෙන්ද ආවේ කියලා. මේවා සියල්ල ගෙනාවේ බුදු හාමුදුරුවන්ගේ බණ පදවලින් අද අපට හොඳ කථාවක් කළ එතුමාගේ පියාගේ කාලයේ කියලාත් මතක් කර දෙන්න මා කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විපක්ෂයට පෙන්නුම් කර දෙන්න ඕනෑ, 2002 - 2004 දක්වා කාල පරිච්ඡේදය තුළ එතුමන්ලා අය වැය හැදුවේ කෙසේද කියලා. ජයරත්න හේරත් මැතිතුමා කිව්වා වාගේ වායු සමීකරණය කරපු කොළඹ කාමරවල ඉඳ ගෙන විදේශිකයන්ගේ අනු දැනුම ඇතිව - සුද්දන්ගේ අනු දැනුම ඇතිව - තමයි එතුමන්ලා අය වැය හැදුවේ. 2005 වර්ෂයේ දී මංගල සමරවීර ඇමතිතුමා සිටියේ අපේ පක්ෂයේ. එතුමා පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහලා තිබෙනවා. එයට උත්තර වශයෙන් රවි කරුණානායක මැතිතුමා විසින් මේ විස්තර ටික ලබලා දීලා තිබෙනවා.

This is how it is stated in the "Lankaweb":

“According to the information provided, foreigners were conspicuous among the former Prime Minister’s advisers. One Mr. John Earl who was brought down by Ranil Wickremasinghe for publicity work during the 1999 Presidential Election and later named as consultant to the unit set up to develop a master plan for Strategic Communication was paid US Dollars 239,280 per year. Accordingly, his monthly pay was US Dollars 19,940 or Rs. 2,053,820. It is also a well-guarded but popular ‘secret’ that whatever his designation, John Earl’s main function appeared to be that of selecting the former Prime Minister’s clothing, and providing him with speech training and strategies to create dissension in opposition ranks. A reflection of the Prime Minister’s insecurities perhaps!

One Mr. A.G. Cuthbertson who was appointed as an adviser for strengthening Government capacity was paid US Dollars 227,625 per year, which amounted to Rs 1,953,781 monthly. Two other so-called advisers Trent J. Bertrand and Thomas Maxwell were paid US Dollars 232,625 each per year, which amounted to Rs. 1,996,697 monthly each. James W. Robertson who was former Prime Minister’s Senior Economic Adviser was paid US Dollars 214,000 per year, which amounted to Rs. 1,836,833 monthly”.

Sir, the source of these funds have been a loan granted by the World Bank during the last stages of the PA Government.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි විපක්ෂයට පැහැදිලි කර දිය යුතුයි, අපේ පක්ෂය හදන අය වැයයි, එතුමන්ලා හදපු අය වැයයි අතර තිබෙන වෙනස ගැන. අද දින බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ අය වැය පාන් භාගයේ අය වැයක් කියලා. ඇත්තෙන්ම ඒක විහිළුවක්. ඒක එතුමාගේ මානසික තත්ත්වය; මේ රටේ දේශපාලන ව්‍යුහය ගැන එතුමා දන්නා තරම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මගේ මූලික අවශ්‍යතාව වෙලා තිබෙන්නේ මේකයි. මහනුවර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු

මන්ත්‍රීවරයකු හැටියට මා නියෝජනය කරන්නේ පාතදුම්බර ආසනයයි. මෙතෙක් කල් අපි කිසි දෙයක් කරලා නැහැ; කිසි දෙයක් කරන්නේ නැහැයි කියා විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා. එහෙම කියන නිසා, 2012 වර්ෂයේ දී අප ආසනය තුළ ඇති වෙලා තිබෙන සංවර්ධන කටයුතු ගැන අද දින මා මේ ගරු සභාවට දැනුම් දීමට කැමැතියි. පාතදුම්බර ආසනයේ ප්‍රාදේශීය සභා දෙකක් තිබෙනවා. ඒ වාගේම එක් නගර සභාවක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකකින් සමන්විතයි. ඒ පන්විල සහ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස. 2012 වර්ෂයේ දී පහත දුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අපි සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙනවා.

ගම නැගුම, මග නැගුම, ජාතික සවිය, දිවි නැගුම ආදී වශයෙන් වූ සංවර්ධන වැඩසටහන් සඳහා පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රුපියල් මිලියන 52ක මුදලක් වැය කරලා තිබෙනවා. පාතදුම්බර ප්‍රාදේශීය සභාව මඟින් මේ ප්‍රදේශය සඳහාම රුපියල් මිලියන 79ක මුදලක් අපි වියදම් කරලා තිබෙනවා. පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රුපියල් මිලියන 40ක මුදලක් -මේක ඉතාම දුෂ්කර ප්‍රදේශයක්- මේ ප්‍රදේශය සඳහා වියදම් කරලා තිබෙනවා. පන්විල ප්‍රාදේශීය සභාව මඟින් රුපියල් මිලියන 83ක් ඒ ප්‍රදේශය සඳහා වියදම් කරලා තිබෙනවා. වත්තේගම නගර සභාව විශාල පානීය ජල යෝජනා ක්‍රමයක් සමඟ රුපියල් මිලියන 82ක මුදලක් මේ ප්‍රදේශය සඳහා වියදම් කරලා තිබෙනවා.

2012 අවුරුද්දට පමණක් රුපියල් මිලියන 336ක මුදලක් මා නියෝජනය කරන පාතදුම්බර ආසනය තුළ වියදම් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව කිලෝමීටර් 26ක ග්‍රාමීය පාරවල් කාපට් කරලා තවත් කිලෝමීටර් 15ක් කාපට් කරන්න ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ වාගේම රජයේ ගොඩනැඟිලි වශයෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැඟිල්ලක්ද, ප්‍රාදේශීය සභාවේ ගොඩනැඟිල්ලක්ද, නව බස් නැවතුම් පොළක් ද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයක්ද ඇතුළුව ගොඩනැඟිලි කිහිපයක් ඉදි කරමින් මේ ප්‍රදේශය තුළ විශාල වැඩ කොටසක් සිදු කර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
මට තව විනාඩියක් දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙවැනි විශාල වැඩ කොටසක් කරලා මේ රට තව ඉදිරියට ගෙන යන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයට දැන් තේරුම් ගොස් තිබෙනවා, අපව මැතිවරණයකින් පරාජය කරන්න බැරි බව. ඒ නිසා විරුද්ධ පාර්ශ්වය වෙනත් කූට උපක්‍රම යොදා ගෙන අපේ ආණ්ඩුව අස්ථාවර කරලා, සංවර්ධන ක්‍රියාදාමයන් නවත්වලා මේ ගෙන යන වැඩ පිළිවෙළ නවත්වන්න කටයුතු කරනවා. උඩරට තරුණ නායකයෙක් හැටියට, සංවර්ධනය සඳහා අපට කළ හැකි සියලුම කාර්යයන් ඉටු කරන බවට මේ අවස්ථාවේදී සහතික වන අතරම, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් 2016 වසර වනවිට මේ රට ආසියාවේ ආශ්චර්යය බවට පත්වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[අ.භා. 5.38]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ පාලනය යටතේ, අටවන අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන මොහොතක ඒ පිළිබඳව අදහස් කීපයක් දැක්වීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා සතුටු වනවා.

විශේෂයෙන්ම මේ අය වැය ලේඛනය දිහා බැලුවාම එහි තේමාවෙන්ම අපි දන්නවා, අපේ රට කුමන ආකාරයේ ගමන් මඟක යනවාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තේමාව වෙලා තිබෙන්නේ 'දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක්' යන්නයි. ඒ තේමාව යටතේ තමයි මෙම අය වැය ලේඛනය අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. වර්ෂ කීපයක සිට අපේ රටේ නිෂ්පාදිතය වැඩි කරලා, අපේ ආර්ථිකය ශක්තිමත් කර ගෙන ඉදිරි ගමනක් යන මොහොතකයි, මේ අය වැය ලේඛනය මේ රටට ඉදිරිපත් කර තිබෙන්නේ.

මම නියෝජනය කරන රජරට ප්‍රදේශය ගත්තොත්, විශාල වශයෙන් අපේ ආර්ථිකය රැඳිලා තිබෙන්නේ කෘෂි කර්මාන්තය මතයි. අපි දන්නවා, පසු ගිය නියං සමය නිසාත්, ඊට පෙර අපේ ප්‍රදේශයන්වලට ඇද හැලුණු දරුණු වර්ෂාව නිසාත් අපේ ගොවි ජනතාව දැඩි පීඩනයකට ලක් වුණු බව. හැබැයි මේ ඇති වුණු සියලුම කරදරවලින් ඒ ගොවි ජනතාව මුදවා ගැනීමේ හැකියාව අපේ රජයට තිබුණා. මොකද, ඒ ජනතාව හැම දාම අතිගරු ජනාධිපතිතුමා සහ අපේ රජය කෙරෙහි විශ්වාසය තියලා කටයුතු කළ නිසා. අපි දන්නවා, මේ වන කොට පසු ගිය නියං සමයේදී ඇති වුණු හානිය නිසා අපේ ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල බිත්තර වී නොමිලේ ගොවි ජනතාවට ලබා දෙමින් පවතින බව. ඒකත් නිසියාකාරව සිදු වෙන්නේ නැහැයි කියන මතයක් විරුද්ධ පාර්ශ්වයේ කණ්ඩායම් ගෙන යන්න හැදුවත් මේ වන කොට මේ කන්නය ආරම්භ වීමත් සමඟම ගොවි ජනතාවට අද බිත්තර වී ලැබෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පොහොර සහනාධාරය මත විශාල ගොවි ජනතාවක් රැඳෙනවා. ඒ වාගේම මේ පොහොර සහනාධාරය නිසා අද අපේ රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත්, අද අක්කරයක පොහොර සඳහා ගොවියෙක් මුදලින් ගෙවන්නේ රුපියල් 1,260යි. නමුත් විවෘත වෙළෙඳ පොළෙන් මේ පොහොර ගන්න ගියොත් රුපියල් 6,000කට ආසන්න මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා. දළ වශයෙන් රජයෙන් රුපියල් 4,000ක 4,500ක සහනාධාරයක් අක්කරයක් වෙනුවෙන් ලබා දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මම හිතුවා, මට තව විනාඩි 8ක් තිබෙනවා කියලා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම රජරට ජනතාව අපේ රජය කෙරෙහි විශ්වාසයක් තියලා තිබෙන්නේ මේ හේතුව නිසායි. අපේ ප්‍රධාන

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

වැව් අමුණු සියල්ල පාහේ ප්‍රතිසංස්කරණය කළා. ඒ වාගේම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිරි වර්ෂය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය තුළින් තවත් මුදල් වෙන් කරලා තිබෙනවා. රට සහලින් ස්වයංපෝෂිත වෙද්දී, බඩඉරිඟු වැනි වගාවන්ගෙන් ස්වයංපෝෂිත වෙද්දී මේ රටේ ජනතාව සතුටින් ජීවත් වෙද්දී විරුද්ධ පාර්ශ්වයෙන් කියන දේ තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් වෙලා තිබෙන්නේ ගමේ ඉන්න ජනතාවට නොවෙයි, ඉහළ ආදායම් ලබන කණ්ඩායමටයි කියලා.

කුඩා ව්‍යාපාර නඟා සිටුවීම කියන කාරණය ගත්තොත්, විශේෂයෙන්ම අපේ නිෂ්පාදකයෝ අවදි කරවලා දේශීය ආර්ථිකය ශක්තිමත් කරන්න, ඔවුන්ගේ ශක්තිය අපේ රටට ගන්න සමෘද්ධි බැංකු හරහා රුපියල් ලක්ෂ 5 දක්වා ණය මුදලක් ලබා ගැනීමට හැකි වාතාවරණය මෙවර අය වැයෙන් අතිගරු ජනාධිපතිතුමා සකස් කර තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා කුඩා කණ්ඩායම්වලට ඇප මත ණය ලබා ගැනීමේ පහසුකම ලබා දීලා තිබෙනවා. ඒ එක්කම වැදගත් වෙන්නේ එතුමා ඒ සියල්ල බදුවලින් නිදහස් කරලා රටේ දේශීය නිෂ්පාදකයන්ට ඔවුන්ගේ දක්ෂතා පෙන්වලා ආර්ථිකය ශක්තිමත් කරන්න අවස්ථාව ලබා දීමයි.

අපේ රට අද සංචාරක ව්‍යාපාරය අතින් ගත්තොත් ඉදිරියට එන වකවානුවක තමයි තිබෙන්නේ. අපි දැක්කා World Travel Mark Report එකේ තිබෙනවා, අද ශ්‍රී ලංකාව tourist destinationsවලින් නැඟී එන රටවල් පහ අතරට ඇවිල්ලා තිබෙන බව. ලංකාව හැරුණු කොට අනෙක් රටවල් බවට පත් වෙලා තිබෙන්නේ, මෙක්සිකෝව, ආජන්ටිනාව, මැලේසියාව සහ ඉන්දුනීසියාව කියන රටවල්. Tourist destinationsවලින් නැඟී එන රටවල් පහ අතරට අපේ රට පත් වෙලා තිබෙන්නේ කරුණු තුනක් හේතු කොට ගෙන. එකක් තමයි, සිවිල් යුද්ධයක් අවසාන කර ගොඩ නැඟෙමින් ඇති රටක් බවට පත්වීම. ඒ වාගේම යටිතල පහසුකම් දියුණුව සඳහා රජය විසින් කරන ආයෝජනය සහ ගමනාන්තයේ ඇති සුන්දරත්වය. අප දන්නවා 2016 වෙද්දි මිලියන 2.5ක සංචාරක ව්‍යාපාරයක් අපේ රටේ ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තුව ඇතුව, සැලසුම් හදලා, ඒක ඉදිරියට ගෙන යන මොහොතක් කියලා මේක. මා හිතනවා අපට ඒ ඉලක්කය සපුරාලන්න සුදුසු වාතාවරණයක් මේ වන කොට අප රට තුළ ඇති වෙමින් පවතිනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ඉහළ මට්ටමෙන් වියදම් කරන විදේශ සංචාරකයන් අපේ රටට ගෙන ඒම සඳහා සෘජුව ඔවුන්ට අලෙවිකරණ පහසුකම ලබා දීම - direct consumer marketing activities - අප ඉතාම වැදගත් කොට සලකන්න ඕනෑ. Foreign journals, travel journals වාගේම TV Travel වාගේ ආයතනවල ජනමාධ්‍යවේදින්ට, මාධ්‍යවේදින්ට මේ රටට ඇවිල්ලා වාර්තා කරන්න අවශ්‍ය පහසුකම් සපයන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා. මා හිතන හැටියට, ඒක ඉතාම වැදගත් සන්ධිස්ථානයක් වෙනවා අපේ රටේ සංචාරක ව්‍යාපාරයට. ඒ තුළින් අපි බලාපොරොත්තු වන සංචාරක ව්‍යාපාරයේ ඉලක්කය අපට සපුරා ගන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපේ රටේ ඉන්නා දේශීය ව්‍යාපාරිකයන් විශාල වශයෙන් සහයෝගය දැක්වීමට කැමැත්ත දක්වලා තිබෙනවා.

මා හිතන්නේ දැන් මට වෙන් වී තිබෙන කාලය අවසානයි කියන එකයි ගරු නියෝජ්‍ය කථානායකතුමා කියන්න යන්නේ. මෙවර අය වැය මේ රටේ ජනතාවට, විශේෂයෙන්ම ග්‍රාමීය ගොවි ජනතාවට ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරලා, ඔවුන්ගේ ජීවිතය නැවත නඟා සිටුවීම සඳහා ඉදිරිපත් කරපු අය වැයක් ලෙසත්, විපක්ෂයේ කණ්ඩායම් හුවා දක්වන ආකාරයට ඉහළ ධනපති පන්තිය සඳහා වෙන් නොවූ අය වැයක් ලෙසත් ප්‍රකාශ කරමින්, අතිගරු ජනාධිපතිතුමාට මේ පිළිබඳව අපේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 5.45]

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2013 අය වැය විවාදයට නැඟෙනහිර පළාත නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට මෙවර අය වැය ඉදිරිපත් කිරීමේදී දෙවනුව ප්‍රකාශ කරපු කරුණක් තමයි, මේ වසරේ පළාත් සභා තුනක මැතිවරණ පැවැත්වූවා; පළාත් සභා තුනේ ඒ මැතිවරණවලින් රජය මහ ජනතාවගේ ප්‍රසාදයට පත් වී තිබුණු බව ප්‍රකාශ වුණු බවත්, විශේෂයෙන්ම නැඟෙනහිර පළාතේ ජනතාව රජය කෙරෙහි විශ්වාසය තබා ඇති බවත් ප්‍රකාශ කළා. මා කියන්න කැමැතියි, නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව මෙවර තමන්ගේ ඡන්දය ප්‍රකාශ කළේ රජයට විරුද්ධව මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂයට බව.

2008 පළාත් සභා ඡන්දයේදී සන්ධානය වැඩි ඡන්ද 51,000කින්, එනම් සියයට 60කින් ජයග්‍රහණය කළා. නමුත් මෙවර මැතිවරණයේදී ඡන්ද 201,000කින් සන්ධාන රජය පරාද වුණා. ප්‍රතිශතයක් ලෙස ගතහොත් ලබාගන්න පුළුවන් වුණේ සියයට 27ක් පමණයි. මේ ඡන්ද ලබාගන්න "දැයට කිරුළ" ව්‍යාපෘතිය තමයි වැඩියෙන්ම market කළේ. සියලු අඩු පාඩු සම්පූර්ණ කරන බවට ප්‍රතිඥා දුන්නා. කැබිනට් ඇමතිවරු බුරුතු පිටින් ගිහිල්ලා නැඟෙනහිර පළාතේ පදිංචි වෙලා හිටියා. නොයෙකුත් දේවල් දෙනවා කියා බොරු පොරොන්දු දෙමින්, ජනතාව මුළා කරමින්, රජයේ දේපළ යොදාගනිමින් ඡන්ද ව්‍යාපාරය මෙහෙයවූවා. නිවාස, රැකියා ලබා දෙන බවට "ෆෝම්" මහා පරිමාණයෙන් බෙදුවා. මේ ක්‍රමයෙන් ඡන්ද ලබාගෙන අවසානයේදී, මනාප ඡන්ද 11,000ක් පමණක් ලබා ගත්, මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රී කෙනකු මහ ඇමති වශයෙන් පත් කර, මුස්ලිම් කොංග්‍රසයත් සමඟ ගිවිසුම් ගහලා, පළාත් සභාව පිහිටුවලා, රටට ලෝකයට පෙන්නුවා, අපි තමයි ජයග්‍රහණය කළේ කියලා. නැඟෙනහිර උදානයට ජනතාවගේ පිළිගැනීම අපට එයින් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන අය වැය ඇත්තටම සුරංගනා කථාවල එකතුවක්. මේක ඇත්තටම අය වැයක් නොවන අය වැයක්. යුද්ධය ඉවර වෙලා අවුරුදු තුනක් ගත වුණත් ජනාධිපතිතුමා ජනතාවට පොරොන්දු වෙච්ච සහන ලබා දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. 2011 අය වැය කථාවේදී එතුමා, ඉතිහාසයේ කවදාවත් නොතිබුණු ඩොලර් බිලියන 8.3ක සංචිතයක් තිබෙන බව, මහින්ද චින්තනය තුළින් ගොඩ නඟපු බව අපට කිව්වා. මේ සංචිතය ඇත්තටම හැදුවේ විදේශ ණයවලින්. ඒ, අපේ රට ණය කරලා ලබා ගත් මුදල් බව කියන්න එතුමාට අමතක වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපනයන වෙළඳාම දිරිමත් කිරීමට, රැකියා උත්පාදනය වැඩි කිරීමට ඩොලරය සියයට 3කින් අවප්‍රමාණ කළා. මා හිතන්නේ ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට රුපියල බාල්දු කරපු අවස්ථාව මෙය

බවයි. අද වන විට රුපියල සියයට 21කින් බාල්දු වෙලා තිබෙනවා. වාර්තාගත ඩොලර් සංචිතය අඩු වුණා විතරක් නොවෙයි, ඉතිහාසය තුළ වැඩිම ණයක් වාර්තා වෙලා තිබෙන්නේත් මේ ආණ්ඩුවෙන් බව අවධාරණය කරන්න ඕනෑ. 2005 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 37ක් වූ අපනයන ආදායම මේ වන විට සියයට 14 දක්වා අඩු වීම තුළින් මේ රාජපක්ෂ ආණ්ඩුවේ සංවර්ධනය අපට හොඳින් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වන විට අපේ රටට නිසි හා ඉතාම සූක්ෂ්ම ආර්ථික ප්‍රතිපත්තියක් අවශ්‍ය වෙලා තිබෙනවා. ආනයන වියදම අඩු කරලා, අපනයන ආදායම වැඩි කරන බවට අය වැයේ සඳහන් වෙලා තිබෙනවා. නමුත් මේවා කරන්නේ කොහොමද කියලා පැහැදිලි විග්‍රහයක් නැහැ. නිෂ්පාදන කටයුතු දියුණු කරන්න ජනතාවට ලබා දෙන ප්‍රතිපාදන, සහන මොනවාද කියලා නැහැ. කොයි විධියෙන්ද ජනතාව සංවර්ධන කටයුතු සඳහා ශක්තිමත් කරන්නේ කියලා සඳහන් වන්නේ නැහැ. දියුණු වූ හැම රටක්ම ගත්තොත්, ඒ රටවල පාලකයන් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට, දියුණු කර ගැනීමට දේශපාලන භේදයකින් තොරව ප්‍රතිපත්ති සකස් කරනවා. නමුත් මේ සන්ධාන රජය ඔවුන්ගේ අදහස්වලට, ක්‍රියා කලාපයට විරුද්ධ හැම කෙනාගෙන්ම ද්වේෂසහගත ලෙස පළිගන්නවා. ගිය වසරේ කඩි මුඩියේ ගෙනාවා පනතක්. කාර්ය සාධනයෙන් අඩු හා පරිහරණය නොකරන ආයතන හා වත්කම් රජයට පවරා ගැනීම සඳහා කියලා පනතක් ගෙනැල්ලා එය පළිගැනීමට අවස්ථාවක් කර ගත්තා. මෙම පනත ගෙනාවට පස්සේ කොටස් වෙළඳ පොළ දිනෙන් දින කඩා වැටුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආයෝජකයන්ට අපේ රට ගැන විශ්වාසයක් නැති වුණා. අරක්කු පෙරනවා කියලා අපට මඩ ගහන්න පටන් ගත්තා. නමුත් රටේ ජනතාව දන්නවා වැඩියෙන්ම කාටද සුරාසැල් තිබෙන්නේ, ගංජා වවන්නේ කවුද, කුඩු ගෙන්වන්නේ කවුද කියලා.

ආර්ථික සංවර්ධන ඇමතිතුමා මේ වෙලාවේ මෙතැන හිටියා නම් ඇත්තටම මම කැමැතියි. එතුමා මෙහිදී කිව්වා සෙවණගල ආයතනයත්, පැල්වත්ත ආයතනයත් රජයට ගත්තාට පස්සේ රුපියල් මිලියන 750කුත්, රුපියල් මිලියන 550කුත් ශුද්ධ ලාභ ලැබුවා කියලා. එවැනි ශුද්ධ ලාභයක් ලැබුණේ කොහොමද? ඇමතිතුමාට කිසිම වියදමක් නැහැ. මොකද, ඔක්කෝම දේවල් කරලායි තිබුණේ. උක් ගස්වලට පොහොර දීලා, උක් ගස් වවන්න ණය දීලා තිබුණේ. අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ආදි සියල්ලටම අපි ආයෝජනය කරලා තිබුණේ. මේක හරියට, කරගෙන යන ව්‍යාපාරයක ඉන්න මිනිස්සු ගහලා එළවලා තවත් පිරිසක් ඒ ව්‍යාපාරය ගත්තා වාගේ වැඩක්. එහෙම කළාම සම්පූර්ණයෙන් ලාභ තමයි හම්බ වෙන්නේ. ඇයි, වියදමක් කරලා නැහැ නේ. සියලු දේවල් ඒ අයට ලාභ තමයි. ඒ වාගේ දෙයක් තමයි කළේ. මා හිතන්නේ එතුමා දවසකටවත් ව්‍යාපාරයක්වත්, රස්සාවක්වත් කරලා තිබෙන කෙනෙකු නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිසා එතුමාට ලාභ පාඩු ගැන කියන එකේ අවශ්‍යතාවක් නැහැ. මම මේ වෙලාවේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට කියන්න කැමැතියි -ඇත්තටම එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ- ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට කන්තලේ සහ හිඟුරාන කම්හල් භාර දෙන්න කියලා. එතකොට රුපියල් මිලියන 750ක්, රුපියල් මිලියන 450ක් වාගේ ලාභ ගන්න පුළුවන් නම් ජනාධිපතිතුමාට කිසිම අපහසුතාවක් නැතුව මේ අය වැය හිඟය නිකම්ම පියවා ගන්න පුළුවන්. [බාධා කිරීමක්] සීනි හදනවා, ලාභ නැහැනේ. ඒ වාගේම සෙවනගලට සහ පැල්වත්තට මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 165ක් දුන්නා. ඒ නිසා ලාභ තිබෙනවා. ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ ආයතනය පවරා ගනිද්දී පාඩුවට දිව්වේ නැහැ කියා. ලාභ ලබන ආයතනය තමයි පවරා ගත්තේ. පාඩු ලබන ආයතනයක් පවරා ගත්තේ නැහැ. පාඩු ලබද්දී තමයි අපි ආයතනය ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම තව කාරණයක් කියන්න කැමැතියි. ඒ වෙලාවේ අරගත් SLECC ආයතනය සිංගප්පූරු රජයත් එක්ක සම්බන්ධ නිසා නැවත භාර දුන්නා. ඉන්දියානු සමාගමත් නැවත භාර දුන්නා. දේශීය ආයෝජනකරුවන්ට විතරයි භාර දුන්නේ නැත්තේ. ඒක දියුණු කරලා ලබන අවුරුද්ද වන කොට මුළු ලංකාවම සීනිවලින් ස්වයංපෝෂිත කරන්න ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාට පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එතුමාට නම් සීනි තිබෙනවා වගේ තමයි පෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්පාර ප්‍රදේශයේ ගොවි ජනතාවට මෙවර අය වැයෙන් මොනවාද දීලා තිබෙන්නේ කියලා මම අහන්න කැමැතියි. මොකද, ගොවි විශ්‍රාම වැටුප් ගෙවපු නැති බව හැම වෙලාවේම ඔවුන් කථා කරනවා. නමුත් රට සහල්වලින් ස්වයංපෝෂිත වෙලා තිබෙන්නේ. පොහොර සහනාධාරය යටතේ හැම පොහොර කිලෝවකින්ම ගොවීන්ගෙන් රුපියල් 3ක් අය කර ගන්නා විධියට දැන් රක්ෂණ ක්‍රමයක් හරිගස්සලා තිබෙනවා. ඒ වාගේම වී සඳහා සහතික මිල රුපියල් 32ක් කරන්න කියලා යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

අපි ගිය වරත් දැක්කා, මේ මිල ගණන් බෝඩ් ලෑලිවලට විතරයි සීමා වුණේ කියා. ඇත්තටම වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න ගොවියෙකුට රුපියල් 33ක් පමණ වැය වෙනවා. ඒ නිසා අවම මිල රුපියල් 40ක් කරන්න කියලා මම ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම කාබනික පොහොර යොදා වී වගා කරන ගොවියාට වී සඳහා රුපියල් 40ක් ගෙවන බව සඳහන් කරලා තිබෙනවා. මහා පරිමාණයෙන් කුඹුරක් හදන්න කාබනික පොහොර නිපදවා ගන්නේ කොහොමද කියන එක ප්‍රශ්නාර්ථයක්. ගොවියා රක්ෂණය කරන්න ඉස්සෙල්ලා ඔවුන්ට ගොවි විශ්‍රාම වැටුප් ගෙවන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේ අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඉඩම් කච්චේරි පවත්වලා බෙදා දුන් ඉඩම්වල වගා කටයුතු කරන්න වනජීවී දෙපාර්තමේන්තුව ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ගොවීන් එම ඉඩම්වල පදිංචි වෙලා හිටියත් විදුලිය ලබා ගන්නවත්, වෙන කිසිම දෙයක් සඳහාවත් පදිංචිය සනාථ කර ගන්න ග්‍රාම නිලධාරිවරු ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගොවීන් ගැන සලකා බලා යම් කිසි සාධාරණයක් කරන්න කියලා මා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පෙබරවාරි මාසය වෙද්දී අම්පාර, පොළොන්නරුව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක මූලික කර ගෙන දැයට කිරුළ වැඩසටහන පටන් ගන්නවා. මේ සඳහා අය වැය ලේඛනයෙන් රුපියල් බිලියන 60ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඇත්තටම දැයට කිරුළ වැඩසටහන වෙනුවෙන් වාර්ෂිකව මෙවැනි මුදලක් වැය කළාට ඒ මුදලට සරිලන ප්‍රතිඵලයක් ලැබෙනවාද කියන එක අපට ප්‍රශ්නයක්. මොකද, වියදම් කරන මුදලින් ඉතාම සුළු කොටසක් යොදවා නිසි ප්‍රමිතියකින් තොරව ඉතාම සුළු කාලයක් තුළදී කරනු ලබන ඉදි කිරීම් ඉතාම කෙටි කාලයක් තුළ විනාශ වී යනවා. ඒ වාගේම එම මුදලින් තැරැව්කරුවා සහ කොන්ත්‍රාත්කරුවා පොහොසත් වන බව විතරයි අපි දන්නේ.

උදාහරණයක් ලෙස කිව්වොත්, මේ දවස්වල අම්පාර-නුවර පාර හදනවා. එම මාර්ගය හදද්දී පස් පුරවලා, ඊට උඩින් ABC දාලා යාන්තම් වහනවා. වැස්ස නිසා ඒ පාරවල්වල ආපහු වලවල් හැරිලා තිබෙනවා. මේ ගැනත් අවධානය යොමු කරන්න. මොකද, දැයට කිරුළ පටන් ගන්න කොට ඒ පාරවල් අබලන් වෙලා තිබේවි. මේ වන කොට අම්පාර ප්‍රදේශයට වර්ෂා කාලය ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ ගැන බලන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ සඳහා වැය කරන්නේ රටේ ජනතාවගෙන් බදු මුදල් වශයෙන් ලබා ගන්නා මුදල්. මේ රටේ අහිංසක ජනතාව කුලී වැඩ කරලා, එහෙම

[ගරු අනෝමා ගමගේ මහත්මිය]

නැත්නම් කම්කරු රැකියාවක් කරලා හම්බ කරන මුදල් තමයි මේ නාස්ති කරන්නේ. මෙහෙම කළොත් ආසියාවේ ආශ්චර්ය කොහොම වුණත් ඉතියෝපියාවේ තත්ත්වයට අපේ රට පත් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා හුදකලා පාසල්වල අධ්‍යාපනය ලබන දරු දැරියන් සඳහා කිරි සහ බිත්තර සහිත ආහාර වේලක් ලබා දීමටත්, අමතර නිල ඇඳුමක් සහ සපත්තු කුට්ටමක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. මෙම යෝජනාව ඇත්තටම හොඳයි. නමුත් මේවා ක්‍රියාත්මක වනවාද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය. ඒ වාගේම පාසල් අධ්‍යාපනය තුළ දරු දැරියන් සියලු දෙනාම එක ගණයේ ලා සැලකිය යුතු වනවා. ජාති, ආගම්, කුල හෝ වෙනත් පදනමක් මත දරුවන් වර්ග කරන්නේ නැතුව සියලු දෙනාටම කිරි සහ බිත්තර සහිත ආහාර වේලක් ලබා දීමටත්, නිල ඇඳුමක් සහ සපත්තු කුට්ටමක් ලබා දීමටත් කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය මාස කිහිපය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ මහා ආන්දෝලනයක් පැවතුණා. Z-score අගය ගැන උසාවි ගිය අසරණ දරුවන් උසස් පෙළ විභාගය කළේ 2011 අගෝස්තු මාසයේදීයි. නමුත් අද වන තුරුත් ඒ දරුවෝ ගෙදරයි ඉන්නේ. 2012 වර්ෂයේ සම්පූර්ණයෙන්ම ඒ දරුවෝ ගෙදරයි සිටියේ. 2013 වර්ෂයේ මාර්තු මාසයේ පමණ විශ්වවිද්‍යාල පටන් ගන්නවාය කියලා ඒ දරුවෝ හිතා ගෙන ඉන්නවා. එම නිසා අවුරුදු එකහමාරකටත් වඩා ගෙදර ඉන්න මෙම දරුවන් ගැන යම් දෙයක් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියයි තිබෙන්නේ. ප.ව. 6.00ට සභාවේ කටයුතු අවසන් කරන්න තිබෙනවා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය මැයි දිනයේදී අපේ ජනාධිපතිතුමා කිව්වා, "ලක්ෂ 6ක් තිබුණු රාජ්‍ය සේවය මා ලක්ෂ 13ක් කළා. රනිල් වික්‍රමසිංහට එක රක්ෂාවක්වත් දෙන්න බැරි වුණා"යි කියලා. නමුත් අද මුදල් අමාත්‍යවරයා හැටියට රජයේ සේවකයන්ට වැටුප් සඳහා රුපියල් බිලියන 366ක් වියදම් කරන එකත්, රාජ්‍ය සේවයේ විශ්‍රාම ලාභීන්ට රුපියල් බිලියන 112ක් ගෙවන එකත් විශාල කරදරයක්, වග කීමක් විධියට තමයි එතුමා කල්පනා කරන්නේ. එය රජයේ සේවකයන්ගේ වැරැද්දද, දේශපාලන අධිකාරියේ වැරැදි කළමනාකරණයද කියන්න මා දන්නේ නැහැ. මැතිවරණයේදී රජයේ සේවකයින්ට සහ අහිංසක ගොවි ජනතාවට පොරොන්දු පිට පොරොන්දු දෙමින්, ඔවුන්ගේ කර පිටින් තමන්ගේ බලය ආරක්ෂා කර ගනිමින් රජයේ සේවකයින්ගේ වැටුප දෛනිකව රුපියල් 25කින් වැඩි කිරීම තුළින් රාජ්‍ය සේවය අවතක්සේරුවට ලක් කිරීම ගැන මා කනගාටු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිෂ්පාදන ආර්ථිකයක් තුළින් ඇති කරන පරිවර්තනය මත 2016 වන විට ඩොලර් බිලියන 100ක ආර්ථිකයක් ඇති කර ගැනීමට රජය බලාපොරොත්තු වනවා නම්, එයින් ඩොලර් බිලියන 15ක් පමණ අපනයන ක්ෂේත්‍රය තුළින් ලබා ගැනීමටත්, ඩොලර් බිලියන 2.5ක් සංචාරක කටයුතුවලින් උපයා ගන්නටත් අපේක්ෂා කරනවා. විදේශ රැකියාවලින් ලැබෙන ආදායම ඩොලර් බිලියන 10කට ගෙන ඒමට රජය අපේක්ෂා කරනවා. නමුත් අපනයන ආදායම වැඩි කරන්නේ කොහොමද කියා කල්පනා කළේ නැහැ. අපනයන ආදායම වැඩි කරන්න එදා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කර්මාන්තපුර ඇති කළා. ඒ වාගේම ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ අපේ රටේ ඇඟලුම් කර්මාන්තයේ විශාල දියුණුවක් ඇති වුණා. ඇඟලුම් ක්ෂේත්‍රය සියයට 53ක විදේශ විනිමය උපයන මාර්ගයක් බවට පත් කළා. නමුත් මේ වන විට අපේ රටේ ශ්‍රමිකයන්ට රැකියා සොයා ගෙන පිට රටවලට යන්න සිද්ධ වෙලා තිබෙනවා. අසරණ කාන්තාවන් තම ශ්‍රමයෙන් උපයා ගන්නා මුදල තමයි අද රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, කාන්තාවන් පිට රට යැවීම වෙනුවට ඔවුන්ට අපේ රටේ ආදායම් මාර්ගයක් ලබා දීමට ක්‍රමයක් සලස්වන්නය කියලා. මන්ද යත්, කාන්තාවන් පිට රට රැකියාවට ගියාම ඔවුන්ගේ පවුල් සංස්ථාව විනාශ වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, කථාව අවසන් කරන්න. You can table the rest of your speech.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

එදා එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කර්මාන්ත ඇමතිතුමා හැටියට කර්මාන්තපුර ඇති කර ලක්ෂ ගණන් රැකියා උත්පාදනය කර අපේ තරුණ තරුණියන් අතින් නිෂ්පාදනය කරන නිෂ්පාදන පිට රට යවා ආදායම් වැඩි කර ගත්තා පමණක් නොවෙයි, අපේ රටේ විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගය බවට එය පත් කර ගන්නත් අපට හැකියාව ලැබුණා.

අද සන්ධාන ආණ්ඩුව යටතේ අපේ රටේ ශ්‍රමිකයන්ට රැකියා සොයා ගෙන මැද පෙරදිග රටවලට යන්න සිදු වී තිබෙනවා. අද අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වී තිබෙන්නේ අපේ රටේ කාන්තාවන් දහඩිය වගුරවමින් සොයා දෙන විදේශ විනිමයයි. මම මේ ගරු සභාවට යෝජනා කරනවා 2016 වන විට අපේ කාන්තාවන් පිට රට යවා මුදල් හොයන ක්‍රමය වෙනස් කර ඔවුන්ට ඔවුන්ගේ උරුමය සමඟ මේ රටේ ජීවත් විය හැකි ආදායම් මාර්ග සොයා ගැනීමට අවකාශ සලසා දෙන ලෙස.

අවසාන වශයෙන් මා සඳහන් කරනවා මෙය අය වැයක් නොව ණය වැයක් පමණක් බව. ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.00 වුයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2012 නොවැම්බර් මස 15 වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.***

*அப்போது பி. ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம் 2012 நவம்பர் 15, வியாழக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Thursday, 15th November, 2012.*

# 2013 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවලින් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

# 2013ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழு

## SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2013

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2012 නොවැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණද '2013 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව' 2012.11.20 සිට 2012.11.26 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රැස්වී සාකච්ඡා කළ යුතුය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම

# ஒத்திவைப்பு

## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.01 ට, 2012 ඔක්තෝබර් 25 වන දින සභා සම්මතිය අනුව, 2012 නොවැම්බර් මස 15 වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.01 மணிக்கு பாராளுமன்றம் அதனது 2012 ஒக்ரோபர் 25 ஆந் திகதிய தீர்மானத்திற்கிணங்க, 2012 நவம்பர் 15, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.01 p.m. until 9.30 a.m. on Thursday, 15th November, 2012, pursuant to the Resolution of Parliament of 25th October, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.